**319 වන කාණ්ඩය - 08 වන කලාපය**
**தொகுதி 319 - இல. 08**
**Volume 319 - No. 08**

**2025 මැයි 22 වන බ්‍රහස්පතින්දා**
**2025 மே 22, வியாழக்கிழமை**
**Thursday, 22nd May, 2025**

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
ආංශික අධීක්ෂණ කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන් සඳහා වන සම්මන්ත්‍රණය [තීරුව 1321]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1321]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1322]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1323-1362]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් සඳහා අවම වැටුපක් හඳුන්වා දීම [තීරුව 1363]

**ආනයන හා අපනයන (පාලන) පනත:**
රෙගුලාසි [තීරු 1365-1473]

**විසර්ජන පනත:**
යෝජනා සම්මත [තීරු 1473-1482]

**කල් තැබීමේ යෝජනාව:**
උතුරු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සවිබලගැන්වීම [තීරු1483-1496]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
துறைசார் மேற்பார்வைக் குழுக்களின் உறுப்பினர்களுக்கான கருத்தரங்கு [ப: 1321]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1321]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1322]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1323-1362]

**தனி அறிவித்தல் மூல வினா:**
மத்திய கிழக்கில் பணிபுரியும் இலங்கைத் தொழிலாளர்களுக்கு குறைந்தபட்ச ஊதியத்தை அறிமுகப்படுத்தல் [ப: 1363]

**இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1365-1473]

**ஒதுக்கீட்டுச் சட்டம்:**
தீர்மானங்கள் [ப: 1473-1482]

**ஒத்திவைப்புப் பிரேரணை:**
வட மாகாண சிறிய மற்றும் நடுத்தர அளவிலான ஏற்றுமதியாளர்களை மேம்படுத்துதல் [ப: 1483-1496]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Seminar for Members of Sectoral Oversight Committees [Col. 1321]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col.1321]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1322]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1323-1362]

QUESTION BY PRIVATE NOTICE:
Introduction of Minimum Wage for Sri Lankan Migrant Workers in the Middle East [Col. 1363]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Cols. 1365-1473]

APPROPRIATION ACT:
Resolutions [Cols. 1473-1482]

ADJOURNMENT MOTION:
Empowerment of Small and Medium-Scale Exporters in the Northern Province [Cols.1483-1496]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 මැයි 22වන බ්‍රහස්පතින්දා***
*2025 மே 22, வியாழக்கிழமை*
*Thursday, 22nd May, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ආංශික අධීක්ෂණ කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන් සඳහා වන සම්මන්ත්‍රණය
### துறைசார் மேற்பார்வைக் குழுக்களின் உறுப்பினர்களுக்கான கருத்தரங்கு
### SEMINAR FOR MEMBERS OF SECTORAL OVERSIGHT COMMITTEES

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආංශික අධීක්ෂණ කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන්ගේ ප්‍රයෝජනය සඳහා "Best Practices for Undertaking Legislative Scrutiny" යන විෂයය යටතේ වූ සම්මන්ත්‍රණයක් Max Planck Foundation for International Peace and the Rule of Lawහි සහාය ඇතිව 2025.05.22 සහ 23 යන දිනයන්හි වෙන් වෙන් වශයෙන් වූ සැසි වාර දෙකක් ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, 2025.05.22, එනම් අද දින සහ 2025.05.23 යන දිනයන්හි ප.ව. 1.30 සිට ප.ව. 3.30 දක්වා සැසිවාර දෙකක් ලෙස මෙම සම්මන්ත්‍රණය කාරක සභා කාමර අංක 2හිදී පැවැත්වෙන අතර, අදාළ දිනයට ආරාධනා ලැබී ඇති සියලු ආංශික අධීක්ෂණ කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ට ඒ සඳහා සහභාගි වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වගන්තිය යටතේ වන නියමයන්ට අදාළ යෝජනා සම්මත (2025 මැයි 14 දිනැති පාර්ලිමේන්තුවේ අංක 2(2) දරන න්‍යාය පුස්තකය සම්බන්ධ පරිපූරකයේ ඇතුළත් කරන ලද අංක 01 සිට 10 දක්වා වූ යෝජනා සම්මත) සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

ගරු කථානායකතුමනි, වෙයන්ගොඩ, මාළිගාතැන්න, අංක 226/1/සී දරන ස්ථානයෙහි පදිංචි ජී.එච්.ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)

ගරු කථානායකතුමනි, නිවිතිගල, දොඩම්පාවත්ත, 'සැනසුම' යන ලිපිනයෙහි පදිංචි එම්.එල්. පුංචි සිංඤෝ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, මීගොඩ, වටරැක, ගාලබැදිහේන වත්ත, අංක 32/79 දරන ස්ථානයෙහි පදිංචි කේ.ආර්. පාලිත කුලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

Hon. Speaker, I present a petition from Mr. P.W.R. Fernando of Police Headquarters, Negombo.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු කථානායකතුමනි, පානදුර, අළුබෝමුල්ල, ෆෝර්ට් පාර්ක් කෝනර්, බෝධිරුක්ඛාරාම පාර යන ලිපිනයෙහි පදිංචි එන්.එල්.ඩී. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
ගරු කථානායකතුමනි, දෙහිඅත්තකණ්ඩිය, රණවිරුගම, අංක 236 දරන ස්ථානයෙහි පදිංචි ජී.ජී.ජී. ප්‍රියදර්ශන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)
ගරු කථානායකතුමනි, බදුල්ල, තල්දෙන, කුකුරුමහන්තැන්න, "ගයානි නිවස" දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. සුදුබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු කථානායකතුමනි, තලවතුගොඩ, වැලි පාර, අංක 468/5 දරන ස්ථානයෙහි පදිංචි එච්.අයි.එස්. කල්දේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු කථානායකතුමනි, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, බෙත්තාරාම මාවත, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි එස්.එන්.ඩබ්ලිව්.එම්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම් ලබා දීම: ක්‍රමවේදය
### இலங்கை மகாவலி அதிகாரசபையின் காணிகளை பாரிய கருத்திட்டங்களுக்கு வழங்குதல்: நடைமுறை
### GRANT OF LANDS OF SRI LANKA MAHAWELI AUTHORITY FOR LARGE-SCALE PROJECTS: METHODOLOGY

11/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්, විශාල ව්‍යාපෘති සඳහා ලබා දීමේ ක්‍රමය කවරේද;

(ii) ඩෝල් ලංකා' සමාගම හා `විටා ඕගනී' සමාගම වෙත කෙසෙල් වගා කිරීම සඳහා වලව කලාපයේ, චන්ද්‍රිකා වැව කොට්ඨාසයේ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් නිසි ක්‍රමය අනුව ලබා දී නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மகாவலி அதிகாரசபை வசமுள்ள காணிகளைப் பாரிய கருத்திட்டங்களுக்கு வழங்கும் நடைமுறை யாதென்பதையும்;

(ii) வளவ வலயத்தில், சந்திரிகா குளப் பிரிவில் வாழைச் செய்கைக்காக `டோல் லங்கா' கம்பனிக்கும், `விற்றா ஓகனி' கம்பனிக்கும் வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அக்காணிகள், உரிய நடைமுறைக்கு அமைவாக வழங்கப்படவில்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the methodology adopted in granting the lands belonging to Sri Lanka Mahaweli Authority for large-scale projects;

(ii) the extent of land provided to companies named Dole Lanka and Vita Organi for banana cultivation in Chandrika Wewa Division of Walawa Region, separately; and

(iii) whether he admits the fact that the said lands were not provided following the proper methodology ;

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.


(අ) (i) ගරු මන්ත්‍රීතුමනි, මෙම ඉඩම් ලබා දෙන ක්‍රමවේදය පිළිබඳව දීර්ඝ පිළිතුරක් තිබෙනවා. මම ඔබතුමාට කෙටියෙන් උත්තරයක් දෙන්නම්. ඉඩම් ලබා දෙන්නේ දීර්ඝ කාලීන බදු පදනම මත, නැත්නම් ඇමතිවරයාගේ වරණීය පදනම මත, එහෙම නැත්නම් ටෙන්ඩර් හෝ වෙන්දේසි කිරීමෙන්. ඒවා තමයි ඒ ක්‍රම තුන.

ප්‍රශ්නයේ (අ) (i) සඳහා තිබෙන එම විස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභා මේසය මත තබන ලද (අ) (i) කොටසට පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட (அ)(i)இன் விடை :*
** Answer to a(i) tabled*

අධිකාරියේ ඉඩම් පරිහරණ සැලැස්මට අනුව ව්‍යාපෘති සඳහා හඳුනා ගත් ඉඩම් විධිමත් පරිදි ඇගයීමට ලක් කර හඳුනා ගත් ව්‍යාපෘති සඳහා සුදුසු ආයෝජකයන් වෙත රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කිරීමට කටයුතු කෙරේ. මහවැලි අධිකාරිය මඟින් පරිපාලනය වන ඉඩම් සැලසුම් කිරීමේදී ඉඩම් පරිහරණ සැලසුම් අංශය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා වෙන් කරන ආයෝජන ඉඩම් පළමුව හඳුනා ගනු ලබයි. ඉන්පසු පුවත් පත් දැන්වීම් මඟින් ටෙන්ඩර් පටිපාටිය යටතේ අභිලාෂ කැඳවීම මඟින් සුදුසු ආයෝජකයන් කැඳවනු ලැබේ.

මෙහිදී ජාතික වශයෙන් සුවිශේෂී වූ අනෝන්‍ය වැදගත්කමින් යුතු ව්‍යාපෘතීන් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව වරණීය පදනම මත තෝරා ගනු ලැබේ. ඉහත මෙම ව්‍යාපෘතීන් සඳහා අදාළ අනුමැතීන් අදාළ කලාපයේ භෞතික සැලසුම් කමිටුවක් හා ආයෝජන ඉඩම් අනුමැතිය කමිටුවක් මඟින් ගනු ලැබේ. මෙම අනුමැතිය ලබා ගත් පසු අදාළ ඉඩම බදු පදනම මත බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් පසු රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන මත විෂය භාර අමාත්‍යතුමාගේ බදු අනුමැතිය ලබාගෙන දීර්ඝ කාලීන බදු පදනම මත ඉඩම් බැහැර කෙරේ.




(අ) (ii) ඩෝල් ලංකා සමාගම වෙත වලව කලාපයේ චන්ද්‍රිකා වැව කොට්ඨාසයෙන් ඉඩම් බැහැර කිරීමක් සිදුකර නොමැත. විටා ඕගනික් සමාගම වෙත අක්කර 39ක්, ඉඩම් කැබලි දෙකක් කෙසෙල් වගා ව්‍යාපෘතියක් සඳහා ලබා දී ඇත.

(iii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේදී නිසි ක්‍රමය අනුගමනය කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම ප්‍රශ්නයෙන් අහලා තිබෙන සමාගම; ඩෝල් ලංකා සමාගම නමින් තිබුණු සමාගම මේ වනවිට වෙනස් වෙලා තිබෙනවා. ඔබතුමා නිවැරදියි. මෙතැන තිබෙන ගැටලුව මේකයි. මහවැලි අධිකාරිය ඔය පිළිතුර ලබා දීපු පදනම මත - වත්මන් ආණ්ඩුවට මේක අදාළ නැහැ - නිවැරදි ආකාරයට ඉඩම් ලබා දුන්නා කියන එකට ඔබතුමා "ඔව්" කියනවා. එහෙම කියන්න ඕනෑ නේ. ඒ නිලධාරීන් නේ උත්තරය හදන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පසුගිය අවුරුදු 10ක පමණ කාලය තුළ ඉඩම් ලබා දීපු ක්‍රමය මොකක්ද කියලා සොයා බලන්න කියලා. මම නමින්ම වෙච්ච දේ කියන්නම්. ඒක අගෞරවයක් නොවෙයි, සිද්ධ වෙච්ච දේ. චමල් රාජපක්ෂ මහත්මයාගේ ලියුම්වලට අක්කර ගණන් ඉඩම් දීලා තිබෙනවා, කිසිම පදනමක් නැතිව. නේවාසික ව්‍යාපාර කළමනාකරු - RPM - විධියට පත් වෙන්නේ ඉන්න ඇමතිවරයාගේ අවශ්‍යතාව ඉෂ්ට කරන කෙනා මිස සුදුසුකම් තිබෙන කෙනා නොවෙයි. ඉඩම් කියන දේ සීමිතයි. සීමිත ඉඩම් ප්‍රමාණයක් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපට අවශ්‍ය වෙන්නේ වගා කටයුතු හෝ project එකක් කරන ඇත්ත කෙනාට නිවැරදිව ඉඩම් ලබා දීමටයි. ඔය ඩෝල් ලංකා කියන නම විකුණාගෙන, ඩෝල් ලංකා කියන සන්නාමය යටතේ එක එක්කෙනා ඉඩම් කැබලි අරගෙන තිබෙනවා. විශේෂයෙන් ඔය කියන අක්කර 39 වෙන් කරගෙන තිබෙන්නේ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් පරිශ්‍රයෙන්.

මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාට මේ ප්‍රශ්නය යොමු කරනවා.

පුළුවන්කමක් තිබෙනවාද, මේ ඉඩම් ලබා දීමේ තිබෙන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණයක් කරන්න, විශේෂයෙන් මහවැලි අධිකාරියේ ඇඹිලිපිටිය, වලව කලාපය කේන්ද්‍ර කරගෙන? අමාත්‍යතුමා හෝ කාගේ හරි මූලිකත්වයෙන් කමිටුවක් පත් කරලා පසුගිය අවුරුදු කිහිපය තුළ ලබා දීපු ඉඩම් පිළිබඳව යම්කිසි ආපසු හැරී බැලීමක් කරන්න පුළුවන්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි. මහවැලි අධිකාරියේ ඉඩම් දීම සම්බන්ධව ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි දැනටමත් යම් යම් ඉඩම් පිළිබඳව විමර්ශනය කරනවා; සොයා බලනවා. ඔබතුමා නිශ්චිතව කියනවා නම්, මෙන්න මේ මේ ඉඩම් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා කියලා, ඒ තොරතුරු ලබා දෙනවා නම්, අපි ඒ කටයුත්ත ආරම්භ කරන්න ලැහැස්තියි. මේ වනකොටත් අපි යම් ප්‍රමාණයකට එහෙම විමර්ශන කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම දැන් ඔය කියන අක්කර 39 දීලා තිබෙන ක්‍රමයම වැරදියි. එතැනින් පටන් ගනිමු. ඔය අක්කර 39 දීලා තිබෙන්නේ පදනමක් ඇතිව නොවෙයි. ඒ හිටපු ඇමතිතුමාගේ නම වුණත් මම කියන්නම්. ඒ ඇමතිතුමාගේ ලිපිය විතරයි තිබෙන්නේ. කිසිම ශක්‍යතා වාර්තාවක් අරගෙන දීපු එකක් නොවෙයි, මේ. ඔය ඉඩම තිබෙන්නේ මම ඉන්න ආසන්නයේ. මම දන්නවා, ඒක දීපු විධිය.

ඊළඟට ඔබතුමා මෙන්න මේ ගැනත් හොයා බලන්න. අද ඇමතිතුමා නැහැ. ඔබතුමා නියෝජ්‍ය ඇමතිතුමා නේ. අපේ කොලොන්න ආසනයේ මන්ත්‍රීතුමන්ලාත් මෙතැන ඉන්නවා. ඒ ඉඩම් දෙන්න පදනම වෙන්නේ, මාධ්‍යවේදීන්, ජනප්‍රිය මාධ්‍යවේදීන්, හමුදා විශ්‍රාමිකයන් වීම වාගේ කාරණා. මෙහිදී අක්කර 50, 100 වෙන් කර ගෙන තිබෙනවා, විශේෂයෙන් සූරියකන්ද, හේස්වත්ත ආදී ඉඩම්. ඒ, LRC ඉඩම්. ඒ නිසා ඉඩම් පිළිබඳ ලොකු ගැටලුවක් තිබෙනවා, ඇඹිලිපිටිය වලව කලාපයේ සහ කොලොන්න ආසනයේ. මම ඉල්ලීමක් කරනවා, දිස්ත්‍රික් ලේකම්තුමා හරි කාගේ හරි මැදිහත්වීමෙන් මේ වෙනුවෙන් ආපසු හැරී බලන්න කියලා. මේ තත්ත්වය තිබෙනවා, ඇඹිලිපිටියෙන් එහා මයුරපුර සිට හම්බන්තොට දිස්ත්‍රික්කය දක්වාත්. දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව විතරයි පසුගිය කාලයේ ඉඩම් දෙන්න එකම සුදුසුකම වුණේ; දේශපාලන පක්ෂයකට දේශපාලනික වශයෙන් සහය දීම විතරයි. පසුගිය කාලසීමාව තුළ වෙච්ච ඒ වැරදි මොනවාද? ඒවා නිවැරදි කර ගන්න අවශ්‍ය නම් නිවැරදි කර ගන්න. ඒ ඉඩම්වල මේ වන විට වගා කරන්නේ නැතුව වෙන වෙන දේවල් සඳහා අවභාවිත කරලා තිබෙනවා නම්, ඒවා නැවත පවරා ගන්න සැලසුමක් ක්‍රියාත්මක කරන්න ඔබතුමා පොරොන්දු වෙනවාද? එහෙම නම්, ඒ වෙනුවෙන් අපට දෙන්න පුළුවන් සහයෝගයත් අපි ලබා දෙන්න සූදානම්.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

මේ සඳහාත් කලින් පිළිතුරම තමයි දෙන්න වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. අපට ඒ සම්බන්ධයෙන් සොයා බලන්න පුළුවන්. ඔබතුමා නිශ්චිතව ඒ ඉඩම්, - *[බාධා කිරීමක්]* දැනටමත් යම් එකක් තිබෙනවා. ඒ ඉඩම් මහවැලියෙනුත් දීලා තිබෙනවා. පස්සේ කාලයේ LRC එකෙනුත් වෙන පාර්ශ්වයකට දීලා තිබෙනවා. ඒ වාගේ ගැටලුවක් තිබෙනවා. ඒ පිළිබඳ සාකච්ඡාවක් වෙනවා. නඩුවකුත් තිබෙනවා. අපි ඒ ගැන සොයා බලනවා.

## ගුරු විද්‍යාල: පුහුණු වැඩ පිළිවෙළ
## ஆசிரிய கலாசாலைகள்: பயிற்சித் திட்டங்கள்
## TEACHERS' COLLEGES: TRAINING PROGRAMME

701/2025

**2. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගුරු විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා පහළ මට්ටමක පවතින බැවින්, එම විද්‍යාල, අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වෙනත් පුහුණු මධ්‍යස්ථාන බවට පත් කිරීමට කටයුතු කරන්නේද;

(iii) ජාතික අධ්‍යාපන ආයතනය උපාධි පිරිනැමීම සඳහා සුදුසුකම්ලත් ආයතනයක් බැවින් ගුරු විද්‍යාලවල එක් අවුරුදු පූර්ණ කාලීන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, එම ගුරු විද්‍යාල සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஆசிரிய கலாசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி கலாசாலைகளில் கல்விபயிலும் மாணவர்களின் எண்ணிக்கை மிகக் குறைவாகக் காணப்படுவதால், குறித்த கலாசாலைகளை கல்வித்துறையுடன் தொடர்புடைய வேறு பயிற்சி நிலையங்களாக மாற்றுவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) தேசிய கல்வி நிறுவகம் பட்டங்களை வழங்குவதற்கான தகைமையுடைய நிறுவகம் என்பதால், ஆசிரிய கலாசாலைகளில் ஒரு வருட முழுநேர பட்டப்பின்படிப்பு பாடநெறியை நடாத்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) இன்றேல், மேற்படி ஆசிரிய கலாசாலைகள் சம்பந்தமாக எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of Teachers' Colleges available in Sri Lanka;

(ii) whether steps will be taken to convert those colleges into other training centres related to the field of education since the number of students learning at the Teachers Ccolleges is very low;

(iii) whether steps will be taken to conduct a one -year, full-time postgraduate diploma course at the Teachers Colleges referred to above since the National Institute of Education is an institution qualified for awarding degrees; and

(iv) if not, the action that will be taken in the future regarding the Teachers Colleges concerned?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගුරු විද්‍යාල සංඛ්‍යාවක 08කි.

(ii) ඔව්. අඛණ්ඩ ගුරු පුහුණු මධ්‍යස්ථාන වශයෙන් තවදුරටත් සංවර්ධනය කිරීම.

(iii) නැත.

(iv) 1. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවා ගැනීම වැඩි කිරීම සඳහා ගුරු විද්‍යාල ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සමඟ ඒකාබද්ධ කිරීම.

දැනට යෝජිත සැලැස්ම පහත පරිදි වේ.

| අනු අංකය | ගුරු විද්‍යාලය | ඒකාබද්ධ කිරීමට සැලසුම්කර ඇති විද්‍යාපීඨය | ගුරු විද්‍යාලය සහ විද්‍යාපීඨය අතර දුර (කිලෝමීටර) | පුහුණු කළ හැකි ශික්ෂණලාභීන් ගණන | නේවාසිකාගාර පහසුකම් සැපයිය හැකි ප්‍රමාණය (නවීකරණයෙන් පසු) |
|---|---|---|---|---|---|
| 1 | ගිරාගම | පේරාදෙණිය | 6.7 | 150 | 110 |
| 2 | අමරසූරිය, උණවටුන | රුහුණ | 9.6 | 125 | 245 |
| 3 | බලපිටිය | දර්ගා නගරය | 20.5 | 450 | 130 |
| 4 | මඩකලපුව | මඩකලපුව | 9.8 | 650 | 83 |
| 5 | අඩ්ඩාලච්චේන | අඩ්ඩාලච්චේන | 0 | 300 | 150 |
| 6 | කෝප්පායි | යාපනය | 2.5 | 500 | 48 |
| එකතුව | | | | 2,175 | 766 |

අපි ඉදිරිපත් කරලා තිබෙන සැලසුම අනුව ගුරු විද්‍යාල සහ විද්‍යාපීඨ යන දෙකම එකතු කරලා අපි පුහුණු කරන ශික්ෂණලාභීන් ප්‍රමාණය වැඩි කරන්න යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව ශික්ෂණලාභීන් 2,175ක් බඳවා ගන්න තමයි අදහස් කරලා තිබෙන්නේ. ඒ අයට අවශ්‍ය නේවාසිකාගාර ප්‍රමාණය හා පහසුකම් වැඩි කරන්න මේ වන විටත් අය වැය ලේඛනය මඟින් මුදල් වෙන් කරලා ඒ සඳහා සැලසුම් කරගෙන යනවා.

2. අඛණ්ඩ ගුරු අධ්‍යාපනය යටතේ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කෙටි කාලීන නේවාසික පාඨමාලා ගුරු විද්‍යාල මඟින් ක්‍රියාත්මක කිරීම මෙම වර්ෂය සඳහා සැලසුම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Hon. Speaker, the Supplementary Question will be asked by the Hon. Mayilvaganam Jegatheeswaran.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, வவுனியா கல்வியியற் கல்லூரியில் 2007ஆம் ஆண்டிலிருந்து Sinhala medium courses நிறுத்தப்பட்டுள்ளதனால் அந்தப் பிரதேசத்திலும் நாட்டின் ஏனைய பிரதேசங்களிலும் இருக்கின்ற மாணவர்களுக்கு இந்தக் கல்வியியற் கல்லூரிக்குச் செல்வதற்கான வாய்ப்பு இல்லாமல் போயுள்ளது. ஏன் அப்படிச் செய்யப்பட்டது? அவற்றை மீளவும் ஆரம்பிப்பதற்கான வாய்ப்புகள் இருக்கின்றனவா? அல்லது அவற்றை மீளவும் ஆரம்பிப்பதில் ஏதாவது பிரச்சினை இருக்கின்றதா? என நான் உங்களிடம் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මම දන්නා තරමින්, 2016 වර්ෂයෙන් පසුව වවුනියා විද්‍යාපීඨයේ සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වීම නැවතිලා තිබෙන්නේ. ඒක සාධාරණීකරණය කරන්නේ යුද තත්ත්වයත් තුළ කියලායි. එතැනට ගුරුවරුන් ලබා දීමේ දුෂ්කරතා තිබෙන බව කියනවා. ඒ අනුව තමයි ඒ කටයුත්ත නවත්වා තිබෙන්නේ. කෙසේ නමුත්, මේ ප්‍රශ්නය ගැන අපි මැදිහත් වෙලා තිබෙනවා. ඊළඟ වර්ෂයට සිසුන් බඳවා ගැනීමේ සිට එම විද්‍යාපීඨයට සිංහල මාධ්‍යයෙන් පාඨමාලා හඳුන්වා දෙන්න අපි මේ වෙනකොටත් සැලසුම් සකස් කරගෙන යනවා. ඒ සියලුම Sinhala-medium courses අපට එක්වරම පටන් ගන්න බැරි වුණත්, විශේෂයෙන්ම ප්‍රාථමික අංශයට අදාළ ගුරු පුහුණුව ආරම්භ කරන්න අපි දැනට සැලසුම් සකස් කරගෙන යනවා.

## කුඩා තේ වතු හිමියන් : කළුතර දිස්ත්‍රික්කය
## சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள் : களுத்துறை மாவட்டம்
## TEA SMALLHOLDERS : KALUTARA DISTRICT

713/2025

**3. ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ සිටින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ ජාතික තේ අපනයනය සඳහා එම කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කොපමණද;

(iii) කළුතර දිස්ත්‍රික්කයේ ඇති පොහොර සහ කෘෂි උපකරණ ලබා ගත හැකි කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව කොපමණද;

(iv) කුඩා තේ වතු හිමියන්ගේ සුබසාධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

(ආ) (i) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා සාමාජිකයන් බඳවා ගනු ලබන ක්‍රමවේදය සහ එම සමිතිවල නිලවරණ පවත්වනු ලබන ක්‍රමවේදය සම්බන්ධයෙන් දැනුවත් වී තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්‍රමවේද පිළිබඳ විස්තර සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்திலுள்ள சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) இலங்கையின் தேசிய தேயிலை ஏற்றுமதியில் மேற்படி சிறு தேயிலைத் தோட்ட உரிமை யாளர்களின் பங்களிப்பு எவ்வளவு என்பதையும்;

(iii) களுத்துறை மாவட்டத்தில் உரம் மற்றும் விவசாய உபகரணங்களைப் பெற்றுக்கொள் வதற்கு வாய்ப்புடைய சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் நலனோம்புகையின் பொருட்டு மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங் களுக்கு உறுப்பினர்கள் இணைத்துக் கொள்ளப் படுகின்ற முறை மற்றும் அந்தச் சங்கங்களில் நிருவாகக் குழு உறுப்பினர் தெரிவு நடாத்தப் படுகின்ற முறை பற்றி அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி முறைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி முறைகள் தொடர்பிலான விபரங்கள் சபைக்குச் சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House of the -

(i) number of tea smallholders in the Kalutara District;

(ii) contribution of the said tea smallholders to the national tea exports in Sri Lanka;

(iii) number of Tea Small Holding Development Societies in the Kalutara District, from which fertilizer and agricultural equipment can be obtained; and

(iv) measures that have been taken for the welfare of the tea smallholders?

(b) Will he also inform this House -

(i) whether he has got acquainted with the method by which members are enrolled to the Tea Small Holding Development Societies and the method by which elections are conducted in those societies;

(ii) if so, the methods concerned, separately; and

(iii) whether details of the methods will be tabled?

(c) If not, why?

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)

(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ சபாநாயகர் அவர்களே, பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் சார்பாக நான் இந்த வினாவுக்கு விடையளிக்கின்றேன்.

(அ) (i) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் எண்ணிக்கை 43,984 ஆகும்.

(ii) 2024ஆம் ஆண்டில் களுத்துறை மாவட்டத்தில்,

- சிறுதேயிலைத் தோட்டத்துறையில் தேயிலை உற்பத்தி: முடிவுத் தேயிலை 15,514 மில்லியன் கிலோகிராம்
- சிறு தேயிலைத் தோட்டத்துறையில் மொத்தத் தேசிய தேயிலை உற்பத்தி: முடிவுத் தேயிலை 197,157 மில்லியன் கிலோகிராம்
- அதன்படி, களுத்துறை மாவட்டத்திலுள்ள சிறு தேயிலைத் தோட்டத்துறை தேயிலை உற்பத்தியில் பங்களிப்பு: 7.86% ஆகும்.

(iii) அச்சங்கங்களின் எண்ணிக்கை 120 ஆகும்.

(iv) சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் நலன்புரிக்காக முன்னெடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்

- சிறு தேயிலைத் தோட்ட உரிமையாளர் களின் நலன்புரிக்காக தேயிலைச் சக்தி காப்பீட்டு நன்மைத் திட்டத்தின்கீழ், சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கத்தில் உறுப்பினர் களாகவுள்ள சிறு தேயிலைத் தோட்ட உரிமை யாளர்கள் மற்றும் அவர்களது குடும்ப உறுப்பினர்கள் நன்மை களைப் பெற்றுக் கொள்ளும் வகையில், 2,400 ரூபாயை தேயிலைச் சக்தி காப்புறுதி நலன் நிதியத்தில் வைப்புச்செய்து, முழுமை யான அங்கத்துவத் தைப் பெற்றுக்கொள்ள முடியும். இவ்வாறு அங்கத்துவத்தைப் பெற்றுள்ள சிறு தேயிலைத் தோட்ட உரிமை யாளர்களுக்குப் பின்வரும் சலுகைகளைப் பெறுவதற்கான உரிமை உண்டு.
- மூளை / சிறுநீரகம்/ இதய அறுவை சிகிச்சை களுக்கு
- முழுக்கால மற்றும் குறிப்பிட்ட காலத்துக்கு உடலுறுப்பு செயலிழப்புக்காக
- திடீர் விபத்துக்களால் ஏற்பட்ட மரணங் களுக்கு
- இயற்கை மரணங்களுக்கு

( ஆ)(i) ஆம்.

(ii) **சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்களுக்கு அங்கத்தவர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கான நடைமுறை**

- சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்க யாப்பின்படி, சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கத்தை நிறுவும் ஆரம்பக் கூட்டத்தில் பங்கேற்கின்ற அனைத்துத் தகுதிவாய்ந்த நபர்களுக்கும் அங்கத்துவம் உரித்தாகும்.
- சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்க யாப்பின்படி, தகுதியுடைய சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள் சங்கத்தில் உறுப்பினராவதற்கான விண்ணப்பப் படிவத்தைப் பூர்த்திசெய்து, சங்கச் செயலாளர்மூலம் பொதுச் சபையில் சமர்ப்பித்து, பொதுச் சபையின் அங்கீகாரத்தைப் பெறுகின்றவர்களுக்கு அங்கத்துவம் உரித்தாகின்றது.

**சிறு தேயிலைத்தோட்ட அபிவிருத்திச் சங்கத்தின் உத்தியோகத்தர் தெரிவுக்கான நடைமுறை**

- சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்கள் 2018ஆம் ஆண்டின் திருத்தச் சட்டத் தொடரின் 19ஆம் பிரிவின் 19.1(அ), (ஆ), (இ), (ஈ)ஆம் பந்திகளின்படி தெரிவுசெய்யப்படுவார்கள்.

(iii) ஆம். அது பின்வருமாறு:

- சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்களுக்கு உறுப்பினர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கான நடைமுறை
- ·சங்கத்தின் அதிகார பிரதேச வரம்புக்குள் இருக்கும் 18 வயதுக்குக் குறையாத சிறு தேயிலைத் தோட்ட உரிமையாளராக இருத்தல் வேண்டும்.
- ·குறித்த ஆண்டில் அதிகாரப் பிரதேச எல்லைக்குள் புதிதாகத் தேயிலைச் செய்கைக்கான அனுமதிப் பத்திரத்தைக் கொண்டவராக இருத்தல் வேண்டும்.
- ·புதிதாக நிறுவப்பட்ட சங்கமொன்றுக்கு அன்றையதினம் கூட்டத்தில் கலந்து கொள்ளும் அடிப்படைத் தகுதிகளைப் பூர்த்திசெய்துள்ள அனைவருக்கும் சங்கத்தில் அங்கத்துவத்தைப் பெறமுடியும்.
- அதிகாரப் பிரதேச எல்லைக்குள் சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கமொன்று ஏற்கனவே நிறுவப்பட்டிருந்தால், அந்தச் சங்கத்தின் செயலாளரிடமிருந்து அதற்கான விண்ணப்பப்படிவத்தைப் பெற்று, பூர்த்திசெய்யப்பட்ட விண்ணப்பப் படிவத்தை சங்கத்திடம் சமர்ப்பித்தல் வேண்டும்.
- அந்த விண்ணப்பப்படிவத்தைப் பொதுக் குழுக் கூட்டத்தில் சமர்ப்பித்து, முன்மொழிவுகள் அனுமதிக்கப்பட்ட பின்னர் அங்கத்துவத்தைப் பெறமுடியும்.
- வருடாந்த அங்கத்துவத் தொகை 240 ரூபாய் ஆகும். அத்தொகை முதலாம் காலாண்டுக்குள் செலுத்தப்படல் வேண்டும்.
- முதலாம் காலாண்டில் அங்கத்துவப் பணத்தைச் செலுத்தாவிடின், சங்க அங்கத்துவம் இடைநிறுத்தப்படும்.

**சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கத்தின் உத்தியோகத்தர்களைத் தெரிவு செய்வதற்கான நடைமுறை**

- பதிவுசெய்யப்பட்ட சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்களின் பதவிக்காலம் இரண்டு ஆண்டுகள் ஆகும்.
- இரண்டு வருட பதவிக்காலம் முடிந்த பிறகு, சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபைத் தலைவரால் அனைத்துச் சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கங்களையும் மறுசீரமைப்பதற்கான அதிகார பூர்வ அறிவிப்பு வெளியிடப்படும்.
- பிராந்திய முகாமையாளரால் சங்கங்களை மறுசீரமைப்புச் செய்வதற்கு உரித்தான சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகார சபையின் தலைவரால் அனுப்பப்படும் அதிகாரபூர்வ அறிவிப்புக் கடிதம் அனைத்துச் சிறு தேயிலைத் தோட்ட அபிவிருத்திச் சங்கச் செயலாளர்கள் மற்றும் பிராந்திய மாவட்ட அமைப்பின் செயலாளர்கள், தேயிலை ஆய்வாளர் விரிவாக்க உத்தியோகத்தர் மற்றும் வலய தேயிலைச் சங்க விரிவாக்க உத்தியோகத்தர்களுக்கு அனுப்பப்படும்.
- சங்கச் செயலாளரால் தேயிலை ஆய்வாளர் விரிவாக்க உத்தியோகத்தருடன் கலந்துரையாடி மறுசீரமைப்புக்கான திகதியைப் பெற்று, சங்கத்தின் மறுசீரமைப்புக்கான அறிவிப்புகள்/அழைப்புக் கடிதங்கள் 14 நாட்களுக்கு முன்னர் அனுப்பப்படல் வேண்டும்.
- ·அதன்பிறகு, நிர்ணயிக்கப்பட்ட திகதியில் சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபையின் தேயிலை ஆய்வாளர் விரிவாக்க உத்தியோகத்தரின் தலைமையில் சங்கம் மறுசீரமைக்கப்படும்.

( இ) ஏற்புடையதன்று.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා යොමු කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කුඩා තේ වතු සංවර්ධන සමිති අපේ ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රියාත්මක වෙනවා. මේ කුඩා තේ වතු සංවර්ධන සමිති හරහා කුඩා තේ වතු හිමියන්ට බොහොම ප්‍රයෝජනවත් වන කාර්යයන් සිදු වෙනවා. විශේෂයෙන්ම මේ සමිති හරහා තේ පොහොර මිලදී ගැනීමේදී සහනදායී තත්ත්වයක් ඒ අයට ලැබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කුඩා තේ වතු සංවර්ධන සමිති ගත්තාම ඒ සමහර සමිති කාලයක් තිස්සේ අක්‍රමවත්ව පවතිනවා. ඒ වාගේම, ඒ නිලධාරින්ගේ ක්‍රියා කලාප පදනම් කරගෙන ඒ සමිතිවල දූෂණ, වංචා සිදුවීම් නිසා ඒවා අක්‍රමවත්ව ක්‍රියාවට නැංවෙනවා. විශේෂයෙන්ම මේ සමිතිවල ප්‍රධාන නිලධාරින් ගත්තාම, දැනට වසර දෙකකට පමණ කලින් පත් වෙච්ච නිලධාරින් පවා සිටිනවා. එවැනි තත්ත්වයන් තුළ දූෂණ, වංචා සිදුවීම් හරහා මේ සමිති දිනෙන් දින අඩපණ වෙන තත්ත්වයක් තමයි දක්නට ලැබෙන්නේ. මේ සමිතිවල සභාපති

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

හෝ අනෙකුත් නිලධාරි මට්ටමට පත් වෙන්න නම් වසර දෙකක් සාමාජිකත්වයේ ඉන්න ඕනෑ කියලා නීතියක් තිබෙන බවට පැහැදිලි කිරීමක් කරනවා.

නමුත්, ඒ වසර දෙකක කාලසීමාව මාස 6ක් වාගේ කාලයක් දක්වා අඩු කර ගන්න අපට හැකියාවක් පවතිනවාද? මොකද, එතකොට කුඩා තේ වතු හිමියන්ට වඩා ප්‍රතිලාභ ලැබෙන විධියට මේ කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රතිසංවිධානය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒ සඳහා අර නීතිය වෙනස් කර ගැනීමේ හැකියාවක් පවතිනවාද කියලා මම ඔබතුමාගෙන් මුලින්ම අහන්න කැමැතියි.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම සාමාජිකත්වය ලබා ඒ තනතුරුවලට යන්න අවුරුදු දෙකක කාලයක් ඉන්න ඕනෑ. අපි හිතනවා, ඒ කාලය වැඩියි කියලා. ඔබතුමා අහන්නේ, සාමාජිකත්වය ලබා මාස 6කින් ඒ තනතුරුවලට පත් කරන්න හැකියාවක් තිබෙනවාද කියලා නේ. ඇත්තටම ඒ පිළිබඳව ඉතා ඉක්මනින් ඒ සමිති එක්ක සාකච්ඡා කරලා, ඒ වෙනස්කම් කරන්න ඉදිරියේදී කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කරන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ කළුතර දිස්ත්‍රික්කය වාගේ දිස්ත්‍රික්කවල ජනතාව රබර් වගාවෙන් ඉවත් වෙලා තේ වගාවට වැඩි අවධානයක් යොමු කරන කාලපරිච්ඡේදයක් තමයි තිබෙන්නේ. ඒකට හේතුව මේකයි. කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත, මතුගම සහ බුලත්සිංහල වාගේ ආසනවල කුඩා තේ වතු හිමියන් සහ දුප්පත් ජනතාව -දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව- දැන් තමන්ගේ ඉඩමේ රබර් වගා කරන්න යන්නේ නැහැ. වඩාත් කඩිනමින් ප්‍රතිලාභයක් ගන්න පුළුවන් වගාවකට තමයි යොමු වෙන්නේ. රබර් වගා කරලා එහි ප්‍රතිලාභ ලබා ගන්න ඔවුන්ට වසර ගණනාවක් ගතවීම සහ කාලගුණික තත්ත්වය එක්ක ඔවුන් ඒවායින් ඉවත් වෙමින් සිටිනවා.

එවැනි මොහොතක දැන් ග්‍රාමීය දුප්පත්භාවය අවම කිරීමේ වැඩසටහනුත් ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදයක අපට හැකියාවක් පවතිනවාද මේ ග්‍රාමීයව හඳුනා ගත්, දරිද්‍රතාවෙන් පෙළෙන පවුල් තෝරාගෙන ඔවුන්ට අක්කර භාගයක් තේ වගා කරන්න ආධාර ලබා දෙන්න? තේ නැවත වගා කරන්න නොවෙයි, වසර එකහමාරක්, දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් විධියට අක්කර භාගයක් තේ වගා කරන්න ආධාර ලබා දීලා පසු විපරමක් කරගන්න හැකියාවක් තිබෙනවාද? ඒ වාගේම, මම කලින් කියපු කුඩා තේ වතු සංවර්ධන සමිති හරහා ප්‍රතිලාභීන් තෝරාගෙන ඔවුන්ව මෙහෙයවීමක් කිරීමට හැකියාවක් පවතිනවාද? ඒ වාගේම ඉදිරියේදී අය වැය මඟින් ඒ සඳහා මුදල් වෙන් කරගන්න පුළුවන්ද කියාත් දැනගන්න කැමැතියි.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

ගරු මන්ත්‍රීතුමනි, දැනට මේ සම්බන්ධව අපි සාකච්ඡා කර තිබෙනවා. ඇත්තටම පර්චස් 20කට වැඩි ඉඩම් තිබෙන ගොවීන්ට ඒ ඉඩම්වල වගා කරන්න පහසුකම් සලසන්න අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න, උදවු කරන්න සූදානමින් ඉන්නවා කියලා මේ මොහොතේ මම කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -718/2025- (1), ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මහියංගනය නගරයේ රජයේ ඉඩමක් වයි.එම්. රත්නපාල මහතාට බදු දීම: විස්තර

## திரு. வை.எம். ரத்னபாலவுக்கு மஹியங்கனை நகரில் குத்தகை அடிப்படையில் வழங்கப்பட்ட அரச காணி: விபரம்

GRANT OF STATE LAND IN MAHIYANGANAYA TOWN TO MR. Y. M. RATHNAPALA ON LEASE: DETAILS

789/2025

**5. ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහියංගනය නගරයේ, කෘෂි අළෙවිසලක් ඉදිකිරීමට ලංකා බැංකුවට යාබද ඉඩමේ 2004 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(ii) වර්තමාන ජනාධිපතිවරයා කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස ඉහත ඉඩම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට මූලික කටයුතු කළ බවත්;

(iii) ඒ සඳහා මහියංගනය ගොවිජන සේවා කාරක සභාව සහ ගොවීන් ඉල්ලීම් කළ බවත්;

(iv) ඉහත ඉඩම, මහියංගනය, 48 කණුව, අරාවත්ත පදිංචි වයි.එම්. රත්නපාල මහතාට වරණීය බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/10/75144 යටතේ අනුමතිය දී ඇති බවත්;

(v) වරණීය පදනම මත රජයේ ඉඩම් ප්‍රබල සහ විශේෂ හේතු මත පමණක් පවරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ඉඩම් පැවරීමට වයස අවුරුදු 80කට වැඩි පුද්ගලයෙකු තෝරා ගැනීමට හේතුව කවරේද;

(ii) රජයේ ඉඩම් අන්සතු කිරීමේදී, රජයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ඉඩම් තිබේද යන්න සහ තෝරා ගන්නා පුද්ගලයාගේ ශාරීරික යෝග්‍යතාව සලකා බලන බවත්, සාමාන්‍යයෙන් වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයෙකුට රජයේ ඉඩම් ලබා නොදෙන බවත් දන්නේද;

(iii) එම ඉඩම පැවරීමේදී ඉහත කරුණු සැලකිල්ලට ගත්තේද;

(iv) ඉහත බදු අනුමැතිය අවලංගු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹியங்கனை நகரில் விவசாயப் பொருள் விற்பனை நிலையமொன்றை நிர்மாணிப்பதற்கு இலங்கை வங்கியை அண்டிய காணியில் 2004ஆம் ஆண்டில் அடிக்கல் நாட்டப் பட்டதென்பதையும்;

(ii) தற்போதைய சனாதிபதி கமத்தொழில் அமைச்சராக மேற்படி காணியை கமநல சேவைகள் திணைக்களத்துக்குக் கையகப்படுத்து வதற்கான ஆரம்ப நடவடிக்கைகளை மேற் கொண்டிருந்தார் என்பதையும்;

(iii) அதன் பொருட்டு மஹியங்கனை கமநல சேவை செயற்குழுவினரும் விவசாயிகளும் கோரிக்கை களை முன்வைத்திருந்தார்கள் என்பதையும்;

(iv) மேற்படி காணியை, மஹியங்கனை, 48ஆம் மைல்கல், அராவத்தையில் வசிக்கும் திரு. வை.எம். ரத்னபாலவுக்கு முன்னுரிமை குத்தகை அடிப்படையில் வழங்குவதற்கு காணி ஆணையாளர் நாயகத்தின் 4/10/75144இன்கீழ் அங்கீகாரமளிக்கப்பட்டுள்ளதென்பதையும்;

(v) முன்னுரிமை அடிப்படையில் அரச காணிகள் வலுவான மற்றும் விசேட காரணங்களின் அடிப்படையில் மாத்திரமே அளிக்கப்படு கின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி காணிகளை ஒப்படைப்பதற்கு 80 வயதுக்கு மேற்பட்ட ஒருவரைத் தெரிவு செய்தமைக்கான காரணம் யாது;

(ii) அரச காணிகளைப் பாராதீனப்படுத்தும்போது, அரசின் தேவைகளுக்குப் போதுமான நிலம் உள்ளதா என்பதும் தேர்ந்தெடுக்கப்படும் நபரின் உடல் தகுதியும் கவனத்தில் கொள்ளப் படுவதோடு பொதுவாக 60 வயதுக்கு மேற்பட்ட ஆளொருவருக்கு அரச காணிகள் வழங்கப் படுவதில்லை என்பதை அறிவாரா;

(iii) மேற்படி காணியை ஒப்படைக்கும்போது மேற்கண்ட விடயங்கள் கவனத்தில் கொள்ளப் பட்டதா;

(iv) மேற்படி குத்தகை அங்கீகாரம் இரத்துச் செய்யப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Is he aware that -

(i) the foundation stone was laid in the year 2004 in the land adjacent to the Bank of Ceylon in Mahiyanganaya Town for construction of an agricultural sales centre;

(ii) the incumbent President, as the then Minister of Agriculture, took preliminary measures to take over the above-mentioned land to the Department of Agrarian Services;

(iii) requests had been made for it by the Mahiyanganaya Agrarian Services Committee and farmers;

(iv) approval has been given under letter No. 4/10/75144 of the Land Commissioner General to grant the above-mentioned land on preferential lease basis to Mr. Y.M. Rathnapala, who is residing at 48$^{th}$ Post, Arawatta, Mahiyanganaya; and

(v) State lands are granted on preferential basis only on compelling and special grounds?

(b) Will he state -

(i) the reason for selecting a person who is over 80 years of age to transfer the above-mentioned land;

(ii) whether he is aware that, when alienating State lands, the availability of sufficient lands for Government needs and the physical fitness of the selected recipient is taken into consideration, and that State lands are not usually given to a person over 60 years of age;

(iii) whether the above-mentioned considerations were taken into account when granting the said land; and

(iv) whether approval for the lease referred to above will be revoked?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්. (2023.03.03 දිනැතිව ගොවිජන සේවා මධ්‍යස්ථානය - මහියංගනය මඟින් ඉල්ලීම් කර ඇත.)

(iv) ඔව්.

(v) ඔව්.

(ආ) (i) රජයේ ඉඩම් ආඥාපනත ප්‍රකාරව වයස අවුරුදු 18ට වැඩි ඕනෑම අයෙකුට දීර්ඝ කාලීන බදු පදනම මත ඉඩම් බැහැර කළ හැකි අතර ඒ සඳහා වන උපරිම වයස් සීමාවන් දක්වා නොමැත. බදු

[ගරු සුසිල් රණසිංහ මහතා]

ගෙවීමේ මූල්‍යමය හැකියාව හා ව්‍යාපෘති ශක්‍යතාව සලකා බලනු ලබයි.

(ii) • රජයේ අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් ඉඩම් පවතී ද යන්න සලකා බලයි.

• උපරිම වයස් සීමාව හා ශාරීරික යෝග්‍යතාව සලකා නොබලයි.

(iii) ඔව්.

(iv) බදු කොන්දේසි කඩ කිරීමක් සිදු කර ඇති බැවින් බදු අනුමැතිය අවලංගු කරයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඉදිරිපත් කළ මෙම ප්‍රශ්නයට අදාළ ඉතිහාසයක් තිබෙනවා. වර්තමාන ජනාධිපති අනුර දිසානායක මැතිතුමා 2004 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දී එතුමාගේ අතින් තමයි ඔය කියන ඉඩමේ මුල්ගලක් තැබුවේ. ගිරාදුරුකෝට්ටේ සී කලාපය, මාපාකඩ වැව, සොරබොර වැව, දඹරා වැව, නාගදීප ව්‍යාපාරය, බත්මැඩිල්ල ව්‍යාපාරය, කෝමාරික ව්‍යාපාරය, බදුලු ව්‍යාපාරය සහ මිනිපේ ව්‍යාපාරය කියන ව්‍යාපාර ආශ්‍රිතව ජීවත් වන ගොවීන්ට කෘෂි උපකරණ අළෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා තමයි මේ ඉඩමේ එදා මුල්ගලක් තිබ්බේ. හැබැයි, කාලයක් තිස්සේ මේ ඉඩම ගන්න විවිධ දේශපාලකයන් උත්සාහ කළා. ඒ අනුව තමයි පසුගිය කාලයේ හිටපු ඉඩම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු මැතිතුමාගේ අනුදැනුම මත සහ හිටපු රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ මැතිතුමා සිටි සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය මත ඉතා කෙටි කාලයක් තුළ මේ ඉඩම ගත්තේ. මේ ඉඩම සාමාන්‍යයෙන් කෝටි 30කට, 40කට වඩා වටිනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරෙහි සඳහන් වුණා, ඉඩම් ලබා දෙනකොට ආර්ථික උත්පාදන හැකියාව බලනවා කියලා. ඒ වාගේම එහි සඳහන් වුණා, දෙන කෙනාගේ සෞඛ්‍ය තත්ත්වය හා වයස අදාළ නැහැ කියලා. හැබැයි, මේ ඉඩම ලියා දුන්නේ එවකට මහියංගනය ප්‍රාදේශීය සභාවට එක්සත් ජාතික පක්ෂයෙන් තේරී පත් වී හිටපු සභාපතිතුමාගේ තාත්තාගේ නමට. එතකොට එතුමාගේ වයස අවුරුදු 82යි. ටෙන්ඩර් පදනමත් නොසලකා හැර, ඒ වාගේම වෙන්දේසි ක්‍රමයත් නොසලකා හැර කෝටි ගණනක වටිනාකමක් සහිත මෙවැනි ඉඩමක් දේශපාලන බලපෑමක් මත එසේ දෙන්න පුළුවන්ද? ඒ නිසා, මෙහි යටගියාව හොයන්න කියා මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, 2022.09.27 දිනැතිව එවකට හිටපු ඉඩම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා විසින් නිකුත් කළ ලිපියක් අනුව, ඒ කියන්නේ වරණීය පදනමක් යටතේ තමයි මෙම ඉඩම ලබා දීලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව තමයි ඉඩම ලබා දීලා තිබෙන්නේ.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

එම ඉඩම ලබා දීම සඳහා අනුගමනය කරපු ක්‍රමවේදය සම්පූර්ණයෙන් වැරැදියි. බදුල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමා ප්‍රශ්න කරනවා, මීට අදාළ ගොඩනැඟිල්ල ගොවි සංවිධානයට ඉදි කරන්න පුළුවන්ද කියලා. ඊට පස්සේ සියලු ගොවි සංවිධාන එකඟතාව පළ කරනවා ඒ ඉඩමේ ගොඩනැඟිල්ල ඉදි කිරීමට අදාළ මුදල් තමන්ට තිබෙනවා කියලා. ඒ ලියුම වහලා තමයි හිටපු ගොවිජන සේවා කොමසාරිස්තුමා ලියුම යවා තිබෙන්නේ; ගොවි සංවිධානවලට එය ඉදි කිරීම සඳහා අවශ්‍ය මුදල් නැහැ, ඒ නිසා ඒ ඉඩම රජයට පවරා ගන්න, එය අවශ්‍ය කටයුත්තක් සඳහා යොදා ගන්න කියන ඉල්ලීම කර තිබෙනවා. මේ නීතිමය රාමුව ඇත්ත වෙන්න පුළුවන්. නමුත්, මේ තුළ ගොඩක් ලිපි ගනුදෙනු සහ වංචාසහගත දේවල් සිදු වුණා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ ඉඩමේ සියලු කටයුතු දැන් නවත්වා ඊට අදාළ මූලික පරීක්ෂණයක් කරලා ඒ ඉඩම නැවත ගොවි සංවිධානවලට ලබා දෙන්න කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, ඒ ඉඩම වරණීය පදනම මතයි ලබා දීලා තිබෙන්නේ. ස්වයං රැකියාලාභීන්ගේ නිෂ්පාදන මිලට ගෙන අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා කියලා තමයි ඒ ඉඩම දීලා තිබෙන්නේ. මේ නීති ප්‍රතිපාදන අනුව මේ කියන කර්තව්‍ය සඳහා ඒ ඉඩම යොදා ගත්තේ නැත්නම් නැවත පවරා ගන්න පුළුවන්. මම ගරු මන්ත්‍රීතුමාට දුන්නු පිළිතුරේත් එය සඳහන්ව තිබෙනවා. දැනට වාර්තා වන පරිදි ඒ ඉඩමේ හෝටලයක් -භෝජනශාලාවක්- තමයි පවත්වාගෙන යන්නේ. ඒ ඉඩම ලබා දුන්නු අවශ්‍යතාවට නොව වෙනත් කර්තව්‍යයක් සඳහා යොදා ගන්නා හින්දා ඒ පිළිබඳ නීතිමය බැඳීමක් තිබෙනවා නම් නැවත පවරා ගැනීම සඳහා කටයුතු කරන්න පුළුවන්.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථාන පවරා ගැනීම: ක්‍රමවේදය

சமுதாய நீர் வழங்கல் நிலையங்களை தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை பொறுப்பேற்றல்: நடைமுறை

TAKEOVER OF COMMUNITY WATER SUPPLY CENTRES BY NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD: PROCEDURE

795/2025

**6. ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථාන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගැනීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ ක්‍රමවේදය කවරේද;

(iii) පවරා ගන්නා ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථානවල ඇති සියලුම දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගන්නේද;

(iv) විධිමත් විගණනයක් සිදු කිරීමකින් තොරව දෙහිඅත්තකණ්ඩිය, නව මැදගම ප්‍රජා ජල සැපයුම් ඒකකය, මණ්ඩලයට පවරා ගෙන ඇති බව දන්නේද;

(v) එම පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய சமுதாய நீர் வழங்கல் திணைக்களத்தின்கீழ் இயங்கும் சமுதாய நீர் வழங்கல் நிலையங்களை தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை பொறுப்பேற்றுக்கொள்ள வேண்டுமென தீர்மானம் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், இதற்குரிய நடைமுறை யாதென்பதையும்;

(iii) பொறுப்பேற்றுக்கொள்ளப்படும் சமுதாய நீர் வழங்கல் நிலையங்களிலுள்ள சகல ஆதனங்களும் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்குப் பொறுப்பேற்றுக்கொள்ளப்படுமா என்பதையும்;

(iv) முறையான கணக்காய்வு மேற்கொள்ளப்படாது தெஹியத்தகண்டிய, நவ மெதகம, சமுதாய நீர் வழங்கல் பிரிவு, சபையால் பொறுப்பேற்றுக் கொள்ளப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(v) மேற்படி பிரிவை பொறுப்பேற்றுக்கொள்வதற்கு அமைச்சரவை அங்கீகாரம் பெறப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether the Community Water Supply Centres functioning under the Department of National Community Water Supply are to be taken over to the National Water Supply and Drainage Board;

(ii) if so, the procedure concerned;

(iii) whether all the properties belonging to the said Community Water Supply Centres will be taken over by the National Water Supply and Drainage Board;

(iv) whether he is aware that the Community Water Supply Unit in New Medagame, Dehiattakandiya has been taken over by the Board without conducting a formal audit; and

(v) whether approval of Cabinet of Ministers has been obtained for the said takeover?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**

(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

නමුත්, සාමාන්‍යයෙන් ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථාන ඇති කරන්නේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආවරණය නොවන ප්‍රදේශවල ජනතාවට පානීය ජලය ලබා දීම සඳහායි. National Water Supply and Drainage Board එකේ ආවරණය ලැබුණාම කිසියම් ගැටලුවක් පවතින, එහෙම නැත්නම් අක්‍රිය තත්ත්වයේ පවතින ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථාන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමට ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා.

(ii) ඒ සම්බන්ධයෙන් වන නිර්ණායක සහ මාර්ගෝපදේශ ඇමුණුමෙහි සඳහන් කර තිබෙනවා. එම ඇමුණුම **සභාගත*** කරනවා.

සාමාන්‍යයෙන් මේ ක්‍රමවේදයට අනුව අදාළ ප්‍රජාමූල සංවිධානයේ සහා රැස්වීමකින් බහුතර එකඟතාව මත ඉල්ලීමක් කළොත් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත් එකතු වෙලා ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරනවා.

ඒ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එළැඹෙන තීරණය අනුව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, ඒ වාගේම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයත් අනුමැතියක් අරගෙන අදාළ ප්‍රජා ජල සම්පාදන මධ්‍යස්ථානය පවරා ගැනීම සඳහා කටයුතු කරනවා.

(iii) නැත. යෝග්‍යතාව සලකා බලා ඒ අනුව අවශ්‍ය දේපළ පමණක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගන්නවා.

(iv) ඔව්. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් අදාළ මාර්ගෝපදේශ අනුව මෙම ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථානය මණ්ඩලය වෙත පවරා ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධයෙන් ප්‍රදේශවාසී ජනතාව සහ විශේෂයෙන්ම ප්‍රජා ජල සැපයුම් ඒකකයේ ප්‍රතිලාභීන් විසින්, විධිමත් විධියට ඒක පවරා ගත්තේ නැහැ කියලා පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පැමිණිල්ල අනුව පරීක්ෂණයක් කරමින් පවතිනවා. එම පරීක්ෂණයේ ප්‍රතිඵල ලබා දෙන්න තිබුණේ පසුගිය අප්‍රේල් මාසයේ. නමුත්, තවමත් එම පරීක්ෂණයේ ප්‍රතිඵල ඇවිල්ලා නැහැ.

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

විධිමත් විධියට පවරා ගැනීමක් සිද්ධ වුණා ද කියන දේ සම්බන්ධයෙන් අපි පරීක්ෂණයක් ආරම්භ කරලා, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.

(v) එවැනි අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නැහැ. මොකද, ඉහත සඳහන් කරපු මාර්ගෝපදේශ අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය හා ජල සම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණයි අවශ්‍ය වන්නේ. ඒ අනුමැතිය අනුව තමයි පවරා ගැනීම සිද්ධ වෙලා තිබෙන්නේ.

(ආ) අදාළ නැත.

ගරු කථානායකතුමනි, ඉහත ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දෙහිඅත්තකණ්ඩිය, නව මැදගම කියන්නේ ඇත්තටම ඉතාම දුෂ්කර ප්‍රදේශයක්; දුප්පත් ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක්. මෙම ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟින් පවුල් 2,500ක පමණ පිරිසක් අඩු මුදලට පානීය ජලය ලබා ගත්තා.

නමුත් ඒ ප්‍රදේශයේ 35 දෙනෙකුගේ කමිටුවක් පත් කරලා මෙම ව්‍යාපෘතිය අත්තනෝමතික ලෙස තමයි මණ්ඩලයට පවරා දී තිබෙන්නේ. මේ කරුණ නිසා ඒ ජනතාව ඉතා අපහසුතාවට පත් වෙලා ඉන්නවා. එම නිසා මම පළමුවෙන්ම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. ජල සම්පාදන අමාත්‍යාංශයේ අංක 12/01 හා 21.03.14 දින දරන චක්‍රලේඛයෙන් ප්‍රජා ජල සමිති පවරා ගැනීමේ මාර්ගෝපදේශ ලබා දීලා තිබෙනවා. නව මැදගම ප්‍රජා ජල සමිතිය පවරා ගැනීමේදී මෙම මාර්ගෝපදේශ කඩකර පවරා ගැනීම නිසා විෂය භාර අමාත්‍යතුමාගේ ලිපිය අනුව 25.02.21 දිනැති අධ්‍යක්ෂ ජනරාල් මඟින් පාරිභෝගික ඉල්ලීම ඉටු කර ගත හැකි බව දන්වා ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නේද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අමාත්‍යාංශය සතු වාර්තා අනුව මේ පවරා ගැනීම විධිමත් විධියට කෙරිලා තිබෙනවා කියන එක තමයි තිබෙන්නේ. නමුත් ඔබතුමියගේ මැදිහත්වීම අනුව සහ අදාළ ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත මේ පවරා ගැනීම විධිමත් විධියට සිද්ධ වුණේ නැහැ කියලා පැමිණිල්ලක් ලැබිලා තිබෙනවා. ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශන කටයුතුවල ප්‍රතිඵල අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම සාමාජිකයන්ගේ ඉල්ලීම සාධාරණයි කියලා තමයි මට හැඟී යන්නේ. මම ක්ෂේත්‍ර පරීක්ෂාවක් කළා, ලිපි ගොනුත් පරීක්ෂා කළා. ඒ අනුව සාධාරණයි කියලා තමයි මට හැඟී යන්නේ. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා විසින් පරීක්ෂණයක් කරන ලෙස දැනුම් දීලාත් තිබෙනවා. එහි ප්‍රගතිය 25.03.11වැනි දාට තමයි දෙන්න කියලා තිබෙන්නේ. මම හිතන විධියට මේ වෙනකම් ඒ වාර්තාව ලැබිලා නැහැ. ඒක ලැබිලා තිබෙනවාද? එහි වර්තමාන තත්ත්වය මොකක්ද? දැනට ඒ පරීක්ෂණය කරලා නැත්නම් ඒ පරීක්ෂණය කරලා කවදාටද අපට ඒකේ ප්‍රගතිය ඉදිරිපත් කරන්නේ කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මගේ පිළිතුරේ සඳහන් කළ පරිදි, නියමිත දිනයට මේ පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබුණේ නැහැ. අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. මම මේ සතියේම එතුමාට දැනුම් දුන්නා, නැවත වරක් ඒ පිළිබඳව සොයා බලා ඒ විමර්ශන වාර්තාව ඉක්මනින් ලබාගන්න කටයුතු කරන්න කියලා. ඒ අනුව අපි හැකි ඉක්මනින් ඒ විමර්ශන වර්තාව ලබා ගන්න කටයුතු කරනවා. ඒ විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි පියවර ගන්න බලාපොරොත්තු වෙනවා.

## වැලි තොටුපළවල් සහ වැලි සඳහා ඇති ඉල්ලුම: විස්තර
### மணல் அகழ்விடங்கள் மற்றும் மணலுக்கான தேவைப்பாடுகள்: விபரம்
### SAND PIERS AND DEMAND FOR SAND: DETAILS

796/2025

**7. ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
පරිසරඅමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා, අතු ගංගා, ඔයවල්, ඇළ මාර්ග ආශ්‍රිත වැලි තොටුපළ සංඛ්‍යාව සහ ඒ ආශ්‍රිත රැකියා කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වැලි තොටුපළ අතරින් නීත්‍යානුකූල වැලි තොටුපළ සංඛ්‍යාව කොපමණද;

(iii) නීති විරෝධී වැලි තොටුපළ තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම තොටුපළ සම්බන්ධයෙන් ගනු ලබන නීත්‍යානුකූල පියවර කවරේද;

(v) වැලි කැනීම හේතුවෙන් සිදු වන පරිසර හානිය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කටයුතු සඳහා වාර්ෂිකව අවශ්‍ය වැලි ප්‍රමාණය ගණනය කර තිබේද;

(ii) එම වැලි ප්‍රමාණය සපුරා ගැනීමේ හැකියාවක් තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප ක්‍රම තිබේද;

(iv) නව වැලි සැපයුම් මාර්ග කවරේද;

(v) එම නව වැලි සැපයුම් මාර්ගවලට ප්‍රමුඛතාව ලබා දෙන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---
* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் பிரதான ஆறுகள், கிளை ஆறுகள், நீரோடைகள் மற்றும் கால்வாய்களை அண்டியதாகக் காணப்படும் மணல் அகழ்விடங்களின் எண்ணிக்கை மற்றும் அவற்றைச் சார்ந்து தொழில்புரிவோரின் எண்ணிக்கை ஆகியன வெவ்வேறாக யாது;

(ii) மேற்குறிப்பிட்ட மணல் அகழ்விடங்களில் சட்டரீதியான மணல் அகழ்விடங்களின் எண்ணிக்கை யாது;

(iii) சட்டவிரோதமான மணல் அகழ்விடங்களும் உள்ளதென அறிவாரா;

(iv) ஆமெனில், மேற்படி மணல் அகழ்விடங்கள் குறித்து மேற்கொள்ளப்படும் சட்டரீதியான நடவடிக்கைகள் யாவை;

(v) மணல் அகழ்வால் ஏற்படும் சுற்றுச்சூழல் பாதிப்புகள் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் நிர்மாணப் பணிகளுக்கு வருடாந்தம் தேவைப்படும் மணலின் அளவு கணக்கிடப்பட்டுள்ளதா;

(ii) அத்தகைய அளவை நிரம்பல் செய்வதற்கான இயலுமை காணப்படுகின்றதா;

(iii) இன்றேல், அதற்கான மாற்றுவழிகள் காணப்படுகின்றனவா;

(iv) மணலை வழங்குவதற்கான புதிய வழிமுறைகள் யாவை;

(v) மேற்படி புதிய மணல் அகழ்வு வழிமுறைகளுக்கு முன்னுரிமை வழங்கப்படுமா;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) separately, the number of sand piers located along the major rivers, tributaries, creeks and canals and the number of people engaged in occupations related to them;

(ii) the number of those that are operated legally, out of the number of piers referred to above;

(iii) whether he is aware that there are illegal sand piers as well;

(iv) if so, the legal action that will be taken against such illegal sand piers; and

(v) the measures to be taken regarding the environmental harm caused by sand mining?

(b) Will he also inform this House -

(i) whether the annual demand of sand for construction activities in Sri Lanka has been estimated;

(ii) whether it is possible to meet that demand;

(iii) if not, whether alternative ways are available to meet the demand;

(iv) the new sources of sand available in the country;

(v) whether priority will be given to the new sources of sand referred to above; and

(vi) if not, the reasons for it?

(c) If not, why?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පරිගණකගත දත්ත පද්ධතිය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා, අතු ගංගා, ඔයවල්, ඇළ මාර්ග ආශ්‍රිතව 2025.03.31 දිනට ලේඛනගත කර ඇති වැලි තොටුපළ/මංකඩ සංඛ්‍යාව 1,256කි.

එම ගංගා වැලි කැණීම් කර්මාන්තය ආශ්‍රිතව සෘජුවම නිරත වන සේවක සංඛ්‍යාව ආසන්න වශයෙන් පුද්ගලයන් 10,000ක් පමණ වේ.

(ii) 2025.03.31 දිනට වලංගුව පැවති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් වැලි කැණීම් බලපත්‍ර ලබා දී ඇති වැලි තොටුපළ/මංකඩ සංඛ්‍යාව 1,256කි.

(iii) අනවසර/නීති විරෝධි වැලිගොඩ දැමීමේ ස්ථාන, මංකඩ, තොටුපළවල් ගංගා ආශ්‍රිතව ක්‍රියාත්මකව පවතින බව වාර්තා වී ඇත.

(iv) අනවසර/නීති විරෝධි වැලි ගොඩදැමීම/කැණීම් කටයුතුවල නිරත පුද්ගලයන් ශ්‍රී ලංකා පොලීසිය හා කාර්යාංශයේ වැටලීම් ඒකකය මඟින් අත් අඩංගුවට ගෙන නීතිමය කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබයි.

(v) වැලි කැණීම් හේතුවෙන් සිදුවන පරිසර හානිය අවම කරගැනීම සඳහා කාර්යාංශය මඟින් නිරන්තර අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. ඊට අමතරව, මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබා ගන්නා තොරතුරු අනුව පරිසර හානි සිදු කරමින් පවතින වැලි කැණීම් බලපත්‍ර අත්හිටුවීමට කටයුතු කරනු ලබයි.

(ආ) (i) ඔව්.

(ii) ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය වන ගංගා වැලි ප්‍රමාණයෙන් සියයට 70ක පමණ ප්‍රමාණයක් සපයා ගත හැකි අතර, ඉතිරි සියයට 30 සම්පූර්ණ කර ගැනීම ගැටලුවක්ව පවතී.

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

(iii) ගංගා වැලි ලබා ගැනීම තුළින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය වැලි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට නොහැකි අතර ඒ සඳහා විකල්ප කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. ඒ සඳහා විකල්ප ලෙස ගැඹුරු මුහුදේ වැලි ලබා ගැනීම හා එම මුහුදු වැලි භාවිතය ප්‍රවර්ධනය කිරීමත්, වැලි අවම භාවිතයකින් යුතු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රමෝපායයන් සඳහා යොමුවීමත් පවතින විකල්ප ක්‍රම වේ. මේ සඳහා අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

(iv) නව වැලි සැපයුම් මාර්ග ලෙස ඉහත (iii) දක්වා ඇති විකල්ප ක්‍රම මඟින් වැලි අවශ්‍යතාව සපුරා ගැනීමට සිදු වේ.

(v) නව වැලි සැපයුම් මාර්ග කෙරෙහි ප්‍රමුඛතාව ලබා දී වැලි අවශ්‍යතාව සම්පූර්ණ කළ යුතුව පවතී.

(vi) නව වැලි සැපයුම් මාර්ග කෙරෙහි ප්‍රමුඛතාව ලබා දීමේදී මතු වන ගැටලු රාශියක් පවතී. පාරිසරික හා සමාජීය ගැටලු, ඉඩම් නිරවුල් කර ගැනීමේ ගැටලු නිරාකරණය කර ගත යුතුව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පතල් හා කැණීම් අංශය විසින් වැලි බලපත්‍ර නිකුත් කරනවා. ඒ නිකුත් කරන වැලි බලපත්‍ර සමඟ වැලි තොටුපොළ හිමියන් විසින් ව්‍යාජ බලපත්‍ර නිකුත් කරලා වැලි අළෙවි කිරීම නිසා ටිපර් රථ රියදුරන්ට අතරමැද සිදු වෙන අපහසුතා වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙනවා. ඒ වාගේම ඒ වැලි බලපත්‍ර වැලි අළෙවි කරන මධ්‍යස්ථාන විසින්, වැලි තොටුපොළවල් විසින් හා අතරමැදියන් විසින් විශාල මුදලකට නැවත අළෙවි කිරීම නිසා නැවතත් වැලි ප්‍රවාහනකරුවන්, ලොරි රථ හිමියන් වාගේම අවසානයේ තමන්ගේ වැඩ සඳහා වැලි ලබා ගන්නා පාරිභෝගිකයන් පවා අපහසුතාවට පත් වෙනවා. මොකද වැලි මිල ඉහළ යැමක් සිදුවන නිසා. ඒක නිසා ටිපර් රථ රියදුරන් සහ අවසානයේ පාරිභෝගිකයන්ට සිදුවන මේ අපහසුතාව මඟහරවා ගැනීම සඳහා වැලිවලට පොදු ස්ථාවර මිලක් ලබා දෙන්න පුළුවන්ද?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට ඔබතුමා කරුණු ඉදිරිපත් කරන්නේ හොරට නිකුත් කරන ප්‍රවාහන බලපත්‍ර සම්බන්ධයෙන්. අපි අමාත්‍යාංශය විධියට මේ ගැන අදාළ කාර්යාංශයත් එක්ක සාකච්ඡා කරලා හොරට නිකුත් කරන බලපත්‍ර -හොරෙන් අච්චු ගහලා ප්‍රවාහන කටයුතුවලට යොදන බලපත්‍ර- ගැන සොයන්න වැටලීම් තීව්‍ර කරන්නත්, මේ වෙන කොට ආරක්ෂිත බලපත්‍ර කොහොමද නිකුත් කරන්නේ කියන එක ගැනත් වෙනම කමිටුවකින් සාකච්ඡා කරලා නුදුරේදීම ඒක ප්‍රකාශයට පත් කරලා ඒ අදාළ ක්‍රියාමාර්ග ගන්නත් කටයුතු කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, වැලිවලට නිශ්චිත පාලන මිලක් මේ වනකොට නියම කරලා නැහැ. මේ ප්‍රශ්නය නිසා පාරිභෝගියන්ට සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැළෙන කොන්ත්‍රාත්කරුවන්ට සහ එවැනි සමාගම්වලට විශාල බලපෑමක් වෙලා තිබෙනවා. ඒක නිසා මම මීට සති කිහිපයකට කලිනුත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට උපදෙස් දුන්නා, වැලි සඳහා රාජ්‍ය භාගය ලෙස අය කරනු ලබන මුදල කොපමණද කියලා ප්‍රකාශයට පත් කරන්න කියලා. නමුත් ඒක ප්‍රකාශයට පත් වෙලා නැහැ. මම ඒ ගැන සොයා බලන්නම්. මේ වෙනකොට වැලි කියුබ් එකක් සඳහා රුපියල් 600ක රාජ්‍ය භාගයක් අය කරනු ලබනවා. ඒක සියයට 7ක වාගේ ප්‍රතිශතයක් ගත්තොත් සාමාන්‍යයෙන් රුපියල් 8,500ක විතර වාගේ මිලක් තමයි වැලි කියුබ් එකකට වෙන්නේ. වැලි තොටුපොළෙන් දෙන මිල තමයි ඒක. ඊට අමතරව ප්‍රවාහන දුර අනුව ඒ අදාළ ටිපර් රථ සහ ලොරි රථ ගාස්තුවක් අය කරනු ලබනවා.

ඒ අනුව තමයි මිල තීරණය වෙන්නේ. කෙසේ වෙතත්, මහ ජනතාවටත්, අදාළ පාරිභෝගිකයන්ගේත් දැනගැනීම සඳහා අපි ඉතා ඉක්මනින් මාධ්‍ය ප්‍රකාශයක් කරනවා, වැලිවලට රාජ්‍ය භාගය අය කර ගනු ලබන මිල මෙකයි, වැලි තොටුපළෙන් වැලි කියුබ් එකක් නිකුත් කරන මුදල මෙකයි කියලා.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ දැන් මතු වෙලා තිබෙන වැලි අවශ්‍යතාව මත, දැනට විශාල වැලි ප්‍රමාණයක් තිබෙනවා කියලා සඳහන් වෙන පිල්ලුමලෙයි, කිතුල, මඩකලපුව හා වැලිකන්ද වැනි ප්‍රදේශවලට මාස පහක විතර සිට, එහෙම නැත්නම් 2025 අවුරුද්දේ මුල් කාලයේ ඉඳලා මේ දක්වාම නීත්‍යනුකූලව වැලි අවසර පත්‍ර ලබා දීලා නැහැ. ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද? අදාළ ස්ථාන සඳහා වැලි බලපත්‍ර නිකුත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නවාද?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
ඇත්තටම මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් අපි සලකා බලමින් පවතිනවා. විශේෂයෙන්ම මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව ගංගාවල ගොඩ ගැසී ඇති වැලි, පාරිසරික ගැටලුවක් නැතුව, පාරිසාරික හානිය අවම වන ආකාරයෙන් කොපමණ ප්‍රමාණයක් අපට ලබාගන්න පුළුවන්ද කියන එක පිළිබඳව මේ වන විට අධ්‍යයනයක් සිද්ධ වෙමින් පවතිනවා. කොහොම වුණත්, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සමඟ අපේ අමාත්‍යාංශය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය එකතු වෙලා, රටේ වැලි අවශ්‍යතාව සහ වැලි මිල පාලනය කර ගැනීම සඳහා නැඟෙනහිර පළාතේ, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රදේශවල පාරිසරික හානිය අවම වන ආකාරයට ඉතා ඉක්මනින් වැලි බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කරන්න ඉදිරියේදී කටයුතු කරනවා.

## දෙයියන්දර නගරය සංවර්ධනය කිරීම: යෝජනා
### தெய்யந்தர நகர அபிவிருத்தி: முன்மொழிவுகள்
### DEVELOPMENT OF DEIYANDARA TOWN: PROPOSALS

816/2025

**8. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දෙයියන්දර නගරය සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සැලසුමක් සකස් කර තිබේද;

(ii) එම සැලසුමේ ඇති යෝජනා කොපමණ ප්‍රමාණයක් මේ වන විට ක්‍රියාත්මක කර තිබේද;

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත සැලසුම අනුව දෙයියන්දර ප්‍රාථමික පාසල මේ වනවිට පවතින ස්ථානයෙන් ඉවත් කිරීමට යෝජනා කර තිබුණේද;

(v) එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරන ලද ආයතනය/පුද්ගලයා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெய்யந்தர நகரை அபிவிருத்தி செய்வதற்காக நகர அபிவிருத்தி அதிகாரசபையால் திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி திட்டத்திலுள்ள முன்மொழிவுகளில் இன்றளவில் நடைமுறைப்படுத்தப்பட்டவற்றின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) எஞ்சியுள்ள முன்மொழிவுகளை நடைமுறைப்படுத்துவதற்கு எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி திட்டத்தின்படி, தெய்யந்தர ஆரம்பப் பாடசாலையை தற்போது அமைந்துள்ள இடத்திலிருந்து அகற்றுவதற்கு முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(v) இந்த முன்மொழிவை நடைமுறைப்படுத்துவதற்கு அதிகாரமளிக்கப்பட்டுள்ள நிறுவனம்/நபரின் விபரம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether the Urban Development Authority has prepared a plan to develop the Town of Deiyandara;

(ii) the number of proposals that have been implemented by now, out of those contained in the plan referred to above;

(iii) the measures that will be taken in the future to implement the remaining proposals;

(iv) whether it has been proposed to remove the Deiyandara Primary School from its current location according to the above-mentioned plan; and

(v) the institution/individual authorized to implement the proposal referred to above?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්, දෙයියන්දර නගරය, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස 2010.02.18 දින අංක 1641/42 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර මේ වන විට දළ නගර සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.

(ii) එම දළ සංවර්ධන සැලැස්ම යටතේ පහත සඳහන් ව්‍යාපෘති තුන මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

1. <u>දෙයියන්දර නගර මධ්‍ය භූ දර්ශන ව්‍යාපෘතිය</u>

සියක් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දෙයියන්දර මංසන්ධිය පදික වේදිකා සහිතව භූ දර්ශනය කර සංවර්ධනය කර ඇත.

2. <u>දෙයියන්දර ප්‍රාථමික පාසල ප්‍රතිස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය</u>

දෙයියන්දර ප්‍රාථමික පාසල ප්‍රතිස්ථානගත කිරීම සඳහා දංහේන ප්‍රදේශයෙන් අක්කර 04ක භූමි ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති අතර එම භූමිය පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දී ඇත.

3. <u>බස් නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතිය</u>

බස් නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර, මේ වන විට එහි පළමු අදියර නිම කර ඇත. නමුත් ඊළඟ අදියර සම්පූර්ණ කිරීම සඳහා පවතී.

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත සංකල්පනාත්මක සැලසුම් ඉදිරිපත් කර භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනීමට සහ රාජ්‍ය හා පෞද්ගලික මැදිහත්වීම මත ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනවා.

(iv) ඔව්.

ඉහත සැලසුමට අනුව දෙයියන්දර ප්‍රාථමික පාසල ඉවත් කිරීමට සැලසුම් කර තිබුණි.

(v) ඇත්තටම මේ තීරණය අරගෙන තිබෙන්නේ දේශපාලන තීන්දුවක් හැටියට. 2016.12.19වන දින මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී දෙයියන්දර බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා දෙයියන්දර ප්‍රාථමික පාසලේ ගොඩනැඟිලි ඉවත් කිරීමට තීරණය කොට ඇත.

ඒ අනුව දෙයියන්දර ප්‍රාථමික පාසල නැවත ප්‍රතිස්ථානගත කිරීම සඳහා දංහේන ප්‍රදේශයෙන් අක්කර 4ක භූමි ප්‍රමාණයක් අත්පත් කරගෙන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. ප්‍රතිපාදන ලද පසු එම භූමියේ පාසල ඉදිකරන තෙක් තාවකාලිකව දෙයියන්දර ප්‍රාථමික පාසල වෙනත් ස්ථානයක ස්ථානගත කර ඇති අතර, පාසල ප්‍රතිස්ථානගත කිරීමේ වගකීම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරී තිබෙනවා.

(ආ) අදාළ නැත.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දෙයියන්දර ප්‍රාථමික පාසල අවුරුදු 100කට වඩා පැරණි පාසලක්. අත්තනෝමතික විධියට ඒ පාසල කඩලා ඉවත් කළා. සැලසුමක් නැතුව තමයි ඒ ඉවත් කිරීමේ වැඩ කටයුතු සිදු කර තිබෙන්නේ.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ පාසලේ ගොඩනැඟිලි 11ක් තිබුණු බව. ඒ ගොඩනැඟිලි 11ම කඩා ඉවත් කළා. එහි තිබුණු සෙවිලි තහඩු, ලී, යකඩ පයිප්ප ආදී රුපියල් කෝටි 4කට, 5කට අධික ගොඩනැඟිලි ද්‍රව්‍ය දැන් ආ ගිය අතක් නැහැ. ඒවා කාටද දුන්නේ, කොහේටද ගෙන ගියේ ආදී මොකුත් තොරතුරු නැහැ. ඒවා ප්‍රාදේශීය දේශපාලනඥයන් තමන්ගේ හිතවතුන්ට බෙදා දීලා තිබෙනවා. සමහර ඒවා විකුණා තිබෙනවා. ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනවාද? මොකද, නාගරික සංවර්ධන අධිකාරියට තමයි ගොඩනැඟිලි ටිකත් එක්කම සම්පූර්ණ භූමිය භාර දුන්නේ. ඒ භාර දීපු භූමියේ තිබුණු ගොඩනැඟිලි ටික අත්තනෝමතික විධියට කඩා ඉවත් කරලා තිබෙනවා. ඒ ඉවත් කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවාද කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමාගේ අදහස එක්ක මම එකඟ වෙනවා. මොකද, පාසලක් ඉවත් කරලා ඒ වෙනුවට බස් නැවතුම්පොළක් ඉදිකරනකොට ඒ පාසල නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විධිමත් සැලැස්මක් අවශ්‍යයි. නමුත් මම කලින් සඳහන් කළා වාගේ දේශපාලන මැදිහත්වීමකින් තමයි 2016දී ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ. ඒ අදාළ පාසල ඉදිකිරීම සඳහා අක්කර 4ක භූමි භාගයක් ලබා දීලා තිබුණත්, විධිමත් සැලැස්මක් නැතුව ඒ කටයුත්ත කෙරිලා තිබෙන නිසා තවමත් පාසල හැදිලා නැහැ. ඔබතුමා සඳහන් කළා වාගේ ඒ ප්‍රාථමික පාසල ඉතා පැරණි පාසලක්. එහි තිබුණු භෞතික සම්පත් මේ වෙනකොට තිබෙන්නේ කොහේද කියන එක සම්බන්ධයෙන් අපි ඔබතුමාගේ ඉල්ලීම පරිදි සහ මේ මතු වෙච්ච කරුණු අනුව ඉදිරියේදී විමර්ශනයක් කරලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න කටයුතු කරනවා.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි. ඒ ප්‍රදේශයට තිබුණු ප්‍රධාන පාසල තමයි, දෙයියන්දර ප්‍රාථමික විද්‍යාලය. එතකොට නාගරික සංවර්ධන අධිකාරියට යුතුකමක් තිබෙනවා, ඒ පාසල කඩා ඉවත් කළා නම්, අලුත් තැනක පාසලක් ඉදි කරන්න භූමිය වෙන් කර ගත්තා වාගේම ඒකට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන හොයලා දෙන්න, ඒකට මැදිහත් වෙන්න. එම පාසල හදන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන්කර දීම සඳහා වූ කිසි දෙයක් දැන් ඔවුන් කරන්නේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරිය දැන් ඒ පාසල කලින් පිහිටි භූමිය සම්පූර්ණයෙන් අරගෙන carnivals, වෙළෙඳ ප්‍රදර්ශන වාගේ ඒවාට පාවිච්චි කරනවා. නමුත් පාසල විනාශ වෙලා තිබෙනවා. දැන් ඒ දරුවන්ට ඉගෙන ගන්න නිසි තැනක් නැහැ. ඒ නිසා ඒ පාසල නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීම සඳහා ඔබතුමන්ලාගේ ආයතනය විසින් කරන මැදිහත් වීම මොකක්ද කියලා දැනගන්න මම කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, මා කලින් සඳහන් කළා වාගේම නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරන්නේ අදාළ ප්‍රදේශයේ නාගරික සැලසුම් සකස් කරලා, නාගරික සංවර්ධන අධිකාරියේ විෂය පථයට අදාළ කොටස සම්පූර්ණ කිරීම සඳහා මැදිහත් වෙන එක. එතැනින් පසුව ඒ නාගරික සැලසුමට අනුව තවත් කිසියම් ආයතනයක් ඒ සඳහා සම්බන්ධ විය යුතු නම්, ඒ අදාළ ආයතනයට පහසුකම් සැපයීම තමයි නාගරික සංවර්ධන අධිකාරියේ රාජකාරිය.

ඒ අනුව ඒ ප්‍රාථමික පාසල ඉදිකිරීම සඳහා අදාළ ඉඩම පවරාගෙන, ඒ ඉඩම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා තිබෙනවා. දැන් ඒ පාසල ඉදිකිරීමේ වගකීම තිබෙන්නේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට. නාගරික සංවර්ධන අධිකාරියට හැකියාවක් නැහැ, ඒ පාසල ඉදිකිරීම සඳහා මැදිහත් වෙන්න. මොකද, ඒ සම්බන්ධයෙන් වගකීම තිබෙන්නේ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය ඒ පාසල සම්බන්ධයෙන් ඔවුන්ගේ විෂය පථයට අදාළ කටයුතු සම්පූර්ණ කරලා තිබෙනවා. දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන පාසලේ ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යා යුතුයි කියන එක තමයි මගේ අදහස.

## අයාලෙ යන සුනඛ ගහනය පාලනය: ක්‍රියාමාර්ග
### கட்டாக்காலி நாய்களின் பெருக்கத்தைக் கட்டுப்படுத்தல்: நடவடிக்கைகள்
### CONTROL OF STRAY DOG POPULATION: MEASURES

817/2025

**9. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අයාලෙ යන සුනඛ ගහනය පාලනය කිරීම සඳහා 2025 වර්ෂයේදී ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(ii) නිවාසවල ඇති කරන සුනඛයන් හා සුනඛ පැටවුන් මහාමාර්ග හා පොදු ස්ථානවලට ගෙනවිත් දැමීම වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

(iii) අයාලෙ යන සුනඛ ගහනය ඉහළ යාම නිසා සිදු වන සුනඛ සපාකෑම් හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கட்டாக்காலி நாய்களின் பெருக்கத்தைக் கட்டுப்படுத்த 2025ஆம் ஆண்டில் எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) வீடுகளில் வளர்க்கப்படும் நாய்களும் நாய்க்குட்டிகளும் பெருந்தெருக்கள் மற்றும் பொது இடங்களில் கைவிடப்படுவதைத் தடுக்க நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

(iii) கட்டாக்காலி நாய்களின் பெருக்கம் அதிகரித்துள்ளதால் சம்பவிக்கும் நாய்க்கடி மற்றும் வீதி விபத்துக்களைக் குறைக்க எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the measures that were taken in the year 2025 to control the stray dog population;

(ii) whether steps will be taken to prevent dogs and puppies raised in households from being brought and abandoned on roads and public places; and

(iii) the measures that will be taken to minimize dog bites and road accidents caused by the increase in the stray dog population?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1. සුනඛ ගහනය පාලනය කිරීම සඳහා විකල්ප උපාය මාර්ග හඳුනා ගැනීම.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් - TWG - විසින් අයාලෙ යන සහ නිදහසේ සැරිසරන සුනඛයන්ගේ ප්‍රජනන වේගය අඩු කරමින් සුනඛ ගහන පාලනයට සහාය වීම සඳහා විභව උපාය මාර්ග ලෙස විවිධ උපත් පාලන ක්‍රම ගවේෂණය මෙහිදී සිදු කරන ලද අතර, මේ වන විට අදාළ පාර්ශ්ව සමඟ මෙම ක්‍රමවල ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.

2. අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ගැනීම.

දුර්වල අපද්‍රව්‍ය බැහැර කිරීම අයාලෙ යන සුනඛයින්ට ස්ථාවර ආහාර ප්‍රභවයක් සපයමින් එය ඔවුන්ගේ වර්ධනයට දායක වන බැවින් සුනඛ ගහනය පාලනය කිරීම සඳහා ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි මෙහිදී අවධානය යොමු කර ඇත. මෙය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන අධිකාරීන්, මධ්‍යම පරිසර අධිකාරිය, පාරිසරික පොලීසිය, මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා සහ සත්ව සුබසාධන සංවිධාන ඇතුළු ප්‍රධාන කොටස්කරුවන්ගේ දායකත්වය ලබා ගැනීමටද මෙහිදී අපේක්ෂා කෙරේ.

3. වගකිව යුතු සුරතල් සතුන් හිමිකාරිත්වය සහ සුරතල් සතුන් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කිරීම.

මෙහි මූලික සැලසුම් අතරට,

i. සුරතල් සතුන් නියාමන රාමුව සංවර්ධනය කිරීම;

ii. ජාතික සුරතල් සත්ව දත්ත සමුදායක් ස්ථාපිත කිරීම; සහ

iii. ජලභීතිකා එන්නත් වාර්තා ඒකාබද්ධ කිරීම යනාදිය ඇතුළත් වේ.

4. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අංශය හරහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම.

(ii) ඔව්.

1. ජාතික සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහනට නිවාසවල ඇති කරන සුනඛයින් අදාළ කර ගැනීම.

2. වගකිවයුතු සුරතල් සතුන් හිමිකාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

මේ යටතේ රට පුරා රජයේ නිලධාරීන් සහ වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ - ToT - වැඩසටහන් ඇතුළු මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි.

3. සත්වයින් නිසා සිදුවන අනතුරු වැළැක්වීම, වගකිවයුතු සුරතල් සතුන් හිමිකාරිත්වය සහ සතුන්ට මානුෂීයව සැලකීම යන මාතෘකා පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම.

4. සත්ව සුබසාධන සංවිධාන සමඟ සහයෝගීතාවෙන් කටයුතු කිරීම.

මෙහිදී සත්ව සුබසාධන සහ ආරක්ෂණ සංගමය - AWPA - සහ සත්ව සුවතා භාරය - AWT - වැනි විවිධ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සමගාමීව කටයුතු කිරීම. මෙමඟින් අතහැර දැමූ සතුන් බේරා ගැනීම සහ පුනරුත්ථාපන කටයුතු සිදු කරනු ලබයි.

5. සුරතල් සතුන් ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම.

මෙමඟින් පොදු ස්ථානවල සුරතල් සතුන් අතහැර දැමීම අධෛර්යවත් කිරීම සඳහා පියවර ගැනීම.

(iii) 1. 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක ජාතික සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන මඟින් අයාලෙ යන සුනඛ ගහනය කළමනාකරණය කිරීම සහ මහජන සෞඛ්‍ය සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා මානුෂීය වන්ධ්‍යාකරණ ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීම.

2. වත්මන් සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහනේ අඩු පාඩු මේ වන විටත් හඳුනාගෙන ඇති අතර, ඒවායේ අඩු පාඩු නිවැරදි කිරීමට දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයුම් සැලසුම් සංශෝධනය කිරීම සහ ඒවා වඩාත් ඉලක්කගතව ක්‍රියාත්මක කිරීමට ග්‍රාම නිලධාරී කොට්ඨාස මත පදනම්ව නව සැලසුම් සංවර්ධනය කිරීම.

[ගරු හංසක විජේමුණි මහතා]

3. වගකිවයුතු සුරතල් සතුන් හිමිකාරිත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

   පුහුණුකරුවන් පුහුණු කිරීමේ - ToT - වැඩසටහන් සංවිධානය කිරීම, වගකිවයුතු සුරතල් සතුන් රැකබලා ගැනීම ප්‍රවර්ධනය කිරීම, සුනඛ සපාකෑම් අවදානම අවම කිරීම යන කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

4. සුරතල් සතුන් නිසා සිදුවන අනතුරු වැළැක්වීම, වගකිවයුතු සුරතල් සතුන් හිමිකාරිත්වය සහ සතුන්ට මානුෂීයව සැලකීම පිළිබඳව දරුවන් දැනුවත් කිරීම, ආරක්ෂිත සහ වඩාත් දයානුකම්පිත සමාජයක් ගොඩනැඟීමට අත්‍යවශ්‍ය වන බැවින් එවැනි කරුණු ජාතික පාසල් විෂය මාලාවට ඒකාබද්ධ කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් විධිමත් යෝජනාවක් මේ වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මීට මාස 4කට ඉස්සෙල්ලා මේ පාර්ලිමේන්තු සැසිවාරයේදීම මම මේ ප්‍රශ්නය මතු කළා. පාරේ යන, අයාලෙ යන සුනඛ ගහනය අඩු කරන්න අපි ඉතිහාසය පුරා විවිධාකාරයේ කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව, සතුන් මරලා තිබෙනවා, වන්ධ්‍යාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. 2025 අවුරුද්දේ ඒ එක කාරණයක්වත් සිද්ධ වුණේ නැති නිසා අද වෙනකොට අයාලෙ යන සුනඛ ගහනය බරපතළ ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ සමහර ස්ථානවල අයාලෙ යන සුනඛයින් ගව ගාල්වලට පැනලා හරක් පැටවුන් අල්ලාගෙන කන තත්ත්වයකට පත්ව තිබෙනවා. ඒ වාගේම සුනඛයින් නිසා මාර්ගයේදී නොයෙක් අනතුරුත් සිදු වෙනවා. එවැනි අවස්ථාවලදී ඒ තුවාලකරුවන් වෙනුවෙන් රෝහල්වලට විශාල පිරිවැයක් දරන්නත් සිදු වෙනවා. විශේෂයෙන් මාර්ගයේදී සිදුවන අනතුරු නිසා තුවාල ලබන අය සහ සුනඛ සපාකෑම්වලට ලක්වන අය සඳහා කරනු ලබන ප්‍රතිකාරවලට. ඇත්තටම මේකේ තිබෙන ගැටලුව වන්නේ, පසුගිය කාල සීමාව තුළ මේ සඳහා නොයෙක් යෝජනා ඉදිරිපත් කරලා තිබුණත්, දැනට ඒවා නතර වෙලා තිබීමයි. දැන් ඒ සතුන් වන්ධ්‍යාකරණය පවා සිදු වෙන්නේ නැහැ. මේ සම්බන්ධව පසුගිය කාලයේ කිසිම ක්‍රියාමාර්ගයක් නොගත් නිසා මේ වනකොට මේ තත්ත්වය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ, මේ කටයුත්ත ඉක්මනින් කරන්න කෙටි කාලීන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවාද කියන එකයි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඇත්තටම සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් අපේ ප්‍රමුඛම කාර්යය වෙන්නේ සුනඛයින් නිසා ඇති වන ජලභීතිකාව කියන රෝගය පාලනය කිරීමයි. ජලභීතිකාව නිසා දැනට අපේ රටේ සිදුවන මරණ අවුරුද්දකට 20ත්, 30ත් අතර ප්‍රමාණයක් වනවා. මීට අවුරුදු 20කට විතර ඉස්සෙල්ලා ඒක 300ක විතර ප්‍රමාණයක් වුණා. නමුත් අපේ මට්ටමේ සිටි තායිලන්තය වාගේ රටවල් අවුරුද්දකට ඒ ප්‍රමාණය 1, 2 දක්වා අඩු කරලා තිබෙනවා. ඒ වාගේම හුඟක් ලතින් ඇමෙරිකානු රටවල මරණ ප්‍රමාණය zero වෙලා තිබෙනවා. ඔවුන් ඒ ඉලක්ක කරා ළඟා වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම සත්ව ගහනය පාලනය කිරීම සහ නිවැරදි එන්නත්කරණ ක්‍රියාවලියක් සිදු කිරීමෙන්. ඒ නිසා අපේ එන්නත්කරණ ක්‍රියාවලිය විධිමත් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා.

අයාලෙ යන සුනඛ ගහනය කළමනාකරණයට අපි විශාල මුදලක් වියදම් කරනවා. ඒ සඳහා විශාල මුදලක් වෙන් කරලාත් තිබෙනවා. සුනඛයින්ගේ සපා කෑම් නිසා මිනිසුන්ට කළ යුතු බෙහෙත්වලට රුපියල් මිලියන 280ක් අවුරුද්දකට අපි වියදම් කරනවා. ඒක ලොකු ගණනක්. ඒ වාගේම සතුන් එන්නත් කරන්නත් අපි රුපියල් මිලියන 180ක් වෙන් කරනවා. ඒ වාගේම සතුන් වන්ධ්‍යකරණයට ආයෙත් අපි රුපියල් මිලියන 200ක් වියදම් කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සම්බන්ධව දරන අනෙකුත් වියදම් සඳහා අවුරුද්දකට රුපියල් මිලියන 800ක් වියදම් කරනවා. එතකොට ඒ රුපියල් මිලියන 800 cost effectiveness එක අපි බලන්න ඕනෑ. එම නිසා මේ වැඩසටහන සමාලෝචනය කරලා, මේකේ අඩු පාඩු සකසා ඉදිරියට ගෙන යාම අවශ්‍ය වෙනවා. ඒ වාගේම වන්ධ්‍යකරණ වැඩසටහන සඳහා රුපියල් මිලියන 200ක් වියදම් කළත්, ඒකේ output එකක් තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. එහෙම තිබෙනවා නම් මේ විධියට සතුන් හැම තැනම ඉන්න විධියක් නැහැ. පාර්ලිමේන්තුවටත් අයාලෙ යන සුනඛයින් ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ check කරලා ගත්තාට කවුරුන් හරි බලු පැටවුන් මෙහෙට ගෙනැල්ලා තිබෙනවා. ඒ කියන්නේ, හැම තැනම මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මේ සඳහා මීට වඩා ක්‍රමවත් වූ ජාතික වැඩ පිළිවෙළක අවශ්‍යතාව අපිත් අවධාරණය කරනවා.

ඒ කියන්නේ, මේ සඳහා අපේ අමාත්‍යාංශයේ විෂය පථයෙන් එහා ගිය වැඩසටහනක් අවශ්‍ය වෙනවා.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තවශයෙන්ම ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව ගත්තාම අපේ රටේ නියාමනයකින් තොරව නිදහසේ සුනඛයින් ඇති කිරීමට ලබා දී තිබෙන අවසරය, ඒ ඉඩ කඩ හරහා මාර්ගවලට එන සුනඛ ගහනය වැඩිවෙලා තිබෙනවා. විශේෂයෙන් අධ්‍යයනවලින් ඉදිරිපත් වෙලා තිබෙන කරුණු අනුව මාර්ගවලට අයාලෙ එන සුනඛ ගහනයට ප්‍රධාන වශයෙන් හේතු වෙලා තිබෙන්නේ, අඩු ආදායම්ලාභින්ගේ නිවෙස්වල ඇති කරන සුනඛයින්ට ලෙඩ හැදුණාට පස්සේ, නැත්නම් ඒ සතුන් ලොකු වුණාම පෝෂණය කරන්න බැරි වුණාම මාර්ගවලට මුදා හැරීමයි. මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ නීතිමය ආවරණයක් නැතිකම, එහෙම නැත්නම් නීති රාමුවක් නැතිකම නිසායි. ඒ නිසා මේ සම්බන්ධ අධ්‍යයනවලින් හෙළිවෙලා තිබෙනවා, අයාලෙ යන සුනඛයින්ගෙන් සියයට 70ක් වාගේ ප්‍රමාණයක් අඩු ආදායම්ලාභින්ගේ නිවෙස්වල ඇති කරන සුනඛයින් බව. ඒ සුනඛයින් නිසා තමයි මාර්ගවල සුනඛ ගහනය වැඩිවෙලා තිබෙන්නේ. එම නිසා මම ප්‍රශ්නයක් වාගේම යෝජනාවක් ඉදිරිපත් කරනවා, පළාත් පාලන ආයතන හරහා අලුතින් සුනඛයින් ලියාපදිංචි කිරීමට, එහෙම නැත්නම් ඒ සතුන් වෙනුවෙන් වෙනම නීතිමය රාමුවක් සකස් කරන්න කියලා. එසේ කරන්න පුළුවන්ද කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

දැනට අපේ අමාත්‍යාංශයත්, ඒ කියන්නේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ

වාරිමාර්ග අමාත්‍යාංශයත්, ඒ වාගේම මේකට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වයනුත් එකතු කරගෙන මේ ගැටලුවට විසඳුම් සෙවීමට රැස්වීම් දෙක තුනක් මේ අවුරුද්ද තුළ පැවැත්වූවා. අපි ඒ කමිටුවෙන් බලාපොරොත්තු වෙනවා, සුනඛයින් පාලනය කිරීම සඳහා වූ නිශ්චිත වැඩ පිළිවෙළක් සැකසීම සහ ඒවාට අදාළ නීති රීති සංශෝධනය කිරීමට හෝ අලුත් නීති රීති සඳහා වූ යෝජනා ඉදිරිපත් කරයි කියලා. ඒක නිසා කෙටි කාලයක් තුළ අපට ඒ තීරණය ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

## කොළඹ විශ්වවිද්‍යාලය: ශිෂ්‍ය නේවාසිකාගාර
### கொழும்புப் பல்கலைக்கழகம்: மாணவ விடுதிகள்
### UNIVERSITY OF COLOMBO: STUDENT HOSTELS

823/2025

**10.ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල මේ වන විට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අනුව සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් නොලැබෙන බව පිළිගන්නේද;

(iv) මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර සංඛ්‍යාව, ඒවායේ නම් කාන්තා, පිරිමි සහ මිශ්‍ර යන නේවාසිකාගාර වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කොළඹ විශ්වවිද්‍යාලයේ 800ක් පමණ ශිෂ්‍යාවන් සංඛ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබූ "මුත්තයියා" කාන්තා නේවාසිකාගාරය පිහිටි කොළඹ 02 ප්‍රදේශයේ ඉඩම, 2020 වර්ෂයේදී පවරා ගත් බව දන්නේද;

(ii) එම නේවාසිකාගාරය පිහිටුවා තිබූ ඉඩමේ වර්තමාන හිමිකාරිත්වය සතු ආයතනය කවරේද;

(iii) එම නේවාසිකාගාරය කඩා ඉවත් කර වර්ෂ 05කට අධික කාලයක් ගත වී ඇතත්, එහි මේ දක්වා කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, එම සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් නැවත කොළඹ විශ්වවිද්‍යාලයට ලබා දෙන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்புப் பல்கலைக்கழகத்தின் அனைத்து பீடங்களிலும் இன்றளவில் கல்விபயிலும் மாணவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்களில் விடுதி வசதிகள் வழங்கப்பட்டுள்ள மாணவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அதற்கமைவாக குறிப்பிட்ட எண்ணிக்கை கொண்ட மாணவர்களுக்கு விடுதி வசதிகள் கிடைக்காததை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) இன்றளவில், கொழும்புப் பல்லைக்கழகத்துக்குச் சொந்தமாகக் காணப்படுகின்ற விடுதிகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள், பெண்கள், ஆண்கள் மற்றும் இருபாலார் எனும் வகைப்படுத்தலின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கொழும்புப் பல்கலைக்கழகத்தைச் சேர்ந்த சுமார் 800 மாணவிகளின் விடுதி வசதிகளைப் பூர்த்திசெய்த "முத்தையா" பெண்கள் விடுதி அமைந்திருந்த கொழும்பு 02 பிரதேசத்திலுள்ள காணி, 2020ஆம் ஆண்டில் கையகப்படுத்தப்பட்டதை அறிவாரா?

(ii) மேற்படி விடுதி அமைக்கப்பட்டிருந்த காணியின் தற்போதைய உரித்தை எந்த நிறுவனம் கொண்டுள்ளது என்பதையும்;

(iii) மேற்படி விடுதி உடைத்து அகற்றப்பட்டு 05 வருடங்கள் கடந்துள்ளபோதிலும், அங்கு இதுவரையில் எவ்வித அபிவிருத்தி நடவடிக்கையும் மேற்கொள்ளப்படாததை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அந்த முழுக் காணி அல்லது அதன் ஒரு பகுதி மீண்டும் கொழும்புப் பல்கலைக்கழகத்துக்கு வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the total number of students studying at all the faculties of the University of Colombo at present;

(ii) the number of those who have been provided with hostel facilities, out of the students referred to above;

(iii) whether she accepts that a considerable number of students do not get hostel facilities accordingly; and

(iv) the number of hostels possessed by the University of Colombo, their names and the number of those as per the categorization of female, male and mixed hostels, separately?

(b) Will she also inform this House -

(i) whether she is aware that the land in Colombo 02, where the Muttiah Girls' Hostel, which provided hostel facilities to around 800 female students of the University of Colombo, had been located was taken over in the year 2020;

[ගරු හිරුනි විජේසිංහ මහත්මිය ]

(ii) the name of the entity which currently has possession of the land, where the aforesaid hostel was located;

(iii) whether she is aware that no development work has been carried out there although more than five years has lapsed after the demolition of the said hostel; and

(iv) if so, whether the entire land or a portion thereof will be returned to the University of Colombo?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල මේ වන විට ඉගෙනුම ලබන අභ්‍යන්තර උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාව 14,207කි.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රීපාලි මණ්ඩපය - සිසුන් 848ක් වේ.

කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයනායතනයේ සිසුන් - 1,092ක් වේ.

(ii) ඒ අතරින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව,

කොළඹ විශ්වවිද්‍යාලය - 4,366කි.

ශ්‍රීපාලි මණ්ඩපය - 341කි.

කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයනායතනය - 71කි.

(iii) නේවාසිකාගාර පහසුකම් ලබන සිසුන්ගේ ප්‍රතිශතය පහත පරිදි වේ.

- කොළඹ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 30.73ක්.
- ශ්‍රීපාලි මණ්ඩපයේ ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 40.21ක්.
- කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයනායතනයේ ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 6.5ක් සඳහා නේවාසිකාගාර පහසුකම් ලැබේ.

(iv) <u>කාන්තා නේවාසිකාගාර</u>

1. හැව්ලොක් නේවාසිකාගාරය
2. සුජාතා ජයවර්ධන නේවාසිකාගාරය
3. සිවා චින්න තම්බි නේවාසිකාගාරය
4. ද සේරම් (වෛද්‍ය) 215 නේවාසිකාගාරය
5. ද සේරම් 220 නේවාසිකාගාරය
6. තෙලවල නේවාසිකාගාරය
7. හෙද පීඨ නේවාසිකාගාරය
8. තාක්ෂණ පීඨ නේවාසිකාගාරය
9. දේශීය වෛද්‍ය පීඨ නො. 330 නේවාසිකාගාරය
10. දේශීය වෛද්‍ය පීඨ මොරගස්මුල්ල නේවාසිකාගාරය
11. කාලිංග මාවත නේවාසිකාගාරය

<u>පිරිමි නේවාසිකාගාර</u>

1. කිත්‍යාකර නේවාසිකාගාරය
2. බ්ලොම්ෆොන්ටේන් වෛද්‍ය නේවාසිකාගාරය
3. තෙලවල නේවාසිකාගාරය
4. හෙද පීඨ නේවාසිකාගාරය
5. තාක්ෂණ පීඨ නේවාසිකාගාරය
6. දේශීය වෛද්‍ය පීඨ බත්තරමුල්ල නේවාසිකාගාරය
7. දේශීය වෛද්‍ය පීඨ මැද වැලිකඩ නේවාසිකාගාරය
8. දේශීය වෛද්‍ය පීඨ නො. 12 නේවාසිකාගාරය
9. භික්ෂු නේවාසිකාගාරය

<u>ශ්‍රීපාලි මණ්ඩපය</u>

1. කාන්තා නේවාසිකාගාර 01කි.
2. පිරිමි සිසුන් 40දෙනෙකු සඳහා එක් සිසුවෙකුට රුපියල් 4,000 බැගින් නේවාසිකාගාර ශිෂ්‍යාධාර ලබා දෙනු ලැබේ.

<u>කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයනායතනය</u>

1. කාන්තා නේවාසිකාගාර 01කි.
2. පිරිමි නේවාසිකාගාර 01කි.

(ආ) (i) ඔව්.

කොළඹ 02, මුත්තයියා පාරේ, අංක 48 දරන ස්ථානයේ පවත්වාගෙන ගිය කොළඹ විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාරය පිහිටි ඉඩම් කොටස නාගරික සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමටත්, එලෙස පවරා ගනු ලබන ඉඩම් කොටස වෙනුවෙන් නාරාහේන්පිට, කාලිංග මාවතේ නිවාස ඒකක 144කින් සමන්විත මහල් නිවාස සංකීර්ණය කොළඹ විශ්වවිද්‍යාලය වෙත පැවරීමටත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලය හා නාගරික සංවර්ධන අධිකාරිය අංක 5598 දරන අවබෝධතා ගිවිසුමට 2021.07.16 දින අත්සන් තබා ඇත.

(ii) 2021දී අත්සන් තැබූ එකඟතා ගිවිසුම අනුව කොළඹ 02, මුත්තයියා පාරේ, අංක 48 දරන ස්ථානයේ පිහිටි දේපළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන ඇති බැවින්, මේ වනවිට එම දේපළ කොළඹ විශ්වවිද්‍යාලය සතු දේපළක් නොවේ.

එසේම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති විසින් රජයේ ඉඩම් ආඥාපනතේ (අධිකාරිය 454) 6 වැනි වගන්තිය යටතේ මෙම ඉඩම ඇතුළු දීමනා පත්‍රයේ පළමුවන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් නිදහස් දීමනා පත්‍රයක් මඟින් කොළඹ 02, ශ්‍රී ජිනරතන මාවත, අංක 61 දරන ස්ථානයේ පිහිටි ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති වන පූජ්‍ය ගලබොඩ ඥානිස්සර ස්වාමීන් වහන්සේ වෙත 2022.02.14 දිනැතිව ලබා දී ඇත.

(iii) උක්ත දීමනා පත්‍රයේ දෙවන උපලේඛනයේ පරිදි එම ඉඩම් හා එහි පිහිටි ගොඩනැඟිලි හරිත උද්‍යානයක් හා පූජා භූමියක් ලෙස සංවර්ධනය

කිරීම සඳහා පමණක් යෙදවිය යුතු බව දන්වා ඇති බැවින්, මෙම ඉඩමේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය - ඒ කියන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය - කටයුතු කරනු නොලැබේ.

(iv) නැත.

අංක 2300/28 හා 2022.10.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති පරිදි, මෙම ඉඩම් කොටස ද ඇතුළත්ව ගැසට් පත්‍රයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් වන අතර එය "හුණුපිටිය ගංගාරාම විහාර පූජා භූමිය" ලෙස හඳුනාගෙන ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි. මුත්තයියා කාන්තා නේවාසිකාගාරය තමයි, කොළඹ විශ්වවිද්‍යාලයේ වැඩිපුර භූමි ප්‍රදේශයක් තුළ ව්‍යාප්ත වෙලා තිබූ නේවාසිකාගාරය. හැබැයි, දැන් එය අභිමි වෙලා තිබෙන්නේ. නමුත්, දත්ත අනුව බලද්දි කොළඹ විශ්වවිද්‍යාලයේ දරුවන්ට නේවාසිකාගාර පහසුකම් ලැබෙන්නේ ඉතාම අඩු මට්ටමින්.

ඒ වාගේම වෙනත් විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන දරුවන්ට යන වියදමත් එක්ක සසඳා බලද්දී කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන දරුවෙකුට නේවාසිකාගාර සහ නවාතැන් පහසුකම් වෙනුවෙන් විශාල වියදමක් දරන්න සිද්ධ වනවා.

අපි හිතමු, යාපනයේ දරුවෙකු ඉන්නවා, ඒ දරුවාගේ අම්මා හෝ තාත්තා රාජ්‍ය සේවකයෙක් කියලා. ඔහුට හෝ ඇයට නේවාසිකාගාර පහසුකම් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලබා ගන්න බැහැ. මොකද, ආදි ශිෂ්‍යයෙක් හැටියට මම දන්නා පරිදි කොළඹ විශ්වවිද්‍යාලයේ සීමිත පහසුකම් ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒ නිසා මම දැනගන්න කැමැතියි, අපේ රජය යටතේ මේ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරනවාද කියලා. රජයේ ගොඩනැඟිලි තිබෙනවා. සමහර ඒවා ඉදි කරමින් පවතින ඒවා. ඒ වාගේම වැඩකටයුතු අවසන් වුණු ඒවා මෙන්ම විවිධ මට්ටම්වල තිබෙන ගොඩනැඟිලි තිබෙනවා. ඉදිරියේදී අලුත් නේවාසිකාගාරයක් විශ්වවිද්‍යාලයට ලබා දීමට හැකියාවක් පවතින්නේද කියලා මම ගරු අගමැතිතුමියගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පොදුවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල බරපතළ විධියේ නේවාසිකාගාර ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු ගණනාවක් තුළ පැවති ආණ්ඩු තීරණයක් ගෙන තිබෙනවා, නේවාසිකාගාර හදන්නේ නැහැ කියලා. නමුත්, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙලා තිබෙන ළමුන් ගණන වැඩි වෙලා තිබෙනවා. පීඨ ගණන, දෙපාර්තමේන්තු -මේ සියල්ලම- වැඩි වෙලා තිබුණාට නේවාසිකාගාර පහසුකම් වැඩි කරලා නැහැ. එම නිසා මේ වනකොට විශාල අර්බුදයක් පැනනැඟිලා තිබෙනවා. ඒ නිසා අපි audit එකක් කළා, පවතින බිල්ඩින් කොහොමද අපට පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ කියන එක පිළිබඳව. විශ්වවිද්‍යාල තුළ space audit එකක් කරලා, දැනට පවතින බිල්ඩින් නේවාසිකාගාර බවට පත් කරන්නත්, සැලසුම්සහගතව මේ නේවාසිකාගාර පහසුකම් ක්‍රමානුකූලව වැඩි කිරීමටත් යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. මේ වනකොට UGC එක විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් එක්ක සාකච්ඡා කරලා, ඒ සඳහා සැලසුමක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව තමයි එම කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ගරු මන්ත්‍රීතුමියනි, මේක කොළඹ විශ්වවිද්‍යාලයේ විතරක් නොවෙයි, පොදුවේ සෑම විශ්වවිද්‍යාලයකම තිබෙන බරපතළ ගැටලුවක්. විශේෂයෙන්ම කොළඹින් ටිකක් දුරින් තිබෙන පැතිවලට මේක විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. ඒගොල්ලන්ට පෞද්ගලිකව සොයා ගන්න තිබෙන ස්ථානත් ඉතාම සීමිතයි. කොළඹ අඩු ගාණේ වෙනත් විකල්ප හෝ තිබෙනවා. මුදල් වියදම් වන බව ඇත්ත. නමුත්, මොකක් හෝ විකල්පයක් තිබෙනවා නේ. නමුත් සමහර පැතිවල එහෙම විකල්ප ක්‍රමත් නැහැ. කිලිනොච්චියේ තිබෙන කැම්පස් එකට එහෙම ළමයින්ට යන්න විධියක් නැහැ, නේවාසිකාගාර පහසුකම් හරියට නැත්නම්. ඒ නිසා මේක විශ්වවිද්‍යාල පද්ධතියේම තිබෙන ප්‍රශ්නයක් නිසා අපි සැලසුම්සහගතව විශ්වවිද්‍යාල තුළ නේවාසිකාගාර පහසුකම් වැඩි කරන්න ක්‍රියාත්මක වෙමින් ඉන්නවා.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අගමැතිතුමියනි. සාමාන්‍යයෙන් රජයෙන් දීමනාවක් ලබා දෙනකොට අනෙකුත් දීමනාවලට නිශ්චිත දිනයක් තිබෙනවා, මේ මේ දිනයේදී එම දීමනාව ලබා දෙනවා කියලා; එක්කෝ මාසයේ මුල දිනයක්, මැද දිනයක්, එහෙම නැත්නම් 25වැනි දා වාගේ නිශ්චිත දිනයක් තිබෙනවා. විශ්වවිද්‍යාල දරුවන්ටත් මහපොළ ශිෂ්‍යාධාරය ලබා දීමේදී එවැනි නිශ්චිත දිනයක් ලබා දෙන්නේ නම් ගොඩක් වටිනවා කියලා මම හිතනවා. මොකද, මමත් විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක් හැටියට සිටියදී අපි හරිම කැමැතියි, රුපියල් 5,000ක හෝ රුපියල් 5,050ක මහපොළ ශිෂ්‍යාධාරය ලැබෙන බවට message එක උදේට අපේ phone එකට ඇවිත් තිබෙනවා දකින්න. ඉතින්, දරුවන් මාසයක්, දෙකක් බලාගෙන ඉන්නවා, ඒ මුදල අද ලැබෙයිද, හෙට ලැබෙයිද කියලා. ඒ ප්‍රමාදය කලින් ආණ්ඩුවල සිට දිගින් දිගටම තිබෙනවා, මහපොළ ශිෂ්‍යාධාරය ලබා දීමේදී. අපේ රජයෙන් ඒ රුපියල් 7,500ක දීමනාව ලබා දීමේදී මාසයේ මෙන්න මේ නිශ්චිත දිනයේදී එය ලබා දෙනවා කියලා, දිනයක් නියමකොට ලබා දීමේ හැකියාවක් තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඔව්. ගරු කථානායකතුමනි, ඒ සඳහාත් අපි මැදිහත් වෙලා තිබෙන්නේ. මාස ගණනක් නොලැබුණු ඒ ශිෂ්‍යාධාර මුදල් මේ වෙනකොට ඔවුන්ට ලැබිලා තිබෙන්නේ. අලුතෙන් ආපු batch එකට තමයි තවම යම් පරක්කුවක් වෙලා තිබෙන්නේ. මෙතෙක් හිරවෙලා තිබුණු දීමනා සියල්ල අපි ලබා දී තිබෙනවා. ඒ වාගේම, ගරු මන්ත්‍රීතුමිය යෝජනා කළ විධියටම නිශ්චිත දවසක් අනුමත කරගෙන ඒ අනුව ඉදිරියට මේ මහපොළ ශිෂ්‍යාධාරය ලබා දෙන්න තමයි වැඩ කරමින් යන්නේ. Mahapola Higher Education Scholarship Trust Fund එක සමඟත් අපි මේ පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් සඳහා අවම වැටුපක් හඳුන්වා දීම
### மத்திய கிழக்கில் பணிபுரியும் இலங்கைத் தொழிலாளர்களுக்கு குறைந்தபட்ச ஊதியத்தை அறிமுகப்படுத்தல்
### INTRODUCTION OF MINIMUM WAGE FOR SRI LANKAN MIGRANT WORKERS IN THE MIDDLE EAST

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මං ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි. මම මේ ප්‍රශ්නය මුදල් ඇමතිතුමාටයි යොමු කරන්නේ.

2016 වසරේදී අය වැය ක්‍රියාවලිය ඔස්සේ මැද පෙරදිග රටවල රැකියා සඳහා යන ශ්‍රී ලාංකික සේවකයින් වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 300ක අවම මාසික වැටුපක් සීමා කළේය. එහෙත් කොරෝනා වසංගතයත්, විදේශ රැකියා අවස්ථා වැඩි කිරීමේ කටයුතුත් හේතුවෙන් මෙම අවම වැටුප් ප්‍රතිපත්තිය 2021 සැප්තැම්බර් 21වන දා රජය විසින් අහෝසි කරන ලදී.

දැනට ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් මැද පෙරදිග රටවලට අධිකාරි නොවන සහ නීති විරෝධී වැටුප් මට්ටමින් රැකියා සඳහා යනු ලබති. එමෙන්ම, පාකිස්තානය, නේපාලය, ඉන්දියාව, බංග්ලාදේශය සහ පිලිපීනය වැනි රටවල් මැද පෙරදිග රටවල් සමඟ අවම වැටුප් ගිවිසුම් අත්සන් කර තිබේ. මේවා ඔස්සේ රැකියා වර්ගය අනුව මාසිකව එක්සත් ජනපද ඩොලර් 218 සිට එක්සත් ජනපද ඩොලර් 1,364 දක්වා වැටුප් සහතික කර ඇත.

විදේශ විනිමය ආදායමට ශ්‍රී ලාංකික රැකියා නියුක්තිකයන්ගේ දායකත්වය දැවැන්ත වන බැවින්, ඔවුන් wage හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් අනපේක්ෂිත තත්ත්වයකට ලක්වීම වැළැක්විය යුතුය.

ඒ අනුව මම පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිමි.

1. මේ වනවිට සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර් සහ කුවේට් රටවල සේවයට යන ශ්‍රී ලාංකිකයන් සඳහා අදාළ අවම වැටුප් මොනවාද?
2. ශ්‍රී ලංකාව මැදපෙරදිග රටවල් සමඟ සාධාරණ වැටුප් සහ යහපත් සේවා කොන්දේසි ලබාදීමට ද්විපාර්ශ්වීය කම්කරු ගිවිසුම් අත්සන් කර ඇතිද?
3. නේපාලය, බංග්ලාදේශය සහ පිලිපීනය වැනි රටවල්වල සේවකයන්ට සමානව හෝ වඩාත් සරිලන වැටුප් ලබාදීම ශ්‍රී ලාංකික සේවකයින්ට සහතික කිරීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර මොනවාද?
4. ශ්‍රී ලාංකික සේවකයින් වැටුප් - wages - වංචා, අඩු වැටුප් සහ ගිවිසුම් උල්ලංඝනය යන කරුණුවලට ලක්වීම වැළැක්වීම සඳහා රජය ගෙන ඇති නීතිමය පියවර මොනවාද?

   ගරු කථානායකතුමනි, අපට බිලියන 1.2ක් හොයා ගන්න පුළුවන්, මේ හරහා. ඒ නිසායි මම මේ ගැන අහන්නේ.

5. කටාර් රටේ අවම වැටුප US Dollars 494ක් වන බව සැලකෙන විට, ශ්‍රී ලාංකික සේවකයින්ට මෙය ලබා දෙනවාද? එසේ නොවේ නම් ඒ සඳහා හේතුව කුමක්ද?
6. සවුදි අරාබියෙහි පිලිපීන ගෘහ සේවිකාවන්ට US Dollars 384ක් අවම වැටුපක් ලෙස ලබා දෙන බව සැලකේ. ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන්ට සවුදි අරාබියෙහි සහ අනෙකුත් ගල්ෆ් රටවලදී ලබා දෙන අවම වැටුප කීයද?
7. ශ්‍රී ලාංකික සේවකයන් වැටුප් වංචාවන්ට හා අඩු වැටුප්වලට ලක්වීම වැළැක්වීම සඳහා අමාත්‍යාංශය, රැකියා සපයන ආයතන සහ බඳවා ගැනීම් නියෝජිතයින් wage අනුකූලතාව පරීක්ෂා කරන ආකාරය කුමක්ද?
8. 2016දී ක්‍රියාත්මක වූ ආකාරයෙන් විදේශ සේවයට යන ශ්‍රී ලාංකිකයන් සඳහා අනිවාර්ය අවම වැටුප් ප්‍රතිපත්තිය නැවත හඳුන්වා දීමට අමාත්‍යාංශය සූදානම්ද? එසේ නැත්නම් ඇයි?
9. මැදපෙරදිග රටවල ශ්‍රී ලාංකික සේවකයන් වැටුප් වංචාවලින් ආරක්ෂා කිරීමට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් රැකියා නියෝජිතයින්ට අවම වැටුප් ප්‍රමිති නියම කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කළ හැකිද?
10. මැදපෙරදිග රටවල ශ්‍රී ලාංකිකයන් මෙන්ම මිලියන 1.7කට ආසන්න ප්‍රමාණයක් සේවයේ නියුතු බව සැලකෙන විට, මෙවැනි ප්‍රතිපත්තියක් මඟින් අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5ක් - US Dollars 1.5 billion - වාර්ෂික වශයෙන් රටට ලබා ගන්න පුළුවන් බව අමාත්‍යතුමා පිළිගන්නේද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ගන්නා බව අපට දන්වා තිබෙනවා. මෙහි inter-ministerial ගතියකුත් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ වාගේ අවස්ථාවක විදේශ විනිමය ලබා ගන්න පුළුවන් හොඳම මාර්ගයක්, මේක. විදේශගත ශ්‍රමිකයන්ගෙන් ඩොලර් බිලියන 1.5ක් පමණ ලබා ගත හැකියි. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් ඉතා ඕනෑකමින් කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය 1 සිට 11 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.05.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

මීට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 11 දක්වා වන යෝජනා - විසර්ජන පනත යටතේ යෝජනා සම්මතයන් - ද මා ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, the Hon. Thilina Samarakoon. You have 12 minutes.

[පූ.භා. 10.51]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, අද දිනයේ අපි ආර්ථිකයට අදාළ කාරණා දෙකක් ගැන මේ පාර්ලිමේන්තුව තුළ මූලික වශයෙන් සංවාද කරන්න; කථා බහ කරන්න බලාපොරොත්තු වෙනවා. පසුගිය දින දෙක තුළදීත් අපි එවැනිම කටයුත්තක නිරත වුණා.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ යටතේ පනවා ඇති, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි පිළිබඳවත් අද දවසේ අපි සාකච්ඡා කරනවා.

ඒක 20වන වගන්තියට අනුව නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය පසුගිය දවසක -2025.05.20වන දින- රජයේ මුදල් පිළිබඳ කාරක සභාව තුළත් සාකච්ඡාවට ගත්තා. එහි තිබෙන කාරණය ගත්තොත්, ජපානයෙන් වාහන ආනයනය කිරීමේදී පසුගිය කාලයේ අපිට තිබුණු ගැටලු කිහිපයක් සහ ජපානයෙන් වාහන ආනයනය කිරීමේදී ඒක වඩාත් හොඳ විධියට, වඩාත් යහපත් විධියට, ක්‍රමානුකූලව කර ගැනීමට අදාළ සංශෝධන මොනවාද කියන එක සලකා බැලීම තමයි සිද්ධ කරන්නේ.

පසුගිය කාලයේ ජපානයෙන් වාහන ආනයනය කිරීමේදී ඒකට අදාළ තක්සේරු වාර්තා ලබා දීමට සම්බන්ධ ආයතන කිහිපයක් තිබුණා. මෙහිදී විශේෂයි, ජපන් වාහන තක්සේරු ආයතනය, ඒ වාගේම Japan Export Vehicle Inspection Centre Company Limited සහ USS Company Limited. එම ආයතන තුනට අමතරව, තව රට ඇතුළේ ක්‍රියාත්මක වුණා වෙනත් රටවලින් වාහන ආනයනය කරද්දී ඒ තක්සේරු වාර්තා සහ වෙනත් වාර්තා දෙන ආයතනයක් වන Bureau Veritas කියන ආයතනය. මෙන්න මේ Bureau Veritas කියන ආයතනය අපි ජපානයෙන් වාහන ආනයනය කිරීමේදී තක්සේරු වාර්තා සහ වෙනත් ඇගැයීම් වාර්තා ලබා දීමට අදාළව නීතිගත කිරීමක් තමයි අපි 2428/07 කියන අති විශේෂ ගැසට් පත්‍රය ඇතුළේ සිද්ධ කළේ.

ඊට අමතරව අපි ජපානයෙන් වාහන ආනයනය කිරීමේදී පසුගිය කාලයේ මුහුණ දුන්න තවත් ගැටලුවක් තිබුණා. ඒ තමයි, ඒ ලේඛනවල යම්කිසි අඩු පාඩුවක් තිබුණා නම්, එහෙම නැත්නම් ඒ නිවැරදි තොරතුරු ලබා ගැනීමේදී යම්කිසි ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දුන්නා නම් නැවත අපිට ඒ documents ජපානයට, එහෙමත් නැත්නම් ඒ රටටම යවලා යම්කිසි verification, එහෙම නැත්නම් confirmation ලබා ගැනීමක් කර ගැනීමට සිද්ධ වීම. මේක ක්‍රමවත් කිරීමේ අරමුණින්, වෙනස් කිරීමේ අරමුණින් courier service එකක යවනවා වෙනුවට විශේෂයෙන්ම inspection report එකේ යම්කිසි ගැටලුවක් තිබුණා නම් අර මම කලින් සඳහන් කළ ආයතන තුළ websitesවලට log in වෙලා අදාළ තොරතුරු නිවැරදි කර ගන්න, අදාළ තොරතුරු ලබා ගන්න අවශ්‍ය පහසුකම් අපි දැන් හදලා තිබෙනවා. ඒ ආයතන මගින් හදපු පහසුකම් ටික අපිට ලබා ගන්න අවශ්‍ය නීතිමය අවශ්‍යතාව මේ හරහා සම්පූර්ණ කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි බැංකු-බැංකු අතර විශේෂයෙන් ණයවර ලිපිවලට අදාළ තොරතුරු හා වෙනත් කටයුතු සිදු කරද්දී customer verification සම්බන්ධව, එහෙම නැත්නම් ජපානයේ එම අපේ රටට වාහන අපනයනය කරන ගනුදෙනුකරුගේ වෙන්නට පුළුවන්, එහෙම නැත්නම් එම සපයන්නාගේ වෙන්න පුළුවන්, ගැටලුවක් අපිට තිබුණොත්, පසුගිය කාලයේ තිබුණු තත්ත්වය වෙනස් කරලා අපට දැන් පුළුවන්, ඒ බැංකුවේ website එකට, නැත්නම් එම බැංකුවේ network එකට සම්බන්ධ වෙලා මේ රටේ ඉඳන් customer verification system එකක් හරහා ඒ තොරතුරු ලබාදීම සිද්ධ කර ගන්නට.

ඔන්න ඔය ආකාරයෙන් ගත්තාට පස්සේ, අපි වාහන ආනයනය ක්‍රමවත් කිරීමට අදාළව නවීන තාක්ෂණය භාවිත කරනවා; ඒ වාගේම, වාහන ආනයනකරු යම් අපහසුතාවකට පත් නොවන ආකාරයෙන් ඒ කටයුතු ඉක්මනට සිදු කර ගන්න අවශ්‍ය පහසුකම් ද මේ වන විට සලසා තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් පුළුල් ලෙස කථා කරන්නේ නැහැ. නමුත්, මූලික කාරණාව ඒකයි.

ඊට අමතරව, මෙහි දෙවැනි කාරණාවේ සිට අද සංවාදයට ලක් කරන්න බලාපොරොත්තු වන කාරණා සම්බන්ධයෙන් අදාළ උපුටා දැක්වීම් ද සහිතව මා අදහස් දක්වන්නම් .

ගරු කථානායකතුමනි, 2023 අංක 34 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනය යටතේ, ගබඩා අත්තිකාරම්, වෙළෙඳ හා නිෂ්පාදන අත්තිකාරම්, විශේෂ අත්තිකාරම් සහ අත්තිකාරම් "බී" ගිණුම් සඳහා 2024 වර්ෂයට අදාළව සීමාවන් නියම කර ඇති අතර, අදාළ වර්ෂය තුළදී උද්ගත වන අවශ්‍යතා අනුව නියමයන් මගින් විසර්ජන පනත යටතේ ලබා දී ඇති අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය කිරීමට මුදල් අමාත්‍යවරයාට 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8වන වගන්තියේ විධිවිධාන මගින් බලය පැවරී

[ගරු තිළිණ සමරකෝන් මහතා]

ඇත. එසේ සිදු කරන ලද සීමා සංශෝධනය ඊළඟ වර්ෂයේ -ඒ කියන්නේ, 2024 වර්ෂයට අදාළව කරපු ගනුදෙනු 2025 වර්ෂයේ හෙවත් මේ වර්ෂයේ- මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය. මෙම සීමාවන් -අද සාකච්ඡාවට ලක් කරන මෙම සීමා සංශෝධනයන්- වලංගු වන්නේ 2024 වර්ෂය සඳහා පමණක් වේ.

එකී සංශෝධන මොනවාද කියන එක මම මේ ගරු සභාවට දැන් ඉදිරිපත් කරන්නම්. ඉන් පළමුවැනි සංශෝධනය මෙකයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 150 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අළෙවියට අදාළ අත්තිකාරම් ගිණුමට ලබාදෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 20,000 සිට රුපියල් මිලියන 8,500 දක්වා අඩු කර තිබෙනවා. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 2,700 සිට රුපියල් මිලියන 2,650 දක්වා අඩු කර තිබෙනවා. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 140 සිට රුපියල් මිලියන 160 දක්වා වැඩි කර තිබෙනවා. ශ්‍රී ලංකා රේගුවේ, අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 8 සිට රුපියල් මිලියන 16 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ, විවිධ අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ 15 සිට රුපියල් ලක්ෂ 4 දක්වා අඩු කර තිබෙනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව, දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 2,500 සිට රුපියල් මිලියන 3,000 දක්වා වැඩි කර තිබෙනවා. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට අදාළව, රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුමට ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 200 සිට රුපියල් මිලියන 50 දක්වා අඩු කර තිබෙනවා. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ, රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුමට අදාළව ලබා දෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 400 සිට රුපියල් මිලියන 350 දක්වා අඩු කර තිබෙනවා. ඒ වාගේම, රජයේ නිලධාරින්ට අදාළ අත්තිකාරම් ගිණුමත් අපි යම් යම් සංශෝධනයන්ට ලක් කර තිබෙනවා.

ඔන්න ඔය විධියට ගත්තාට පස්සේ කරුණු කාරණා කිහිපයක් අද දිනයේදී අපේ සංවාදයට ලක් කරන්නට සූදානම් වෙලා ඉන්නවා. මේක ඇතුළේ මුලින්ම සඳහන් කරපු වාහන මෙරටට ගෙන්වීමට අදාළව අප කරපු සංශෝධනයන් මෙන්න මේ කියන්නට යන කාරණා අදාළ කරගෙන තමයි අපි සිදු කර තිබෙන්නේ. එකක් තමයි, විශේෂයෙන්ම වාහන ආනයනයේදී ක්‍රමවත් සැලසුමක් ඉදිරිපත් කරලා වාහන ගෙන්වා ගැනීම. මොකද, පසුගිය කාලයේ ගැටලු ඇති වුණු ඒවා courier සේවයක් හරහා return කරලා නැවත ලංකාවට එනකල් යම්කිසි කාලවකවානුවක් අපේ ආනයනකරුට බලාගෙන ඉන්න සිදු වෙලා තිබෙනවා. ඒකට සැලකිය යුතු කාලයක් ගත වෙනවා. දැන් අපි ඩිජිටල් - online - ක්‍රමවේද හරහා ඒ පහසුකම් ටික වෙනස් කරලා තිබෙනවා, ආනයනකරුට අවශ්‍ය පරිදි ක්ෂණිකව සහ ඉක්මනින් ලබා ගැනීම සඳහා. ඒ හරහා අප බලාපොරොත්තු වන එක කාරණයක් තමයි, ආනයනකරුට යම්කිසි පහසුකම් ප්‍රමාණයක් සැලසීම. තවත් එකක් තමයි, ජාත්‍යන්තර වෙළෙඳාම පුළුල් කිරීම. විශේෂයෙන්ම අපේ රටේ ජනතාවට මේ හරහා ජපානයෙන් ඉක්මනින් වාහන ගෙන්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව පුළුල් කර තිබෙනවා.

තවත් කාරණයක් තමයි, රටට ලැබෙන බදු ආදායම. ඒ කියන්නේ, වාහන ආනයනය කිරීම මඟින් රටට ලැබෙන බදු ආදායම මේ හරහා සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය කර ගන්න අපට පුළුවන්. ඔන්න ඔය වාගේ කාර්යයන් කිහිපයක් අප කරපු මෙන්න මේ වෙනස්කම් එක්ක කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් අපේ රජය පත් වුණාට පසුව පසු ගිය කාලයේ අප නිතරම කථා බහට ලක් කරපු කාරණයක් තමයි, digitalization. ඉතින් අපි එය මේ තුළින් ද සිදු කර තිබෙනවා. වාහන ආනයනයේදී digitalized system එකක් හරහා, එහෙම නැත්නම් websites හරහා සිදු කරන්නේ ඊට අදාළ තවත් කටයුත්තක්. වාහන ආනයනකරු යම්කිසි අපහසුතාවකට පත් වෙනවා නම් එය මේ හරහා මඟ හරවා ගන්න අපට පුළුවන්. ඉතින් system change එක කියලා අප බලාපොරෙත්තු වෙච්ච කාරණා එකින් එක මේ හරහාත් සිදු වෙමින් තිබෙනවා.

ඒ වාගේම, අත්තිකාරම් ගිණුම්වලට අදාළව සිදු කරන වියදම් සම්බන්ධයෙන් යම් යම් සීමා පැනවීමේ, එහෙම නැත්නම් සීමා වැඩි දියුණු කර ගැනීමේ අවශ්‍යතා පැන නැඟිලා තිබෙන්නේත්, යම්කිසි අරමුණක් ඇතිවයි; යම්කිසි ඉලක්කයක් ඇතිවයි. විශේෂයෙන්ම වංචා, දූෂණ නැවැත්වීමට උපරිමව ක්‍රියාමාර්ග ගන්නා ආණ්ඩුවක් විධියට, එහෙම නැත්නම් වංචාව, දූෂණය, අල්ලස වැළැක්වීමට කටයුතු කරන්න බැඳිලා ඉන්න ආණ්ඩුවක් විධියට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වෙන් කර තිබුණු රුපියල් මිලියන 50, රුපියල් මිලියන 150 දක්වා වර්ධනය කරන්නත් හේතුවක් තිබෙනවා. පසුගිය කාල වකවානුවේදී රට තුළ සිදු වුණු අල්ලස් ලබා ගැනීම, අල්ලස් ලබා ගැනීමට අදාළ කාරණා හරියටම විශ්ලේෂණය කර බැලුවාම, හරියටම සොයා බැලුවාම පෙනෙනවා, සමහර ඒවාට අදාළව රුපියල් මිලියන 50ක් ප්‍රමාණවත් නැති බව.

සමහර නිලධාරින්, වෙනත් යම් යම් පුද්ගලයන් ඊට එහා මුදලක් අල්ලස් වශයෙන් ගත්තු අවස්ථාවලට උදාහරණ තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ අතට ලබා දෙන මුදල, ඒ කියන්නේ අල්ලස් ගන්න පුද්ගලයන් හසු කර ගන්න අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හරහා විශාල මුදලක් ලබා දෙන්න වෙනවා. ඒ නිසා තමයි අපි ඒ මුදල වැඩි කරලා තිබෙන්නේ. ඒ මුදල ආපහු රජයට ලබා දෙන්න ඕනෑ. රුපියල් මිලියන 50කින් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් අල්ලසක් ගන්න බලාපොරොත්තු වන කෙනෙකුට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මැදිහත් වෙලා ඒ අවශ්‍ය මුදල ලබා දීම සිදු වනවා. ඒ මුදල නැවත රජයට ලබා ගන්නවා. නමුත් ඒ සඳහා යම්කිසි මුදලක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතුව තිබෙන්නට ඕනෑ. ඉතින් ඒ නිසා තමයි ඒ ගණන මේ විධියට -රුපියල් මිලියන 50 සිට 150 දක්වා- වැඩි කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, රජයේ මුදල් ක්‍රමවත් ලෙස ආයෝජනය කිරීමේ අවස්ථාවක් විධියට විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය ඇතුළේ දරුවන්ට පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා පසුගිය කාල වකවානුව ඇතුළත රුපියල් මිලියන 20,000කට ආසන්න ප්‍රමාණයක් වියදම් කර තිබෙනවා. අපි එය රුපියල් මිලියන 8,500 දක්වා අඩු කර තිබෙනවා. සමහර කෙනෙකුට හිතෙන්න පුළුවන් මෙය අධ්‍යාපනයට කරන වියදම් යම්කිසි ආකාරයකින් අඩු කිරීමක් ද කියලා. නැහැ, මේ එහෙම දෙයක් නොවෙයි. තාක්ෂණය හරහා යම් යම් ක්‍රමවේද භාවිත කිරීම, පසුගිය කාල වකවානුවේ ජාත්‍යන්තර වෙළෙඳ පොළේ කඩදාසි මිලෙහි යම්කිසි පහළ වැටීමක් සිදු වීම, ඩොලරයේ අගය යම්කිසි පහත වැටීමක් සිදු වීම ආදියට සාපේක්ෂව තමයි රජයේ

මුදල් හොඳම විධියට කළමනාකරණය කිරීමේ අරමුණින් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා වෙන් කරලා තිබුණු, එහෙමත් නැත්නම් ප්‍රචාරක කටයුතු සඳහා වෙන් කරලා තිබුණු මුදල රුපියල් මිලියන 20,000 සිට රුපියල් මිලියන 8,500 දක්වා අඩු කර තිබෙන්නේ.

ඒ වාගේම, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගබඩා අත්තිකාරම් ගිණුම රුපියල් මිලියන 2,700 සිට රුපියල් මිලියන 2,650 දක්වා අඩු කරලා තිබෙනවා. ඒ, විශේෂයෙන් ආයුධ ගබඩාවලට අදාළවයි. ඒ අනුව ආණ්ඩුව විසින් නාවික හමුදාවේ ඒ ගබඩා පවත්වාගෙන යෑම සඳහා දිය යුතු අත්තිකාරම් මුදල රුපියල් මිලියන 2,700 සිට රුපියල් මිලියන 2,650 දක්වා රුපියල් මිලියන 50කින් අඩු කරලා තිබෙනවා. පසුගිය කාලයේ එවැනි වියදම් වැඩි වෙන්න හේතුවක් තමයි, නොයෙක් පුද්ගලයන් -විශේෂයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන්; ඇමතිවරුන් වෙන්න පුළුවන්- තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාව මත අවි ආයුධ භාවිත කිරීම. ඔවුන් තමන්ගේ ආරක්ෂාවට අදාළව අවි ආයුධ භාවිත කිරීමේදී මෙම අවි ගබඩා හරහා ඔවුන්ට අවි ලබා දෙන්න සිදු වෙලා තිබෙනවා. නමුත් දැන් අපි අලුත් දේශපාලන සංස්කෘතියක් බිහි කරලා තිබෙනවා. ඒ දේශපාලන සංස්කෘතිය ඇතුළේ මෙවැනි අවි ආයුධ පෞද්ගලිකව තමන්ගේ ආරක්ෂාවට භාවිත නොකරන රාජ්‍ය පාලකයන් පිරිසක් අපි බිහි කරලා තිබෙනවා. ඒ වාගේ කාරණා පදනම් කරගෙන තමයි රට ඇතුළේ මෙන්න මේ කාරණා සඳහා වන වියදම් අඩු වීම, එහෙම නැත්නම් අත්තිකාරම් ගිණුම් හරහා මුදල් වෙන් කිරීම අඩු වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම රුපියල් මිලියන 140 සිට රුපියල් මිලියන 160 දක්වා වැඩි කර තිබෙනවා. ඒ කියන්නේ, බන්ධනාගාර ඇතුළේ ඉන්න රැඳවියන්ගේ යම් යම් නඩත්තු කාරණා සඳහා, ඔවුන්ගේ නඩත්තු වියදම් සඳහා වෙන් කළ යුතු මුදල අපි රුපියල් මිලියන 20කින් වැඩි කර තිබෙනවා. විශේෂයෙන්ම අපි ඒ රජයේ නිලධාරින් එක්ක කරපු සාකච්ඡාවත් එක්ක බැලුවාම, මත්ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත වෙනත් කටයුතු සඳහා රැඳවියන් බවට පත් වන පිරිස දිනෙන් දින වැඩි වෙනවා. ඒවාත් එක්ක ඔවුන්ගේ නඩත්තුව සඳහා යම්කිසි මුදලක් වැඩිපුර වෙන් කරන්න සිදු වෙලා තිබෙනවා. ඊට අමතරව, රස පරීක්ෂකවරුන් වෙන්න පුළුවන්, ඒ ආශ්‍රිත කටයුතු සිදු කරන වෙනත් නිලධාරින්ගේ හිඟය නිසා මෙවැනි තත්ත්වයක් පැන නැඟිලා තිබෙනවා. ඉතින් රජය විධියට අපි බලාපොරොත්තු වෙනවා, එම රැඳවියන් සංඛ්‍යාව අඩු කිරීම සඳහා යම්කිසි කටයුතු ප්‍රමාණයක් ඉදිරියේදී ඉක්මනින්ම සිදු කර ගන්න. නමුත් දැන් තිබෙන තත්ත්වය යම්කිසි විධියකට පාලනය කරලා ඒ රැඳවියන්ට යම්කිසි යහපත් සුබසාධන පහසුකම් ටිකක් ලබා දීම සඳහා මෙම රුපියල් මිලියන 20 වැඩි කරන්න අපට සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම, සැලකිය යුතු තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අත්තිකාරම් -අමතර කොටස්- ගිණුම රුපියල් මිලියන 2,500 සිට රුපියල් මිලියන 3,000 දක්වා වැඩි කර තිබෙනවා. මොකද, දුම්රිය සේවය ආශ්‍රිත ප්‍රවාහන කටයුතු සිදු කරද්දී, ඒ ආශ්‍රිතව දෛනිකව පැන නඟින ගැටලු තිබෙනවා. අමතර කොටස් මිල දී ගැනීමේදී පැන නඟින ගැටලු තිබෙනවා. ඉතින් රට ඇතුළේ හොඳ ප්‍රවාහන ක්‍රමයක් පවත්වා ගෙන යන්නට නම්, මේ උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රමාණවත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුමේ තිබෙන්නට ඕනෑ.

ඒක නිසා ඒ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. ඒ හරහා අපි බලාපොරොත්තු වෙනවා, ගැටලුවකින් තොරව හොඳ දුම්රිය ප්‍රවාහන සේවයක්, හොඳ දුම්රිය ප්‍රවාහන ක්‍රමයක් රට ඇතුළේ ස්ථාපිත කරන්න. ඔන්න ඔය විධියට නොයෙකුත් ක්ෂේත්‍ර පිළිබඳ සලකා බලා තමයි මේ වියදම් ප්‍රමාණය වෙනස් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල සංශෝධන සිද්ධ කරලා තිබෙනවා. ඒක ඇතුළේ ඔවුන්ගේ පහසුකම්වලට, වැටුප් අත්තිකාරම්වලට, විශේෂයෙන් ආපදා ණයවලට යම්කිසි මුදල් ප්‍රමාණයක් වැඩි කරලා තිබෙනවා. ඒ සඳහා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් වැඩි කරලා තිබෙනවා. ඔන්න ඔය කාරණා කිහිපය ගැන තමයි අද අපට සාකච්ඡා කරන්න තිබෙන්නේ. මේ කරුණු සාකච්ඡා කරන ගමන් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සහ රටේ මහජනතාවට මම පණිවුඩයක් ලබා දෙන්න කැමතියි. ආණ්ඩුව system change එකකට, එහෙම නැත්නම් ක්‍රම වෙනසකට සූදානම් වෙලා, මේ ක්‍රම වෙනස ඇතුළේ සිද්ධ කරන කටයුතු තමයි මේ හරහා ඔබට බලන්නට තිබෙන්නේ; දකින්නට ලැබෙන්නේ. ඒ නිසා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, මේ ආණ්ඩුව බොරු කියනවා, පව කියනවා වැනි අදහස් සමාජයට ඉදිරිපත් කරනවා වෙනුවට, අපි රටේ ආර්ථිකය වෙනස් කරන්නේ කොහොමද, අපි රටේ system change එක ගන්නේ කොහොමද කියන කාරණා මේ දත්ත, තොරතුරු මත හරියට විශ්ලේෂණය කරලා කරුණු, කාරණා ඉදිරිපත් කරන්න කියලා. ඔන්න ඔය විධියට අද මේ කරුණු පිළිබඳ අපි හොඳ විධියට සංවාද කරමු; විවාද කරමු. අපි මේකට අදාළ කරුණු ඉදිරිපත් කරමු. දත්ත, තොරතුරු මත පදනම් වෙලා ඉතා හොඳ විධියට මේ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම කරමු. පසුගිය දවස් දෙකේ මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ රටේ තිබෙන ලුණු ප්‍රශ්නය ගැන විතරක් කථා කරනවා අපි දැක්කා. ආර්ථිකය ගැන අපි විවාද කරද්දී ඔවුන් උත්සාහ කළේ ඒ කථාව විතරක් කියන්නයි.

අපි මෙන්න මේ කාරණා හොඳ සංවාදයකට භාජන කරමු; හොඳ විවාදයකට ලක් කරමු. තොරතුරු මත පදනම් වෙලා, එහෙම නැත්නම් අපි ඉදිරිපත් කළ කරුණු මත පදනම් වෙලා ආර්ථිකය හොඳ විධියට වෙනස් කරන්නේ කොහොමද, මේ ආර්ථිකයේ turn එක ගන්නේ කොහොමද කියන කාරණා පිළිබඳ අපි සලකා බලමු. ඒ කාරණා යහපත් විධියට සලකා බැලීම සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මගේ පැත්තෙන් කරනවා.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අදාළ සංවාදය සහ අත්තිකාරම් ගිණුම්වලට අදාළව සංවාදය කිරීම අපි අද දිනය තුළ පාර්ලිමේන්තුව ඇතුළේ වඩා හොඳ විධියට කරලා ඒවාට අදාළ අනුමැතිය මේ සභාව තුළින් ලබා ගනිමු කියන අදහස සියලු දෙනාට ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Rauff Hakeem. You have 14 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.10]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අද මෙම විවාදය ආරම්භ කළේ පසුපෙළ මන්ත්‍රීවරයෙක්. එතුමා ඉතාම හොඳට මේ රෙගුලාසි පිළිබඳ විග්‍රහයක් කළා. එතුමාට ප්‍රශංසා කරන අතර, මට ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ අවධානයට යොමු කළ යුතු කාරණාවක් තිබෙනවා. විශේෂයෙන් අපි මේ සභාව තුළ තිබෙන සම්ප්‍රදායයන් රැකිය යුතුයි. මෙවැනි වැදගත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනකොට අදාළ අමාත්‍යතුමා නැත්නම් නියෝජ්‍ය අමාත්‍යතුමා ඒවා ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් සභානායකතුමා. එහෙම නැත්නම් ඒ සඳහා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා, අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා. විධායකය නියෝජනය කරමින් කවුරු හෝ මේ කාර්යය කරන්න ඕනෑ. නමුත් අද පසුපෙළ මන්ත්‍රීවරයෙකුට මේ කාර්යය භාර දීලා තිබෙනවා. එතුමා ඒක හොඳට කළා. ඒක වෙනම කාරණාවක්. නමුත් මෙහෙම කටයුතු කළාම අපට -විපක්ෂයට- යම් ප්‍රශ්නයක් අහන්න, වගකීම්සහගතව ඒ ප්‍රශ්නවලට උත්තර ලබා ගන්න බැරි වෙනවා.

අපි බලාපොරොත්තු වෙනවා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨයෝ මේ පිළිබඳව රජය දැනුවත් කරයි කියලා. හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින්. එතුමා කරන්න තිබුණු කථාවක් තමයි පසුපෙළ මන්ත්‍රීවරයෙකුට දුන්නේ. එහෙම නොකර, වගකීම් දරන කෙනෙක් මේවා ඉදිරිපත් කරන්න තිබුණා. අපට ඕනෑ ඒවා පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කරන්නයි. එතකොට අපට අවශ්‍ය දේවල් පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව යම් පැහැදිලි බවකින් ඉන්නවා. අපි කවුරුත් දන්නවා, මෑතකදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දූෂණ, වංචා පිළිබඳව - corruption vulnerabilities පිළිබඳව - විගණනය කිරීම පිළිබඳව ඒගොල්ලන්ගේ නියම කිහිපයක් පිළිබඳව කියා තිබෙනවා. මේ රජයට ඒ පිළිබඳව තිබෙන බලාපොරොත්තුව, ඒකට ජනතාව දුන් ජනවරම අපි ආරක්ෂා කළ යුතුයි. මෑතකදී ලෝක බැංකුවෙන් ඩොලර් බිලියනයක ණය ආධාරයක් ලබා දීලා තිබෙනවා. දීර්ඝ කාලයකට පස්සේ ප්‍රථම වතාවට මෙවැනි විශාල මුදලක් රජයට ලබා දීලා තිබෙන්නේ දූෂණයෙන් තොරව ඒ මුදල් පරිහරණය කරන්න මේ රජය කටයුතු කරයි කියන විශ්වාසයෙන්. ඒක අපි අගය කරනවා. නමුත්, අද මම මේ කාරණාව පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසිත් අනුමැතිය සඳහා අද ඉදිරිපත් කරලා තිබෙනවා. අද "The Morning" පත්තරේ පළ වෙලා තිබෙන ලිපියකට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

It sates, I quote:

"Indian salt shipment arrives

A shipment of salt imported from India was set to arrive in Sri Lanka yesterday (21) night, as part of efforts to address the current salt shortage in the country, the Minister of Trade, Commerce and Food Security Wasantha Samarasinghe said.

Samarasinghe confirmed that the consignment includes a total of 3,050 metric tonnes (MT) of salt. Of this, 250 MT have been imported by the private sector, while the remaining 2,800 MT were brought in by the State-run National Salt Company."

මෙතැනින් තමයි පූසා මල්ලෙන් එළියට පනින්නේ. රජයේ සංස්ථාව ඉන්දියාවෙන් ලුණු ආනයනය කිරීමට මුලින්ම import bill එක සකස් කරලා ඉවරයි. නමුත් ඊට පස්සේ තමයි පෞද්ගලික ක්ෂේත්‍රයට ආනයනය කරන්න ඉඩ ලැබෙන්නේ. දැන් මේ රටේ ලුණු මාෆියාවක් හැදිලා තිබෙනවා. මේ ලුණු මාෆියාව හැදෙන්න කවුරුන් හෝ යම්කිසි උත්තේජනයක් ලබා දෙනවාද, ලබා දීලා තිබෙනවාද? ඒ ගැන හොයලා බලන්න ඕනෑ. ඒ ක්‍රමයට විරුද්ධව තමයි මේ රටේ ජනතාව මේ රජයට විශාල ජනවරමක් ලබා දුන්නේ. නමුත් ඇති වෙමින් යනවා, ලුණු මාෆියාවක්. ළඟදී දවසක ලුණු මාෆියාව පිළිබඳව ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා විවේචන කිහිපයක් ඉදිරිපත් කළා. පුත්තලමේ ලුණු නිෂ්පාදනය කරන්නේ Government එකයි, private sector එකයි දෙකම එකතුව වෙන්න පුළුවන්. ඒ සමහර පෞද්ගලික කොම්පැනිවල ඉන්න හාම්පුතුන් එහි කොටස් අරගෙන ඒකේ අධ්‍යක්ෂ මණ්ඩලයේත් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුත්තලම කියන්නේ මේ රටේ ලුණු නිෂ්පාදනයෙන් හරි අඩක් නිෂ්පාදනය කරන ප්‍රදේශයක්. නමුත් ඒ ප්‍රදේශයේ තිබෙන ලුණු දැන් වෙළෙඳ පොළේ නැහැ. චුවමනාවෙන්ම කවුරු හරි ඒ දේ කරනවාද? ඒ තුළින් ලුණු මාෆියාවට රජයේ කවුරු හරි උත්තේජනයක් ලබා දෙනවා ද? ඒකයි දැන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. දැන් ලුණු පැකට් එකක මිල රුපියල් 350යි; 130ට තිබුණු එක දැන් 350යි. නමුත් ආනයනය කරලා වැඩිම වුණොත් රුපියල් 150කට, නැත්නම් රුපියල් 200කට දෙන්න පුළුවන්. නමුත් එහෙම නොදී ජනතාව මත මෙවැනි විශාල බරක් පැටවීම පසුපස විශාල ලුණු මාෆියාවක් හැදිලා තිබෙනවා.

මෙහෙම ලුණු මාෆියාවක් ඇති වීමට මේ රජයත් වගකිව යුතුයි. දෙසැම්බර් මාසයේ ඉඳලා පුත්තලමේ ලුණු නිෂ්පාදකයෝ කිව්වා, ලුණු ආනයනය කරන්න කියලා. හැබැයි, ඒක පරක්කු කරමින් හිටියා. මේක තමයි හාල්වලටත් කළේ. හාල් හිඟයක් ඇති වෙනකල් හිටියාට පස්සේ ආනයනය කරන්න සිදු වෙනවා. ආනයනය කරනකොට ලයිසන් ක්‍රමයක් පාවිච්චි කරනවා. දැන් ලයිසන් ක්‍රමය නැති කරමු, අපි ලයිසන් රාජ්‍යය නැති කරනවාය කිව්වා. ඒක හොඳයි. දැන් ඔක්කොටම ආනයනය කරන්න ඉඩ දීලා තිබෙනවා. එහෙම ඉඩ දීලා තිබියදීත් මේ වාගේ දේවල් සිදු වීම පිළිබඳව අපි හොයා බලන්න ඕනෑ.

පුත්තලමේ ලුණු නිෂ්පාදනය පිළිබඳව ගත්තොත්, විශේෂයෙන්ම මේ රටේ ලුණු නිෂ්පාදනයෙන් හරි අඩක් එම ප්‍රදේශයේ තමයි නිෂ්පාදනය කරන්නේ. අපට ලුණු මෙට්‍රික් ටොන් දෙලක්ෂයක් අවුරුද්දකට අවශ්‍යයි. ඒකෙන් මෙට්‍රික් ටොන් ලක්ෂයක් පුත්තලම ප්‍රදේශයේ නිෂ්පාදනය වුණා. නමුත්, ලුණු නිෂ්පාදනයේ අඩුවීමක් වෙනකොට මොනවාද කරන්නේ? ලුණු නිෂ්පාදනය අඩුවීමට කාලගුණික තත්ත්වයන් බලපෑවා කියන එක අපි දන්නවා. එලෙස කාලගුණික තත්ත්වයන් බලපෑවත් මේ කටයුත්ත නිරීක්ෂණය කරන්නවත්, ඒ පිළිබඳව නිෂ්පාදකයන්ට වාගේම ඒ ක්ෂේත්‍රයේ ඉන්න අයට උපදෙස් ලබා දෙන්නවත් කිසිම රාජ්‍ය ආයතනයක් ඉදිරිපත් වෙන්නේ නැහැ. කවුරුවත් ඒ වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ නිසා අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. ඒ පිළිබඳව තිබෙන දත්ත හොයලා කල් සිටම මෙවැනි දේවල් සිදු වන බව දැනගෙන ඒවාට පිළියම් යොදන්න ඕනෑ. එහෙම නොකරන තත්ත්වයක් මත තමයි මේ වාගේ විශාල හිඟයක් රට තුළ ඇති වෙලා තිබෙන්නේ. මෙය අභාග්‍ය සම්පන්න තත්ත්වයක්. මොකද, මේ රට වටා මුහුද තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ ලුණු නිෂ්පාදනය මේ වාගේ පහත වැටීමක් සිද්ධ වෙලා තිබෙනවා නම් එය විශාල ඛේදවාචකයක්. එයට හේතුව මේ මාෆියාකරුවන් හදන ප්‍රශ්නය. මාෆියාකරුවන් කල් සිටම මේ ප්‍රශ්නය දකිනවා. ඔවුන්

කල් සිටම මේ ප්‍රශ්නය දැකලා, බලවතුන් පස්සේ ගිහිල්ලා යම් යම් දේවල් කර ගන්නවා. අපි දන්නවා, එහෙම සමහරු ඉන්න බව. එවැනි අය හම්බන්තොටත් ඉන්නවා. දැන් නැගෙනහිරත් ඉඩම් අල්ලා ගෙන ඉන්නවා. පුත්තලම පැත්තෙත් දැන් Corporation එකට ඇතුළු වෙලා කොටස් අරගෙන සම්පූර්ණයෙන්ම ඒවා පාලනය කරනවා. කලින් මේවාට කෝටා ලබා දෙනකොටත් විවිධ companies "East", "West", "South" කියලා නම් දමාගෙන එක පුද්ගලයෙක් ඔක්කොටම කෝටා ලබා ගන්නවා. ඒ නිසා විශාල හිඟයක් ඇති වීමේ තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ගැන හරියට හොයලා බලන්න ඕනෑ. මේ පිළිබඳව කළ යුතු දේවල් මොනවාද කියලා කල් සිටම දැනගෙන ඒවාට පිළියම් යොදන්න ඕනෑ.

So, it is important, Hon. Deputy Speaker, that this shortage of salt is solved in the proper way. I feel that when a particular person in the private sector controls one sector, there is a conflict of interest. Therefore, we must make sure that there is proper regulation in place; there has to be a regulatory authority looking into it. In the past, we had price control on all items. We have moved away from that concept. But, the Government's fair trading principles must be properly monitored. So, that is why we have government institutions set up to look into it. But, unfortunately, with all that and having warned from last December onwards about an impending shortage of salt in the country, the Government was very slow in taking action and finally resulted in the salt mafia controlling the price of salt in the market. And, who is behind this salt mafia? Is the Trade Ministry aware of that? Are the Trade Ministry's officials knowingly assisting this mafia?

Particularly, when I see this news item, it is quite apparent that from Bombay a salt shipment had started and has arrived here already. But, it is only a small fraction that the private sector can import. A large fraction is imported by the State sector. We know that the State Trading (General) Corporation is used as a ploy, as a cover to cover up corruption. It had been done by past administrations also, in which we were also part of and we had been speaking up in the Cabinet. The relevant Ministers have to be careful. In Ministries like the Ministry of Trade and the Ministry of Finance, there are bureaucrats who are corrupt. That is another problem. Getting rid of corruption is not only on politicians. What about bureaucrats? Bureaucrats are also to be blamed; they, too, are involved in this type of action, which finally results in the poor general public having to suffer, paying a heavy price for a very simple item like salt.

Sir, I would also like to mention this.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, புத்தளம் பிரதேசத்திலுள்ள உப்பு உற்பத்தியாளர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாகவும் உப்பளப் பிரச்சினை சம்பந்தமாகவும் நான் ஏற்கனவே ஓர் ஒத்திவைப்புவேளைப் பிரேரணையில் கூறியிருக்கிறேன். புத்தளத்திலுள்ள உப்பளச் சங்கத்தினர் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பூர்வீகக் காணிகளில் மேற்கொண்டுவந்த உப்பு வியாபாரத்தைத் தடுக்க வேண்டும் என்பதற்காக, அவர்களை அங்கிருந்து அகற்ற வேண்டும் என்பதற்காக திட்டமிட்டு சில காணிகளை அரசாங்கம் அபகரித்துக் கொண்டது. அதுமட்டுமல்ல, நீண்ட காலமாக அவர்கள் பாவித்துவந்த அந்தக் காணிகளைத் தனியாருக்குக் கொடுப்பதற்காக கடந்த அரசாங்க காலத்தில் சில விடயங்கள் மேற்கொள்ளப்பட்டன. இது இன ரீதியான ஒரு பாகுபாடாகவும் அந்தப் பிரதேச மக்களால் பார்க்கப்பட்டது. இந்த விவகாரங்கள் இன ரீதியாக அணுகப்படக் கூடாது என்று பேசுகின்ற இந்த அரசாங்கம், புத்தளம் பிரதேச செயலகத்தினூடாகக் கையகப்படுத்தி வைத்திருக்கின்ற புத்தள உப்பளச் சங்கத்தினர் பயன்படுத்திய காணிகளை அச்சங்கத்தின் உறுப்பினர்களுக்கு மீளப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அதாவது, அந்தக் காணிகளுக்கான permitஐ - உத்தரவுப் பத்திரத்தை - பெற்றுக்கொடுப்பதன்மூலம் அந்தக் காணிகள் மீளக் கையளிக்கப்பட வேண்டும். இது இந்த உப்புப் பிரச்சினைக்கான தீர்வின் ஓர் அங்கமாகவும் அமையும்.

அடுத்து, இன்று புத்தளத்தில் இருக்கின்ற களப்பிலுள்ள நீரின் உவர்த்தன்மை வெகுவாகக் குறைவடைந்து வருகின்றது. ஏனென்றால், வேறு நீர்நிலைகளிலிருந்து வருகின்ற நீர் அக்களப்பில் வந்து சேர்கின்றது. முன்னர் 1-3 சதவீதம் வரை இருந்த உவர்த்தன்மை இன்று 0.5-1 சதவீதமாகக் குறைவடைந்திருக்கின்றது. அதனால்தான் அங்கு உப்பு உற்பத்தியில் பாரிய பாதிப்பு ஏற்பட்டிருக்கின்றது. இதனை அங்கிருக்கின்ற அனைத்து உப்பள உரிமையாளர்களும் ஏற்கனவே அரசுக்குச் சொல்லியிருக்கிறார்கள். ஆனால், அது தொடர்பில் நடவடிக்கை எடுப்பதற்கு புத்தளத்தில் அதிகாரமுள்ள எவருமில்லை என்றும் அரசாங்கத்தினூடாக எந்தவிதமான உதவிகளும் வழங்கப்படுவதில்லை என்றும் குற்றச்சாட்டுகள் முன்வைக்கப்படுகின்றன. இவ்வாறு அங்கு பாரிய பிரச்சினைகள் இருக்கின்றன. இவற்றை எல்லாம் கவனத்திலெடுத்து, உப்புப் பிரச்சினைக்கு நிரந்தரமான ஒரு தீர்வைக் காண்பதற்கு இந்த அரசாங்கம் முன்வர வேண்டும்.

இன்று உப்பு வியாபாரத்தில் 'மாபியா' ஒன்று உருவாகியிருக்கின்றது. அந்த உப்பு மாபியாவுக்குப் பின்னால் அரசாங்கத்தின் அனுசரணையில் ஏதாவது இடம்பெறுகின்றதா? என்பதைப் பார்க்க வேண்டும். ஏன் காலம் தாழ்த்தி மும்பையிலிருந்து உப்பு இறக்குமதி செய்யப்பட்டது? இறக்குமதி செய்யப்பட்ட உப்பு மூடைகள் இன்று காலையில் வந்துவிட்டன. இன்று இந்த நாட்டுக்கு கிட்டத்தட்ட 4 மில்லியன் உப்பு மூடைகள் தேவையாக உள்ளது. ஆனால், இறக்குமதி செய்யப்பட்டிருப்பது வெறும் 6 இலட்சம் உப்பு மூடைகள்தான். இருந்தாலும், இதில் பாரிய ஊழல் நடந்திருக்கிறது. அந்த ஊழல் தொடர்பில் விசாரணை நடாத்தப்பட வேண்டும். யார் இந்தக் கம்பனிக்குச் சொந்தக்காரர்கள்? யார் இப்படியான விடயங்களைச் செய்கின்றார்கள்? என்பதைக் கவனிக்கவேண்டியது மிக முக்கியமானது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததே ஊழலை இல்லாமல் செய்வதற்குத்தான். எனவே, அரசாங்கம் இந்த ஊழல் சம்பந்தமாக ஆராய்ந்து, உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனப் பணிவாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Major General (Rtd.) Aruna Jayasekera.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට 2025-2026 සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සබැඳිව ප්‍රකාශයක් කරන්න තිබෙනවා. ඒ සම්බන්ධව මම කෙටියෙන් දන්වන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025

[ගරු අරුණ ජයසේකර මහතා]

මැයි 21වැනි දා වනවිට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට ප්‍රසිද්ධ දැන්වීමක් පළ කර තිබෙනවා. නමුත්, එහි වෛද්‍ය පීඨය සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීම සම්බන්ධ වගන්තිවල නිවැරදි කිරීමක් කළ යුතුව තිබෙනවා. ඒ අනුව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා සිසුන් බඳවා ගැනීමේදී මෙවර විදේශීය ශිෂ්‍යයන් හා කැඩෙට් නිලධාරින් සඳහා පමණක් අවස්ථාව ලබා දීමට රජය තීරණය කර තිබෙන බව මම සඳහන් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Handunnetti. You have 16 minutes.

[පූ.භා. 11.27]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි සාකච්ඡා කරන්නේ වාහන ආනයන බලපත්‍ර පරීක්ෂණ ආයතනවලට අවශ්‍ය පහසුකම් ලබා දීම ගැනයි. වාහන ආනයනයටත් වඩා දැන් ලුණු ආනයනය ප්‍රධාන මාතෘකාවක් වෙලා තිබෙනවා.

ඉතින් දවස් 3ක් ලුණු ගැන මේ පාර්ලිමේන්තුවේ කථා වුණා. මම හිතන විධියට, වැඩිම කාලයක් මේ පාර්ලිමේන්තුව ලුණු ගැන සාකච්ඡාවට ගත්ත කාලය මේක. මම දැක්කා Facebook එකේත් පළ වෙලා තිබුණා, "ඔබත් ලුණු වාගේ වෙන්න" කියලා; "තිබෙන වෙලාවට රසවත් වෙන්න, නැති වෙලාවට වුවමනාවක් ඇති කෙනෙක් බවට පත් වෙන්න" කියලා. ඒක දැන් ඒ තරමම ප්‍රශ්නයක්. ඇත්තටම හොයා බලනකොට, පවතින දේට වඩා වැඩි දෙයක් පෙන්වනවා, විපක්ෂය සහ මාධ්‍ය කිහිපයක්. රාජ්‍ය ව්‍යාපාර, ජනතාවගේ අත්‍යවශ්‍ය ව්‍යාපාර කඩා වැට්ටීම ව්‍යාපාරයක් බවට පත් කර ගත් මාධ්‍ය කිහිපයක් ඒක මෙහෙයවනවා. මම ඒ ගැන පසුව කථා කරන්නම්, ඉස්සර වෙලා අද න්‍යාය පත්‍රයේ තිබෙන මාතෘකාවට අදාළව කරුණු කිහිපයක් කියලා.

වාහන ආනයන බලපත්‍ර සම්බන්ධයෙන් කථා කරනකොට කියන්න ඕනෑ, ජපානයෙන් වාහන ආනයනය කරනකොට ඒ ආනයනය කරන වාහනවල තත්ත්ව පරීක්ෂණය සම්බන්ධයෙන් 2007 ඉඳලාම ආයතන කිහිපයක් ක්‍රියාත්මක වුණු බව. Bureau Veritas කියන ආයතනය වාහන ආනයන බලපත්‍ර පරීක්ෂණ ආයතනයක් ලෙස 2013 අප්‍රේල් 03 දිනැති 1804/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයට ඇතුළත් වෙලා නැහැ. අන්න ඒ ඇතුළත් වෙලා නැති ආයතනය දැන් හෝ ඒ කාර්යය සඳහා ඇතුළත් කරන්න කියලා සාකච්ඡාවක් ඇති වුණා, මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සහ ජපානයේ අදාළ ආයතන සමඟ. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් හැටියට තමයි වාහන ආනයනය කරද්දී, විශේෂයෙන් ජපානයෙන් වාහන ආනයනය කරද්දී ඒ වාහනවල තත්ත්ව බලපත්‍රය ඇතුළත් කිරීමේ ආයතනයක් බවට Bureau Veritas කියන ආයතනය ඇතුළත් කරන්න කියන තීරණය ගත්තේ. මේ අද අපි සාකච්ඡා කරන විෂයයන් අතර තිබෙන අංක 2428/07 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අදාළ පළමුවැනි කාරණය එයයි.

දෙවැනි කාරණය මොකක්ද? අපි ලංකාවට වාහනයක් ගෙන්වද්දී ලංකාවේ බැංකුවක් ඒ වාහන ගෙන්වන ආයතනය වෙනුවෙන් LC open කරනවා වාගේම ජපානයේ ඒ වාහන අපනයනය කරන ආයතනය වෙනුවෙන් ඒ රටේ බැංකුවකුත් LC open කරනවා. එතැනදී ඒ බැංකු දෙකේම නිල මුද්‍රාව තියන්න ඕනෑය කියලා ලේඛනවල තිබෙනවා. ඒ නිල මුද්‍රාවත් ඇතුළුව තත්ත්ව සහතිකය වාගේ තවත් සහතික විශාල ප්‍රමාණයක් නිකුත් කිරීමට මාර්ගගත - online - ක්‍රමයට පහසුකම් සැලසීම තමයි මේ අති විශේෂ ගැසට් නිවේදනයට අදාළ දෙවැනි කාරණය. මම හිතන විධියට මේ කාරණා දෙක සම්බන්ධයෙන් විපක්ෂයට තර්කයක් නැහැ; විරුද්ධ වෙන්න කිසිම හේතුවක් නැහැ. ඒ නිසා තමයි ලුණු ගැන කියන්න ගත්තේ. ඇත්තටම ඔවුන් ඒකට ලුණු දැම්මා. වාහන ආනයනය කිරීම පිළිබඳව ගැසට් නිවේදනයේ තිබෙන කාරණයට හකීම් මන්ත්‍රීතුමා ලුණු දැම්මා. කමක් නැහැ, ඒකත් හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. අපි අත්තිකාරම් ගිණුමේ සීමා ඉහළ පහළ දැමීමක් කරනවා. මොකද රජයේ දෙපාර්තමේන්තුවල තිබෙන අතිශය වැදගත් දෙයක් තමයි, අත්තිකාරම් ගිණුමෙන් කරන කටයුතු. විශේෂයෙන්ම රජයේ නිලධාරින්ට අත්තිකාරම් "බී" ගිණුමෙන් ලබා දෙන ආපදා ණය සීමා අපි ඉහළ දමනවා. ඒ වාගේම උත්සව අත්තිකාරම් දීමනා ඉහළ දමනවා. රජයේ දෙපාර්තමේන්තුවල කාර්යක්ෂමතාව ඇති කරද්දී ඇතිවන විශාල ප්‍රශ්නයක් තමයි, අත්තිකාරම් ගිණුම්වල සීමාව. අද සිදු කරන වෙනස්කම්වලින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ පුපුරණ ද්‍රව්‍ය හා සම්බන්ධ ගබඩා අත්තිකාරම් ගිණුමේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුමේ, රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුමේ වෙනස්කම් කිහිපයක් යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම වාණිජ පදනමක් මත මෙළෙඳාම් කටයුතු සිදු කරන දෙපාර්තමේන්තු තිබෙනවා. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුමක් තිබෙනවා. ඒ වාගේම පැලවත්තේ අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට තිබෙන ග්‍රන්ථ ප්‍රකාශන කටයුතු සිදු කරන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අළෙවිය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුමක් තිබෙනවා. මෙවැනි වාණිජමය කටයුතුවලදී භාවිත කරන අත්තිකාරම් ගිණුම්වල සීමාව ඉහළ පහළ දැමීමක් අද අපි මේ සංශෝධනවලින් කරනවා. විශේෂ අත්තිකාරම් ගිණුම, හදිසි ආපදා -අනපේක්ෂිත- තත්ත්වයන්ට වියදම් දැරීමේ ගිණුම, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ විවිධ අත්තිකාරම් ගිණුම, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළව අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම තිබෙනවා. යම්කිසි සිද්ධියක් සම්බන්ධව වැටලීමක් කිරීමේදී එම කොමිෂන් සභාවේ නිලධාරින් ඒ අල්ලස දෙන්න සාමාන්‍ය මුදල් පාවිච්චි කරන්නේ නැහැ. අල්ලස් කොමිසමේ වැටලීම් අංශයක් තිබෙනවා. ඔවුන් ඒ සඳහා විශේෂයෙන් සලකුණු කරන ලද මුදල් තමයි දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය පුරුදු කරපු සංස්කෘතිය අනුව අල්ලස් වශයෙන් දැන් පුංචි ගණන් නොවෙයි ඉල්ලන්නේ, ලොකු මුදල් ඉල්ලනවා. ඒවා වටලන්න තමයි අපි දැන් යන්නේ. අපි ඒවා වටලන්න යනකොට අල්ලසට පොඩි ගණනක් දීලා හරියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 25,000ට අල්ලස් දෙන ක්‍රමය මේ අය 1977න් පසුව වෙනස් කළා. රුපියල් 25,000 දැන් 75,000 කරලා තිබෙනවා නම් මොකක්ද කරන්න ඕනෑ? අල්ලස් වැටලීම් සඳහා තිබෙන අත්තිකාරම් ගිණුමේ සීමාවත් වැඩි කරන්න ඕනෑ.

ඇයි? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දෙන මුදල් තමයි වැටලීම් අංශයෙන් ගෙනිහිල්ලා සැකකරුවන්ට දෙන්නේ. මේ සංශෝධනයෙන් අපි කරන්නේ, අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා

අත්තිකාරම් ගිණුමේ සීමාව වැඩි කරන එක. මොකද, දැන් ඇති කර තිබෙන සංස්කෘතිය අනුව පොඩි ගාණක් දෙන්න බැහැ, ලොකු ගණන් ඉල්ලන්නේ. ඉතින් මේ වැටලීම් කරන්නත් ඕනෑ ලොකු ගණන් ගෙනියලා. ඒකට තමයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ.

ඊළඟ එක, රේගු දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුම. මේවායේත් වෙනසක්ම් අපි අද කරනවා. ඒවා කරන්නේ වෙන මොකකටවත් නොවෙයි, පවතින රාජ්‍ය සේවය, රාජ්‍ය දෙපාර්තමේන්තුවල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා. ඒවා ගැන තමයි අද මේ විවාදය පවත්වන්නේ. මම හිතනවා, මේවා ගැන විපක්ෂයට විවාදයක් නැහැ කියලා.

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කිව්ව කාරණය හරි, කැබිනට් මණ්ඩලයේ කෙනෙක් මේක ඉදිරිපත් කරන්න ඕනෑය කියන කාරණය. ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා, මේ වාගේ කාරණා අපට එකඟ වෙන්න පුළුවන් කාරණා නම් විවාදයෙන් තොරව සම්මත කරලා වැදගත් මාතෘකාවක් විවාදයට ගනිමු කියලා. Parliamentary Business Committee එකේදී කථා කරලා මේවා විවාදයෙන් තොරව සම්මත කර ගනිමු. මොකද, මේවා ආණ්ඩුවේ සාමාන්‍ය කටයුතු නිසා විවාදයෙන් තොරව සම්මත කරන්න පුළුවන් දේවල්.

දැන් ලුණු කථාවක් කියනවා නේ. විෂය භාර ඇමතිවරයා හැටියට මමත්, වෙළෙඳ අමාත්‍යතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අපි මේකට මැදිහත් වුණා. අපි මේකට මැදිහත් වුණු කාල වකවානුව ගත්තොත්, අපි ආණ්ඩු බලය ගත්තේ සැප්තැම්බර් මාසයේ. දෙසැම්බර් මාසයේ තමයි මේ ලුණු ප්‍රශ්නය පැන නැඟුණේ. මේක ස්වාභාවික ක්‍රියාවලියක්. අපි ලුණුවලට කියන්නේ, "ස්වාභාවික ලුණු" කියලායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ක්‍රියාවලිය සිදුවෙන්නේ හිරු එළියයි, සුළඟයි, ජලයයි එක්ක. මේක පටන් ගන්නේ මෙහෙමයි. මුලින්ම කළපුවේ තිබෙන ලුණු සනත්වයක් සහිත -කාරම සහිත- වතුර ලියැදිවලට එකතු කරනවා. ඒ එකතු කරන සෝඩියම් ක්ලෝරයිඩ්වල percentage එක 24 දක්වා තිබෙන්න ඕනෑ. Percentage එක 24 දක්වා තිබෙන සෝඩියම් ක්ලෝරයිඩ් මාස තුනක්, හතරහමාරක් අතර කාලයක් ඒ ලියැදිවල කරකවන්න ඕනෑ. ඒකෙන් තමයි සෝඩියම් තත්ත්වය, කාරම කියන එක පහළට ගන්නේ. හැබැයි, ඒ කාලය ඇතුළත වැස්සොත් මේ percentage එක පසුපසට යනවා.

මේ ප්‍රශ්නය ඇති වුණු ගිය අවුරුද්දේ දෙසැම්බර්වල හම්බන්තොටට මිලිමීටර් 165ක වර්ෂාපතනයක් ලැබී තිබුණා. මම මේ සම්බන්ධව පසුගිය අවුරුදු 4ක තොරතුරු ඇතුළත් වාර්තාවක් අරගෙන තිබෙනවා. පුත්තලමේ පසුගිය දෙසැම්බර්වල වර්ෂාපතනය මිලිමීටර් 44යි; මන්නාරමේ මිලිමීටර් 118යි; අලිමංකඩ මිලිමීටර් 232යි. මේ තත්ත්වය ඔක්තෝබර්, නොවැම්බර් මාසවල ඉඳලාම තිබෙනවා. මොකද, දෙසැම්බර් දැම්මා කියලා ලුණු දෙසැම්බර්වලම හැදෙන්නේ නැහැ. මේ වර්ෂාපතනය ඔක්තෝබර් ඉඳලා ඒ විධියට තිබෙනවා. හම්බන්තොටට ඉතිහාසයේ වැඩිම වර්ෂාපතනය මේ අප්‍රේල්වල ලැබී තිබෙනවා, මිලිමීටර් 140ක්. 2024 අප්‍රේල්වල ලැබී තිබුණේ මිලිමීටර් 26යි. 2023 අප්‍රේල්වල ලැබී තිබුණේ මිලිමීටර් 40යි. එතකොට මේ අප්‍රේල්වල ලැබී තිබෙනවා, මිලිමීටර් 140ක වර්ෂාපතනයක්. මාර්තුවල මිලිමීටර් 142යි. හම්බන්තොටට 2023 මාර්තුවල ලැබී තිබුණේ මිලිමීටර් 23ක වර්ෂාපතනයක්. ඒ මිලිමීටර් 23 දැන් මිලිමීටර් 140ක් වෙලා තිබෙනවා. 2025 මාර්තුවල පුත්තලමේ වර්ෂාපතනය මිලිමීටර් 132යි. 2024 මාර්තුවල මිලිමීටර් 0. 4යි. 2023 මාර්තුවල තිබුණේ මිලිමීටර් 57යි. එහෙමයි වර්ෂාව ලැබී තිබෙන්නේ. මාලිමා ආණ්ඩුව ආ නිසා ලුණු කැටයක්වත් නැහැ කියන්න බැහැ. මේකේ තිබෙන්නේ ස්වාභාවික ක්‍රියාවලියක්. මාස 4ක් තිස්සේ තිබිලා ලුණු percentage එක 24ට ආවාට පස්සේ තමයි ඒවා ටැංකිවලට දාන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවා ටැංකිවලත් තිබෙන්න ඕනෑ දවස් 45ක්. අපි කියන්නේ ටැංකිවලින් ලුණු කඩනවා කියලායි. මහ කන්නයේ ලුණු කඩන්න පටන් ගන්නේ මැයි මාසයේ. හැබැයි ටැංකිවල තැන්පත් වෙන්න නම් ජලය අඩු වෙන්න ඕනෑ. වැස්සත් අපට spill කරන්න පුළුවන්. හැබැයි, සාමාන්‍ය තත්ත්වයක් තිබෙන්න ඕනෑ. Deep tanks තිබෙනවා, ගරු රවුෆ් හකීම් මැතිතුමාත් ඒ ගැන දන්නවා. Deep tanksවල තිබෙන ඒවා කඩන්න පුළුවන්. පුත්තලමේ ගොඩ දැම්මේ deep tank ඒකේ මෙට්‍රික්ටොන් 1,300ක් තිබුණා. හැබැයි ඒ හොඳ ලුණු නොවෙයි. මම පෙරේදා ගිහිල්ලා බැලුවා. ඒවා සුද්ද කරලා සුද්ද කරලා ගන්නකොට මෙට්‍රික්ටොන් 1,300න් හදන්න පුළුවන් වන්නේ මෙට්‍රික්ටොන් 300ක් විතර. වැඩිපුරම යන්නේ පිප්සම්වලට. *[බාධා කිරීමක්]* එහේ තිබෙනවා, වර්ග කිලෝමීටර 675ක්. අපි හදන්නේ වර්ග කිලෝමීටර 210ක. හැබැයි ඒ හදන්නත් වර්ෂාපතනය අඩු වෙන්න ඕනෑ, හිරු එළිය තිබෙන්න ඕනෑ. හිරු එළිය තිබුණත් වැඩක් නැහැ, වැස්ස නැතත් වැඩක් නැහැ, සුළඟ තිබෙන්න ඕනෑ. මොකද, ඉහළ තලයේ තිබෙන ජල වාෂ්ප කරකවලා ගෙනියන්නේ සුළඟින්. ඒක මිනිස්සුන්ට කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා අඩු තරමින් මාස 7කවත් කාලයක් ගත වෙනවා. පළමු මාස 3ක, 4ක වාගේ කාලය 1 ඉඳලා 24 දක්වා වන ලියැදිවල මාරු වෙනවා. ටැංකිවල දින 45ක් තිබෙනවා. ඊට පස්සේ ටැංකියෙන් ගොඩ අරගෙන මැග්නීසියම් ලෙවල් එක අඩු වෙන්න තව දින 45ක් පිරමිඩ ගහලා තියන්න ඕනෑ. ඉස්සර අලිමංකඩ යනකොට පොල් අතුවලින් වහලා තිබුණා පිරමිඩ වාගේ. දැන් පොල් අතුවලින් වහන්නේ නැහැ. ඒ විධියට පිරමිඩ ගහලා තියන්න ඕනෑ, තව දින 45ක්. එතකොට දින 45 ඒවා දෙකයි. ඒ කියන්නේ මාස තුනයි. ලියැදිවල කැරකෙන කාලය මාස 4යි. ඔක්කෝම මාස 7යි. දෙසැම්බර් මාසයේ වැස්සේ නැහැ කියලා හිතලා අපි පටන් ගත්තත්, සාමාන්‍ය තත්ත්වයේ හිරු එළිය යටතේ, සාමාන්‍ය සුළඟ යටතේ මාස 7ක් තිබෙන්නට ඕනෑ, අපි ලියැද්දට ගන්නා ජලය ටික ලුණු බවට පත් කරලා, කැට කරලා factory එකට ගන්න. නමුත්, එහෙම හදලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි අපි දෙසැම්බර් මාසයේ මුලින්ම ලුණු මෙට්‍රික් ටොන් 30,000ක් ගේන්න තීන්දු කළේ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඒකෙන් මෙට්‍රික් ටොන් 12,000ක් ගෙනාවා.

පුත්තලමේ මුස්ලිම් ජනතාවට ඔබතුමා දෙමළ භාෂාවෙන් කථා කළා නේ. ඔබතුමා මාර දක්ෂයි ඒ වැඩේට. සිංහලෙන් එකක් කථා කරනවා. වෙළෙඳාම ගැන ඉංග්‍රීසියෙන් කථා කරනවා. මුස්ලිම් ජනතාවට දෙමළ භාෂාවෙන් කථා කරනවා. ඔබතුමා ඒක නියමෙට කළා. ඒක ඔබතුමාගේ experience එක නේ. I respect you; ඒ ගැන මම ඔබතුමාට ගරු කරනවා. ඒක සාමාන්‍යයෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. හැබැයි, ඒක හොඳයි. ඔබතුමා පුත්තලමේ මුස්ලිම් ජනතාවට කථා කළේ. අන්න ඒ කාලයේ සමිතිවලින් ලුණු මෙට්‍රික් ටොන් 12,000ක් ගෙනාවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ලුණු මෙට්‍රික් ටොන් 12,450ක් ගෙනාවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ලුණු මෙට්‍රික් ටොන් 12,450ක් ගෙනාවා. ඒ සමිති මොනවාද කියලා මම කියන්නම්. රයිගම් සමාගමේ ඒකාධිකාරයක් ගැන මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා නේ. 1997.02.05වැනි දින Puttalam Salt Limited එකේ අයිතියෙන් සියයට 90ක් ආයතන සමූහයකට තිස් අවුරුදු බද්දට දුන්නා. එසේ ලබා දුන් සමාගම්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තමයි, ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය, වයඹ පළාත් ග්‍රාමීය බැංකු සංගමය, කළුතර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය, මහජන බැංකුව, පැන් සෙරෙන්ඩිබ් ආයතනය, මධ්‍යම පළාත් ග්‍රාමීය බැංකු සංගමය, ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සංගමය, ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය කියන ඒවා. පුත්තලම ලුණු සංස්ථාව කියලා එකක් දැන් නැහැ. පුත්තලම සංස්ථා ලුණු කියන්නේ, මෙන්න මේ ආයතන අටේ තිබෙන ලුණු. හැබැයි, ඇත්ත සංස්ථාව මේ ආයතන අටට දෙනකොට හකීම් මැතිතුමා 1997දී හිටියේ විපක්ෂයේද, ආණ්ඩු පක්ෂයේද, අෂ්රොෆ් මහත්මයා ළඟද, ෆේරියල් ඉස්මයිල් අෂ්රොෆ් මහත්මිය ළඟද, අතාවුල්ලා මහත්මයා ළඟද, ප්‍රේමදාස මහත්මයා ළඟද, කොහේද හිටියේ කියලා මම දන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුවේ හිටියා කියලා මම දන්නවා. 1997දී ඔබතුමා ආණ්ඩුවේ හිටියා, හකීම් මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඔය පුටුවේ හිටියේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මෙතැනද හිටියේ? ඒක නේ. එතකොට ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන ඔබතුමාට මේකට විරුද්ධ වෙන්න තිබුණා නේ. 1997දී පුත්තලම ලුණු සංස්ථාව දුන්නාට පස්සේ තමයි ඒක ඉවර වුණේ. සංස්ථාව ඉවරවෙලා ඒක මේ සමුපකාර සංගම් අතට ගියා. අන්න ඒ සමුපකාර සංගම්වල බලයෙන් කොටසක් රයිගම් ලුණු ආයතනය ගත්තා. ඒක ඒගොල්ලන් ගත්තේ, කළුතර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ සහ මහජන බැංකුවේ කොටස් මිලදී අරගෙන. ඒ වෙලාවේ මුලින්ම ආපු සභාපතිවරයෙක් තමයි අශෝක සුබසිංහ මහත්මයා. පැන් සෙරෙන්ඩිබ් ආයතනයේ ධර්මවර්ධන මහත්මයා කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් හිටියා. ඒ දෙදෙනා තීරණයක් ගත්තා, සියයට 10ක් සේවකයින්ට දෙන්න ඕනෑ කියලා. එසේ සේවකයින්ට දෙන්න තිබුණු සියයට 10යි, කළුතර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේයි, මහජන බැංකුවේයි කොටස් ටික රයිගම් ආයතනය ගත්තා. ඒ කොටස් ටික අරගෙන රයිගම් ආයතනය ලුණු නිෂ්පාදනය කරන්න පටන් ගත්තා. ඒගොල්ලන් Raigam Wayamba Salterns PLC කියලා අපේ Puttalam Salt Limited එක එහා පැත්තෙන් factory එකක් හැදුවා. නමුත් ඒක අනීතිකයි. ඒගොල්ලන් මේ ලුණු සමාගමේම අය, ඒ කියන්නේ Puttalam Salt Limited එකේ අධ්‍යක්ෂ මණ්ඩලයට එන අය ගත්තා. මම ඒකේ list එකම ඕනෑ නම් ඔබතුමාට කියන්නම්. ගත්ත විධියත් මම දිගටම කියන්නම්. තව අවුරුදු දෙකකින් ඒ ක්‍රියාවලිය ඉවර වෙනවා. හැබැයි, ඔබතුමන්ලා 1997 ඉඳලා ආණ්ඩුවල හිටියා. එතකොට සමුපකාර සංගම්වල හිටපු අහිංසක මිනිසුන්ගේ බලය, ඔබතුමා කියපු විධියට ඒ වෙළෙඳ මාෆියාව, ලුණු මාෆියාව, ඔබතුමා කියපු විධියට "උක්කු" මාෆියාව විසින්,-

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
"උප්පු" මාෆියාව.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ආ, උප්පු මාෆියාව. ඔබතුමා කියන විධියට "උක්කුද", "කුක්කුද" කියලා මම දන්නේ නැහැ. අන්න ඒක කරපු කාලයේ ඔබතුමන්ලා හිටියේ ආණ්ඩුවේ. මම කියන්නේ ඒකයි. ආණ්ඩුවේ ඉඳගෙන ඒ මාෆියාවට පාර කපලා දැන් අපිවත් ඒකට ගාවන්න යනවා. ඒ කියන "උක්කු, කුක්කු" මාෆියාවට ඔබතුමන්ලා තමයි පාර කැපුවේ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඒකාධිකාරය නැති කළා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒකාධිකාරය නැති කළේ නැහැ, ඒකාධිකාරය ඇති කළා. එහෙම නැති කළා නම් රයිගම්ලා මෙච්චර දහලන්නේ කොහොමද? රයිගම්ලා දහලන්නේ ඔබතුමන්ලා හදපු ඒකාධිකාරය නිසා නේ. ඔබතුමා දෙමළෙන් කථා කළේ, එසේ දෙමළෙන් කථා කරපු කට්ටියට වැඬේ දීලා මුදලාලිලාට පාර කැපුවා. මම මේ කියන්නේ 1997 අවුරුද්ද ගැන. 1997, 1999, 2000, 2024, දැන් 2025 අවුරුද්දත් ඇවිල්ලා තිබෙනවා. ඒක පැත්තකින් තියන්නකෝ.

ඊළඟට, මතු වුණු ප්‍රශ්නය මේකයි. අපි 2025 මාර්තු මාසයේ 24වැනි දා කැබිනට් තීරණයක් ගෙනාවා. ධීවර අමාත්‍යාංශයේ කර්මාන්තවලට ලුණු නැතුව තිබුණා. විශේෂයෙන්ම කරවල කර්මාන්තයට ලුණු නැති වුණා. අපි ඒගොල්ලන්ට ලුණු මෙට්‍රික් ටොන් 10,000ක් ගෙන්වලා දෙන්න තීරණය කළා. ඒ වාගේම ජාතික ලුණු සමාගමට ලුණු මෙට්‍රික් ටොන් 20,000ක්, Lanka Salt Limited එකට ලුණු මෙට්‍රික් ටොන් 20,000ක් ගේන්න අපි තීරණය කළා. ඒකට හේතුව මොකක්ද දන්නවාද? ඇත්තටම අපිට ඒ වෙලාවේ ගන්න තිබුණු තීරණය තමයි ලුණු ගෙන්වීම පෞද්ගලික අංශයට විවෘත කරන එක, අපි ගෙන්වන්නේ නැතුව. හැබැයි, ඒ වෙලාවේ ඒක කළේ නැත්තේ මේ නිසායි. ලුණු ගෙන්වීම පෞද්ගලික අංශයට විවෘත කරපු වෙලාවේ ලුණු ගෙන්වුවේ තුන්දෙනායි. ඉන් එක් කෙනෙක් රයිගම්ලා. අනෙක් එක්කෙනා හිරු. අනෙක් කෙනා මොහොමඩ් ගවුස්. ඒ තුන්දෙනාගෙනුත් වැඩිම ප්‍රමාණය ගෙනාවේ රයිගම්ලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන සමිතිවලට ඕනෑ කරන ප්‍රමාණය සමිති 18ක් නියෝජනය කරලා ගෙනාවේ රයිගම්ලා. ඒගොල්ලන් ලුණු මිල වැඩි කළා. ඒ මිල manipulate කරන එක වළක්වන්න තමයි අපි දෙදෙනා කථා කරලා තීරණය කළේ National Salt Limited එකෙන් ගෙනැල්ලා හැමෝටම ලුණු දෙන්න ඕනෑ කියලා. ඔබතුමා මම මේ කියන්න යන කාරණය විශ්වාස කරන්න. මම මේ රටේ ජනතාවට කියනවා, මේ ලුණු හිඟය එන්න තිබුණේ පළාත් පාලන මැතිවරණයටත් කලින්, අප්‍රේල් මාසයේ සිංහල හා හින්දු අවුරුද්දටත් කලින් බව. අලිමංකඩ ලුණු ටික හම්බන්තොටටත් දීලා, රයිගම්ලාටත් දීලා, පුත්තලමේ ලුණු ටික, මන්නාරමේ ලුණු ටික හරියට බෙදා හැරලා අපි ඒක කළමනාකරණය කළා. ඊට පස්සේ මාර්කට් එකට එව්වා, සතොස හරහා. අදත් සතොසේ ලුණු කිලෝවක් විකුණන්නේ රුපියල් 120ට. තුන්දෙනෙක්, හතරදෙනෙක් තමයි Facebook එකේ දැමුවේ රුපියල් 350ට ලුණු කිලෝවක් විකුණනවා කියලා. අද සතොසේ ලුණු කිලෝවක් විකුණන්නේ රුපියල් 120ට. "Food City"වල ලුණු කිලෝවක් විකුණන්නේ රුපියල් 120ට. මේක තමයි ඇත්ත කථාව. හැබැයි, අපි 2025 මාර්තු මාසයේ 24වැනි දා කැබිනට් තීරණය ඉදිරිපත් කළා. ඒ කැබිනට් තීරණයේ guideline එක මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ guideline එක අනුව රජයෙන් ලුණු ගෙන්වන්න ගියාම අනුගමනය කළ යුතු පියවර 32ක් තිබෙනවා. පෞද්ගලික අංශයට LCs open කළා නම් දවස් තුනෙන්, හතරෙන් ලුණු ගේන්න පුළුවන්. මෙන්න මේවා තමයි මුදල් අමාත්‍යාංශය වෙනස් කරන්න ඕනෑ. මේ, අවශ්‍යතාවට නීතිය වෙනස් කරගන්න බැරි වුණු ආණ්ඩු. ඒක තමයි ඇත්ත කථාව. අද අපි ලුණු ගෙනැල්ලා දෙන්නේ ඔබතුමන්ලා හදපු නීතිවලට. ඔබතුමන්ලා හදපු නීති අපි වෙනස් කරන්න ඕනෑ. මම කියන්නේ ඒකයි. බලන්න, 2025 මාර්තු 24 ඉඳලා 2025.05.16 තමයි shipment එක dispatch වෙන්නේ. එතකොට වුණේ මොකක්ද? අපි ලුණු ගෙනාවේ ගුජරාට් වරායෙන්. ගුජරාට් වරාය දවස් 5ක් වහලා තිබුණා. ඒ, අපේ කැමැත්ත නිසා නොවෙයි, ඉන්දියා - පාකිස්තාන යුද්ධය නිසා. අන්න ඒක නිසා තමයි ලුණු දැන් එන්නේ. අපි හදපු ප්‍රශ්න නොවෙයි මේවා. වැස්ස අපි හදපු ප්‍රශ්නයක් නොවෙයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මොකද, ඔබතුමන්ලා කියන ඉතිහාසයේ විකෘති කිරීම් නිවැරදි වෙන්න ඕනෑ. මම ආණ්ඩුවේ ඒ පියවර 32 ගැනත් කියන්න කැමතියි. මේවා ඇත්තටම වෙනස් වෙන්න ඕනෑ. මම කියන්නේ ලුණුවලට පාලන මිලක් ඕනෑ නැහැ කියායි. ලුණු කිලෝවක් රුපියල් 350ට වැඩි වෙන්නේ මොකද? සැපයුම අඩු වෙච්ච හින්දා. අපි පාසල් යන කාලයේ ඉගෙන ගත්තා, ලුණු කියන්නේ අනම්‍ය භාණ්ඩයක් කියලා. ඒ කියන්නේ සැපයුම වැඩි වෙනකොට මිල අඩු වෙනවා කියන එකයි. සපයන ප්‍රමාණයට මිනිස්සු ලුණු කන්නේ නැහැ, ඔබතුමන්ලාගේ රනිල් කජු කෑවා වාගේ. ලුණු කන්නේ නැහැ, එහෙම. සැපයුම වැඩි වුණාය කියලා එහෙම ලුණු කන්නේ නැහැ. ලුණු සැපයුම වැඩි වෙනකොට ඉබේම මිල අඩු වෙනවා. ඒක තමයි ලුණුවල ක්‍රමය. ලුණුවල ක්‍රමය ඒකයි. ඒක හින්දා දැන් ලුණු සැපයුම ඕනෑ. මම කියනවා, ඔක්තෝබර් මාසය වෙනකොට අපි මහ කන්නයේ ලුණු කඩනවා කියලා. අපි අප්‍රේල් මාසය වෙනකොට ඒ වෙනුවෙන් සැලැස්මක් හදනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ලුණු වැඩියෙන් කෑවාම blood pressure වැඩි වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, ලුණු වැඩියෙන් කෑවාම blood pressure වැඩි වෙනවා. හැබැයි, ඔබතුමන්ලා කියන ඒවාට ඊට වඩා blood pressure වැඩි වෙනවා. ඔබතුමන්ලා කියන බොරුවලට තමයි මේ රටේ මිනිස්සුන්ගේ blood pressure වැඩි වෙන්නේ.

ඊළඟට, දැන් ලොකු කථා හදන්න එනවා මම දැක්කා. මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තව ප්‍රශ්නයක් ගැන අද කථා කරනවා. අද මාධ්‍යවල පළ වුණු ප්‍රධාන කාරණයක් තමයි, කටුනායක factory එකක් වහපු කථාව. මේ වාගේ කථාවකුත් තිබෙනවා නේ. කටුනායක "NEXT" කියන garment factory එක වහලා. ඒකේ factories තුනක් තිබෙනවා, නවගත්තේගම, ආඬිගම සහ කටුනායක කියන තැන්වල. කටුනායක factory එකේ එක කොටසක් තමයි වහලා තිබෙන්නේ. ඒකේ මැහුම් අංශය වහලා තිබෙනවා. එතකොට ඇරපු ආයතන වෙන නැද්ද? අපේ ආණ්ඩුව ඇවිල්ලා garment factoriey කොච්චර අරිනවාද? ඒවා ඇරලාත් තිබෙනවා. සාමාන්‍ය සංසිද්ධිය අනුව ඒවා වැහෙනවා, ඇරෙනවා. හැබැයි, garment factories ඇරෙන එක ගැන කථා කරන්නේ නැහැ. නමුත්, සේවකයෝ 1,400ක් සහිත එක අංශයක් වහපු එක ගැන නම් කථා කරනවා. හැබැයි, ඒක වහලා තිබුණාට අනෙක් ආයතන වහලා නැහැ. අපි හොයලා බැලුවා, මේකේ තිබෙන ප්‍රශ්නය ගැන. ඒගොල්ලන්ගේ management එකම කියනවා, "කටුනායක මැහුම් අංශයේ ලාභදායක තත්ත්වයක් නැහැ" කියලා. මැහුම් අංශයේ ලාභදායක තත්ත්වයක් නැති නිසා ඒගොල්ලන් ඒක වහලා. එතකොට එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මෙයයි. ඒගොල්ලන්ගේ collective agreement එකක් තිබෙනවා, එක වෘත්තීය සමිතියක් එක්ක. ඒ වෘත්තීය සමිතියත් එක්ක තිබෙන collective agreement එක ගැන garment industry එකේ හැමෝම දැනගෙන නැහැ. ඒක ඒගොල්ලන් හදා ගත්ත එකක්. ඒක නිසා වන්දි පිළිබඳ අවසරය ගත්තාද කියලා අපි දන්නේ නැහැ. ඒ ආයතනය BoI එකත් එක්ක එකතු වෙලා ඒ ගැන හොයන්න ඕනෑ. Labour Ministry එකෙන් ඒ ගැන අහන්න ඕනෑ. කොහොම නමුත් ඒ අංශය වහලා තිබෙන්නේ ඒ ආයතනයේ කොටසක් පාඩු වෙච්ච නිසා මිසක සමස්ත garment industry එක වහපු නිසා නොවෙයි.

හැබැයි, අද උදේ පත්තරේ මුල් පිටුව බලනකොට, එක නාළිකා මහත්මයෙකුට - "නයි" නාළිකාවේ කෙනාට - මුළු ව්‍යවසායකත්වයම කඩා වැටිලා; මුළු ව්‍යවසායක ආර්ථිකයම බිඳ වැටිලා; garment industry එකම ඉවරයි. නයා මැරිලා. ඔහු දැන් නයා මැරුණු අභිකුණ්ඨිකයා වාගේ වෙලා; නයා මැරුණු අභිකුණ්ඨිකයාට වෙච්ච වැඩේ තමයි දිලිත්ට වෙලා තිබෙන්නේ. දැන් ඔහුගේ ලොකුම ප්‍රශ්නය මොකක්ද දන්නවාද? මේ "NEXT" factory එකේ branch එකක් වැහුණු එක. දෙනවා නැති වෙන්න. දිලිත්ගේ නයි පැටවුන් ටිකකුත් ඉන්නවා ඒකටම හරියන්න කියවන්න පටන් ගන්න. මේ, garment factory එකක branch එකක කොටසක් වැහුණු එකක්; ඒ branch එකේ කොටසක් වැහිලා. ඒකත් මේ රටේ ප්‍රශ්නයක්. ඒක ප්‍රශ්නයක් නොවනවා නොවෙයි. ඒක ප්‍රශ්නයක්. ඒකට උත්තරයක් හොයන්න ඕනෑ. හැබැයි, ඒ management එක කම්කරු කොමසාරිස්ට දැනුම් දුන්නාද, ආණ්ඩුවත් එක්ක කථා කළාද කියා බලන්න ඕනෑ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිවරයා හැටියට මාත් එක්ක නම් කථා කළේ නැහැ. මට පරචිත්ත විඥානය නැහැ. මගේ පඬුපුල් ආසනය උණු වෙන්නේ නැහැ, ඒගොල්ලන්ගේ factory එකේ branch එකක් පාඩු වනවා කියලා දැනගන්න. මේ පුටුව ඒ වාගේ වුණා නම් මම මෙලහකට එහේට ගිහිල්ලා. මේක රත් වන පුටුවක් නොවෙයි, ශක්‍ර දෙවියන්ගේ ආසනය වාගේ. කම්කරු ඇමති එක්ක කථා කරලා නැහැ, කර්මාන්ත ඇමති එක්ක කථා කරලා නැහැ, BoI එකත් එක්ක කථා කරලා නැහැ. ඒගොල්ලන් කථා කරලා තිබෙනවා, නයි මුදලාලි එක්ක. නයි මුදලාලිට තමයි වාර්තා කර තිබෙන්නේ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
පුටුවලට දාන්න තෙල් තිබෙනවා. *[බාධා කිරීමක්]* දැන් ගාන්න තෙල් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔයගොල්ලන් ගෑවා ඒ කාලයේ. මට මතකයි, ප්‍රේමදාස මහත්මයාට දෝෂාභියෝගය ගෙනාපු වෙලාවේ මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ පුටුවල තෙල් ගෑවා. මම ඒක කියන්න යන්නේ නැහැ. අම්මෝ! ඔයගොල්ලන් දමපු ගේම් මතකයි, අපට. "රාජාලියා" ලකුණින් තරග කළ කාලයේ. ගෑවා නේද? ප්‍රේමදාස මහත්මයාගේ කට්ටිය එනකොට ඒගොල්ලන්-*[බාධා කිරීමක්]* හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා නම් මරු. ඔයගොල්ලන් ඒ කාලයේ තෙල් ගෑවා නේද, මුස්ලිම් මන්ත්‍රීවරුන්ට වාඩි නොවෙන්න? දැනුත් ඒවා මතක් වෙනවා නේ. *[බාධා කිරීමක්]*

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අපි කියන්නේ විශේෂයෙන්ම මේ රටේ ජනතාවට දෙන ප්‍රවෘත්ති සම්බන්ධයෙන් ඒ වාගේ වැඩ කරන්න එපා කියලායි. ඇත්තටම ගත්තොත්, අපනයන ක්ෂේත්‍රයේ කර්මාන්තවල, ඇඟලුම් කර්මාන්තවල SVAT එක return කරන්න ලොකු සැලැස්මක් හදලා තිබෙනවා. දින 45ක් ඇතුළත SVAT එක return කරන්න ක්‍රමයක් හදලා තිබෙනවා. ඒ ක්‍රම හදලා තිබෙනවා. කිසිම කර්මාන්තයකින් අපට ආපු පැමිණිල්ලක් නොවෙයි මේක. මේක හදාගෙන යන කථාවක්. Garment factory එකක එක අංශයක් වැහුණාම මේ තරම් සද්දේ දාන්නේ මොකද?

ලුණුවලටත් එහෙමයි. අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමා මාර චුන් එකක් ගත්තා, අලිමංකඩ ගිහිල්ලා. අලිමංකඩ ලුණු factory එකේ උද්ඝෝෂණයක් හැදුවා, මේගොල්ලන්. එහෙම කරලා මේගොල්ලන් කියන්නේ මොකක්ද? එතැන ඉන්න සේවකයන් 10දෙනෙකු විතර අරගෙන ඒගොල්ලන් කියනවා,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා වාඩිවෙන්න. මම කියන්නම්; මම කියන්නම්. *[බාධා කිරීමක්]* මේගොල්ලන් ගිහිල්ලා කිව්වේ මොකක්ද දන්නවාද? උතුරේ ලුණු දකුණට එවන්න එපා කිව්වා. මාර ලුණු! උතුරේ ලුණු; අලිමංකඩ ලුණු. උතුරේ ලුණු දකුණට එවන්න එපා කිව්වා. උතුරේ ලුණු, දකුණේ ලුණු කියලා ලුණු නැහැ, බොස්. රටේ ලුණු තිබෙන්නේ. ඔබතුමන්ලාට උතුරේ ලුණු, දකුණේ ලුණු තිබ්බා නම් ඒවා ඒ කාලයේ තියාගන්න. දැන් නැහැ ඒවා. මේ කාලයේ අපි මුළු රටම එකක් කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා ඒ කාලයේ හදා ගත්තා, ප්‍රභාකරන්ගේ ලුණු. ඒවා නැහැ, දැන්. උතුරේ ලුණු දකුණට එවන්න එපා කියලා ඔබතුමා කිව්වා. ඒගොල්ලන්ට බොරු පොරොන්දු දුන්නා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, if you want to say something more, you can reply later.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ සාකච්ඡාවේ සම්පූර්ණ වාර්තා මම **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අලිමංකඩ අපි ලුණු හැදුවා. 2012 ඉඳලා Puttalam Salt Limited එකේ "රජ ලුණු" කියලා නමක් තිබුණා. ඒක අපි හදා ගත්ත එකක් නොවෙයි. ඒ කාලයේ තිබුණු එකක්. ඇත්තටම අපි ඒක වෙනස් කළා. "රජ ලුණු" කියලා ලුණු නැහැ නේ. අලිමංකඩ නම් අලිමංකඩ ලුණු, මාන්තායි නම් මාන්තායි ලුණු. Salt is salt. අපි ඒක වෙනස් කළා. වෙනස් කරලා මේක හැදුවාට පස්සේ එතුමා ගිහිල්ලා කියනවා, "රජ ලුණු" ලු. රජ ලුණු ශ්‍රී ලංකාවේ රජ්ජුරුවන්ගේ ලුණු ලු. අනුර කුමාර රජ්ජුරුවන්ගේ ලුණු ලු. අනේ! බයිලා කියන්නේ නැතිව ඉන්න. ඒ වාගේ කථා තමයි එතුමා ගිහිල්ලා හැදුවේ. බොරු කිව්වා. *[බාධා කිරීමක්]*

අපි ඒගොල්ලන්ට EPF දෙනවා, travelling allowance එක දෙනවා, වාහනයක් දෙනවා, එන්න ගමන් පහසුකම් දෙනවා. ඒ සේවකයන්ට ප්‍රශ්නයක් නැහැ. අර්ච්චුනා මන්ත්‍රීතුමා, චුන් වෙන්නේ නැතිව ඉන්නකෝ. ඔබතුමා පාර්ලිමේන්තු ඇවිල්ලාත් එහෙමයි; අලිමංකඩ ගිහිල්ලාත් එහෙමයි. *[බාධා කිරීමක්]* මේගොල්ලන්ට මාතෘකාවක් හැදුණොත් ඒක නියමෙට අරගන්නවා. *[බාධා කිරීමක්]* ගුටි කනවා, ගිහිල්ලා. ගියොත් එහෙම අලිමංකඩ මිනිස්සු ගහනවා ඔබතුමාට, බොරු පව ගහන නිසා. ඒ වාගේ කථා තමයි මේගොල්ලන් හැදුවේ. ලුණුවලින් චුන් වෙන කට්ටිය බලන්නකෝ. මෙතුමා එක විධියකට ලුණුවලින් චුන් වෙනවා පුත්තලමේ මුස්ලිම් අයට කථා කරලා. අර මන්ත්‍රීතුමා තව විධියකට චුන් වෙනවා එහේ කට්ටියට කථා කරලා, "මේවා උතුරේ ලුණු, දකුණට එවන්න එපා" කියලා. කර්මාන්ත ඇමති හැටියට මම සතුටු වෙන්නේ මොකක් ගැනද කියලා දන්නවාද? ලුණු කර්මාන්තය ගැන මේ වාගේ සාකච්ඡාවක් ඇති වෙච්ච එකට. දිලිත් සතුටු වෙනවා, තව විධියකට. එතුමා නයි පෙන්වනවා, ලුණුවලට. එහෙම නේ වෙන්නේ. නැත්නම්, මේ වාහන ආනයනය ගැන කථා කරන දවසේ ලුණු ගැන කථා කරන්නේ මොකටද? දැන් ලුණු ප්‍රශ්නය විසඳලා ඉවරයි. මම මේ රටේ ජනතාවට කියනවා, ලුණු ප්‍රශ්නය විසඳලා ඉවරයි කියලා. වරායට ලුණු ඇවිල්ලා තිබෙන්නේ. ඊළඟට තිබෙන්නේ කඩවල්වලට ලුණු එන එක. ඒක දවස් දෙක තුනකින් සිද්ධ වෙයි.

හෙට ඉඳලා ඒවා එනවා. මම ඉන්නවා, වෙළඳ ඇමතිතුමා ඉන්නවා, මේ ආණ්ඩුව වග කියනවා. තේරුණාද? ඊළඟට, තව මොකෙක් හරි නයි පැටියෙක් හොයාගන්න. ලුණු ප්‍රශ්නය ඉවරයි දැන්. ඊළඟට, මොකක්ද සොයා ගන්නේ? ගැරඩියෙක් සොයාගන්න වෙනවා. ප්‍රශ්නයක් නැතිව ප්‍රශ්න හදන්න එපා. පාර්ලිමේන්තුවේ කාලය කන්නත් එපා. දවස් තුනක් ලුණු ගැන කථා වුණා. දැන් ඇති.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may have a minute.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Deputy Speaker.

මම Elephant Passවල තිබුණු ලුණු ප්‍රභාකරන්ගේ ලුණු කිව්වා ලු, ඒක දකුණට,- *[බාධා කිරීමක්]* මම ආපසු සිංහලෙන් කියන්නම්. ඔබතුමාට සිංහලෙන් කිව්වොත් තේරෙනවා නේ. ඒ නිසා සිංහලෙන් කියන්නම්. එහෙම උතුරේ ලුණු, නැඟෙනහිර ලුණු කියලා මොකුත් නැහැ. ඒ ගැන මම කථා කළේවත් නැහැ. මේක Privilege issue එකක් raise කරන්න පුළුවන් defamation එකක්. බලන්න, Penal Code එකේ Section 190. මන්ත්‍රීතුමෙකු කථා කරපු නැති දෙයක් කථා කළොත්, ඒක defamation එකක්, Privilege issue එකක්. Sir, කරුණාකර මට Privilege issue එකක් raise කරන්න ඉඩ දෙන්න.

දෙවැනි කාරණය මේකයි. Sir, මම කවදාවත්, මේ රටේ කොතැනකවත් කිව්වේ නැහැ මේක රජ ලුණු, රාජ ලුණු කියලා. කවදාවත් එහෙම කිව්වේ නැහැ. එතැන ඉන්න මිනිස්සු උද්ඝෝෂණ කරනවා. මේගොල්ලන් job එකෙන් එළවලා තිබෙනවා. මම Standing Order No. 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. Sir, ඒගොල්ලන් job එකෙන් අයින් කරන්න එපා කියලා විතරයි කථා කළේ. මම කිව්වේ නැහැ, මේක කොටින්ගේ ලුණු, උතුරේ ලුණු, දකුණට ගෙනයන්න එපා කියලා. ගේන්න දකුණට, pack කරන්න ලස්සනට, අඩුම ගණනට විකුණන්න. ඒකට අපි උදවු කරන්නම් කියලායි කියා තිබෙන්නේ. Sir, let me raise this as a Privilege issue. Part A of the Parliamentary (Powers and Privileges) Act clearly states that if any Member makes a defamatory statement, he will be punished under Section 190 of the Penal Code. I will raise this matter as a Privilege issue. It is a serious concern. මම සිංහලෙන් කියන්නම්. My mother came from a Sinhala area. මම කවදාවත් එහෙම කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, what you say has been understood. - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
So, please do not do that. ඇමතිතුමනි, ඔබතුමාට කථා කරන්න ඕනෑ නම්, mediaවලට පේන්න ඕනෑ නම් මගේ ළඟට එන්න. මගේ ළඟට ආවොත් ලස්සනට media එකට පෙනෙනවා. හැබැයි, ඔතැන ඉඳගෙන එහෙම ජරා කථා අපට කියන්න එපා. එක අවස්ථාවකවත්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may sit down now. Regarding your Privilege issue, you have to make a request to the Hon. Speaker in writing.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එක අවස්ථාවකවත් මම එහෙම කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have made your point clear, Hon. Member. Please, take your seat.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ නම සඳහන් කර ඒක පැහැදිලි කළ නිසා මේ කාරණය කියන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අර්ච්චුනා මන්ත්‍රීතුමා Parliamentary (Powers and Privileges) Act එක කියවා තිබෙන නිසා මම හරි සතුටු වෙනවා. ඒ නිසා Parliamentary (Powers and Privileges) Act එකට අනුවම වැඩ කරන්න කියලාත් ඉල්ලීමක් කරනවා.

ඊළඟට, මම මේ කියන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please, take your seat. You have made your point clear and I told you about the procedure.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා Parliamentary (Powers and Privileges) Act එක කියවලා, study කරලා එන එක ගැන මම සතුටු වෙනවා. මොකද, අපේ කාලය ඉතිරි වෙනවා නේ එතකොට. හැබැයි, ඒකට අනුවම කටයුතු කරනවා නම් තවත් හොඳයි. මම කිව්වේ, මේගොල්ලන් ගෙනැල්ලා මතු කරපු දේවල්, සේවකයින් එක්ක සාකච්ඡා කරපු minutes අනුව. මම ඒක table කළා. ඒකේ, දෙවැනි කාරණය වශයෙන් මොකක්ද තිබෙන්නේ? "Transferring salt to other parts of the country." අන්න, ඒකෙන් ඒගොල්ලන් මතු කරන දේ තමයි මේ උතුරේ ලුණු දකුණට එවන්න එපා කියන එක. ඒවා අතිශය කැත කථා.

ඊළඟට, මෙතුමන්ලා 11 වන කාරණයෙන් තව එකක් කියනවා. "Change the Manager"; "අපේ Manager මාරු කරන්න" කියනවා. හේතුව මොකක්ද දන්නවාද? එතුමා කිලිනොච්චියේ කෙනෙක් නිසා. කිලිනොච්චියේ කෙනෙක් නිසා මාරු කරන්න ලු, යාපනයේ කෙනෙක් නොවෙයි කියලා. ගරු මන්ත්‍රීතුමා, එහෙම කරන්න පුළුවන්ද? ඒ Managerගේ වරදක් තිබෙනවා නම් මාරු කරන එක හරි. මේ කියන්නේ අලිමංකඩ ඉන්න ඕනෑ යාපනයේ කට්ටිය විතරයි කියලායි. කිලිනොච්චියේ ඉන්න දක්ෂ මිනිහෙකුටවත් එතැන ගිහින් වැඩ කරන්න බැහැ. අපි three months අරන් තිබෙනවා. ඔහුගේ මොනවා හෝ වරදක් තිබෙනවා නම් අපි ඒකට ක්‍රියාමාර්ග ගන්නවා. එහෙම නැතුව කිලිනොච්චියේ කෙනෙකුට යාපනයේ ඉන්න බැහැ කියලා නීතියක් නැහැ, බොස්. ඒවා තියාගන්න එපා. ඔයගොල්ලන් අඩුම තරමින් රැකියාවක් කරනකොටවත් අසාධාරණ විධියට සලකන්න එපා ඒ වාගේ. *[බාධා කිරීමක්]* කිලිනොච්චියේ කෙනාට යාපනයේ job කරන්න බැරි මොකද? මොකක්ද හේතුව? ඔබතුමා කියන්න ඒක. ඔබතුමා දොස්තර කෙනෙක් නේද? *[බාධා කිරීමක්]* දොස්තරද, කොන්දොස්තරද ඔබතුමා? කිලිනොච්චියේ කෙනෙක් යාපනයේ job එක කරනවාට විරුද්ධ වෙනවා මේගොල්ලන්. ඒ තරම් මිනිස්සු මේගොල්ලන්. මේවා රටට පෙනෙන්න ඕනෑ. මම කියන්නේ බොරු නොවෙයි. මේ වාර්තාවේ තිබෙනවා. කිලිනොච්චියේ කෙනෙකුට යාපනයේ job එක කරන්න බැරි මොකද කියලා කියන්න, අර්ච්චුනා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* කිලිනොච්චියේ කෙනාට යාපනයේ job එක කරන්න එපා ලු. කිලිනොච්චියේ මන්ත්‍රීවරු ඉන්නවා, මේ ගැන දන්නේ නැද්ද? කිලිනොච්චියේ කෙනාට යාපනයේ job එක කරන්න බැරි මොකද? මොකක්ද වෙනස? කථා කරන භාෂාව ද, ආගම ද? ආගම හින්දු, කථා කරන්නේ දෙමළ. ඔයගොල්ලන්ගේ අසාධාරණය එහෙමයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I told you that you can submit a Privilege issue in writing to the Hon. Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, give me 20 seconds, please.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කවදාවත් කියලා නැහැ කිලිනොච්චි කෙනාව අරගේ දාන්න කියලා. Elephant Pass එකේ හිටපු Managerව මන්නාරමට දාලා, මන්නාරමේ හිටපු මෙගොල්ලන්ගේ trade union එකේ කෙනාව ගෙනැල්ලා මේකට දාලා තිබෙනවා. ඒකට මිනිස්සු උද්ඝෝෂණ කරනවා. ඒක ලියලා තිබෙන්නේ. මම අර විධියට කිව්වේ නැහැ කවදාවත්. මාර පට්ටපල් බොරුවක් කියන්නේ මේ. Sir, my wife is a Sinhalese. So, how can I be a racist? நான் எப்படி பிரதேசவாதம் கதைக்க முடியும்? බොරු කියන්න එපා පාර්ලිමේන්තුවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, what you say has been understood.

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have five minutes. - *[Interruption.]* Hon. Archchuna, would you please allow the Hon. Member to make his submission?

[மு.ப. 11.58]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்களே, திருகோணமலை மாவட்டத்தில் விவசாயிகள் எதிர்கொள்கின்ற சில சிக்கல்களை இச்சந்தர்ப்பத்தில் இந்த மேலான அவையின் கவனத்திற்குக் கொண்டுவர நினைக்கின்றேன்.

நாம் இங்கு பொருளாதாரத்தைப் பற்றி பேசிக்கொண்டிருக்கின்ற இந்த வேளையில், வனத் துறையானது திருகோணமலை மாவட்டத்திலுள்ள மூதூர் பிரதேச செயலாளர் பிரிவில் உள்ளடங்கும் சம்பூர் கிராம சேவையாளர் பிரிவில் 40 விவசாயிகளுக்குச் சொந்தமான 250 ஏக்கர் நிலத்தையும், கிளிவெட்டி கிராம சேவையாளர் பிரிவில் 37 விவசாயிகளுக்குச் சொந்தமான 85 ஏக்கர் நிலத்தையும், பாரதிபுரம் கிராம சேவையாளர் பிரிவில் 45 விவசாயிகளுக்குச் சொந்தமான 117 ஏக்கர் நிலத்தையும், ஆசாத் நகர் கிராம சேவையாளர் பிரிவில் 70 விவசாயிகளுக்குச் சொந்தமான 148 ஏக்கர் நிலத்தையும், தோப்பூர் கிராம சேவையாளர் பிரிவில் 60 விவசாயிகளுக்குச் சொந்தமான 93 ஏக்கர் நிலத்தையுமாக மொத்தம் 252 விவசாயிகளுக்குச் சொந்தமான 693 ஏக்கர் நிலத்தை எல்லைக் கற்களையிட்டுப் பிடித்திருப்பதோடு, அவ்விவசாயிகளை அங்கு விவசாயம் செய்யவிடாமலும் தடுத்து வருகின்றது. இதைப்போலவே சேருவில் பிரதேச செயலாளர் பிரிவில் உள்ளடங்கும் தங்கநகர் கிராம சேவையாளர் பிரிவிலும் 85 விவசாயிகளுக்குச் சொந்தமான 145 ஏக்கர் நிலத்தை எல்லைக் கற்களை இட்டுப் பிடித்துள்ளது. வனத் துறையின் இந்தச் செயற்பாட்டை உடன் நிறுத்த ஆவன செய்யுமாறு துறைசார் அமைச்சரைக் கேட்டுக்கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் நில வன்கவர்வு விடயத்தில் ஆட்சி மாறினாலும் காட்சி மாறாத நிலையே காணப்படுகின்றது. 1983ஆம் ஆண்டு தொடக்கம் 2009ஆம் ஆண்டுவரை போர் நிலவிய காலத்தில் மக்கள் இடம்பெயர்ந்தனர். அவ்வேளையில் மக்கள் பரம்பரை பரம்பரையாக விவசாயம் செய்துவந்த நிலங்களை வனத் துறையினரும், வனவிலங்குத் துறையினரும் எல்லைக் கற்களை இட்டுப் பிடித்து வைத்துள்ளார்கள். எடுத்துக்காட்டாக, திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் போர்க் காலத்திலே கைவிடப்பட்ட 205 சிறுகுளங்களையும், 25 அணைக்கட்டுகளையும் கொண்டமைந்த அண்ணளவாக 12,000 ஏக்கர் நிலத்தை வனத் துறை எல்லைக் கற்களை இட்டுப் பிடித்து வைத்துள்ளது. இதன்மூலம் 24,000 மெற்றிக்தொன் நெல் உற்பத்தி இல்லாமற் செய்யப்பட்டுள்ளது.

திருகோணமலை மாவட்டத்திலுள்ள வெருகல் பிரதேச செயலாளர் பிரிவின் பரப்பளவு 32,042 ஏக்கர் ஆகும். இதில் வனவிலங்குத் துறை 25,242 ஏக்கர் நிலத்தையும், வனத் துறை 11,906 ஏக்கர் நிலத்தையும் தமக்குரியதெனச் சொந்தம் கொண்டாடி வருகின்றனர். மொத்தம் 32,042 ஏக்கர் பரப்பளவு நிலத்தைக் கொண்ட வெருகல் பிரதேச செயலாளர் பிரிவில் எப்படி 37,148 ஏக்கர் நிலத்தைக் கைப்பற்றினார்கள்? என்பது கேள்விக்குரிய விடயம். இப்படியான திறமை இந்த நாட்டில் உள்ள வனத் துறை மற்றும் வனவிலங்குத் துறை அதிகாரிகளைத் தவிர உலகத்தில் வேறு யாருக்கும் இருக்க முடியாது என மக்கள் கேலியாகப் பேசிக்கொள்கின்றனர்.

அதேபோன்று, திருகோணமலை மாவட்டத்தில் உள்ள குச்சவெளிப் பிரதேச செயலாளர் பிரிவில் 29,430 ஏக்கர் நிலத்தை வனத்துறை கையகப்படுத்தி வைத்துள்ளது; மேலும் 28,372 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்த முனைகின்றது. வனவிலங்குத்துறை 7,330 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளது. தொல்பொருள் துறையானது 1,087 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளது. புத்த பிக்குகள் 'பூஜா பூமி - பூஜா கொடை' என்ற பெயரில் 3,820 ஏக்கர் நிலத்தைக் கையகப்படுத்தியுள்ளனர். இதன்மூலம் குச்சவெளிப் பிரதேச செயலாளர் பிரிவில் மட்டும் 1985ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் விவசாயம் செய்த 70,039 ஏக்கர் நிலத்தில் நெல் உற்பத்தி செய்வது தடுக்கப்பட்டுள்ளது. இதனால் ஒரு போகத்தில் மட்டும் 140,000 மெற்றிக் தொன் நெல் உற்பத்தி குறைக்கப்படுகின்றது.

அதேபோல, தொல்பொருள் துறையும் மக்கள் விவசாயம் செய்த நிலங்களை எல்லைக் கற்களை இட்டுப் பிடித்து வைத்துக்கொண்டு, அங்கு தொல்பொருட் சின்னங்களைக்

கண்டுபிடிக்க முடியாதிருக்கும் அதேவேளை, அங்கு மக்களை விவசாயம் செய்யவிடாமலும் தடுத்து வருகின்றது. எடுத்துக்காட்டாக, திரியாய் கிராமத்தில் உள்ள ஏறத்தாழ 1,000 ஏக்கர் விவசாய நிலத்தைத் தொல்பொருள் துறையினர் கையகப்படுத்தி எல்லைக் கற்களை இட்டுப் பிடித்து வைத்துள்ளபோதிலும் மூன்று - நான்கு ஆண்டுகளாக அப்பகுதியில் எதுவித தொல்பொருட் சின்னங்களையும் அவர்களால் கண்டுபிடிக்க முடியவில்லை என்பதுடன், அந்த நிலங்களை மீள மக்களுக்கு விவசாயம் செய்ய வழங்காமலும் இருக்கின்றனர். இதனால் நெல் உற்பத்தி கடுமையாகப் பாதிக்கப்படுகின்றது.

முடிவாக, திருகோணமலை மாவட்டத்திலே 1985ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் விவசாயம் செய்த 118,710 ஏக்கர் நிலத்தை வனத் துறையினரும், 111,619 ஏக்கர் நிலத்தை வன விலங்குத் துறையினரும் 2,599 ஏக்கர் நிலத்தை தொல்பொருள் துறையினரும் 'பூஜா பூமி - பூஜா கொடை' எனும் பெயரில் ஏறத்தாழ 3,820 ஏக்கர் நிலத்தைப் புத்த பிக்குமாருமாக மக்கள் விவசாயம் செய்த 236,748 ஏக்கர் நிலத்தை விவசாயம் செய்யவிடாமல் தடுத்து வருகின்றனர். இதன்மூலம் ஒரு போகத்தில் மட்டும் ஏறத்தாழ ஐந்து இலட்சம் மெற்றிக் தொன் நெல் உற்பத்தி இல்லாமல் போகின்றது. இதனை இந்த அரசு கருத்திலே கொள்ளவேண்டும். இந்தக் காணிகளை விடுவிப்பதன்மூலம் ஐந்து இலட்சம் மெற்றிக் தொன் நெல் உற்பத்தியைக் கூட்டவும் விவசாயிகள் மகிழ்ச்சியாக வாழவும் ஆவன செய்ய வேண்டுமென்றும் அரிசி இறக்குமதியை இல்லாமற் செய்ய வேண்டுமென்றும் வேண்டி, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Upali Samarasingha. You have ten minutes.

[අ.භා. 12.03]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම ගරු විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. අප අද දවසේ විශේෂ පනත් දෙකක් යටතේ වන රෙගුලාසි සහ යෝජනා සම්මතයන් කිහිපයක් සම්බන්ධයෙන් තමයි ආණ්ඩුව පාර්ශ්වයෙන් මේ විවාදය පටන් ගත්තේ. හැබැයි, මීට කලින් කථා කළ මන්ත්‍රීවරු දෙපළම ඒවා සම්බන්ධයෙන් නොව, වෙනත් පරිබාහිර කාරණා මතු කරමින් කථා කළා. ඒ මිස මේ වඩාත් වැදගත් පනත් දෙකට අදාළ රෙගුලාසි සහ යෝජනා සම්මතවල අඩු පාඩු ආදිය පෙන්වා දෙන්න උත්සාහ කළේ නැහැ. විපක්ෂයේ කාර්ය භාරය තමයි මේ ගරු සභාවට ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පතක් හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් එතුමන්ලාගේ අලුත් අදහස්, යෝජනා ඉදිරිපත් කරන එක. සමහරු එහෙම නොකර කොහේද යන්නේ කියලා ඇහුවාට පසුව "මල්ලේ පොල්" කියනවා වාගේ තමතමන්ගේ ප්‍රදේශවල තිබෙන වෙනත් විවිධ කාරණා ගැන මතු කරමින් ඉන්නවා.

හැම දාම වාගේ විපක්ෂය පැත්තෙන් මතු කරන දෙයක් තිබෙනවා. ඒ තමයි, ඉතිහාසය ගැන කියන්න එපා, පරණ කථා කියන්න එපා, ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති, ඔබතුමන්ලාගේ රට හදන වැඩ පිළිවෙළ ගැන කියන්න කියන කාරණය. අද දවසේත් මේ ගරු සභාවේ විවාදයට මාතෘකා කරගෙන තිබෙන්නේ ඉතාම වැදගත් පනත් දෙකක් යටතේ වන කාරණා කිහිපයක්. එම නිසා මේ සාකච්ඡාව වෙනත් පැත්තකට තල්ලු කරන්නේ නැතිව, මේ රෙගුලාසි, මේ යෝජනා සම්මතයන් රටේ අනාගතය වෙනුවෙන් වඩා හොඳ විධියට ක්‍රියාත්මක කර ගන්න අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, හොඳ විවාදයක්.

අපි දන්නවා, අපේ රටේ තිබෙන සමහර නීති කෙටුම්පත් අවුරුදු 10, 15 පැරණි ඒවා බව. වර්තමානයේ පවතින තත්ත්වයන්ට, වෙළෙඳ පොළේ සිදු වන වෙනස්කම්වලට, ලෝකයේ සිදු වන තාක්ෂණික වෙනස්කම්වලට වාගේම ජනතාවගේ අවශ්‍යතාවලට, අලුත් තත්ත්වයන්ට ගැළපෙන පරිදි ඒ නීති වෙනස් කර ගැනීම තමයි වර්තමාන රජයේ බලාපොරොත්තුව. අපේ ප්‍රතිපත්තියක් ලෙස අපි හිතනවා, අපේ රටේ සිදු කරන සියලු කටයුතුවල විනිවිදභාවය, මුදල් ඉතිරි කර ගැනීම, ජනතාවට වඩාත් හොඳ සේවාවක් සැපයීම, ලෝකයේ අනෙකුත් රාජ්‍යයන් සමඟ හොඳින් ගනුදෙනු කිරීම වාගේ කාරණා පදනම් කරගෙන නීති කෙටුම්පත් කර ගැනීම කළ යුතුයි කියලා. ඒ නිසා තමයි අද අපේ පැත්තෙන්, අපේ රටේ ජනතාවගේ සුව පහසුව, අපේ රට ලෝක වෙළෙඳ පොළ සමඟ සාර්ථකව ගනු දෙනු කිරීම සම්බන්ධයෙන් වන අපේ රටට ඉතාම වටිනා මෙවැනි රෙගුලාසි, යෝජනා සම්මතයන් ආදිය ඉදිරිපත් කරන්නේ. ඒ අනුව වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් යම්කිසි නීතිමය ගැටලුවක්, කල් පසු වීමක්, නීතිමය නොවන කිසියම් තත්ත්වයක් මෙතෙක් තිබුණා නම් ඒවා වෙනස් කර ගන්න තමයි අපි මෙම රෙගුලාසි ආදිය සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන්නේ.

පසුගිය කාලය පුරාම අපේ රටේ නීති සම්පාදනය කර තිබුණා; ඒවා මඟින් විවිධ අවසර දීම් ද කර තිබුණා. නමුත්, ඒ හැම තත්ත්වයක් ඇතුළේම අපේ රටට වාහන ආනයනයේදී ඒවා අස්සෙන් රිංගලා, නීත්‍යනුකූල නොවන විධියට, බදු වංචා කරලා, සමහර විට පිටරටවලින් හොරකම් කරන ලද වාහන පවා ලංකාවට ගෙනැල්ලා ලියා පදිංචි කරලා පාවිච්චි කරලා තිබෙනවා. දැන් එම වාහන අත් අඩංගුවට ගැනීම්, විමර්ශන කිරීම් කරනවා. ඒ වාගේම පසුගිය කාලය තුළ වාහන ආනයනයේදී ඒ ආනයනකරුවන්ට වාගේම ගැනුම්කරුවන්ට මුදල් යොදවලා විශාල කාලයක් බලා ගෙන ඉන්න වුණා. එහෙම වුණේ මේ වාගේ නීතිමය කාරණා රටවල් දෙකක් අතර විසඳා ගැනීමේදී ඇති වෙච්ච බාධා නිසායි. ඒ වාගේම, ඒ ගෙන්වන ලද වාහනවල තත්ත්වය සම්බන්ධයෙන් හා ඒ වාහනයේ තාක්ෂණය සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේදී ගැනුම්කරුවන්ට අපහසුතා ඇති වෙලා තිබුණා.

ඒ වාගේම, බදු අය කරනකොට ඒ බදු නියාමනය වර්තමාන තත්ත්වයට ගැළපෙන විධියේ නීතිමය තත්ත්වයක තිබුණේ නැහැ. මේ පනත් කෙටුම්පත යටතේ රෙගුලාසි 2013 වසරේ සම්මත කරලා, ශ්‍රී ලංකා රේගුව හා මුදල් අමාත්‍යාංශය අනුමැතිය දුන්නත්, පසුගිය කාලයේ -වසර 4ක්, 5ක් පුරාවට- රටේ තිබුණු ආර්ථික තත්ත්වය හමුවේ වාහන ආනයනය ඉතාම පසුගාමී තත්ත්වයක තමයි තිබුණේ. හැබැයි, මේ විපක්ෂය පැත්තෙන් දැවැන්ත විවේචන, දැවැන්ත අභියෝග, දැවැන්ත බොරු චෝදනා එල්ල කළත්, අඩුම ගණනේ අවුරුදු 4කට, 5කට පස්සේ අපේ රටට වාහන ගෙන්වීමට වර්තමාන රජයට පුළුවන්කම ලැබුණා. අපේ රටේ ආර්ථිකය බිඳ වැටීමත් සමඟ අපේ රට ගැන ලෝකය තුළ, වෙළෙඳ පොළ තුළ තිබුණේ පසුගාමී තත්ත්වයක් සහ විශ්වාසය බිඳ වැටීමක්. නමුත්, අපේ රටේ ඩොලර් සංචිතවලට -මහ බැංකු සංචිත- හානියක් කර ගන්නේ නැතුව, අපි ලංකාවට වාහන දස දහස් ගණනක් ගෙන්වුවා. අපි ඒ ගෙන්වන ලද වාහන අධි සුඛෝපභෝගීද, ප්‍රාථමික වාහනද කියන එකට වඩා, නැවත අපේ

[ගරු උපාලි සමරසිංහ මහතා]

ලංකාවට වාහන ගෙන්වීම කියන කාරණය ගැන අපි රටක් විධියට ආඩම්බර වෙන්න ඕනෑ, වැටුණු ආර්ථිකයක් තුළ අපට එවැනි තත්ත්වයකට එන්න පුළුවන්වීම සම්බන්ධයෙන්.

ඒ වාගේම ඒ වාහන ගෙන්වීමට සම්බන්ධ සමහර සමාගම් තිබුණා. ඒවා දේශීය හා විදේශීය වශයෙන් සම්බන්ධ වෙච්ච ආයතන. ඒවා තුළ තිබුණු සමහර ප්‍රශ්න නිසාම අපට සිද්ධ වුණා, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නීත්‍යනුකූල ආනයනකරුවන් සඳහා ආයතනන නම් කරන්න. ඒ නිසා ඉදිරියේදී රටේ ජනතාවට අපහසුවීමකින් තොරව, ඉතා ඉක්මනින් ඒ සමාගම් හරහා වාහන ගෙන්වීමටත්, ඒ ගෙවන්න ලද වාහනවල තත්ත්ව පරීක්ෂාව, සාධාරණ මිල යන සියලු දේවල් ඉතා හොඳ කළමනාකරණයක් සහිතව කර ගන්න අපට පුළුවන් වෙයි.

අපේ රටේ විසර්ජන පනත යටතේ අත්තිකාරම් ගිණුම් තිබෙනවා. යම් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක සේවා සැලසීමේදී ඒ සඳහා අය වැය ලේඛනය මඟින් මුදල් වෙන් කිරීම සඳහා ක්‍රමයක් තිබුණා. හැබැයි, අවුරුදු 10ක්, 12ක් යනකොට ඒ ක්‍රමය ඇතුළේ, ඒ අදාළ ප්‍රධාන කාරණා 10 තුළ මේ වෙනකොට තිබෙන තත්ත්වය ගැන නැවත පරීක්ෂණයක් කරලා, සමීක්ෂණයක් කරලා, නිරීක්ෂණයක් කරලා, අදට ගැළපෙන විධියේ සේවා සපයන්න පුළුවන් වන ආකාරයට ඒ ආයතන සඳහා තව වැඩියෙන් මුදල් වෙන් කරන්න ඕනෑද, එහෙම නැත්නම් ඒ මුදල් අඩු කරන්න ඕනෑද කියන කාරණය සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න අපට සිද්ධ වෙනවා.

ඒ නිසා විශේෂයෙන්ම මෙන්න මේ යෝජනා 10 සඳහා වන සාකච්ඡාවක් අදාළ ආයතන සමඟ කරගෙන අපි තීන්දු කරලා තිබෙනවා, ජනතාවට පහසුවක් වන විධියටත් රාජ්‍ය මුදල් පරිස්සම් වන විධියටත් මේ කටයුත්ත කරන්න.

මම අවසාන වශයෙන් උත්තර කිහිපයක් සපයන්න ඕනෑ. විශේෂයෙන්ම ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ලුණු සම්බන්ධ ප්‍රශ්නයේ දී කිව්වා, පුත්තලම ලුණු නිෂ්පාදන ආයතනය අපේ රටට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 50ක් නිෂ්පාදනය කරනවා කියලා. ඇත්තටම අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා ඒකට උත්තර දුන්නා. මම සමුපකාර සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා ලෙස කියන්න ඕනෑ, පුත්තලමේ සියලු ලුණු නිෂ්පාදනකරුවන්ගේ එකතුවේ තිබෙන්නේ මෙට්‍රික්ටොන් 30,000කට පොඩ්ඩක් වැඩි ප්‍රමාණයක් බව. එතුමා කිව්වේ සියයට 50ක ප්‍රමාණයක් කියලා. වගකීමක් සහිතව කථා නොකර මේ වාගේ ප්‍රකාශ කිරීම ගැන අපි කනගාටු වෙනවා. අද වෙනකොට අපි මෙට්‍රික්ටොන් 600ක් ලුණු ගෙනැල්ලා තිබෙනවා. අද ඒවා මුදා හරිනවා. අද සිට දිගටම මේ දවස් කිහිපය ඇතුළත අවශ්‍ය ලුණු ප්‍රමාණය දෛනිකව වරායෙන් පිට කරනවා.

ඊයේ අපේ රිසාඩ් බදියුදීන් මැතිතුමා මන්නාරම සහ පුත්තලම අතර තිබෙන මාර්ගයක් ගැන කථා කරමින් කිව්වා, ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමිය පොරොන්දු වුණා කියලා ඒ පාර විවෘත කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Upali Samarasingha, your time is up.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

අපි එතුමාට කියන්න ඕනෑ, අපි මේ රටේ වැඩ කරන්නේ විශේෂයෙන්ම අධිකරණයට ගරු කරලා. මේ වෙනකොට මේ සම්බන්ධ අධිකරණ තීන්දුවක් තිබෙනවා. ඒ නිසා අපි ඉදිරියේදී ඊට අදාළ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමන්ලා වාගේ උසාවියට වෙනත් මාර්ගයකින් බලපෑම් කරලා අපට මේ කටයුතු කරන්න බැහැ. අපි මන්නාරම් ජනතාවට පොරොන්දු වෙනවා, ඒ ජනතාවගේ දැවෙන ප්‍රශ්නයට අදාළව කටයුතු කරන්න.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have 12 minutes.

[අ.භා. 12.13]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද 22වෙනි දා, 05වන මාසයේ. අද ජන රජ දිනය. 1972.05.22වන දා දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇතුළු සමඟි පෙරමුණු ආණ්ඩුවේ අපේ පක්ෂයේ නායකයෝ තමයි පූර්ණ නිදහස මේ රටට අරගෙන දුන්නේ. අපි මේ රටේ නිදහස 1948 පෙබරවාරි 4වන දා සැමරුවාට, පෙබරවාරි 4 නොවෙයි අපට නිදහස ලැබුණේ. 1972 අද වාගේ දවසක තමයි -මැයි මාසයේ අද වාගේ දවසක- මේ රටට සම්පූර්ණ නිදහස ලැබුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමඟි පෙරමුණු ආණ්ඩුවක් යටතේ තමයි මේ රටට නිදහස ලබා දුන්නේ.

අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ගැන කථා වුණාට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙන් හොඳ කථාවක් එළියට ආවා. මොකක්ද ඒ කථාව? අර්ච්චුනා මන්ත්‍රීතුමා අලිමංකඩ ලුණු දකුණට එවන්න එපා කියනවා කියලා. හරි. ඒක තමයි අපි කිව්වේ. අර්ච්චුනා හරි. ඒක තමයි අපේ අය රණවිරුවෝ වුණේ. අර්ච්චුනාලා තමයි අපේ අය රණවිරුවෝ කළේ. ලුණු විතරක් නොවෙයි අපේ රටට නැති වෙන්නේ, 2009 යුද්ධය තව ටික දවසක් තිබුණා නම්. අන්න ඒක පිළිගන්න දැන්වත්. ඒ නිසා දැන්වත් සොල්දාදුවෝ කියන්න එපා. දැන්වත් ජනාධිපතිතුමාට කියන්න ඒක පිළිගන්න කියලා. ඒක පිළිගෙන තිබෙනවා රටේ ඇමති කෙනෙක්. ඇමති කෙනෙක්ගේ කටින් අද කියවුණා. අලිමංකඩ ලුණු දකුණට එවන්න එපා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද කිව්වේ?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කිව්වාද, නැද්ද කියන එක වැඩක් නැහැ. රටේ ඇමති කෙනෙක් නේ කිව්වේ. ලුණු භාරව ඉන්න කර්මාන්ත ඇමතිවරයා. අලිමංකඩ ලුණු ලේවාය තිබෙන්නේ

එතුමා යටතේ. මන්නාරම ලුණු ලේවාය තිබෙන්නේ එතුමා යටතේ. එතුමාගේ වගකීමෙන් කිව්වේ ප්‍රභාකරන්ගේ කාලයේ ඒවා දැන් වෙන්නේ නැහැ කියලා. එතුමා මෙතැන කියපු කථාව මම මේ කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ ගරු සභාවේදී ඇමති කෙනෙක් කථා කළා, උතුරේ යුද්ධය හරියට අපි කළ දෙයක් වාගේ. අපි ජාතිවාදියෝ නොවෙයි. මේ යුද්ධය පටන් ගත්තේ මොකක් නිසා ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා මැරුවේ අපිද? ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා මැරුවේ ප්‍රභාකරන්ලා. ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා මරලා පටන් ගත්ත යුද්ධයනේ, මේ. ඊට පස්සේ මොකක්ද වුණේ? 1983දී ජුලි කලබල ඇති වුණා. මේ පැත්තේ මිනිස්සුන්ට කරදර වුණා. ඊට පස්සේ 1986දී ජේ.ආර්. ජයවර්ධන වඩමාරච්චි මෙහෙයුමේ අවසාන මොහොත පෙනි පෙනී ඒ මෙහෙයුම අවසන් කරන්න යනකොට මොකක්ද වුණේ? ඉන්දියාවෙන් ඇවිල්ලා මේ රටට බඩු දැම්මා.

1987දී රජීව් ගාන්ධි ලංකාවට බලෙන් ආවා. ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම ගැහුවා. මේ රට ගිනි ගත්තා. අවශ්‍ය නැති පළාත් සභාවක් අපේ රට ඇතුළට ගෙනැත් දැම්මා. එදා ගෙනාපු පළාත් සභා ක්‍රමයට කවුද විරුද්ධ වුණේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, ජේවීපී එකයි. පළමුවැනි පළාත් සභා මැතිවරණයේදී ඡන්දය ඉල්ලුවේ නැත්තේ ජේවීපී එකයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. පළමුවැනි පළාත් සභා මැතිවරණය වර්ජනය කළේ ජේවීපී එකයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. පළමුවැනි පළාත් සභාව ජේවීපී එකේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් නියෝජනය කළා ද? නැහැ. පළමුවැනි පළාත් සභා මැතිවරණය ඔයගොල්ලොයි, අපියි තමයි මුලින්ම වර්ජනය කළේ. මොකක්ද වුණේ? ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ඇමතිවරු ඉවත් වුණා; බස් ගිනි ගත්තා; ඇඳිරි නීතිය වැටුණා. ඊට පස්සේ පළාත් සභා ක්‍රමයත් ආවා. ඊට පස්සේ රණසිංහ ප්‍රේමදාස මහත්මයා මොකක්ද කළේ? රණසිංහ ප්‍රේමදාස මහත්මයා 1988දී පැවති ජනාධිපතිවරණයේදී දීපු පොරොන්දුව මොකක්ද? ප්‍රභාකරන්ලාට මොකක්ද කිව්වේ? ඉන්දියන් සාම සාධක හමුදා යවනවා කිව්වා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගෙනාපු ඉන්දියන් සාම සාධක හමුදාව, එතුමාගේම පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වෙච්ච රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ ආපසු යැව්වා. ඉන්දියන් සාම සාධක හමුදාව යැව්වා විතරක් නොවෙයි, කාලයක් කිව්වා කොක්කුතොඩුවායිවලින් ආයුධත් දුන්නා කියලා. ඒ කාලයේ එහෙම කිව්වා නේ. බ්‍රිගේඩියර් ජානක පෙරේරා ඇතුළු අය කොක්කුතොඩුවායිවලින් ආයුධත් දුන්නා කියලා කිව්වා.

ඊට පස්සේ මොකක්ද වුණේ? 1990.05.05වන දා මට හොඳට මතක දවසක්. 1990.05.05වන දා පුල්මුඩේ, කුච්චවේලි, උප්පුවේලි ඇතුළු උතුරු, නැඟෙනහිර පොලිස් ස්ථාන කීයක් යටත් කර ගත්තාද? පොලිස් නිලධාරින් කීදෙනෙක් දණ ගැස්සුවාද? යටත් කළාද? රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා එදා ඒ අයට කිව්වා, සුදු කොඩි උස්සලා යටත් වෙන්න කියලා. මොකක්ද වුණේ? අපේ රටේ හැම නායකයෙක්ම ත්‍රස්තවාදීන්ට දණ නැමුවා. නැහැ කියන්න බැහැ. අපි 1987දීත් ත්‍රස්තවාදීන්ට දණ නමලා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පළාත් සභා ක්‍රමය ගෙනාවා. 1989දී ඉන්දියන් සාම සාධක හමුදාව අපේ රටින් යවලා, 1990.05.05වැනි දා උතුරු, නැඟෙනහිර තිබුණු සියලු පොලිස් ස්ථාන ත්‍රස්තවාදීන් විසින් යටත් කර ගත්තාට පස්සේ, සුදු කොඩි උස්සලා යටත් වෙච්ච පොලිස් නිලධාරින් 675 දෙනෙකු මරා දැම්මා. නැඟෙනහිර ඉඳන් උතුරේ මායිමට යනකම් මැරුවා.

ඊට පස්සේ මොකක්ද වුණේ? 1994දී චන්ද්‍රිකා නෝනා ජනාධිපතිවරිය බවට පත් වුණා. ආයෙමත් සාම සාකච්ඡා මේසයට ගියා. ඒවායින් ප්‍රතිඵලයක් අත් වුණාද? පළාත් සභා ක්‍රමය ප්‍රභාකරන් පිළිගත්තාද? පළාත් සභා ක්‍රමයට එකඟ වුණාද? නැහැ. ඒ විතරක්ද? ඊට පස්සේ 2002දී රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව කාලයේ අපේ රටට එරික් සොල්හයිම් ආවා. ඊට පස්සේ අවුරුදු දෙකක් සාම සාකච්ඡා ගියා. ත්‍රස්තවාදීන් ඒවා පිළිගත්තාද? නැහැ. ඊට පස්සේ මොකක්ද වුණේ? 2005දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වුණා. ඒ ආණ්ඩුව කාලයේ 2006දී මාවිල්ආරු අමුණ වහලා නැවත යුද්ධය පටන් ගත්තේ අපිද? අපිද මේ රටේ යුද්ධය ඉල්ලුවේ? කිසිම අවස්ථාවක අපට එහෙම කියන්න එපා. ඊයේ ඇමතිවරයෙක් කියනවා, අපි ගිහිල්ලා යුද්ධය ඉල්ලා ගත්තා කියලා. අපි යුද්ධයක් ඉල්ලුවේ නැහැ. කිසි කෙනෙක් අපේ සිංහල මිනිසුන්ව ජාතිවාදී විධියට මනින්න එපා. සිංහල මිනිස්සු කවදාවත් බලෙන් යුද්ධය ඉල්ලුවේ නැහැ. අපේ නායකයන් මැරුණා. රන්ජන් විජේරත්න පාරේ මැරුණා. සී.වී. ගුණරත්න පාරේ මැරුණා. කී දෙනෙක් මැරුණා ද? රණසිංහ ප්‍රේමදාස පාරේ මැරුණා. රණසිංහ ප්‍රේමදාසට මොකද කළේ? ප්‍රේමදාස අවි ආයුධ දුන්නා කියලා කිව්වා. ප්‍රේමදාස ඉන්දියන් සාම සාධක හමුදාව යැව්වා. හැබැයි, රණසිංහ ප්‍රේමදාස ඉන්දියන් සාම සාධක හමුදාව යැව්වා කියලා, 1993 මැයි 1වැනි දා ප්‍රේමදාස ඉතුරු කළා ද? ප්‍රේමදාස මැරුවා. ඒ වාගේම රටේ නායකයෝ මැරුවා. දහස් ගණන් සෙබළු මැරුණා. අපේ ගමකට ගිහිල්ලා බලන්න, හමුදා සොල්දාදුවෙක් මිහිදන් කරපු සොහොනක් නැති සුසාන භූමියක් කොහේද තිබෙන්නේ කියලා. පුළුවන් නම් කවුරු හරි ඇවිල්ලා කියන්න එවැනි සුසාන භූමියක් තිබෙනවා ද කියලා.

මෙතැනත් ද්‍රවිඩ මන්ත්‍රීවරු ඉන්නවා. උතුරු, නැඟෙනහිර මන්ත්‍රීවරු ඉන්නවා. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, අපි කථා කරන්න ඕනෑ මේ රට වෙනුවෙන්. වසර තිස් ගණනක් පැවති යුද්ධය ජයග්‍රහණය කරලා අවුරුදු 16ක් ගත වන මේ මොහොතේ අපිට නිදහස ලැබිච්ච මේ රට වෙනුවෙන් අපි කථා කරන්නේ නැද්ද? එහෙම නම් අපි මොකටද මේ පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ? මේ සැරේ පළාත් පාලන මැතිවරණයේදී ඔයගොල්ලන්ගේ මන්ත්‍රීවරුන්ට බහුතරයක් ඡන්ද දීලා තිබෙන්නේ කොහෙන්ද කියලා බලන්න. ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ දිස්ත්‍රිකයේ හෝමාගම, මහරගම, කැස්බෑව, කඩුවෙල වාගේ ප්‍රදේශවල ඔයගොල්ලන්ට තමයි බහුතර ඡන්ද ලැබුණේ. සිංහල බහුතර මිනිස්සු ඡන්දය දීලා තිබෙන්නේ මාලිමාවට. කුරුණෑගල බලන්න. කුරුණෑගල කී දාහක් හමුදා සොල්දාදුවන් ජීවිත පූජා කළාද? ඇත ගම්දනව්වල, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල, මාතර, ගාල්ල ආදී ප්‍රදේශවල කී දාහක් තරුණයෝ මේ යුද්ධය වෙනුවෙන් ජීවිත පූජා කළාද? ඒ නිසා මේ යුද්ධයේ ජයග්‍රහණය ගැන, කවුරු හරි කියනවා නම් අපි ඒක වැරදි විධියට කළා කියලා, එහෙම කියන්න එපා.

වැරදි විධියට ඉල්ලා ගත්තා. අද ඇමතිතුමා කියනවා නේ, අර්චුනා මහත්මයා ගිහින් ලුණු එවන්න එපා කියා තිබෙනවා කියලා. අපට ලුණු එවන්න නොවෙයි, අපේ රටේ වවුනියාවෙන් එහා පැත්තට, යාපනය පැත්තට පයින් ගිහින් බලලා එන්නවත් බැරි තත්ත්වයට මේ රට පත් වෙලා තිබුණා. අන්න ඒක අපි කවුරුත් පිළිගන්න ඕනෑ. අද අත පය නැති රණ විරුවන් දහස් ගණනක් ඉන්නවා. ඒ රණ විරු ජයග්‍රහණය සුළුවෙන් තකන්න එපා.

ජනාධිපතිතුමාගේ කථාවේදී සමහරවිට වරදින්න පුළුවන්. මේ රටේ නායකයින් ඔළුවේ ප්‍රශ්න තියාගෙන නේ ඉන්නේ. නමුත් ඒ කථාව -ජනාධිපතිතුමා කළ කථාව- අනෙක් අය ඇවිත් මේ පාර්ලිමේන්තුවේ එහෙම කියන්න එපා. මේ, ඔයගොල්ලන්ගේ ආණ්ඩුව, ඔයගොල්ලන්ගේ රජය. අපි මේ රටේ දේශපාලන නායකයෝ එක්ක වැඩ කරලා තිබෙනවා. මම 2009 ඌව පළාත් සභාවට ඉල්ලපු දවසේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය දිනපු දවසේ, -මම මේ කථාව මේ පාර්ලිමේන්තුවේ පළමුවැනි

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

වතාවට කියන්නේ. යුද්ධය දිනපු මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ඒ කාලයේ කිසිම කෙනෙක් විවාද කරන්නේ නැහැ; තර්ක කරන්නේ නැහැ- මම පළමුවැනියට තර්ක කළා. මොකක්ද මම කිව්වේ? එදා නිමල් සිරිපාලට විරුද්ධව අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ නායිකාවක් කේලමක් කිව්වා. මහින්ද මහත්මයා මගෙන් ඇහුවා, "චාමර මේ කියන්නේ ඇත්තද?" කියලා. මම කිව්වා, "සර්, මෙයාට පිස්සු" කියලා. කේලාම් කියන එක මම නැවැත්තුවා. එදා මහින්ද මහත්තයා මට විරුද්ධව නැඟිට්ටා. හැබැයි 2015දී කේලම නිසා මෛත්‍රීපාල මහත්මයා ගිහිල්ලා ඡන්දය ඉල්ලුවා. මෛත්‍රීපාල මහත්මයා ජනාධිපති වුණා. ඒ, කේලමක් නිසා.

2022දී අපි ගෝඨාභය මහත්මයාව බලයට ගෙනාවා. ඊට පසුව පොහොර පිළිබඳ ප්‍රශ්නය ඇති වුණා. මැති ඇමතිවරු 20ක් ජනාධිපතිතුමා ළඟ හිටියා. නිමල් සිරිපාල, රමේෂ් පතිරණ, චන්ද්‍රසේන ගෝඨාභය මහත්මයා වට කරගෙන හිටියා. හැබැයි මැති ඇමතිවරු කැබිනට් එකේ අනුමත කරලා ඇවිල්ලා නායකයාට බයේ කටවල් අරින්නේ නැතිව හිටියා. මැති ඇමතිවරු නායකයාට බයේ කට ඇරියේ නැහැ. එදා විෂයභාර ඇමති අලුත්ගමගේ මහතා අද බන්ධනාගාරගතව ඉන්නවා. ඔහුගෙන් අහන්න, මම විතරයි කෙළින් ගිහින් කිව්වේ, "මේක කරන්න එපා. මේක කළොත් යුද්ධයට වඩා අමාරු වැඩක් වෙනවා මේ පොහොර ප්‍රශ්නය. ඒ නිසා ඔබතුමා දෙවැනි වතාවේ ජනාධිපතිවරණය දිනලා ඔය වැඩේ කරන්න. දැන් ඕක කරන්න එපා" කියලා. මොකක්ද වුණේ? අතුකෝරල මන්ත්‍රීතුමා අහිංසකම මන්ත්‍රීවරයා. මේ පිටුපස ඉන්නෙත් අහිංසක මන්ත්‍රීවරු. මේ ඉස්සරහා ඉන්න අය ගැන නම් අපි දන්නවා. මේ අය පණ යනකම් ජේවීපී කරලා, කරලා ඇවිත් ඉන්නේ. මේ ඉන්න අනෙක් අය වෘත්තීයවේදීන්, යම් යම් ව්‍යාපාරවල හිටපු අය, ගුරුවරු, නැත්නම් වැදගත් රැකියාවල ඉඳලා ආපු අය. මේ අය පළි නැහැ, මොනවා හරි වුණාම. අන්තිමට මොකද වුණේ? අන්තිමට වුණේ අර පොළොන්නරුවේ අහිංසක මනුෂ්‍යයා මැරුණු එකයි. අතුකෝරල මන්ත්‍රීතුමා පාරේ මැරුවා. ඒක තමයි අන්තිමට වුණේ, පොහොර ප්‍රශ්නයෙන්. ඒ නිසා අපි නායකයින්ට,- *[බාධා කිරීමක්]* මේ සරත් නියෝජ්‍ය ඇමතිතුමා, පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා අහනවා වාගේම ඔබතුමාට මේ ආණ්ඩුව ගෙනියන්න වුවමනාව ඇති. හැබැයි, ආණ්ඩුව ගෙනියන්න නායකයාට කෙළින් කථා කරන්න. "සර්, මේක කරන්න එපා. සර්, අපි බෞද්ධ රටක ඉන්නේ. බහුතරයක් සිංහල මිනිස්සු ඉන්නේ" කියලා වැරදි තැන් පෙන්වලා දෙන්න. "සහෝදරයා" කියලා හරි, කොහොම හරි කියලා ඔයගොල්ලන්ගේ භාෂාවෙන් කියන්න. මම දන්නේ නැහැ, ඔයගොල්ලන්ගේ භාෂාව. ඔයගොල්ලන්ගේ භාෂාව අපි දන්නේ නැහැ. හැබැයි, වැරදි පාරේ යනවා නම් හරවන්න. අපි වැරදි පාරේ ගිහින් හැරෙව්වා. මට ඌව පළාත් සභාවේ ඇමතිකම දුන්නේ නැහැ, වැරදි පාරේ යනකොට හරවන්න ගිහිල්ලා. ඒ ගැන දයාසිරි ජයසේකර ලේකම්තුමා දන්නවා. නායකයින් වැරදි පාරට හරවන්න එපා.

ගෝඨාභය මහත්මයාට මම පළමුවැනි වතාවට කියනකොට ඇමතිවරු 22ක් ළඟ තියාගෙන හිටියා. එක ඇමති කෙනෙක් කිව්වේ නැහැ. මට රමේෂ් පතිරණ කිව්වා, ඒ ගැන තව ටිකක් කියන්න කියලා. මම කිව්වා. මම කිව්ව එක හරි ගියා, නියෝජ්‍ය ඇමතිතුමා. මම එළියට එන්න ආවා. මොකද වුණේ? අවුරුද්දක් යනකොට අරගළයක් හැදුණා. අන්තිමේදී මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ගිනි ගත්තා. එක මන්ත්‍රීවරයෙක් මැරුණා. මැරුණු මන්ත්‍රීවරයාගේ මළගෙදරට පොළොන්නරුවට යන්න 225න් එක්කෙනකුවත් හිටියේ නැහැ. චාමර සම්පත් විතරයි පෙට්ටියට අත ගහලා ආවේ තනියෙන් ගිහිල්ලා. ඊයේ පෙරේදා මන්ත්‍රීවරයෙක් මැරුණා. එතකොට මම හිරගෙදර. හිරගෙදර හිටියේ නැත්නම් මම ඒ මළ ගෙදරට සහභාගි වෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔයගොල්ලන්ගේ එක්කෙනෙක් නැති වුණා නේ. මම හිටියා නම්, ඒ මළ ගෙදරත් යනවා. මට යන්න බැරි වුණා. එදා මම හිර ගෙදර හිටියේ. මම දැනගත්තා, මන්ත්‍රීවරයෙක් නැති වුණා කියලා. මේවා අහගන්න. 225න් එක මන්ත්‍රීවරයෙක් හිටියේ නැහැ, පාරේ මැරුණු මන්ත්‍රීවරයාගේ මළ ගෙදරට යන්න; සහභාගි වෙන්න.

මම විතරයි ගියේ. ගෙවල් ගිනි ගන්නවා, ඒ වෙලාවේ පොළොන්නරුවට යන්න බැහැ. මම ඒ මන්ත්‍රීතුමාගේ ගෙදරට ගිහිල්ලා ඒ අවමංගල්‍ය කටයුතුවලට සහභාගි වෙලා ආවා. ඇමතිලා ආණ්ඩු කරයි, ඇමතිලා ගාණ සොයා ගනීවි, ඇමතිලා හොඳට ඉඳීවි, ඇමතිලා විපක්ෂයටත් ගිහිල්ලා ඉඳීවි. ඊළඟ සැරේ කියයි, අපි ටික විපක්ෂයට යමු කියලා. හැබැයි, පසු පෙළ සහ අනික් සියලුදෙනාට මම කියන්නේ, ඒකේ පරිප්පුව ඔක්කෝම තමයි කන්නේ කියලා. අපි ඒ පරිප්පුව කෑවා. අපි 153දෙනෙක් හිටියා, ඔතැන. මම හිටියේ අන්න අර මගේ සහෝදර බලගල්ල මන්ත්‍රීතුමා හිටපු පුටුවේ. මමත් හිටියා, ඔතැන. ඔක්කෝම පරිප්පු කෑවේ එක වැරැද්දකට. ඒ නිසා වැරදි කළා වාගේම වැරැද්ද නිවැරදි කරන්න බලන්න. නායකයෝ නිවැරදි කර ගන්න. නායකයන්ගෙන් සමහර වෙලාවට වැරදි වචන කියැවෙනවා. නායකයෝ අතින් සමහර වැරදි වෙනවා. අපි ඒවාට ඒවා මේවා කියන්නේ නැහැ. හැබැයි, මේ රණවිරු ජයග්‍රහණය පහළට දාන්න එපා. මේ රණවිරු ජයග්‍රහණය අද අර්ච්චුනාගෙන්ම ආවා නේ, එළියට. අපේ අර්ච්චුනාගේ කටින්ම ආපු එක, අපේ කර්මාන්ත ඇමතිතුමාත් කිව්වා නේ. ඒ නිසා ඒ ගැන අපි කල්පනාවෙන්, මේ රණවිරුවන් කළ උතුම් දේ, ඒක ආරක්ෂා කරන්න. සොල්දාදුවෙක් නොවෙයි, රණ විරුවාට වැඩිය උසස් වචනයක් කියන්න තියෙනවා නම්, ඊටත් වැඩිය උඩින් තියලා ඒ වචනය කියන්න. ඒ රණ විරුවන් උඩින් තියලා කථා කරන්න. එහෙම කථා කරලා ඒ ජයග්‍රහණය විඳින්න. මේවා අපි ඉල්ලාගෙන කාපුවා නොවෙයි, අපට දැම්ම පරිප්පු. කැබිතිගොල්ලෑවේ කපලා මරපු ටික දැකපු ගමන් තමයි මහින්ද රාජපක්ෂ මහත්තයාටත් සිද්ධ වුණේ යුද්ධයට යන්න, යුද්ධය ඉවර කර ගන්න. පසු පෙළ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි, මේ සියලුදෙනාට, මේ 225ටම දේශපාලනය තුළ හැමදාම නත්තල් නැහැ කියන එකත් හොඳට හිතාගන්න. හැමදාම නත්තල් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Manoj Rajapaksha. You have a total allocation of 11 minutes. I might have to interrupt you to suspend the Sitting for the lunch break. You may continue with your submission after the lunch break.

[අ.භා. 12.28]

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මෙම විවාදයට තුඩු දී තිබෙන එක් මාතෘකාවක් තමයි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුමත කිරීම. විශේෂයෙන්ම වාහන ගෙන්වීමේදී තිබෙන අකාර්යක්ෂමතාව නැති කරන්නත්, ඒ වාගේම වාහන ගෙන්වීමේදී රටවල් දෙකේ බැංකු අතර ගනුදෙනු කිරීමේදී LCs පවත්වාගෙන යෑමේදී හුවමාරු වන ලිපි ගොනුවල නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමත් මේ තුළින් අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම අත්තිකාරම් ගිණුම්වල සීමා වෙනස් කිරීම සම්බන්ධවත් අද අපි විවාදයට ගන්නවා.

ඉතින් මේ විවාදය ආරම්භ කරනකොට පෙනෙන කාරණයක් තමයි, විශේෂයෙන්ම අද විපක්ෂය මේ විවාදයට සම්බන්ධ වෙන්නේ නැතිම තරම් කියන එක. මොකද, මෙතෙක් වෙලා විපක්ෂය පැත්තෙන් දක්වපු කරුණු ගත්තාම, මේ විවාදයට අදාළ කාරණා කියැවුණේ අල්ප වශයෙන්. විශේෂයෙන්ම ගත්තොත්, ආරම්භයේ සිටම අපි දැක්කා, මේ පාර්ලිමේන්තුව තුළ දීර්ඝ කාලයක් විවිධ වගකීම් දරමින්, ඇමති ධුර දරමින් වැඩ කරපු ජ්‍යෙෂ්ඨ යැයි කියා ගත්ත මන්ත්‍රීවරුන් මාතෘකාවෙන් එළියේ විවිධ කාරණා කියලා මේ පාර්ලිමේන්තුවේ වටිනා කාලය, මේ විවාදය සඳහා වෙන් කර තිබෙන වටිනා කාලය විවිධ වල්පල්වලට වෙන් කරන ආකාරය. මම හිතන විධියට අපි නැවත වතාවක් ඒ ගැන කල්පනා කරන්න වෙනවා.

ඒ කොහොම වුණත් අපි දන්නවා, අද දවසේ අපි මේ දේවල් සාකච්ඡා කරන්නේ ආර්ථිකය බිඳ වට්ටපු රටක සිට බව. විශේෂයෙන්ම ජපානයෙන් වාහනගෙන්වීමේදී සිදු වුණු අකාර්යක්ෂමතා නිසා විවිධ අකටයුතුකම් සිද්ධ වෙලා තිබෙනවා. වාහන ගෙන්වීමේදී හුවමාරු වන ලිපිගොනුවල විවිධ අඩුපාඩු තිබෙනකොට ඒ වාහන ගෙන්වා ගන්න අයට නොයෙක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. අන්න ඒවා නැති කරලා කාර්යක්ෂම ලෙස මේ කටයුත්ත ඉදිරියට අරගෙන යෑමේ අරමුණ සහිතව තමයි විශේෂයෙන්ම අපි මේ අලුත් සංශෝධනය කරලා තිබෙන්නේ, අති විශේෂ ගැසට් නිවේදනය මඟින්.

අපි දන්නවා, වාහන ගෙන්වීමේදී දෙරට අතර මූලිකවම ආයතන ගණනාවක් සම්බන්ධ වෙන බව. එතැනදී Bureau Veritas කියන ආයතනයත් විශාල කාර්යභාරයක් කරමින් දෙරට අතර මේ වාහන ගනුදෙනුව සිදු කර ගැනීම වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් කරන්නට තමයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ.

ජපානයෙන් වාහන ගෙන්වීමේදී, ජපානයෙන් මෙරටට වාහන එවන පුද්ගලයා විසින් විශේෂ ලිපිගොනු ගණනාවක්ම සකස් කළ යුතුයි. ඒ වාගේම Inspection Certificate එකක් අවශ්‍ය වෙනවා. ඒ certificate එක නිල විධියට අවශ්‍ය නිල මුද්‍රා තියලා, ලිපිගොනු විධියට තමයි අපේ රටට එවලා තිබෙන්නේ. ඒ ලිපිගොනුවල සීල් තැබීම් වාගේ විවිධ අඩුපාඩු තිබුණොත් courier ක්‍රමයට තමයි ඒ ලිපිගොනුව නැවත ජපානයට යවන්නේ. ඒ අඩු පාඩු සකස් කරලා, නැවත courier කරලා ගෙන්වා ඊට පස්සේ තමයි අවශ්‍ය කටයුතු සිදු කරගෙන යන්නේ. මෙන්න මේ ක්‍රමවේදය ගත්තාම ටිකක් දීර්ඝ කාලයක් ගතවන නිසා වාහනයක් ගෙන්වා ගැනීමේදී විශේෂ දුෂ්කරතාවලට මුහුණ පාන්න සිදු වෙලා තිබෙනවා. අන්න ඒ තත්ත්වය අවම කරලා කාර්යක්ෂමව වාහන ගෙන්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම තමයි අද කරන මෙම සංශෝධනවල මූලික අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ.

අපේ ආණ්ඩුව දැන් ඒ කාර්යයට අත තියලා තිබෙනවා. පසුගිය වසර තුනක වාගේ කාලය තුළ අපේ රටට වාහන ගෙන්වූයේ නැහැ. අපේ ආණ්ඩුව ආවාට පසුව දැන් වාහන ගෙන්වන්න පටන් අරගෙන තිබෙනවා. ඒ අනුව වාහන දස දහස් ගණන් ලංකාවට එන්න පටන් අරගෙන තිබෙනවා. අපේ ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, ඒ වාහන ගෙන්වා ගැනීමේදී අවශ්‍ය පහසුකම් හදලා, දුෂ්කරතා මඟහරවලා ඊට නිසි ක්‍රමවේදයක් සකස් කරලා දෙන්න. ඒක තමයි විශේෂයෙන්ම අද අපි ගෙනෙන මේ රෙගුලාසි තුළින් බලාපොරොත්තු වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Manoj Rajapaksha, you may continue, please. You have a balance of seven minutes.

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි කථා කරමින් සිටින්නේ විශේෂ වැදගත්කමක් සහිත ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සහ විසර්ජන පනත යටතේ ගෙනෙන යෝජනා සම්මත කිරීම් දහයක් අනුමත කිරීම පිළිබඳවයි. පසුගිය වසර ගණනක් අපේ රටට වාහන ගෙන්වීම නවත්වා තිබුණා. පසුගිය කාලයේ පැවති ආණ්ඩු අපේ රටේ ආර්ථිකය බිඳ වට්ටලා, මිනිස්සුන්ගේ ජන ජීවිතය කඩා වට්ටලා තිබුණු පරිසරයක් තුළ අපේ රටට වාහන ගෙන්වීමත් නවත්වන්න සිද්ධ වුණා. අපේ ආණ්ඩුව පත් වෙලා කෙටි කාලයක් තුළ අපට පුළුවන්කම ලැබුණා, නැවත වාහන ගෙන්වන්න කටයුතු කරන්න. නමුත් නැවත වාහන ගෙන්වීමේදී ලෝකයේ වෙච්ච වෙනස්කමක් තිබුණා. ඒ තමයි, වසර කිහිපයක් තුළ, අපි ලංකාව විධියට වාහන ගෙන්වන්නේ නැතුව ඉන්නකොට, ලෝකයේ වාහන තාක්ෂණය වෙනස් වෙලා තිබීම. විශේෂයෙන්ම හයිබ්‍රිඩ් වාහන තාක්ෂණය වෙනස් වෙලා තිබුණා. ඒ වාගේම, ඉලෙක්ට්‍රික් වාහන විශාල වශයෙන් අපේ රටට ගෙන්වන්න ජනතාවගේ උනන්දුවක් තිබුණා. ඒක නිසා ජපානයෙන් වාහන ගෙන්වීමේදී ඒ තිබුණු පැරණි ක්‍රම වෙනස් කිරීමේ අවශ්‍යතාව ඉතා තදින් දැනුණා.

විශේෂයෙන්ම මම පෙර මතු කරපු විධියට ඒ අවශ්‍ය ලිපි ලේඛන හුවමාරුවීමේ ක්‍රමය ප්‍රශ්නගත වුණා වාගේම, ඉතා සෙමින් තමයි ඒ කටයුතු සිද්ධ වුණේ. එය වෙනස් කිරීම සඳහා අපි ආණ්ඩුව විධියට ආර්ථිකය ඩිජිටල්කරණය කරලා, අලුත් තාක්ෂණය හරහා අවශ්‍ය හුවමාරු කිරීම් කර ගන්න දැන් පියවර තබා තිබෙනවා.

විශේෂයෙන්ම වාහනයක් ගෙන්වීමේදී වාහනයේ තත්ත්ව සහතිකය එහෙම නැත්නම් inspection certificate එක ඉතා වැදගත්. ඒ certificate එක ලංකාවට ගෙන්වා ගෙන, ඒවා පරීක්ෂා කිරීමේදී සිදු වන අඩු පාඩු නැවත සකස් කරන්න ඕනෑ නම් ලිපි ගොනුව නැවත යවන්න ඕනෑ කියන කාරණය තමයි අපි කථා කරමින් හිටියේ. මේ සංශෝධනයත් එක්ක සිද්ධ වෙන්නේ ඒ ලිපි ලේඛනවල යම් අඩුවක් තිබුණත්, ඒවා කුරියර් ක්‍රමයට නැවත යවන්නේ නැතුව, ලංකාවේ ඉඳලාම online ක්‍රමය හරහා ඒ තොරතුරු තහවුරු කර ගන්න පුළුවන්කම ලැබෙන එකයි. ඒ අනුව ඒවායේ නිරවද්‍යතාව තහවුරු කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඉන්පසුව අපට පුළුවන්කම තිබෙනවා, ඒ වාහන ගෙන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කාර්යක්ෂමව ඉදිරියට අරගෙන යන්න. ඒක තමයි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මේ රෙගුලාසි අනුමත කිරීමේ විශේෂ වැදගත්කම විධියට තිබෙන්නේ.

අපි කවුරුත් දන්නවා, පසුගිය කාලය පුරාවට අපේ රටේ ආර්ථිකය බිඳ වැටිලා තිබුණා, අපේ ඩොලර් සංචිත හීන වෙලා තිබුණා කියන එක. ඒක නිසා වාහන ගෙන්වන්න බැරිව තිබුණා.

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

හැබැයි, දැන් අපේ රටට ක්‍රමානුකූලව වාහන ගෙන්වීම සඳහා අවසර දීලා තිබෙනවා. ඒ විධියට වාහන ගෙන්වීමේදී අපට ඇති වෙන විශේෂ වාසි ප්‍රමාණයක් තිබෙනවා. භාණ්ඩාගාරයට එන මුදල් ප්‍රමාණය වැඩි වෙනවා. මොකද, ඉතා කාර්යක්ෂමව, ඉතා ක්‍රියාශීලිව වාහන ගෙන්වන්න පෙලඹෙනකොට, අනවශ්‍ය කාලය ගත වෙන එක නවතිනකොට, භාණ්ඩාගාරයට එන ආදායම් වැඩි වෙන්න පටන් ගන්නවා. ඒ වාගේම මේ අලුත් තාක්ෂණයත් එක්ක මේ ගනුදෙනුව පවත්වා ගෙන යනකොට, පසුගිය කාලයේ අයථා විධියට, විවිධ සැක කටයුතු විධියට වාහන ගෙන්වපු ඒවා සම්පූර්ණයෙන් නවතිනවා. ඒ වාගේම ඉදිරියටත් අපේ ආණ්ඩුව වාහන ගෙන්වීම නවත්වන්නේ නැහැ. තව තවත් අපේ ආර්ථිකය ප්‍රසාරණය වන තරමට, අපේ සංචිත ඉහළ යන තරමට වාහන ගෙන්වීම පුළුල් කිරීම තමයි, අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබෙන්නේ. ඒක නිසා ඒ කටයුතු වඩා හොඳින් කරන්න, කාර්යක්ෂමව පවත්වා ගෙන යන්න නම් අපට මෙවැනි සංශෝධන කරන්නම වෙනවා. අපි කවුරුත් දන්නවා, අපේ ඩොලර් සංචිතය මේ වෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 6.3ට විතර ඇවිල්ලා තිබෙනවා කියලා. මේ වසර අවසානය වෙනකොට ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 7.3ක් දක්වා අරගෙන යන්න අපි අපේක්ෂා කරනවා. ඒ අපේ ආර්ථික ශක්තිය මත පදනම් වෙලා තමයි, ලංකාවට වාහන ගෙන්වීමත්, ඒ අවශ්‍ය අනෙකුත් කටයුතුත් සිද්ධ කරන්නේ. ඒක නිසා අපේ රටේ ඉදිරි ගමන ගැන හිතුවාම මෙවැනි රෙගුලාසි ගෙන ඒම ඉතා වැදගත් වෙනවා.

විශේෂයෙන්ම විපක්ෂයට ඕනෑ වෙලා තිබුණේ මේ තුළ අකාර්යක්ෂමතාවක් ඇති කරන්නයි. ඔවුන්ට අවශ්‍ය වාහන ගෙන්වා ගැනීමේදී විවිධ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. අන්න ඒවා පවත්වා ගෙන යෑමේ ක්‍රමයක් තමයි ඔවුන්ට ඕනෑ වෙලා තිබුණේ. ඒගොල්ලන්ට ඕනෑ වෙලා තිබුණේ වැරදි කරන්න පුළුවන් ක්‍රමයක්. ඒක තමයි ඔවුන්ට ඕනෑ වෙලා තිබුණේ. නමුත් අපි මේ රෙගුලාසි හරහා කරන්නේ එවැනි දේවලට ඉඩ නොතියා විනිවිදභාවයකින්, ක්‍රමවත්ව, විධිමත්ව ලංකාවට වාහන ගෙන්වා ගැනීමයි. විශේෂයෙන්ම මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි තුළින් අපි ඉෂ්ට සිද්ධ කරන්නේ ඒකයි. එය මේ මොහොතේ කළ යුතු දෙයක්.

අපි මේ කටයුතු කරගෙන යනකොට අත්තිකාරම් ගිණුම්වල සීමා වෙනස් කිරීම් ටිකක් ද සිදු කළා. මොකද, ඒක කරන්න ඕනෑකම තිබුණා. වාහනයක් ගෙන්වනකොට වුණත් අදාළ documents හරි ගියාට මදි. LC open කරනකොට බැංකු අතර සිද්ධ වෙන ගනුදෙනු හරියට ක්‍රියාත්මක වුණාට මදි. මේ සංශෝධනය හරහා Sri Lanka Customs එකෙන් ඒවා නැවත වතාවක් පරීක්ෂා කර බලනවා. ඒ අනුව දෙපොළකදී මේවා පරීක්ෂා වෙනවා. මම හිතන්නේ ඒකත් අපි මේ රෙගුලාසි හරහා කරගත්ත විශේෂ හොඳ තත්ත්වයක්. අවස්ථා දෙකකදීම මෙන්න මේ සොයා බැලීම සිද්ධ වෙන විධියක් තමයි මේ රෙගුලාසි හරහා සිදු කර තිබෙන්නේ.

ඒ වාගේම තමයි මේ අත්තිකාරම් ගිණුම්වල සීමා වෙනස් කිරීම. විශේෂයෙන්ම ගත්තොත්, පොත් මුද්‍රණයට රුපියල් මිලියන 20,000ක් වියදම් වෙලා තිබෙනවා. දැන් ඒක රුපියල් මිලියන 8,500 දක්වා අඩු කරන්න සංශෝධනය කර තිබෙනවා. ඒක හොඳ තත්ත්වයක්. ඒ අනුව පොත් මුද්‍රණය සඳහා යන වියදම අඩු වෙලා තිබෙනවා.

රිමාන්ඩ් බන්ධනාගාර සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම ගැන කථා කළොත්, ඒ සඳහා වූ සංශෝධන ද අද ඉදිරිපත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම යාන වාහනවලට යන වියදම ගත්තොත්, රේගුවේ වැටලීම් කරනකොට ඒවා වාහනවලින් ගිහින් කරන්න සිද්ධ වෙනවා. ඒ සඳහා යන තෙල් වියදමක් තිබෙනවා. අන්න ඒ තෙල් වියදම රුපියල් මිලියන 8 සිට රුපියල් මිලියන 16 දක්වා වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. ඒකෙන් කියැවෙන්නේ මොකක්ද? ඒ වැඩි කිරීම තුළින් කියැවෙන්නේ, ඒ විමර්ශන, රේගුවේ වැටලීම් ටික ඉතා හොඳින් සිද්ධ වෙනවා කියන එකයි. අපරාධ, හොරකම්, දූෂණ, වංචාවලට ඉඩ අහිමි වෙනවා කියන එක තමයි ඒකෙන් කියැවෙන්නේ.

ඒ වාගේම දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුමත් සංශෝධනය වෙනවා. දැනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන් වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 2,500යි. ඒක රුපියල් මිලියන 3,000 දක්වා වැඩි වෙන්න මේ තුළින් පටන් ගන්නවා. වර්තමාන රජය රටේ අවශ්‍යතා හඳුනා ගෙන තිබෙනවා. ඒවාට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න අපි මැළි වෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have 10 minutes.

[අ.භා. 1.08]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ගැන අපි පාර්ලිමේන්තුවේ විවාද කරනවා වාගේම, ආණ්ඩුවේ යෝජනා සහ ප්‍රතිපත්ති ගැනත් කථා කරනවා. හැබැයි, ඉතින් මේ ආණ්ඩුව බලයට ආපු දවසේ ඉඳන් ක්‍රියාත්මක කරපු ප්‍රතිපත්ති දිහා බැලුවාම අපට පෙනී යනවා, ඒ ප්‍රතිපත්ති ප්‍රමුඛ වුණේ දේශීය කර්මාන්ත -ලංකාවේ නිෂ්පාදන- විදේශ වෙළෙඳ පොළට යවනවාට වඩා, විදේශ වෙළෙඳ පොළෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා අපේ රටට ගෙන්වා ගැනීමයි කියන එක. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හැරුණුකොට අපි දැක්කේ නැහැ, මේ ආණ්ඩුව කිසි විටෙක දේශීය ව්‍යාපාරිකයා කේන්ද්‍ර කරගෙන ප්‍රතිපත්ති අනුගමනය කරනවා. සමහර විට ඔබතුමන්ලා බලයට එන්න කලින් කරපු බොහෝ ප්‍රකාශ බලයට ආවාට පසු නොගැළපෙනවා වෙන්න ඇති. ඒක කොච්චර නොගැළපෙනවාද කිව්වොත්, එක පැන් පහරින් රටේ වී මාෆියාව අයින් කරන්නයි ඔබතුමන්ලා බලයට ආවේ. හැබැයි, අද වෙනකොට හාල් පිට රටින් ගේනවා.

එපමණක් නොවෙයි, මේ කන්නයේ පොහොර සහනාධාරයත්, ධීවරයාගේ සහනාධාරයත් වෙලාවට දීගන්න බැරිව තමයි ආණ්ඩුව ඉන්නේ. ඔබතුමන්ලා පසුගිය කන්න දෙකක් පිළිබඳව ඊට කලින් තිබිච්ච ආණ්ඩුවලට චෝදනා කළා. ඉතින්, තවදුරටත් -මේ කන්නයේදීත් - පසුගිය ආණ්ඩුවලට චෝදනා කරනවාද එහෙම නැත්නම් මේ ප්‍රශ්නවලට අවංකවම විසඳුමක් හොයන්න කටයුතු කරනවාද කියන තීන්දුව ඔබතුමන්ලාට ගන්න පුළුවන්. ඔබතුමන්ලාට තර්කයක් විධියට ගේන්න පුළුවන්, මිනිස්සු කජු කනවා වාගේ ලුණු කන්නේ නැහැ කියලා. හැබැයි, ඉතින් ලුණු අවශ්‍යයි. ලුණු පිටින් ගෙනාපු කාල වකවානු ගැන අපට ස්වල්ප වශයෙන් තමයි මතකයේ

තිබෙන්නේ. ඒ පිළිබඳ අවුරුදු 30, 40ක මතකයක් අපට නැහැ. හැබැයි, අද ඔබේ ආණ්ඩුව කොච්චර දක්ෂද කිව්වොත්, ලුණුත් පිට රටින් ගේන තැනට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒක පිළිගන්නවා වෙනුවට මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? අමාත්‍යවරයා කියනවා, තව මාසයකින්, ඊළඟ කන්නයට අපි ලුණු ගේන්නේ නැහැ, කවදාවත් ගේන්නේ නැහැ කියලා.

ඒ කියපු ඇමතිවරයා ඊට ටික දවසකට පස්සේ කියනවා, අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, ලුණු වුට්ටක් අවශ්‍යයි, ඒ නිසා අපි ලුණු ගෙනෙන්න යනවා කියලා. හාල් පිටින් ගෙනෙන්නේ නැහැ, වී ගොවියා ආරක්ෂා කරනවා කියලා ඔබතුමන්ලා බලයට ආවේ. එහෙම ආපු එක්කෙනා අද කියනවා, මේ මාෆියාව බිඳින්න නම් අපි අලුත් මාෆියාවක් හදන්න ඕනෑ කියලා. ඒ මොකක්ද? පිට රටින් හාල් ගෙනෙන මාෆියාව. මේ රටේ ජනතාවට අඩුවට හම්බ වෙනවා නම්, පිටින් හාල් ගෙනැල්ලා දෙන එක කමකුත් නැහැ. හැබැයි අඩුවට හම්බ වෙන්නේත් නැහැනේ. ඒ හම්බ වෙන්නේත් තවත් වැඩි ගණනකට. මම දැක්කා, ඊයේ අපේ අර්චුනා මන්ත්‍රීතුමා සමඟ එක්තරා අමාත්‍යවරයෙක් ලුණු සම්බන්ධයෙන් ආරාවුලක් ඇති කර ගත්තා. අර්චුනා මන්ත්‍රීතුමාගේ තර්කය වුණේ, ලුණු බෙදා හැරීමේ ක්‍රමයක් හදන්න කියන එක. ලේවා තුනක් රටේ කොන් තුනක තිබෙනවා නම්, ඒවා බෙදා හරින ක්‍රමයක් හදන්න කියන එක මිසක්, එක පළාතකට සීමා කරන්න කියන එක නොවෙයි එතුමාගේ තර්කය වුණේ. නැත්නම් මටත් කියන්න පුළුවන් නේ, හම්බන්තොට ලුණු හම්බන්තොටට විතරක් දෙන්න කියලා. ඉතින් ඒකත් තේරුම් ගන්න බැහැ. එතුමා කිව්වේ, උතුරේ ලේවායේ තිබෙන ලුණු ටික කොළඹට ගෙනැල්ලා ආයෙත් යවන්නේ නැතුව උතුරට, උතුරුමැදට, නැඟෙනහිරට බෙදා හරින ක්‍රමයක් හදන්න කියලා. ඉතින් අමාත්‍යවරයාට ඒක තේරුම් ගන්න බැරුව ඒකත් ජාතිවාදය හැටියට මතු කරන්න හදනවා. මොකද, එක පැත්තකින් ඔබතුමන්ලා ඩයස්පෝරාවට එක පොරොන්දුවක් දුන්නා. නමුත් ක්‍රියාත්මක වෙන්නේ තවත් පොරොන්දුවක්. *[බාධා කිරීමක්]* වෙලාව ආවාම අපි ඒවා කියන්නම්. අර්චුනා මන්ත්‍රීතුමාත් කියයි නේ. ඒවා අපි කියන්නම්. හැබැයි, ඩයස්පෝරාවට එක පොරොන්දුවක් දීලා, බලයට ඇවිල්ලා තවත් එකක් කරනවා. ඒක වහගන්න උතුරෙන් ආපු මන්ත්‍රීවරයාට බණිනවා. ඒකටත් කියන්නේ මොකක්ද? කියන්නේ "ජාතිවාදය" කියලා. තමන්ට නිදහස අරගෙන දීපු රණ විරුවාට "සෙබළා" කියලා කථා කරන, "රණ විරුවෙක්" කියන්න කොන්ද පණ නැති, හමුදාවේ හිටපු ඉහළ නිලධාරියෙක් නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට අද ඉන්නවා නම්, ශ්‍රී ලංකා පොලීසියත්, ත්‍රිවිධ හමුදාවත් නියෝජනය කළ, ආණ්ඩුව නියෝජනය කරන අයට හමුදාවේ අයට "රණ විරුවා" කියන්න තරම් කොන්ද පණ නැත්නම්,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කියලා තිබෙනවා "රණ විරුවා" කියලා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අර්චුනා මන්ත්‍රීතුමා කියනවා "රණ විරුවා" කියලා, ලංකාවේ හමුදාවේ අයට. හැබැයි ඡන්දයට කලින් පෝස්ටරයේ "මමත් රණ විරුවෙක්" කියලා ගහගත්ත කෙනා, විශ්‍රාමික රණ විරුවන්ගේ සංසදය හැදුවා. දැන් ඒක විශ්‍රාමික සෙබළුන්ගේ සංසදය වෙලාද? *[බාධා කිරීමක්]* ඒ ගැන මම කියන්නම් වෙලාවට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් කියන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
දැනුත් කියන්නම්. අහගන්න කෝ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා පාපිස්සටවත් වෙන පක්ෂවලින් ගන්නේ නැති නිසා ජේවීපී එකට ඇවිල්ලා පාර්ලිමේන්තු ආවා. ඒ නිසා දැන් කරුණාකරලා අහගන්න. *[බාධා කිරීමක්]* ඔබේ ජනාධිපතිතුමා කියන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලාගේ ජනාධිපතිතුමාට මෙතුමන්ලා පාපිස්සකටවත් වටින්නේ නැත්නම්, ඒ වටිනාකම හදාගන්න මගේ ඇඟේ එල්ලිලා හරි යන්නේ නැහැ. මෙතුමන්ලා හිතනවා, රාජපක්ෂලාගේ ඇඟේ එල්ලුණාම ජනාධිතිවරයා පාපිස්සෙන් උඩට ගනියි කියලා. නැහැ. *[බාධා කිරීමක්]* මෙහෙම ගියොත් ඔබතුමන්ලාට වෙන්නේ, පාපිස්සෙනුත් බිමට වැටෙන්න. ඒ නිසා ඔබතුමන්ලා කරුණාකරලා මේක අහගන්න.

ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, ආයෝජකයන් ගෙනෙනවා කියලා. දැන් මොකක්ද වෙන්නේ? කර්මාන්තශාලා වැහෙනවා. වැහුණාම ඔබතුමන්ලාගේ අමාත්‍යවරයා ඇවිල්ලා මොකක්ද කියන්නේ? "ඒක ගණන් ගන්න එපා, කර්මාන්තශාලාවේ එක පැත්තයි වැහුණේ, රස්සා අහිමි වුණේ 1,400කට" කියලා. නමුත් කර්මාන්තශාලාව වැහිලා. අඩු ගණනේ වැහිච්ච හේතුව හොයා ගන්න. මොකක්ද තිබෙන ප්‍රශ්නය කියලා හොයා ගන්න. කර්මාන්තවලට දරා ගන්න බැරි අසීමිත බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරනකොට මොකද වෙන්නේ? ඒ අතරේ ඔබතුමන්ලා ට්‍රම්ප් ජනාධිපතිතුමාට ලියුමක් යැව්වා. අපි දන්නවා, ඒකට උත්තරයක් ආවේ නැහැ. ලියුමක් යැව්වා, ඒ tariff එක සම්බන්ධයෙන්. හැබැයි එදාත් විපක්ෂය කිව්වා, ලියුමක් යැව්වාට උත්තරයක් එන්නේ නැහැ, ගිහිල්ලා සාකච්ඡා කරන්න කියලා. දැන් ඒ පිට දාලා හරි යන්නේත් නැහැ. ඔබතුමන්ලා අසීමිත බදු ප්‍රතිපත්තියක් අනුමනය කළා. හිතා මතා විදුලි උත්පාදන වියදම වැඩි කළා, පුනර්ජනනීය විදුලියෙන් අයින් වෙලා. අඩු ගණනේ ආගමික සිද්ධස්ථානවලට - පන්සල්, පල්ලි, කෝවිල්වලට - සවි කරපු solar panelsවලට connection එක දෙන්න. ඒක දෙන්නේත් නැහැ. ඒක දුන්නේ නැහැ විතරක් නොවෙයි, ගෙවල්වල solar එකේ plug එක අයින් කරන්න කියලාත් SMS එකක් එවනවා. අන්තිමට ඩීසල්, ගල් අඟුරු මාෆියාවෙන් විදුලිය උත්පාදනය කරන්න ගිහිල්ලා නිෂ්පාදන පිරිවැය වැඩි කර ගත්තා.

SVAT එක අයින් කරන්න එපා කියලා අපි පුන පුනා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. නමුත් ඒක අයින් කළා. කර්මාන්තශාලාවක්, ආයෝජකයෙක් දිරි ගන්වනවා වෙනුවට ඔබතුමන්ලා බලයට ආපු වෙලාවේ ඉඳලා කළේ, ආයෝජකයන් හරවා යවන එක.

කොළඹ වරාය නගරය බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාත් කොළඹ. දැන් වරාය නගරයට මොකක්ද වෙලා තිබෙන්නේ? එදා ඔබතුමන්ලා වෙනත් මතයක හිටියා. වරාය නගරය මහින්ද රාජපක්ෂ හදපු නිසා සීගිරියත් කඩලා ගල් ගෙනැල්ලා ඒක හදන්න ඕනෑ කියලා හිතුවා.

හැබැයි, ඔබතුමන්ලාගේ විදේශ ඇමතිවරයා ගිහිල්ලා මුල් ගලක් තිබ්බානේ එක සමාගමක් එක්ක ඒකට ආයෝජකයෙක් ගේන්න ඕනෑ කියලා. ඒ මුල් ගල පැළ වුණාද නැද්ද කියන කාරණය අපි බලමු ඉස්සරහට. අද ඔබතුමන්ලා වරාය නගරය තියාගෙන ඒක ගැන කල්පනා කර කර ඉන්නකොට, ඒකට ආයෝජකයෝ ගේන්න උනන්දුවක් නොදක්වන කොට, මාලදිවයින ඩොලර් බිලියන 8ක වරාය නගරයක් හදනවා. එය අපේ direct competitor වෙනවා. ඒක සෘජුවම අපේ වෙළෙඳ

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

පොළත් එක්ක හැප්පෙන්න හදන්නේ. හැබැයි අපි ඒකට සූදානම් වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ගතානුගතික, පාරම්පරික දේශපාලන ක්‍රමය අලුත් වෙනවා කිය කියා ඉන්නවා. පික්පොකට් න්‍යායනේ මේ තිබෙන්නේ. පික්පොකට් ගහන කෙනා තමයි, "අන්න හොරා" කියලා දුවන්නේ. ජේවීපී එකත් ඒ වාගේයි. කියන්න කනගාටුයි, පික්පොකට් න්‍යාය තිබෙන්නේ. පික්පොකට් ගහන කෙනා තමයි පික්පොකට් ගහලා "අන්න හොරෙක්" කියලා දුවන්නේ. අද ඔබතුමන්ලාත් ඒ වාගේ. ආයෝජකයෙක් ගෙනෙන එක කෙසේ වෙතත්, රටේ ඉන්න ආයෝජකයා ආරක්ෂා කරන්න කටයුතු කරන්න. ඉන්න ආයෝජකයා ආරක්ෂා කර ගන්න ඔබතුමන්ලා මොනවාද අරගෙන තිබෙන ක්‍රියාමාර්ග? ඒ අයට ඇහුම්කන් දුන්නාද? ඒ කර්මාන්තශාලා මුහුණ දෙන අභියෝග ඔබතුමන්ලා හඳුනා ගත්තාද? නැහැ. ඔබතුමන්ලා මොකක්ද කියන්නේ? "වැහුණේ එක ෆැක්ටරියයි, ඒ හින්දා ප්‍රශ්නයක් නැහැ, ඒකෙන් භාගයයි වැහිලා තිබෙන්නේ, තව තිබෙනවා" කියනවා. එහෙම නැත්නම්, "ඇඟලුම් කර්මාන්තශාලාවල ලොකු ප්‍රශ්නයක් නැහැ, අපට තව ගේන්න පුළුවන්" කියනවා. ඒ කථා හොඳයි පක්ෂ සම්මේලනයට. අර ජනාධිපතිතුමා කිව්වේ පාපිස්ස ගැන, ඒ පක්ෂ සම්මේලනයේ කථාවේදී. ඒක ටීවී එකේ live ගියා, මට කරන්න දෙයක් නැහැ ඒකට. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක පක්ෂය අභ්‍යන්තරයේ කළ සාකච්ඡාවක්.

මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න ඕනෑ නම් imports ගැන, export ගැන ඔබතුමන්ලා අපට පැය ගණන් පාර්ලිමේන්තුවේ lectures දීලා හරියන්නේ නැහැ, අප බංකුවේ වාඩි කරවලා ජාතික ආරක්ෂාව ගැන කථා කළා වාගේ. දැක්කානේ ඒකේ ප්‍රතිඵලත් එනවානේ. ඒ හින්දා ඔබතුමන්ලා දැන්වත් ඔය මහන්තත්තකම පොඩ්ඩක් පැත්තක තියලා ඇහුම්කන් දෙන්න; සේවකයන්ට ඇහුම්කන් දෙන්න. සේවකයා සහ හාම්පුතා අතර ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක බේරන්න ආණ්ඩුව මැදිහත් වෙන්න. කම්කරු අමාත්‍යතුමා ඉන්නවානේ. ඔබතුමාට පුරුදුයිනේ. හැබැයි, ඔබතුමාට ඒකේ වෙනසක් තිබෙනවා. කලින් ඔබතුමා හිටියේ අනෙක් පැත්තේ; ගිනි තියපු එක කළේ. දැන් ඔබතුමන්ලාට ගින්න නිවන්න වෙනවා. මොකද, දැන් ගිනි තිබ්බොත් රක්ෂා ටික අහිමි වෙනවා. ඔබතුමන්ලා පසුගිය කාලයේ වාගේ දැන් ගිනි තිබ්බොත් මොකද වෙන්නේ? එතකොට ඉතිරි කර්මාන්තශාලා ටිකත් වැහෙනවා. ඒ හින්දා දැන් ඔබතුමන්ලා ගිනි තියන්නේ නැතිව ගින්න නිවන්න පක්ෂයක් විධියට, ආණ්ඩුවක් විධියට මැදිහත් වෙන්න ඕනෑ. අද මේ එක කර්මාන්තශාලාවක් විතරයි වැහිලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තව කර්මාන්තශාලා කීයක් වැහෙයිද කියලා අපි දන්නේ නැහැ, ඔබතුමන්ලා දන්නෙත් නැහැ. මොකද, දැන් ඔබතුමන්ලාට ඒවා කියන්නෙත් නැහැ. එච්චරටම ඔබතුමන්ලා ගණන් ගන්නේ නැහැ. වෙන දා නම් කර්මාන්තශාලාවක් අපහසුතාවට පත් වෙනකොට BoI එකට දැනුම් දෙනවා, කම්කරු අමාත්‍යාංශයට දැනුම් දෙනවා, සාකච්ඡා කරනවා. ඔබතුමාට දැනුම් දුන්නේ නැහැයි කිව්වාද කියන්න මම දන්නේ නැහැ. ඒක අපි දන්නේ නැහැනේ, අපට එන්නේ ඔබතුමන්ලා කියන කාරණයනේ. හැබැයි දැනුම් දීලා නැත්නම් ඒ කියන්නේ ඒ කර්මාන්තශාලාවේ හාම්පුතා මේ රටේ ආණ්ඩුව, කම්කරුවා, කම්කරු අමාත්‍යාංශය, BoI එක සත පහකට ගණන්ගෙන නැහැ. වැඩක් නැහැ කියලා හිතුවා; මාස දෙකක පඩි දුන්නා; වැහුවා; ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. මේ පනත් සංශෝධනය කරන එක හොඳයි. ඒවා ගැන අපි කථා කරමු, වාද විවාද කර ගනිමු. හැබැයි මතක තියාගන්න මේ හැම දෙයක් ගැනම නිදහසට කරුණු සොයලා, තර්කානුකූලව සමාජ මතය වෙනස් කරලා, ඒ මතය වෙනස් කළාම හරි, හෙට එක්කෙනෙක් අත්අඩංගුවට ගන්නවා, ඊට පස්සේ තව එක්කෙනෙක් ගන්නවා. පොහොර ගෙනාපු එක්කෙනා අත්අඩංගුවට ගන්නවා, රාජපක්ෂලා ගන්නවා, නාමල් ගන්නවා, නාමල් හිරේ යනවා, දැන් හරි කියලා හිටියොත් මොකද වෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි හිරේ ගිහිල්ලා ඇප අරගෙන එයි. අපි අධිකරණයෙන් නඩුව බේරා ගන්නම්. ගරු විනිශ්චයකාරවරු කෙරෙහි සහ මේ රටේ අධිකරණ පද්ධතිය කෙරෙහි අපට විශ්වාසයක් තිබෙනවා. අපි ඒක එතැනදී බේරා ගන්නම්. ඒකෙන් ආණ්ඩුවේ ඔබතුමන්ලාගේ හිත තාවකාලිකව හැදෙයි. හැබැයි ඉතින්- *[බාධා කිරීමක්]* හොරා කවුද, ජේන බලන්නේ කවුද කියන එක වේලාව ආවාම අපි කියන්නම්. එදාට කාට කාටත් තමන්ගේ ජේන පිළිබඳව, හොරු පිළිබඳව, තමන් කළ කාරණා පිළිබඳව, කරපු චෝදනා පිළිබඳව පාර්ලිමේන්තුව ඇතුළේ නොවෙයි සමාජය ඉස්සරහ පසුතැවෙන්න වෙයි. ඒ හින්දා අවසාන වශයෙන් මම ඔබතුමන්ලාට මතක් කරන්නේ කරුණාකරලා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න, මිනිස්සුන්ට ඇහුම්කන් දෙන්න, ආයෝජකයන්ට ඇහුම්කන් දෙන්න කියලායි. මේ රටේ අර්බුදයක් තිබෙනවා නම් ඒකට මැදිහත් වෙන්න කියන ඉල්ලීමත් කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මට තත්පර 20ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can have 15 seconds.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

ගරු නාමල් රාජපක්ෂ මහතා මගේ නම සඳහන් කර තිබුණා රණ විරුවෝ ගැන මම කියපු කථාව නිසා. ඇත්තටම ඉතිහාසයේ එළාර ගත්තොත්, අපි සලකලා තිබෙනවා හොඳ විධියට. ඒ වාගේ අපේ කොටි නායකයා ප්‍රභාකරන් ඉන්න කාලයේත් රණ විරුවන් රණ විරුවන් විධියට අපි identify කරලා තිබෙනවා. කොටි ඉන්න කාලයේ එක දවසක්වත්, කවදාවත් අපි එක රණ විරුවෙකුටවත් වැරදි විධියට සැලකුවේ නැහැ.

ඒ විධියට ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ගේ රට වෙනුවෙන් මැරිලා තිබෙනවා නම් අපි සලකනවා. ඒ ගොල්ලන්ට "රණ විරුවෝ" කියන නම අපි කියන්න කැමතියි. ඒක ගැන මම පැහැදිලි කරලා කියන්න ඕනෑ, මේ රටට. යුද්ධයට සම්බන්ධ වෙලා ඒ ගොල්ලෝ මැරිලා තිබෙනවා නම් ඒ ගොල්ලොන්ගේ අම්මලාගේයි, තාත්තලාගේයි පපුවේ තිබෙන pain එක එකමයි කියලා දෙමළ ජනතාව විධියට අපි understand කරනවා. ඒ වාගේ අපේ පැත්තේ අය ගැනත් understand කරන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. Thank you so much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, you made your point clear.

The Hon. Ashoka Gunasena. You have 11 minutes.

[අ.භා. 1.21]

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය ලෙස අපි 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි, අනුමත කර ගැනීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

විපක්ෂය හැම වෙලාවේම වාගේ මේ අණ පනත් පිළිබඳව ඒ ගොල්ලන්ගේ අදහස් ඉදිරිපත් කරන කොට අපට තේරෙන දෙය තමයි, අප මේ හරි ගස්වමින් ඉන්නේ ඒ ගොල්ලන්ගේ අදහස්වලට අනුව රට පාලනය කරපු යුගය ඇතුළේ අපේ රටට වෙච්ච වැරැද්ද නේද කියන එක. මෙතුමන්ලා දැන් මේ කියන දේවලින් අපට එය දැනෙනවා. මෙච්චර කාලයක් තිස්සේ මෙතුමන්ලා රට පාලනය කරලා අත්පත් කර දීපු තත්ත්වය විසින් ඉතා විශාල බේදවාචකයක් අපේ රට ඇතුළේ නිර්මාණය කර තිබෙනවා. ඒක හරි ගස්සන්න තමයි වර්තමාන ආණ්ඩුව හැටියට මේ අණ පනත්, රෙගුලාසි ඉදිරිපත් කරමින් අපි කටයුතු කරන්නේ.

මීට ඉස්සෙල්ලාත්, මේ දවස් කිහිපය තුළත් විපක්ෂය මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරපු දේවල් අනුව පෙනෙන දෙයක් තිබෙනවා. වාහන ආනයනය සම්බන්ධයෙන් කථා කරන වෙලාවේ විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වුණු කාරණා දෙස බලන්න. වාහන ආනයනයට අදාළ මේ අණ පනත්, රෙගුලාසි ගැන කථා කරනවාට වඩා වෙනත් දේවල් ගැන කථා කරන්න තමයි ඒ ගොල්ලන් අවධානය යොමු කරලා තිබෙන්නේ.

වාහන ආනයනය කියන කාරණය ගත්තාම, අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න පුළුවන් වන විධියට අත්‍යවශ්‍ය වාහන ගෙන්වීම ප්‍රමුඛ වනවා. වාහන ආනයනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන අවස්ථාවලදී, මගී ප්‍රවාහන වාහන ආනයනය කිරීම විශේෂ කාරණයක් හැටියට අපි සැලකුවා. අපි ඒ ගැන මතක් කළා. නමුත්, මගී ප්‍රවාහන වාහන ආනයනය කරන එකේ තේරුම විපක්ෂය දන්නේ නැහැ. අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට අකාර්යක්ෂම මගී ප්‍රවාහනය බාධාවක් වෙලා තිබෙනවා. ඒ බාධාව මඟ හරවා ගන්න නම් මගී ප්‍රවාහන වාහන භාවිතය කාර්යක්ෂම කරලා, නිෂ්පාදන ක්‍රියාවලියට හරියාකාරව දායක වෙන්න වැඩ කරන ජනතාවට අවස්ථාව ලබා දිය යුතුව තිබෙනවා.

ඒක තමයි මගී ප්‍රවාහන වාහන ආනයනයේ අරමුණ. ඒක තේරුම් ගන්න බැරුව තමයි ඒවා ගැන කථා නොකර වෙන වෙන දේවල් ගැන කථා කරන්න මෙතුමන්ලා ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒක මීට කලිනුත් මම දැක්කා. පසුගිය දවස්වල මෙතැන කරපු සාකච්ඡා වෙනත් පැත්තකට අරගෙන ගිහින් සමහරු මේ සභා ගර්භය ඇතුළේ යුද්ධය ගැන කථා කළා; විශේෂයෙන් රණ විරුවන් ගැන කථා කළා. රණ විරුවන් ගැන කථා කරපු වෙලාවක විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් ජනාධිපතිතුමාගේ කථාවේදී කියපු, යුද්ධය තුළ මිය ගිය සෑම පුරවැසියෙක්ම මේ රටේ සාමය වෙනුවෙන් මිය ගියා කියන අදහසට පහරක් එල්ල කළා. විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමා කියනවා, යුද්ධය නතර කිරීම සඳහාලු, දිවි පිදුවේ. එතකොට එතුමා කියන්නේ, මේ රටේ සොල්දාදුවන් -රණ විරුවන්- ඇතුළු සාමාන්‍ය ජනයා -ඒ හැමෝම- යුද්ධය නතර කිරීම සඳහා දිවි පිදුවා කියලායි. එහෙම කියන එතුමාට තේරෙන්නේ නැහැ, යුද්ධය නතර කිරීම කියන්නේ සාමයයි කියලා. ජනාධිපතිතුමාගේ පැත්තෙන් ඉදිරිපත් කරන්නේ ඒක; "සාමය වෙනුවෙන් හැම කෙනෙක්ම දිවි පිදුවා" කියන්නේ ඒක. අපි හැම වෙලාවේම යුද්ධය ගැන කථා කරන කොට කියන්න ඕනෑ එයයි. යුද්ධය සාමය දක්වා පරිවර්තනය කර ගන්න ඕනෑ. මූලික පරමාර්ථය විය යුත්තේ එයයි. ඒ නිසා තමයි ජනාධිපතිතුමාගේ පැත්තෙන් ඒ අදහස හරියාකාරව ඉදිරිපත් කළේ.

විපක්ෂයේ මන්ත්‍රීවරු මෙතැනට ඇවිල්ලා අදහස් ඉදිරිපත් කරමින් කිව්වා, එක පෑන් පහරින් කරනවා කියපු ඒවා ගැන. මෙතුමන්ලා ඒවා ගැන කථා කළා නේ. රටේ සාකච්ඡාවලදී, රැස්වීම්වලදී "අපි එක පෑන් පහරින් නතර කරනවා" කියන එක තුළ තිබෙන අදහස, හැම දෙයක්ම එක පෑන් පහරින් නතර කරන්න පුළුවන් කියන කාරණය නොවෙයි. ඒකේ අදහස විපක්ෂයට තේරෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂය හැටියට අපි අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කපන්න ඕනෑ කියලා, හැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම වරප්‍රසාදයක්ව තිබුණු වාහන පර්මිට් එක නතර කරන්න ඕනෑ කියලා තීරණයක් ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තීරණය අරගෙන ඒ වරප්‍රසාදය එක පෑන් පහරින් නතර කළා. ආණ්ඩුව පත් වෙලා එක පෑන් පහරින්ම ඒ වරප්‍රසාදය නතර කරලා තිබෙනවා. එක පාරටම එම වරප්‍රසාදය කාටවත් හම්බ වෙන්නේ නැතුව ගියා. හැම දෙයක්ම එක පෑන් පහරින් නතර කරන්න බැහැ කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තේරෙන්නේ නැහැ. ඒ ගොල්ලෝ ඒ ගොල්ලන්ට තේරෙන විධියට දේශපාලනය කරපු යුගයේ ප්‍රතිඵලවලට තමයි, ඒ බේදවාචකයට තමයි අපේ රට මේ වෙලාවේ මේ මුහුණ දෙමින් ඉන්නේ.

අපේ අරමුණ ගත්තොත්, අපට තිබෙන්නේ, මේ රට පොහොසත් රටක් කරන්න ඕනෑ කියන අරමුණ. මේ රට පොහොසත් රටක් කරන්න නිකම් බැහැ. එහිදී ආනයනය, අපනයනය කියන ඒවා ප්‍රධාන කාරණා. රටක අපනයනය වාගේම ආනයනයත් වැදගත්. විපක්ෂය ආනයනයේ වැදගත්කම දන්නේ නැහැ. මේ ගත කරන මොහොතේ අපේ රට ආනයන සම්පූර්ණයෙන් නවත්වා, අපනයනය කරන එකක් බවට පත් කරන්න බැහැ කියලා ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ. ආනයන කාර්යයේ තිබෙන අඩු පාඩුකම්, එහි තිබෙන අකාර්යක්ෂමතාව, එහිදී සිදු වන වංචා, දූෂණ වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සංශෝධනත් ගේන්න ඕනෑ. ඒක හරියට තේරුම් ගන්න බැරිකම නිසා තමයි විපක්ෂය අර වාගේ ප්‍රකාශ නිකුත් කරන්නේ. මෙතෙක් කල් විපක්ෂය කරපු වැරැදි හරිගස්වමින් යන ගමනේදී එන සංශෝධන තමයි මේ එන්නේ. විපක්ෂය ඒක හරි හැටියට තේරුම් ගත්තා නම් හොඳයි.

ඒ වාගේම පසුගිය දවසක මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ එක් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒ ගොල්ලන්ගේ අද්දැකීම් ගන්න , ඒ අය අද්දැකීම් ගොඩක් තිබෙන අය කියලා. අපේ මේ ගරු සභාවේ කථානායක අසුනේ වාඩි වෙලා හිටපු මන්ත්‍රීවරයකුට -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීවරයෙකුට- කියනවා, ඒ ගොල්ලන් ගොඩක් අද්දැකීම් තිබෙන අය, ඒ නිසා ඒ ගොල්ලන්ගෙන් ඉගෙන ගන්න කියලා. ඒ ගොල්ලන්ගේ අද්දැකීම්වලින් ඉගෙන ගන්න ගියොත් අපට වන දේ මා කියන්නම්. ඒ ගොල්ලෝ ජනාධිපති අරමුදලේ මුදල් වංචා කරලා තිබෙනවා. එතකොට ඒ අද්දැකීම්වලින් ද අපි ඉගෙන ගන්න ඕනෑ? ඒ ගොල්ලන්ගෙන් ද අපි ඉගෙන ගන්න ඕනෑ? ඒ අද්දැකීම්වලින් ඒ ගොල්ලන් සමාජයට දීපු දේවල් නිසා තමයි මේ සමාජය මේ තැනට, මේ වාගේ බේදවාචකයක් බවට පත් කරලා තිබෙන්නේ. එම නිසා ඒ ගොල්ලන්ගෙන් අපට අද්දැකීම් ගන්න දෙයක් නැහැ. ඒ ගොල්ලෝ සද්දෙ දැම්මාට, අපි ඒ සද්දවලට බය නැහැ. විපක්ෂයේ අය හැම වෙලාවේම කරන දෙයක් අපි දකිනවා. මාධ්‍යවලට වොයිස් කට් එකක් දෙන්න විපක්ෂයේ අය මෙතැනට ඇවිල්ලා හැසිරෙනවා කියලායි අපට දැනෙන්නේ.

[ගරු අශෝක ගුණසේන මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසුගිය දවසක පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගිහිල්ලා පත්තරේ බැලුවා. ජනාධිපතිතුමාගේ ඒ ප්‍රකාශයට විරුද්ධව කියපු දේවල් පත්තරේ තිබුණා. ඒ වාගේම, තමන්ගේ අත්දැකීම්වලින් අපට ඉගෙන ගන්න කියපු අයගේ ප්‍රකාශත් තිබුණා.

එතකොට අපට තේරෙන දේ තමයි, මෙතුමන්ලා මාධ්‍ය ආවරණයක් ලබා ගැනීම සඳහා පමණක් මේ දේශපාලන කටයුත්ත කරන බව. මේ විපක්ෂය මේ දවස් කීපයේ මේ පාර්ලිමේන්තුවේ ගත කරපු කාලය තුළ කියන දේවල්වලට, හැසිරෙන ආකාරයට සමාජය කියනවා, "ගොන්පාට්" කියලා. සමාජය කියන මේ "ගොන්පාට්" කියන කථාව වාගේම තවත් කථාවක් තිබෙනවා. ඒ වාගේ බාල ගනයේ ප්‍රකාශ, ඒ වාගේ වැරදි ප්‍රකාශ, සමාජය අවුස්සන ජාතිවාදී ප්‍රකාශ මතු කරලා දේශපාලනය කරන මාධ්‍ය සංස්කෘතියක් අපේ රටේ සමහර මාධ්‍ය ආයතනවල තිබෙනවා. ඒ සමහර මාධ්‍ය ආයතන ඒවා පාවිච්චි කරනවා. ඒ සමහර මාධ්‍ය ආයතනවල ඒ ක්‍රියාවලිය දැක්කාට පස්සේ මට හිතෙන්නේ අර ගොන්පාට්වලින් ගොන් ආතල් ගන්නවා කියලායි. සමාජය අතුළේ එහෙම කථාවක් තිබෙනවා. එක පැත්තකින් විපක්ෂයේ අය අර වාගේ භාවිතයක් හරහා සමාජයේ තිබෙන කථාවට අනුව ගොන්පාට් ඉදිරිපත් කරනවා මෙතැන. ඒ වාගේම, අනෙක් පැත්තෙන් මාධ්‍ය ඒවා පාවිච්චි කරමින්, සමාජ මාධ්‍යවල පොස්ට් දමමින් ගොන් ආතල් ගන්න පිරිසක් ඉන්නවා. නමුත් ගොන්පාට් දාන අයගෙනුයි, ගොන් ආතල් ගන්න අයගෙනුයි අපට ගන්න දෙයක් නැහැ. අපි, ගන්න තිබෙන ආදර්ශ ඇතිතරම් ගන්න දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට මූලිකවම අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ඉස්සරහට ගෙනියන්න අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, අපි එහි කාර්යක්ෂමතාව වැඩි කරන්න, එහි තිබෙන වංචා, දූෂණ අඩු කරන්න, ඒක සමාජයට වඩා වැඩදායී දෙයක් බවට පත් කරන්න අවශ්‍ය මැදිහත්වීම කරමිනුයි ඉන්නේ මේ වෙලාවේ.

මට මේ වෙලාවේ යම් කාරණයක් මතක් වෙනවා. අපි දේශපාලනයේදී විශේෂයෙන් හදාරණ පොතක් තිබුණා. ඒ තමයි, රුසියානු විප්ලවය සිද්ධ වෙන වෙලාවේ, ඒ කලබලකාරී යුගයේ ඇමෙරිකානු මාධ්‍යවේදියකු වන ජොන් රීඩ් කියන මාධ්‍යවේදියා "ලොව හෙල්ලූ දස දවස" කියන පොත ලිව්වා. ඒක දේශපාලන අරමුණ වඩා යහපත් ඇසකින් දැකලා, සුබවාදී ඇසකින් දැකලා ලියපු පොතක්. අපි විපක්ෂයට කියනවා, තිබෙන වටපිටාව අනුව බිඳ වට්ටපු සමාජයක් නැවත නැඟිට්ටවන්න දරන උත්සාහයක් මේ තිබෙන්නේ කියලා. ඒ වෙනුවෙන් හැමෝම වරප්‍රසාද කපමින්, වංචා, දූෂණ නතර කරමින් ඉදිරියට යන ගමනක් මේ යන්නේ. ඒ රුසියානු විප්ලවයේම නායකත්වය දරපු ලෙනින් ඒ විප්ලවය සිද්ධ වෙන වෙලාවේ, මේ වාගේ විපක්ෂයේ අය හඬ නඟන වෙලාවක මෙහෙම කියනවා.

"මේක අම්මා කෙනෙක් දරුවෙක් බිහි කරන අවස්ථාවක්. උඹලා මේ තිබ්බිරි ගෙට එබී බලලා ලේ ගැන කථා කරන්න එපා. මේකේ කැපුම්, සීරීම් ගැන කථා කරන්න එපා. හැබැයි තවත් ටික කාලයක් බලාගෙන ඉඳපල්ලා. ලස්සන දරුවෙක් හිනාවෙනවා."

ඒ වාගේම අපට විපක්ෂයට කියන්න තිබෙන්නේත් මේක ඉතා දුෂ්කර අවස්ථාවක අපට භාරගන්න සිද්ධ වෙච්ච රටක් කියලායි. දැන් මේ රට නිවැරදි තැනට ගමන් කරමින් ඉන්නේ. ඒ ගමන් කිරීමේදී දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි උපරිම මැදිහත්වීම කරමින් ඉන්නේ. ඒ පිළිබඳ යම් යම් අඩුපාඩුකම් දකිනවාට වඩා මේ හොඳ කාර්යභාරයට දායක වෙලා මේ ගමන ඉස්සරහට අරගෙන ගිහිල්ලා රටට හොඳ අනාගතයක් උදා කරන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. K. Sujith Sanjaya Perera. You have ten minutes.

[අ.භා. 1.32]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි අනුමත කර ගැනීම සඳහා පැවැත්වෙන විවාදයේදී ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

පසුගිය රජය කාලයේ වාහන ආනයනය සීමා කරලා තිබුණු අවස්ථාවේදී, තහනම් කරලා තිබුණු අවස්ථාවේදී ඒ කාලයේ විපක්ෂයේ ඉන්නකොට අපේ ජනාධිපතිතුමාත්, වර්තමාන ඇමතිවරුත් කිව්වේ මොකක්ද? අපි බලයට පත් වුණාට පස්සේ අනිවාර්යයෙන්ම වාහන ආනයනය කිරීමට අවස්ථාව සලසා දෙනවා කිව්වා. ඒ වාගේම, එවකට හිටපු ආණ්ඩුව දැඩි ලෙස විවේචනය කළා, ඒ කාලයේ අපේ රටේ ජනතාවට වාහනයක් ගේන්න අවස්ථාව සලසා දෙන්නේ නැහැ කියලා. ඒ වාගේම, වර්තමාන ඇමතිවරු ඒ කාලයේ කිව්වා මට මතකයි, වාහනයක් ලක්ෂ 12කට විතර ගෙනැත් දෙන්න පුළුවන්කම තිබෙනවා කියලා. එහෙම ගෙනැල්ලා දෙන්න ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ කියලා තමයි එදා ප්‍රකාශ කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපට මතකයි, ගරු ජනාධිපතිතුමා ජපන් බයිසිකලයක් ගෙනෙන එකක් ගැන ප්‍රකාශ කරපු ආකාරය. "අපේ රටේ තරුණ තරුණියෝ ඒකට බොහොම ආසාවෙන් ඉන්නේ. ඒකට අවස්ථාව දෙන්න මේ වර්තමාන පාලකයන්ට හැකියාවක් නැහැ" කියලා තමයි එතුමා එදා ප්‍රකාශ කළේ.

ඉතින් වර්තමාන ආණ්ඩු පක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාගෙන් මට මේ අවස්ථාවේ අහන්න තිබෙන්නේ, තමුන්නාන්සේලා අපේ රටේ ජනතාවට ජපන් බයිසිකලයක් අඩු මිලට ගන්න, එහෙම නැත්නම් වාහනයක් අඩු මිලට ගෙනෙන්න අවස්ථාව සලසා දීලා තිබෙනවාද කියන එකයි.

දැන් මොන තරම් අණ පනත් වෙනස් කරන්න හැදුවත් අපට තේරෙන හැටියට නම් මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, වාහන ආනයනකරුවන් එක්ක සාකච්ඡා කරන විට ඒ අය කියන්නේ, "වාහන ආනයනය කිරීමට අපිට දැන් පුළුවන්කමක් නැහැ; දැනට ගෙනැත් තිබෙන වාහන ටිකවත් විකුණා ගන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි අද තිබෙන්නේ" කියලායි. ඒකට මූලික හේතුව වශයෙන් අප විශේෂයෙන් දකින්නේ, මේ තිබෙන අධික තීරු බදු යි. රජය අය කරන අධික තීරු බද්ද නිසා ඒ අයට වාහනයක් මිල දී ගන්න පුළුවන්කමක් නැහැ. වර්තමානයේ, මේ රටේ ජනතාවට -පුරවැසියන්ට- මේ අධික තීරු බද්ද ගෙවලා සහන මිලකට වාහනයක් මිල දී ගැනීම සිහිනයක්ම බවට පත් වෙලායි තිබෙන්නේ. ඒ නිසා වර්තමාන රජයට මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, යම් යම් සංශෝධන ගෙනැල්ලා වාහන ආනයනයට තිබෙන සීමා සම්බන්ධ ගැටලු නිරාකරණය කර දෙනවාට වඩා මේ රටේ ජනතාව බලාපොරොත්තු වන සහන මිලට වාහනයක් ලබා ගන්න අවස්ථාව ලබා දෙන්න කියා. ඒ ඉල්ලීම තමයි මේ අවස්ථාවේ අපට ආණ්ඩුවෙන් කරන්න තිබෙන්නේ. මොකද, මේ රටේ ජනතාව අනිවාර්යයෙන් බලාපොරොත්තු වන්නේ සහන මිලට ත්‍රිරෝද රථයක් ලබා ගන්නයි, මෝටර් සයිකලයක් ලබා ගන්නයි,

වාහනයක් ලබා ගන්නයි. එහෙම නැතුව තමුන්නාන්සේලා මොන තරම් දේවල් කථා කෙරුවා වුණත්, මොන තරම් සංශෝධන ගෙනාවා වුණත්, මේ තිබෙන තත්ත්වයත් එක්ක වර්තමාන වාහන ආනයනකරුවන් ඉදිරි කාලයේදී වාහන ගෙන්වීමේ කටයුත්ත කරයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, එහෙම කරන්න පුළුවන් තත්ත්වයක් අද ඒ අයට නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් පැත්තෙන් ගත්තොත්, මේ කාලයේ ආණ්ඩුව බලාපොරොත්තුවෙන් ඉන්නේ, මේ වාහන ආනයනයෙන් විශාල බදු ආදායමක් ලබා ගන්නයි. නමුත්, ඒ බදු ආදායම ලබා ගැනීමේ අපේක්ෂාවත් අද සිහිනයක් බවට පත් වෙලා තිබෙනවා. රජය බලාපොරොත්තු වන ආදායම ලබා ගන්න පුළුවන්කමක් නැහැ. දැනට වාහන ආනයනය කෙරෙන ආකාරය අනුව පෙනී යන දෙයක් තිබෙනවා. මොන තරම් සහන සලසා දුන්නා වුණත්, ඒ අයට තිබෙන බාධා ඉවත් කරලා දුන්නා වුණත්, ඉදිරි කාලයේදී වාහන ආනයනය කරන්න ඒ අය පෙලඹෙන්නේ නැහැ, එහෙම නැත්නම් ඒ කටයුත්ත කරන්නේ නැහැ කියන එක තමයි අද වාහන ආනයනකරුවන්ගේ මැසිවිල්ල වෙලා තිබෙන්නේ. ඒ නිසා මට මේ අවස්ථාවේ කියන්න තිබෙන්නේ, මොන තරම් දේවල් කෙරුවා වුණත් ඒවායෙන් ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ කියන එකයි. මෙමඟින් රටේ ජනතාවටත්, ඒ වාගේම ආනයනකරුවන්ටත් යම්කිසි සහනයක් ලබා ගන්න පුළුවන් වෙන්නේ අධික තීරු බද්ද අඩු කරලා සහනදායී ලෙස වාහන ගෙන්වීමට අවස්ථාව සලසා දුන්නොත් පමණයි. ඒක තමයි මේ කාලයේ කරන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහන ආනයනකරුවන් විතරක් නොවෙයි, තවත් නොයෙකුත් භාණ්ඩ ගෙන්වන ආනයනකරුවෝ ඉන්නවා. ඒ වාගේම, අපනයනය කරන අයත් ඉන්නවා. අපනයනය කරන උදවියටත්, ආනයනය කරන ව්‍යාපාරිකයන්ටත් අද වරායෙන්, රේගුවෙන් ඊට අදාළ කටයුතු නිසියාකාරව කර ගන්න ගියාම නොයෙකුත් ආකාරයේ බාධා ඇති වෙනවා. ඒක අප කවුරුවත් කථා කරන්නේ නැති ප්‍රශ්නයක්. පසුගිය දවස්වල අපි දැක්කා, ආනයනකරුවන්ටත්, අපනයනකරුවන්ටත් නොයෙකුත් ආකාරයේ බරපතළ ප්‍රශ්න තිබුණු බව. අපි දන්නවා, ඒ කන්ටේනර් ටික නිසියාකාරව නිෂ්කාසනය කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ කියා. මොකද, ඒ කටයුතු කරලා දෙන්න මාස ගණන් කල් ගත්තා. ඒ නිසා ඒ අයට ඒවා නිෂ්කාසනය කර ගන්න මාස ගණන් ගියා. මේ වාගේ නොයෙකුත් ආකාරයේ ප්‍රායෝගික ගැටලු තිබෙනවා. අද වන කොට රජය බලයට පත් වෙලා මාස 6ක්, 7ක් ගත වෙලා තිබෙනවා වුණත්, ඒ අයට තවම මේ සම්බන්ධයෙන් නිසියාකාර විසඳුම් ලබා දෙන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ කටයුතුවලදී තවදුරටත් වංචා, දූෂණ සිදු වනවා කියන එක තමයි ආනයනකරුවන්ගේත්, අපනයනකරුවන්ගේත් මැසිවිල්ල වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මතකයි, පසුගිය දවස්වල ඒ තදබදය අස්සේ කන්ටේනර් 327ක් නිදහස් කරන්නත් කටයුතු කළ බව. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරනවා කිව්වාට, රජය ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරලා, ඒ පිළිබඳව ජනතාවට තේරුම් කරලා දුන්නේ නැහැ; ජනතාවට තොරතුරු ටික ලබා දුන්නේ නැහැ. ඒ කන්ටේනර් තුළ තිබුණේ මොනවාද, ඒ කන්ටේනර්වල රටට අහිතකර දේවල් තිබුණා ද, එහෙම නැත්නම්, වංචාසහගතව බදු ගෙවන්නේ නැතිව ගෙනාපු ද්‍රව්‍ය මොනවා හෝ ඒවායේ තිබුණා ද කියන එක ගැන කිසිම සඳහන් කරන්න වර්තමාන රජයේ අය අපොහොසත් වෙලා තිබෙනවා. ඉතින්, ඒවාත් බරපතළ ප්‍රශ්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් පැත්තෙන් ආනයනකරුවන්, අපනයනකරුවන් මැසිවිලි නඟන කාරණයක් තමයි, භාණ්ඩ නිෂ්කාසනය කර ගන්න ගියාම තමන්ට මතු වෙලා තිබෙන ගැටලුසහගත තත්ත්වය. ඒ වාගේම අපි දන්නවා, ඇතැම් නිලධාරින් නිසා ඇති වී තිබෙන ගැටලු ගැනත්. ඒ සමහර නිලධාරින්ට මුදල් හදල් දෙන්න තිබෙනවා. නොයෙකුත් ආකාරයේ සන්තෝසම් ලබා දීලා, මුදල් ලබා දීලා ඒ භාණ්ඩ නිදහස් කර ගැනීමට සිදු වීම කියන ප්‍රශ්නයත් තිබෙනවා. වංචාව, දූෂණය හැම පැත්තෙන්ම නැති කරනවා කියලා නේ ඔබතුමන්ලා බලයට ආවේ. ඔබතුමන්ලා බලයට ආපු නිසා මම ඉල්ලා සිටින්න කැමැතියි, මේ සංශෝධන ගෙනෙනවා වාගේම වරාය ඇතුළේ තිබෙන, රේගුව සම්බන්ධයෙන් තිබෙන අනෙකුත් ගැටලු, ප්‍රශ්න සම්බන්ධවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා, වංචාවෙන්, දූෂණයෙන් තොරව, අත යට මුදල් ගනු දෙනු නැතිව, ඒ බඩු භාණ්ඩ නිදහස් කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒක තමයි අපට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපනයනය පැත්ත ගෙන බලන්න. අපනයනය ඉතාම වැදගත් කියලා අපි දන්නවා. මේ දවස්වල අපට අපනයනය විශේෂයෙන් වැදගත් වෙලා තිබෙන්නේ ඇයි කියා අපි දන්නවා. මොකද, විදේශ විනිමය නැතිව අපට කිසි දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ.

ඒ කාලයේ විදේශ විනිමය තිබුණේ නැහැ. විදේශ විනිමය නැති නිසා අපට අවශ්‍ය අත්‍යවශ්‍ය දේවල් ගෙන්වා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඉදිරි කාලයේදී, තවත් අවුරුද්දක් දෙකක් යන කොට අපට ණය ගෙවන්න තිබෙන බව අපි දන්නවා. ණය ගෙවන්න තිබෙන්නේ ඩොලර්වලින්. ඒ සඳහා විදේශ විනිමය උපයා ගැනීම සම්බන්ධව, එයට තිබෙන අවහිරතා සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙළක් වර්තමාන ආණ්ඩුව ක්‍රියාත්මක කරන බවක් අපට පෙනෙන්නට නැහැ. මම කියන්නම්, ඇඟලුම් ක්ෂේත්‍රයෙන් ඒකට හොඳම උදාහරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට වැඩියෙන්ම විදේශ විනිමය ලබා දෙන්නේ ඇඟලුම් ක්ෂේත්‍රයෙන් බව අපි කවුරුත් දන්නවා. ඇඟලුම් කර්මාන්තය අද තිබෙන තත්ත්වය ගත්තාම බරපතළ අර්බුදයකට ලක් වෙලායි තිබෙන්නේ. ඒවායේ හිමිකරුවන් කියන්නේ මොකක්ද? "අපිට මේ ඇඟලුම් කර්මාන්තශාලා පවත්වාගෙන යන්න බැහැ, අපිට මේවා තවදුරටත් කරගෙන යන්න පුළුවන්කමක් නැහැ" කියලායි කියන්නේ. ඒකට හොඳම උදාහරණය තමයි, ඊයේ පෙරේදා කටුනායක තිබෙන "NEXT" කියන පැරණිම ඇඟලුම් කර්මාන්තායතනය වහන්න කටයුතු කරපු එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා. අද සේවකයන් 2,000ක් විතර මහ පාරට වැටිලා තිබෙනවා. මෙතැනදී අප කල්පනා කරන්න ඕනෑ ඒවා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ගැනයි. ආණ්ඩුව මූලිකත්වය දෙන්න ඕනෑ අන්න ඒ කාරණාවලටයි. එහෙම නැතිව පසුගිය දවස්වල සිදු වෙච්ච වංචා, දූෂණ සම්බන්ධව මෙතැනට ඇවිල්ලා lists ඉදිරිපත් කිරීමෙන් පමණක් මේ කටයුත්ත කරන්න පුළුවන්කමක් නැහැ. ඒ ඇඟලුම් කර්මාන්තශාලාව පිළිබඳව ඔවුන් අද නඟන මැසිවිල්ල මොකක්ද? මම දැක්කා, ඒ පිළිබඳව ඊයේත් පුවත් පත් සාකච්ඡාවක් පවත්වා තිබෙනවා. ඒ සාකච්ඡාවේදී ඔවුන් කියන්නේ මොකක්ද? "මේ පිරිවැය අපිට දරා ගන්න බැහැ" කියලායි ඔවුන් කියන්නේ. හෙට අනිද්දා වනකොට විදුලි බිල තවත් වැඩි කරන්න ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. ඒ වැඩි වන විදුලි බිලත් එක්ක කොහොමද තම කර්මාන්තශාලා පවත්වාගෙන යන්නේ කියන එක තමයි ඒ අය නඟන මැසිවිල්ල. ඒ ගොල්ලන් කියන්නේ, "මේවා සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන අප වෙනුවෙන් යම්කිසි සහනදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න; අපේ කර්මාන්ත ටික පවත්වාගෙන යන්න, අපේ පිරිවැය අඩු කරන්න වැඩ පිළිවෙළක් හදන්න" කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අනෙක් ප්‍රධාන අපනයන ආදායම මොකක්ද? ඒ තමයි, තේ කර්මාන්තය. තේ කර්මාන්තය සම්බන්ධවත් අද වන විට ලොකු අර්බුදයක් මතුව

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

තිබෙනවා. තේ කර්මාන්තශාලා හිමියනුත් ඉහත කී මැසිවිල්ලම තමයි නඟන්නේ. මොකද, ඒ අයගේ නිෂ්පාදන වියදමත් වැඩි වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම වැඩි වුණාම ඔවුන්ට ලැබෙන ආදායම අඩු වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම වැඩි වන කොට තේ කර්මාන්තයේ නියැළී සිටින කුඩා තේ වතු හිමියන්ට ලබා දෙන මුදල -ඒ කියන්නේ, ඒ ගොල්ලන් තේ දලු කිලෝ එකක් සඳහා ලබා දෙන මුදල- අඩු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ, නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබෙන නිසායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා සම්බන්ධව තමයි ආණ්ඩුවේ අවධානය යොමු වෙන්න ඕනෑ. මේවා පිළිබඳව ආණ්ඩුව දැඩි අවධානයක් යොමු කරලා, අපනයනය වර්ධනය කරන්න තිබෙන බාධා ඉවත් කර දීලා, ඒවාට අවශ්‍ය කරන අනෙකුත් පිරිවැය සහන ලබා දෙන්න යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එසේ කළේ නැත්නම් අප මෙතැනට ඇවිල්ලා කොච්චර කථා කළත්, අපට හොඳ ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ වාගේම රට ඉස්සරහට යන්නේත් නැහැ කියලායි මා හිතන්නේ. හැම දාම වාගේ කරන්නේ මෙතැනට ඇවිල්ලා දෙපැත්තට වෙලා කථා කර කර ඉන්න එක විතරයි. ඒ පැත්තෙන් මෙහෙට චෝදනා එල්ල කරනවා. මේ පැත්තෙන් එහෙට චෝදනා එල්ල කරනවා. ඒවා කරනවාට වඩා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් කියලා තමයි මට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ. අපේ ඒ ප්‍රධාන ආදායම් මාර්ග දෙක රැක ගන්න ඕනෑ. පළමුවෙනි කාරණාව ඒකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ආදායම් මාර්ග දෙක කඩා වැටුණොත්, අප කාටවත් අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මොකද, දේශීය වශයෙන් කොච්චර ආදායම් උපදවන්න අප කටයුතු කළත් විදේශ විනිමය නැත්නම් මොන දෙයක්වත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ කාරණය සම්බන්ධව රජය දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒක තමයි කිව යුත්තේ. මට නම් පෙනෙන්නේ නැහැ, මේ මාස 6 ඇතුළත ඒ පැත්තෙන් යම්කිසි සහනයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා කියලා. ඇඟලුම් කර්මාන්තය, තේ කර්මාන්තය ආරක්ෂා කර ගැනීමේ යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා මේ අවස්ථාවේදී රජය පාර්ශ්වයට යෝජනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) A.M.M.M. Rathwaththe. You have 11 minutes.

[අ.භා. 1.42]

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි පිළිබඳවත් විවාදයට ගැනෙනවා. මෙම විවාදයට සම්බන්ධ වීමට ප්‍රථම කථා කළ යුතුම මාතෘකාවක් සම්බන්ධව මගේ කාලය වෙන් කරන්න මම හිතුවා. එහෙම කරන්න හේතුවක් තිබෙනවා.

තිස් අවුරුදු කුරිරු යුද්ධය නිමාවෙන් වසර 16ක් ගෙවී යන මොහොතේ ත්‍රිවිධ හමුදාවේ කාන්තා බලකාය නියෝජනය කරමින් දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව උදා වූ ප්‍රථම පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය විධියටත්, කුරිරු යුද්ධයට සක්‍රියව දායක වුණු කාන්තා බලකායේ නියෝජිතවරියක විධියටත් මට හිතුණා, රණ විරුවන් සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අය කරන කථා පිළිබඳව පොඩි කාලයක් අරගෙන කථා කරන්න.

පසුගිය කාලයේ ඒ කුරිරු යුද ගැටුම් නිර්මාණය කළේ කවුද? ජාතීන් විධියට, ආගම් විධියට ජනතාව බෙදා වෙන් කළේ කවුද? තමන්ගේ දේශපාලන අභිමතය වෙනුවෙන් යුද්ධය වවාගෙන කාපු බංකොලොත් දේශපාලන පක්ෂ නියෝජනය කරන, මේ ඉදිරි අසුන්වල සිටින මහත්වරුන්ගේ කථා පසුගිය දවස් දෙකේ සහ අදත් මම අහගෙන සිටියා.

ඇත්තටම හරිම ලජ්ජයි! අපුලෙන් තමයි මම ඒ කථා අහගෙන සිටියේ. රණ විරුවන් ගැන අද කිඹුල් කඳුළු හෙළන මේ විපක්ෂයේ අය රණ විරුවන්ට සැලකුවේ කොහොමද කියලා මම පළමුවෙන්ම ඔබතුමන්ලාට කියන්නම්.

30 අවුරුදු යුද්ධය නිමාවට පත් කරන්න නායකත්වය දුන් ඒ අභීත සෙන්පති ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා කුදලාගෙන ගිහින් හිරේ දමපු මොහොතේ, නමට රණ විරුවෙකු වෙලා හිටපු, හිටපු ජනාධිපතිවරයෙකුගේ පුතෙකුගේ සපත්තු ලෙව කමින් හිටපු, දැන් රණ විරුවන් ගැන කිඹුල් කඳුළු හෙළන ඔය මහත්වරුන් එදා කොහේද හිටියේ කියලා මම අහන්න කැමැතියි. ඒ වෙලාවේ බිහිරන්, ගොළුවන් වාගේ ඔළුව කකුල් දෙක අස්සේ ගහගෙන හැංගිලා හිටපු ඔය මිනිස්සු අද මේ රණ විරුවන්ට "රණ විරුවන්" නොකියා "සොල්දාදුවන්" කිව්වාය කියලා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කඳුළු හෙළනවා.

ඒ වාගේම, අර අටවා ගත්තු නිල් බලකාය කියලා එකක් තිබුණා නේ. ඒකේ හිටපු පුතණ්ඩිලා ටිකයි, නළු නිළියන් ටිකයි යුද්ධ හමුදාවේ නාම ලේඛනයට ඇතුළත් කරලා යුද්ධ හමුදාවෙන් වැටුප් ගන්න කොට, මේ පිරිස හිටියේ කොහේද කියලාත් මම අහන්න කැමැතියි. කිසිදු සුදුසුකමක් නැති වුණත් ජනාධිපති පුතා වූ නිසාම, ඒ වරප්‍රසාදය නිසාම, නාවික හමුදාවේ තනතුරු බල්ලට දමලා, ඒ පුතාගේ වැඩවලට නාවික හමුදාවේ ඉහළ තනතුරුවල සිටි අය යොදවන කොට, දැන් රණ විරුවන් ගැන කඳුළු හෙළන පාර්ලිමේන්තුවේ මේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එදා කොහේද හිටියේ කියලාත් මම අහනවා. ඒ වාගේම තමයි ඔය ප්‍රභූ යැයි කියා ගන්නා අයගේ ගෙවල්වල බල්ලන් නාවන කොට, ඒ අයගේ නෝනලාගේ සාරි හැට්ටවල කටු ගහන කොට, ඒ වාගේම ඒ පුතාලාට රේස් පදින්න නුවර මාළිගාව ඉස්සරහා වැලි කොට්ට ගහන්න රණ විරුවන් යොදවා ගන්න කොට, රණ විරුවන් ගැන දැන් කඳුළු හෙළන මේ මහත්වරුන්ට එදා ඒවා නොපෙනුණු එක ගැන ඇත්තටම හරිම පුදුමයි.

ඒ වාගේම තමයි 30 අවුරුදු යුද්ධය නිමාවත් සමඟ රණ විරුවන්ගේ අභිමානය පසෙකට දමා, ඔවුන් ශත පහකට මායිම් නොකර එදා හිටපු පාලකයන් රණ විරුවන්ගේ කකුල්වල තුවාල එනකල් අනුරාධපුර, කොළඹ, නුවර ආදි ප්‍රධාන නගරවල කුණු කානු අදින්න යෙදෙව්වා. ත්‍රිවිධ හමුදා සෙබළුන්ගේ රාජකාරියක් විධියටම එම රාජකාරියත් නම් කළේ එවකට සිටි ඒ පාලකයන් බව මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි එදා පටු දේශපාලන අදහස් වෙනුවෙන් එල්ටීටීඊ සංවිධානයට අවි ආයුධ නොදුන්නා නම්, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ලෙස ජාතීන් විධියට, ආගම් විධියට මේ රටේ ජනතාව බෙදා වෙන් නොකළා නම්, මේ රටේ අභිමංසලවල ආබාධිත රණ විරුවන් අද මේ විධියට ඉන්නේ නැහැ. ඒ වාගේම රණ විරු උපහාර පවත්වන්න අපට අවශ්‍ය වෙන්නේත් නැහැ. එදා සිටි පාලකයන්ගේ පටු දේශපාලන අදහස් වෙනුවෙන්, ඔවුන්ගේ පටු අරමුණු වෙනුවෙන් එදා ජාතීන්

විධියට මේ රටේ ජනතාව බෙදා වෙන් කිරීම සහ එල්ටීටීඊ සංවිධානය පෝෂණය කිරීම නිසා තමයි අපට ඒ වාගේ කුරිරු අත්දැකීම් ලබා ගන්න සිදු වුණේ.

ඒ විතරක් නොවෙයි, හරි ලස්සන වැඩක් වුණා. එක විශ්‍රාමික ජනාධිපතිවරයෙකුගේ පුතෙක් හිටියා, නාවික හමුදාවේ සේවය කරපු. මා දන්නා තරමට, ඔහු නාවික හමුදාවෙන් කිසිදු වැටුපක් ලබා ගත්තේ නැහැ කියලා තමයි කියන්නේ. නමුත් කෝටි 500ක් වියදම් කරලා TV channel එකක් ඔහුගේ නමින් විවෘත කරන්න තරම් ඔහු ලොකු පොහොසතෙක් වුණා. ඔහු Navy එකේ හිටපු නිලධාරියෙක්. මම අහන්න කැමැතියි, වැටුප් නොගෙන ඒ විධියට කෝටි 500 ගණන් වියදම් කරලා TV channel එකක් open කරන්න තරම් ඒ අය ඒ මුදල් හම්බ කළේ කොහොමද කියලා.

ඒ, මහජනතාවගේ බදු මුදල් හොරා කාලාය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ආණ්ඩුවක් විධියටත්, යුද හමුදාවේ සේවය කරපු නියෝජිතවරියක් විධියටත් මා මේ අවස්ථාවේදී කියනවා, උතුරේ ජීවත් වන ඒ ආදරණීය අම්මලාට, තාත්තලාට යුද්ධයෙන් මිය ගිය තමන්ගේ දරුවෝ යුද විරුවෝ තමයි. ඒ වාගේම දකුණේ ජීවත් වන අපේ ආදරණීය අම්මලාට, තාත්තලාටත් යුද්ධයෙන් මිය ගිය ඒ ආදරණීය දරුවන් යුද විරුවෝම තමයි. එය උතුරේ ද, දකුණේ ද, නැගෙනහිර ද කියලා කිසිම භේදයක් නැහැ. මේ රටේ පැවැති යුද්ධය වෙනුවෙන් ජීවිත පූජා කරපු හැමෝම යුද විරුවෝ. අපි රජයක් විධියට මේ වෑයම් කරන්නේ නම් යුද විරුවන් නිර්මාණය කිරීමට නොවෙයි. අපට අවශ්‍යතාව තිබෙන්නේ නැවත එවැනි ම්ලේච්ඡ යුද්ධයක් නිර්මාණය කිරීමට නොවෙයි. අපට අවශ්‍යතාව තිබෙන්නේ මේ රටේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" නිර්මාණය කිරීමටයි. ඒ වෙනුවෙන් ආණ්ඩුවක් විධියට ගන්න පුළුවන් උපරිම තීන්දු-තීරණ අපි ගන්නවා. මෙතෙක් ගෙන තිබෙන තීන්දු-තීරණ ඒ වෙනුවෙන් ප්‍රමාණවත් නොවෙයි නම් නැවත තීන්දු-තීරණ අරගෙන හරි මේ රට "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කිරීමේ ඒ අදිටන අපි අනිවාර්යයෙන්ම, ස්ථිර වශයෙන්ම ඉෂ්ට සිද්ධ කරනවා. අපි ඒක මේ අවස්ථාවේදී මේ සභා ගැබේදී ස්ථිර කරනවා. අපි විපක්ෂයේ මහත්වරුන්ගෙන් ඉල්ලන්නේ, අනේ මහත්වරුනේ ආයෙත් ගිනි තියන්න ලැහැස්ති වෙන්න එපා කියලායි. මොකද, ඔබතුමන්ලා තියපු ගින්න නිවන්න අවුරුදු 30ක් විතර ගියා. ඒත් ඔබතුමන්ලා ගිනි තියනවා නම් අපි ආයෙත් ඒ ගිනි නිවන්නත් ලැහැස්තියි කියන ඒ පණිවුඩය අපි ඔබට ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදයට ගනු ලබන්නේ 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයයි. මේ තුළින් ආනයන හා අපනයන (පාලන) පනතේ සඳහන් රෙගුලාසි අංක 5, 7 සහ 8හි සංශෝධන කිහිපයක් සිදු කර තිබෙනවා. ජපානයෙන් වාහන ගෙන්වීමේදී ඇති වී තිබෙන දුෂ්කරතා හා ගැටලු මඟ හැර ගැනීම වෙනුවෙන් Bureau Veritas ආයතනය බලය ලත් පරීක්ෂකවරයකු ලෙස මෙම අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නම් කර තිබෙනවා. එහිදී ඇතිවන වාසි නම්, වාහන ආනයනයේදී ආනයනකරුවන් මුහුණ දෙන ප්‍රායෝගික දුෂ්කරතා පහසු කර ගැනීමයි. ඒ වාගේම තමයි ප්‍රමාද ගාස්තු සහ ක්‍රියාවලිය අවම කිරීම තුළින් වෙළෙඳ පොළ තුළ වාහන මිල සඳහා එකතු විය හැකි වක්‍ර වියදම් අවම කර ගැනීමත් මේ තුළින් ඇතිවන වාසියක් ලෙස පෙන්වා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Dilith Jayaweera. You have ten minutes.

[අ.භා. 1.52]

**ගරු දිලිත් ජයවීර මහතා**
*(மாண்புமிகு திலித் ஜயவீர)*
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

අද මේ ගරු සභාව ආමන්ත්‍රණය කිරීමේදී ප්‍රවේශයක් ලෙස මා මේ කරුණ සඳහන් කළ යුතුයි. ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරලා තිබුණා, මටත් ආරාධනා කරලා තිබුණා කියලා පළාත් පාලන ආයතන පිහිටුවන්න එන්න කියලා. මට එතුමාගෙන් විමසිය යුතු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. අද මට ආරංචි වුණු දෙයක් තමයි, අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත් නයි ප්‍රශ්නයක් මතු කරලා තිබුණ බව. මටත් "ඇන්ටිජන්" වංචාව සම්බන්ධයෙන් ලොකු චෝදනාවක් කරලා තිබුණා. පැලවත්තේ "fake-comment *balakaya*" ඒ ගැන ඉඳලා හිටලා ගහනවා, නලින්ද ජයතිස්ස ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී එම කරුණ නිවැරදි කරලා තිබියදීත්. ඒ වාගේම වසන්ත සමරසිංහ මැතිතුමාත් ඒ ගැන ඉඳලා හිටලා කථා කරනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ පක්ෂයේ ආත්ම ගෞරවය ආරක්ෂා කිරීම සඳහා ඔබතුමන්ලා එක්ක එකතු වන ඒ වාගේ වැඩවලට සම්බන්ධ නොවී ඉන්න අපට සිද්ධ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, NPP එකට හොඳ නැහැ. එහෙම වුණොත්, හොරු සමඟ එකතු වෙලාය, නයි පෙන්වපු අය සමඟ එකතු වෙලාය කියලා මේ පක්ෂයට චෝදනාවක් එන්න පුළුවන්.

කොහොම වුණත් අපි ප්‍රශස්ත දේශපාලනයක නියුක්ත වන දේශපාලන ව්‍යාපාරයක් හැටියට, සර්වජන බලය මේ පළාත් පාලන මැතිවරණය හා බද්ධ වුණු ඒ ප්‍රතිඵලය නිශ්චිත ලෙස විග්‍රහ කරලා, ඒ විග්‍රහය තුළින් අපට කියන්න පුළුවන් යම්කිසි පණිවුඩයක් තිබෙනවා නම් ඒකත් බොහොම පැහැදිලිව ඔබතුමන්ලාට පැහැදිලි කර දීලා, අපේ ස්ථාවරයත් පැහැදිලි කළා. අපි සාම්ප්‍රදායික දේශපාලනයේ යෙදෙන දේශපාලන ව්‍යාපාර මෙන් දේශපාලන පක්ෂවලට මුක්කු ගහන්න ජනතාව විසින් අපට ලබා දුන් ඒ ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ කියන එක අපි කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රවේශයත් එක්ක මම කියන්න ඕනෑ, we are in a terrible situation altogether as far as the country is concerned. Now, look at what we are discussing in Parliament. In this Parliament, you all have a clear majority of 159 seats. That mandate has been given with a purpose or an expectation by the people and that is a revolutionary decision the people had taken. That is why, time and again, I try to remind you all to please understand that message.

දැන් මේ පාර්ලිමේන්තුවේදීම වසන්ත සමරසිංහ ඇමතිතුමා කියනවා, අපේ සර්වජන බලය පක්ෂයේ අයත් එතුමන්ලාට කථා කළා කියලා. අපිත් පැලවත්තට ගෙන්වා කථා කරනවා ලු. ඒ, මොනවා කරන්නද? ඒ පරණ දහ ජරා වැඩේම, ඒ කුප්ප වැඩේම කරන්නයි. ඔබතුමන්ලා බලයට ආවේ ඒකටද? පැවති දේශපාලන සම්ප්‍රදාය වෙනස් කරලා, අලුත් දෙයක් කරලා හොඳ සමාජයක් හදනවා කියලා නේද බලයට ආවේ? ඔබතුමන්ලාත් ඒ පරණ දහජරා වැඩේම කරනවා නම්, මේ ආයතන පිහිටුවන්න ඡන්ද ලබා ගන්නට විවිධ වරදාන වරප්‍රසාද, මුදල් දෙන්න පටන් ගෙන තිබෙනවා නම්, ඒක ජනතා අභිලාෂය කියවා ගැනීමක් ද? ඒක ද මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ? ජනතාව බලාපොරොත්තු වුණේ, මැතිවරණ ක්‍රමය නිවැරදි කරලා, තිබෙන

[ගරු දිලිත් ජයවීර මහතා]

අඩු පාඩු සකස් කරලා, මුදල් මත තරගකාරිත්වයක් නිර්මාණය කරලා තිබෙන ඒ ක්‍රමය වෙනස් කරලා, පක්ෂ මාරු කරන්න බැරි කරලා අලුත් දෙයක් කරන්න කියලායි. මේකෙන් මොකක්ද කියන්නේ? මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 159දෙනාත්, ඔය පක්ෂයත් සුදානම් නැහැ, මේ රට නව මාර්ගයක ගෙනයන්න. ඒ පරණ වැඩේම වෙනත් විධියකට කරන්නටයි හදන්නේ. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා.

එතුමා කියනවා නම් අපේ අයට කථා කළාය කියලා, ඒක ඇත්ත. අපේ අයට කථා කරනවා. ඒක තමයි දුක. එහෙම කොහොමද කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒක නිසා මම බොහොම කනගාටුවෙන් නමුත්, ආදරයෙන් මේ ප්‍රකාශය කියන්නේ. කරුණාකරලා නැවත නැවතත් කියනවා, අද රට ආර්ථික වශයෙන් වැටී ඇති මේ ප්‍රපාතයෙන් ගොඩ ගන්නට ඔබගේ පක්ෂයේ ඔබ ඔය දාර්ශනිකව ඉදිරිපත් කර තිබෙන යාචක මානසිකත්වයෙන් මිදෙන්නට ඕනෑය කියලා. අපේ රටේ ආර්ථිකය මෙහෙයවන්න හදන්නේ දුගී මගී යාචක දෘෂ්ටිකෝණයෙන් නම්, අපේ ජනාධිපතිතුමා රටවල් 3කට රුපියල් මිලියන 1.1කින් ගිහිල්ලා යහළුවන්ගේ ගෙවල්වල නැවතිලා ඉන්නවා නම්, දුගී විධියට කල්පනා කරලා රට කරනවා නම්, ඇමතිවරුන්ගේ පඩි ටික අරගෙන අරමුදලට දාගන්නවා නම්, ඔවුන්ට යන්න එන්න වාහනයක් නැත්නම්, ඔවුන්ගේ නිල නිවාස අරගෙන තිබෙනවා නම්, කොළඹදී කවුරු හරි සොයාගෙන ඔවුන්ට නැවතිලා ඉන්න සිද්ධ වෙලා තිබෙනවා නම්, මේක ජාතියට කරන අභාග්‍යතම ප්‍රකාශනයයි. මේ රට මෙහෙම කරන්න බැහැ. අපි තරග කරන්නේ ලෝකයේ දියුණු රටවල් එක්ක. අපේ අසල්වැසි රට ඉන්දියාව ගත්තොත්, Sir, now you know the level they have risen to, what they have achieved. So, we have got to compete with them. If we are to compete, could we do so with an attitude like this, with this begging mentality? එම නිසා මම වත්මන් ආණ්ඩුවට ආරාධනා කර සිටිනවා, අපේ ජනතාව කියපු දේ තේරුම් අරගෙන ආර්ථිකය පැත්තෙන් ද, අපේ සභ්‍යත්වය, සංස්කෘතිය පැත්තෙන් ද, සමාජ සදාචාරය පැත්තෙන් ද නිවැරදි කථාවකට, කතිකාවකට අප සමඟ එකතු වෙන්න කියලා.

අපටත් ඕනෑ මේ රට ඉදිරියට යනවා දකින්නයි. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ බල තණ්හාවෙන් කාත් එක්ක හෝ එකතු වෙලා බලය ලබා ගන්න නොවෙයි. අපට ඕනෑ මේ රට ඉදිරියට යනවා දකින්නටයි; ආර්ථික දියුණුවක්, ආර්ථික ප්‍රගතියක් දකින්නටයි. ඉතින්, ඒක කොහොමද කරන්නේ?

මේ රටේ තිබුණු රණවිරු සැමරුම ඉස්සරහ නටපු නාඩගම මොකක්ද? දැන් මුතුමැණිකේ රත්වත්තේ මන්ත්‍රීතුමිය කථා කළා. එතුමිය කැමතිද "සෙබළිය" කියනවාට? අරුණ ජයසේකර හිටපු මේජර් ජෙනරාල්තුමා කැමතිද "සෙබළා" කියනවාට? "සෙබළා" කියනවාට කැමතිද? ලේ, ඉස්, මස් ඔක්කොම දීලා මේ රට වෙනුවෙන් සටන් කරපු ඒ රණ විරුවාට "සොල්දාදුවා" කියලා කථා කරන්නේ මොන මානසිකත්වයෙන්ද? මේක අපි කියවා ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ජනාධිපතිතුමා පටලවා ගත්ත තැන මේක. එතුමා මේ රටේ සහජීවනය පටලවාගෙන තිබෙනවා. සහජීවනය යනු කුමක්ද කියා තේරුම් නොගෙන, උතුරේ ජනතාවගේ වාගේම දකුණේ ජනතාවගේ අභිලාෂ තේරුම් නොගෙන ඔවුන් එතුමාට ලබා දුන් ඡන්දයේ පරමාර්ථය, අපේක්ෂාව තේරුම් නොගෙන තමයි මේ සියලු ප්‍රකාශ කරන්නේ. ඒ නිසා අපේ යුතුකම තමයි එතුමාට මේක කියලා දෙන එක; තේරුම් කරලා දෙන එක; මතක් කරලා දෙන එක. එහෙම නැතුව අපි වෙන මොනවා කරන්නද?

අපි නැවත නැවතත් කියන්නේ කරුණාකරලා මේ විකාර රංගනයෙන් ඉවත් වෙලා යථාර්ථයත් එක්ක ගනුදෙනු කරන්න පුරුදු වෙන්න, පටන් ගන්න කියන එකයි. ඔවුන් දන්නවා, තවමත් ජනතාවගේ තුනෙන් දෙකක බලය දිනා ගන්නට බැරි වෙලා තිබෙන තත්ත්වය තුළ ඇති අභියෝගය බරපතළ අභියෝගයක් බව. මේ අභියෝගය තුළ දුක් විඳින ජනතාවට බලාපොරොත්තු වෙන්න පුළුවන් කුමක්ද? ජනතාවට බලාපොරොත්තුවක් ඇති වෙන්නේ මේ ආණ්ඩුව කරන මොන දේ නිසාද? අපට හැම දාම අහන්න ලැබෙන්නේ එතුමන්ලා කලින් කිව්ව කථාවට සම්පූර්ණයෙන්ම පරස්පර කථාවක්. ඒ නිසා ජනතාවගේ බලාපොරොත්තු දිනපතා බිඳ වැටෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේදී ඇඟලුම් කර්මාන්තශාලාවක් ගැන සඳහන් වුණා. The "NEXT" apparel manufacturing company is a UK-based company. They have a couple of factories here. I hope they would not close down the rest of their factories. What they are going to close down is the factory in the Katunayake Free Trade Zone. මේ වාගේ විශාල ඇඟලුම් කම්හලක් වැහෙන්නේ ඇයි? මේකෙන් කියවා ගත යුතු පණිවුඩය මොකක්ද? මේ රටේ ව්‍යවසායකයාට දැනෙන දේ මොකක්ද? දැනෙන්නේ මේ රට ගැන බලාපොරොත්තු තියා ගන්න බැහැ, මේ රටේ ආයෝජනය කරන්නට ඔවුන්ට විශ්වාසයක් නැති බවයි. එහෙම රටක් ගැන මේ රටේ ජනතාව බලාපොරොත්තුවක් තියා ගන්නේ කොහොමද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

මේ රටේ මිනිස්සු උදේට නැඟිටින්නේ මොන අපේක්ෂාවෙන්ද? මොන සිහිනයෙන්ද? මොකක්වත් සිහිනයක් නැහැ. මේ රටේ මිනිස්සු උදේට නැඟිටින්නේ රෑ කෑම වේලට ලුණු තිබේවිද, නැද්ද කියලා කල්පනා කරමින්. විශාල බලයක් ලබා දුන් ආණ්ඩුව මේ තත්ත්වයට පත් වෙලා නම් මේ රටේ මිනිස්සු කොතරම් අසරණද? ඇඟලුම් කම්හල් සේවක සේවිකාවන් උදේට නැඟිටින්නේ හෙට රස්සාව නැති වෙයිද කියලා හිතාගෙන නම්, මේ රටේ ඉපදුණු ඒ මිනිස්සු මේ රට ගැන බලාපොරොත්තුවක් තියාගෙන හෙට දවසට මුහුණ දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dilith Jayaweera, you have exhausted your allotted time.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණය නැවත නැවතත් මේ පාර්ලිමේන්තුවේදී පවසා සිටිනවා. ඔබතුමන්ලා ප්‍රශස්ත සංවාදයකට එළඹෙන්නේ නැත්නම්, සැබෑ ප්‍රශ්න සැබෑ ලෙස හඳුනාගෙන ජනතාව සමඟ මේ දෙබස ඇරඹුවේ නැත්නම් අවසාන වෙන්නේ ඔබතුමන්ලා විතරක් නොවෙයි, අපේ මේ මාතෘ භූමිය හා එහි අනාගතය බවත් පවසමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Muhammad Faizal. You have 12 minutes.

[பி.ப. 2.03]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம். அஸ்ஸலாமு அலைக்கும்! ආයුබෝවන්! வணக்கம்!*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இறக்குமதி மற்றும் ஏற்றுமதி தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இலங்கையில் அந்நியச் செலாவணிப் பற்றாக்குறைப் பிரச்சினை காரணமாக 2020ஆம் ஆண்டு மார்ச் மாதம் முதல் வாகனங்களின் இறக்குமதிக்குத் தற்காலிகத் தடை விதிக்கப்பட்டிருந்தது. சென்ற அரசாங்கங்கள் செய்த வீண் விரயங்கள்தான் அதற்குக் காரணமாக இருந்தது. அதன் பின்னர் தேசிய மக்கள் சக்தி அரசாங்கம் மூன்று வகைப்படுத்தல்களின் அடிப்படையில் வாகன இறக்குமதிக்கு அனுமதி வழங்கும் வகையில் முதற் கட்டமாக 2024ஆம் ஆண்டு ஒக்ரோபர் 01ஆம் திகதி முதல் பொதுப் போக்குவரத்து மற்றும் சிறப்பு வாகனங்களையும், இரண்டாம் கட்டமாக 2024ஆம் ஆண்டு டிசம்பர் மாதம் 01ஆம் திகதி முதல் வர்த்தக மற்றும் சரக்குப் போக்குவரத்து வாகனங்களையும், மூன்றாம் கட்டமாக 2025ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 01ஆம் திகதி முதல் தனிப்பட்ட பயன்பாட்டு வாகனங்களையும் இந்த நாட்டு மக்களுக்காக இறக்குமதி செய்வதற்கான ஏற்பாடுகளைச் செய்திருந்தது.

இறக்குமதி மற்றும் ஏற்றுமதி தொடர்பான இந்த விவாதத்தினை எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் வேறு விவாதமாகக் கொண்டுசென்று, இந்த நாட்டில் உப்புத் தட்டுப்பாடு காணப்படுகின்றது என்ற விடயத்தை முக்கியமாகப் பேசினார்கள். இந்த நாட்டில் ஹம்பாந்தோட்டை, ஆனையிறவு, புத்தளம் போன்ற பகுதிகளில் உப்பு அதிகமாக உற்பத்தி செய்யப்படுகின்றது. தற்போது புத்தளத்தில் அளவுக்கதிகமான உப்பு உற்பத்தி செய்யப்படுகின்றது. நான் புத்தளம் மாவட்டத்தைச் சேர்ந்தவன். புத்தளம் உப்பளத்தில் அதிகமான உப்பு உற்பத்தி செய்யப்பட்டு, மலைக் குன்றுகளைப் போன்று அங்கு குவிக்கப்பட்டிருப்பதை சிறு வயதிலிருந்தே நான் பார்த்திருக்கின்றேன். பாலாறிலும், புத்தளம் நகரப் பகுதியிலும், விருதோடை போன்ற கிராமப் பகுதியிலும் அதிகமான உப்பு உற்பத்தி செய்யப்படுகின்றது. எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் கதைப்பது போன்று, உப்பு இயந்திரங்களால் உற்பத்தி செய்யப்படுவது அல்ல, அது இயற்கையினால் உற்பத்தி செய்யப்படுவதாகும். கடல் நீர், காற்று மற்றும் வெப்பத்தினால் உற்பத்தி செய்யப்படுவதே உப்பாகும். இவ்வாறு உப்பு உற்பத்தி செய்யப்பட்டு அறுவடை செய்யக்கூடிய தருணத்தில் மழை பெய்யுமானால் உப்பு உற்பத்தி குறைவாகவே காணப்படும். எனது நண்பர்கள் பலரும்கூட உப்பு உற்பத்தியைச் செய்வதில் முன்னிலையில் காணப்படுகின்றார்கள். அவர்களும்கூட மழைக் காலங்களில் உப்பை எடுத்துக்கொள்ள முடியாதுபோகின்ற கவலைக்குரிய நிலைமைகளைச் சொல்லியுள்ளார்கள்.

அதனடிப்படையில், சென்ற கிழமை எமது கௌரவ அமைச்சர் அவர்கள் புத்தளத்திலுள்ள உப்பளத்திற்கு வந்து, உப்பை எந்தளவுக்கு அதிகமாக உற்பத்தி செய்யமுடியும் எனவும், அதற்கு எவ்வாறான குறைபாடுகள் இருக்கின்றன என்பதையும் அவதானித்து, அதனைச் சரியான முறையில் செயற்படுத்துவதற்கு மேலும் தங்களால் இயன்ற ஆளணிகளை வழங்கி, உப்பை உற்பத்தி செய்வதற்கான உதவிகளைச் செய்வதாகக் கூறியிருந்தார். ஆனால், இங்கு எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் உப்பை இயந்திரத்தின்மூலம் உற்பத்தி செய்வதுபோலக் கதைக்கின்றார்கள். அவ்வாறு செய்ய முடியாது. நாட்டில் உப்புப் பற்றாக்குறை ஏற்பட்டதற்குக் காரணம் தேசிய மக்கள் சக்தியல்ல, காலநிலை மாற்றம்தான். காலநிலை மாற்றத்திற்கும் தேசிய மக்கள் சக்திக்கும் சம்பந்தமில்லை. இந்தக் காலநிலை மாற்றத்தின் காரணமாகத்தான் தற்போது எமது நாட்டில் உப்புத் தட்டுப்பாடு ஏற்பட்டிருக்கிறது. இருந்தாலும், எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் நாட்டு மக்கள் எதிர்கொள்ளும் உப்புத் தட்டுப்பாட்டை நிவர்த்திசெய்வதற்காக அதனை இறக்குமதி செய்யவிருக்கின்றது. தமிழ், சிங்களப் புத்தாண்டுக் காலப்பகுதியில்கூட தட்டுப்பாடு இல்லாமல் மக்கள் பெற்றுக் கொள்ளக்கூடிய வகையில் சிறந்த உப்பை இறக்குமதி செய்து கொடுத்திருக்கின்றோம்.

இங்குள்ள பெரும்பாலான எதிர்க்கட்சி உறுப்பினர்கள் அண்மையில் நடைபெற்ற உள்ளூராட்சி மன்றத் தேர்தல் சம்பந்தமான விடயங்கள் பற்றி அதிகம் கதைக்கிறார்கள். கடந்த பாராளுமன்றத் தேர்தலில் 35 வருடங்களுக்கு பின்னர், ஆளும் கட்சி சார்பாகப் புத்தளத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர் ஒருவரை எமது கட்சி பெற்றுக்கொண்டது. அதன் தொடர்ச்சியாக இந்த உள்ளூராட்சிச் சபைத் தேர்தலில் புத்தளம் மாநகர சபையாக இருக்கலாம், புத்தளம் பிரதேச சபையாக இருக்கலாம், வனாத்தவில் பிரதேச சபையாக இருக்கலாம், அவை அனைத்திலும் எமது கட்சி வெற்றி பெற்றதோடு, கற்பிட்டிப் பிரதேச சபையிலும் ஏனைய கட்சிகளுக்குச் சமமான பிரதிநிதித்துவத்தைப் பெற்றிருக்கின்றது.

இந்த உள்ளூராட்சி மன்றத் தேர்தலிலே எதிர்க்கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் பண அரசியலைக் கொண்டுவந்து தமது கட்சிகளுக்கு வாக்குகளைப் பெற்றுக்கொள்ள முற்பட்டார்கள். அவர்கள் மக்களுக்கு பெருந்தொகைப் பணத்தைக் கொடுத்தது மட்டுமல்லாமல், நீர் இறைக்கும் இயந்திரம் மற்றும் சில சாமான் parcelஐக் கொடுத்தும் வாக்குகளைப் பெற்றார்கள். தேசிய மக்கள் சக்தி ஒரு ரூபாய் கூட செலவழிக்காமல், அதாவது posterகூட அடிக்காமல் இத்தகைய வெற்றியைப் பெற்றுள்ளது. புத்தளம் தொகுதி மக்கள் தேசிய மக்கள் சக்தியுடன்தான் இருக்கிறார்கள். குறிப்பாக புத்தளம் வாழ் முஸ்லிம்கள் தேசிய மக்கள் சக்தி பக்கம்தான் இருக்கிறார்கள். ஆனால், எதிர்க்கட்சி உறுப்பினர்கள் தமது கட்சிக்காகக் கள்ள votesஐப் போடச் செய்தார்கள். பாடசாலைக்குச் செல்கின்ற சிறுவர்களை அனுப்பிக்கூட கள்ள votesஐப் போட வைத்தார்கள். அவ்வாறு கள்ள votes போட்டுப் பிடிபட்ட 3 மாணவர்கள் 7 நாட்கள் சிறைத் தண்டனை அனுபவித்து இப்போது வெளியே வந்திருக்கிறார்கள். இவ்வாறான செயற்பாட்டைக்கூட எதிர்க்கட்சியினர் செய்தார்கள். இந்தளவுக்கு அவர்கள் வாக்குகளைப் பெறுவதற்கு பணம், பொருள், இன்னோரன்ன உதவிகளை மக்களுக்குக் கொடுத்து கள்ள votesஐ போட வைத்ததுதான் காரணம். அதற்கான ஆதாரமும் பொலிஸில் இருக்கின்றது.

1990களில் இடம்பெயர்ந்து புத்தளம் மாவட்டத்திற்கு வந்த எமது முஸ்லிம்களை இரு கைகளாலும் அரவணைத்து, அவர்களை வாழ வைத்தவர்கள் புத்தளத்தைச் சேர்ந்த மக்கள். அதேநேரம், அங்கு பண அரசியலை அறிமுகம் செய்த எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் அந்த மக்களுக்கு அரசியல் பழிவாங்கலைச் செய்வதற்காக "இன்று ஆளுங்கட்சியினர் கற்பிட்டிப் பிரதேச சபையில் ஆட்சி

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

அதிகாரத்தைப் பெற்றுக்கொள்வதற்காக ஒரு பிரதிநிதிக்காக 25 இலட்சம் ரூபாய் வரையும் கொடுப்பதற்கு முன்வருகிறார்கள்" என்று கூறுகிறார்கள். அவர்கள்தான் இந்தப் பண அரசியலைப் பழக்கினார்கள். ரூபாய் 25 இலட்சம் அல்ல, 50 இலட்ச ரூபாய் என்றாலும் கொடுத்து இந்தப் பிரதேச சபை உறுப்பினர்களைப் பெற்றுச் சபை அமைப்பதற்கான எல்லா நடவடிக்கைகளிலும் இன்றும் அவர்கள் ஈடுபட்டுக் கொண்டிருக்கிறார்கள். அவர்கள் இன்று இங்கு வந்து தேசிய மக்கள் சக்தி பணம் கொடுத்துச் சபையை அமைப்பதற்கு முயற்சிப்பதாகச் சொல்லிக் கொண்டிருக்கிறார்கள். இவ்வாறான கேவலமான வேலையைத் தேசிய மக்கள் சக்தி ஒருபோதும் செய்யாது. எமது கட்சி இவ்வாறு எந்தவிதக் கொடுப்பனவும் செய்யாமல் மக்களின் வாக்குகளைப் பெற்று புத்தளத்தில் அனைத்துச் சபைகளிலும் வெற்றி பெற்றிருக்கின்றது.

அடுத்து, இடம்பெயர்ந்துவந்த மக்கள் மீண்டும் ஊருக்குச் சென்று வருவதற்கான புத்தளம் - மன்னாருக்கான பாதையைத் திறப்பது தொடர்பில் இங்கு பேசிய இடம்பெயர்ந்து வந்தவர்களில் ஒருவரான கௌரவ பாராளுமன்ற உறுப்பினர் 2001 இலிருந்து இன்றுவரை 24 வருடங்களாகப் பாராளுமன்றத்தில் இருக்கின்றார். அவர் கடந்த பலமான அரசாங்கங்களில் மூன்றுமுறை Cabinet அமைச்சராகவும் இருந்திருக்கின்றார். அக்காலங்களில்கூட புத்தளத்திலிருந்து மன்னாருக்குச் செல்வதற்கான அந்தப் பாதையைத் திறப்பதற்கு எந்தவிதமான முயற்சியையும் அவர் எடுக்கவில்லை; எடுத்திருந்தால் அதனைச் செய்திருக்கலாம். அவ்வாறு செய்யாமல், இன்று அந்தப் பாதையை நாங்கள் மூடிவிட்டோம் என்று இங்கே எமது தேசிய மக்கள் சக்தியைக் குற்றம் சாட்டிக் கொண்டிருக்கிறார். எமது ஜனாதிபதியும் தேசிய மக்கள் சக்தியும் அப்பாதையைத் திறப்பதற்கு எடுக்கின்ற முயற்சிகளின்போது, சட்டத்தின்முன் குற்றஞ்சாட்டப்பட்டவர்களாக நிற்கின்றவர்கள் இன்று சட்டத் தீர்ப்புகளைப் பற்றிக் கதைக்கிறார்கள். இன்ஷா அல்லாஹ்! நாங்கள் இந்த மக்கள் இலகுவான முறையில் புத்தளத்திலிருந்து மன்னார் போவதற்கான பாதையைத் திறப்பதற்கு எல்லா வகையிலும் ஆராய்ந்து பார்த்து, இந்தப் பிரச்சினையைச் சரியான முறையில் தீர்த்துவைப்போம். எமது ஜனாதிபதி அவர்கள் மன்னார் சென்றபோதும் அந்தப் பாதையைத் திறப்பதாகத்தான் சொல்லியிருந்தார். ஜனாதிபதியும் கௌரவ அமைச்சர்களும் தேசிய மக்கள் சக்தி அரசாங்கமும் கட்டாயம் அதனைத் திறந்துவைப்பதற்கான நடவடிக்கையை இந்த வருடத்திற்குள் எடுப்பார்கள் என்பதை நான் இங்கே உறுதியாகக் கூறிக்கொள்கின்றேன்.

மேலும், எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் இன்றிலிருந்து இந்த உப்புத் தட்டுப்பாடு சம்பந்தமாகக் கதைப்பதை நிறுத்த வேண்டும். ஏனென்றால், அந்தளவுக்கு அவர்களுக்கு இங்கே தெளிவான விளக்கம் கொடுக்கப்பட்டுள்ளது. இன்றும் நேற்றும் நேற்றுமுன்தினமும் இங்கு அதையே அவர்கள் பேசிக்கொண்டிருக்கிறார்கள். உப்பு உற்பத்தி குறைவதற்கான காரணம் எமது அரசாங்கம் அல்ல, காலநிலை! உப்புப் பிரச்சினையைத் தீர்ப்பதற்கான எல்லா விடயங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் எமது பிரதேசத்திற்கு வந்தவேளை கூறியிருக்கின்றார்.

அதுபோல், இந்த நாட்டிலிருக்கின்ற முஸ்லிம்கள் எங்கள் தேசிய மக்கள் சக்தியை நம்பி நாடு பூராவும் பிரதேச சபைத் தேர்தலில் எமக்கு வாக்களித்திருக்கிறார்கள். புத்தளம் மக்களும் அதேபோன்றுதான் செயற்பட்டார்கள். தேசிய மக்கள் சக்தி இதுவரைக்கும் ஒருவருக்குக்கூட ஒரு ரூபாய் பணம் கொடுத்து வாக்குகளைப் பெற்றதில்லை; ஒரு parcel கொடுத்து வாக்குகளைப் பெற்றதில்லை; அவர்களைப்போல் தண்ணீர் இறைக்கும் இயந்திரங்களைக் கொடுத்து வாக்குகளைப் பெற்றதில்லை. இவ்வாறான கேவலமான வேலைகளைச் செய்துவிட்டு, உறுப்பினர்களையும் அதிகமான பணம் கொடுத்து வாங்குவதற்கான முழுமுயற்சியும் செய்திருக்கின்ற அதேசமயத்தில், தேசிய மக்கள் சக்தியானது பிரதேச சபை உறுப்பினர்களைப் பெற்றுக்கொள்வதற்கு 25 இலட்சம் ரூபாய் பணம் கொடுப்பதாக எங்கள்மீது குற்றம் சொல்கின்றார்கள். இதற்கு ஆதாரம் இருக்கின்றதா என்று பார்த்தால், இல்லை! ஆகவே, எமது நாட்டிலே இந்த மாதிரியான பண அரசியலை இல்லாமல் செய்ய வேண்டும். வாக்களிக்கின்ற மக்களுக்கு அவர்கள் விரும்புகின்றவர்களுக்கு வாக்களிக்கின்ற சந்தர்ப்பத்தை அளிக்க வேண்டும். புத்தளத்தில் இதற்கு முன்னர் தேசிய மக்கள் சக்திக்கு ஓர் உறுப்பினர்கூட இல்லாத சந்தர்ப்பத்தில், இன்று புத்தளம் தொகுதி பூராவும் பிரதேச சபைகளுக்கு அதிகமான உறுப்பினர்களை அம்மக்கள் பெற்றுக்கொடுத்துள்ளார்கள். புத்தளத்தில் வாழுகின்ற முஸ்லிம் மக்கள் எமது ஜனாதிபதியையும் தேசிய மக்கள் சக்தியையும் நம்பி இந்த அரசாங்கத்திற்கு வாக்களித்திருக்கிறார்கள்.

அதேபோல், புத்தளத்திலும் முழு நாட்டிலும் இருக்கின்ற இந்தப் பண அரசியலை இல்லாதொழிப்பதற்கான வேலைகளை, இன்ஷா அல்லாஹ்! எதிர்வரும் காலங்களில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் நிச்சயமாகச் செய்யும். இந்த நாட்டில் இனவாதத்தை ஒழித்துச் சகல மக்களும் எந்தப் பிரச்சினையும் இல்லாமல், ஜாதி பேதம் இல்லாமல் வாழக்கூடிய வகையில் இன்று சிறந்த முறையில் ஆட்சி செய்கின்ற இந்த தேசிய மக்கள் சக்தி அரசாங்கம், நாட்டுக்குச் சிறந்த சேவையையும் நாட்டைக் கட்டியெழுப்புவதற்கான அபிவிருத்தியையும் நிச்சயமாகச் செய்யும். அத்துடன் வாகனங்களை இறக்குமதி செய்வதற்கான அனுமதி வழங்கப்பட்டிருப்பதோடு, எமது நாட்டில் அதிகமான பொருளாதார வளர்ச்சியும் ஏற்படும் என்பதையும் கூறி, எனக்கு வாய்ப்பளித்ததற்கு நன்றிகூறி, விடைபெறுகின்றேன். *வஸ்ஸலாம்!*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Harshana Rajakaruna. You have 10 minutes.

[අ.භා. 2.15]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී කථා වුණා, අපේ රණ විරුවන් පිළිබඳව. ඉතාම කනගාටුයි කියන්න, ඒ රණ විරු උපහාර උළෙලට ජනාධිපතිවරයා සහභාගි නොවෙන නිසාම තමයි එතුමාගේ ප්‍රධානත්වයෙන් නොව නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ඒ ආරාධනා පත්‍ර ගැහුවේ. ඒ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍යවල ඒ ඇති වෙච්ච විරෝධය නිසා එතුමා තීන්දු කළා, ඒ අවස්ථාවට සම්බන්ධ වෙන්නට. ඒකයි ඇත්ත, මේ අය මේ මොන කථා, මොනවා පටලවන්න හැදුවත්, මොනවා කියන්න ගියත්. අද මුළු රටම දන්නවා, උතුරේ ජනතාව දේශපාලන වාසියකට එකතු කර

ගන්න තමයි ඒ සිදුවීම සිදු වුණේ කියලා. ඒ විතරක් නොවෙයි, පසුගිය ජනාධිපතිවරණයේදී, පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ප්‍රභාකරන්ගේ ස්මාරකයක් හදනවා කියලාත් පොරොන්දු වෙලා තිබෙනවා. අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා කියනවා, චන්ද්‍රසේකර් අමාත්‍යවරයා ඉතා පැහැදිලිව එය ප්‍රසිද්ධියේ සිදු කළාලු. එතකොට මෙතැනදීත් එල්ටීටීඊ ඩයස්පෝරාව සතුටු කරන්න, එහෙම නැත්නම් උතුරේ අහිංසක ජනතාව රවට්ටන්න කරපු දෙයක් තමයි මේ කියන එක ඉතා පැහැදිලියි. ඒක දැන් ඔප්පු වෙලා තිබෙනවා.

"රණ විරුවෝ" කියන වචනය කියා ගන්න තටමන එක මොන විහිළුවක්ද? ඇයි, "රණ විරුවෝ" කියන වචනය කියන්න තටමන්නේ? එහෙම තටමන්න අවශ්‍ය නැහැ. තමුන්නාන්සේලාට පුළුවන් නම්, "ඉල්මහ විරුවෝ" කියලා ඉතා ගෞරවනීය ලෙස සහ ආඩම්බරයෙන් කියන්න - "ඉල්මහ විරුවෝ" කියලා කියනවා නම් - මේකෙදි එහෙම තටමන්න අවශ්‍ය නැහැ. යම් කාරණාවක් නිසා ඒ දිවි පිදීම පිළිබඳව ඒ ගෞරවය ලබා දෙන්න ඕනෑ. මේක ඊට එහා ගිය දෙයක් නේ. දේශපාලන මතයකට නොවෙයි, රට වෙනුවෙන් යම් පුද්ගලයෙක් ජීවිතය පූජා කළා නම්, මම හිතනවා ඒ ගෞරවය අපි ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මගේ පවුලෙත් තුන්දෙනෙකුට ජීවිතය අහිමි වුණා යුද්ධය නිසා. ඉතින් ඉතා පැහැදිලිවම ඒ ගෞරවය ලබා දෙන්න කටයුතු නොකිරීම පිළිබඳව ඉතාම ලජ්ජාවක්, ඉතාම කනගාටුවක් තිබෙන බව ප්‍රථමයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම අද අපි අපේ ආනයන හා අපනයන ප්‍රතිපත්තිය පිළිබඳව කථා කරනවා. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට මා දන්නවා, Katunayake Industrial Zone එකේ "NEXT" කියන ඇඟලුම් කර්මාන්තශාලාව වහලා තිබෙනවා කියන කාරණය. සමහර ඇමතිවරු මේ ගැන කියන්න පුළුවන්, "ඔව්, එහෙම තමයි. සමහර කර්මාන්තශාලා අරිනවා, සමහර කර්මාන්තශාලා වැහෙනවා" කියලා. ඔව්. හැබැයි මේ කියන ආයතනය සේවකයින් 1,000කට වැඩි පිරිසක් සේවය කරපු ආයතනයක්. ඒ වාගේම මේක අද ආරම්භය වෙන්න පුළුවන්.

තමුන්නාන්සේලා උද්ධච්චකමට හැමදාම කරන්නේ මේ ගැන හාස්‍යයට ලක් කරලා, ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ලොකුකම පෙන්වන එක. මේ පාර්ලිමේන්තුවේදී කථා කරලා ඒ ලොකුකම පෙන්වලා, උද්ධච්චකම පෙන්වනවා. ඒකට පමණක් සීමා වෙනවා. හැබැයි, ඒ ප්‍රශ්නය පිළිබඳව අවබෝධ කර ගන්නේ නැතුව, ඒ ප්‍රශ්නය පිළිබඳව යම් ගැඹුරු පරීක්ෂණයක් සිදු කරන්නේ නැතුව ඒ කාරණය අමතක කරනවා. ඒ වාගේම තමයි තමුන්නාන්සේලා කිව්ව කථා. තමුන්නාන්සේලා කිව්වා, මේ රටට කවදාවත් සහල් ආනයනය කරන්නේ නැහැ කියලා. සහල් ආනයනය කිරීම NPP එහෙම නැත්නම් JVP රජයකින් කවදාවත් සිදු කරන්නේ නැහැ කිව්වා; ආණ්ඩුව ඇවිල්ලා සහල් මාෆියාව දණ ගස්සනවා කිව්වා. නමුත් මේ ආණ්ඩුව ඇවිල්ලා ඉස්සෙල්ලාම කළේ සහල් ආනයනය කරන්න අවසර ලබා දුන්න එකයි.

ඒ විතරක් නොවෙයි, අද වෙලා තිබෙන දේ මොකක්ද? අද ලුණු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ලුණුත් ආනයනය කරන්නේ නැහැ කිව්වා.

අපේ සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යවරයා පෙබරවාරි මාසයේ කර්මාන්තශාලාවට ගිහිල්ලා ඉතාම ආඩම්බරයෙන් කියනවා මම දැක්කා, "කවදාවත් ආපහු ලංකාවට ලුණු ආනයනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ, ලුණුවලින් ස්වයං පෝෂිතයි" කියලා. ඉතින් අපිත් සතුටු වුණා, ඒක ලොකු දෙයක් නේද කියලා. ඒ කර්මාන්තශාලා ව්‍යාපෘතිය එතුමා කරපු එකක් නොවෙයි. ඒක පසුගිය ආණ්ඩුවෙන් ආරම්භ කරපු එකක්. එතුමන්ලා ආරම්භ කළා කිව්වා වුණත් කමක් නැහැ, එතුමන්ලා ඒ නිෂ්පාදන ක්‍රියාවලිය අවසන් තැනට ගෙනැල්ලා ඒ වෙනුවෙන් කටයුතු කළා නම්. නමුත් අද මේ රටේ ජනතාවට ලුණුත් නැහැ. ඒකයි අද වෙලා තිබෙන්නේ. අද මේ රටේ ජනතාවට ලුණුත් නැහැ. කැඳත් නැහැ වාගේ දැන් ලුණු එක්ක කැඳත් නැහැ. මාස දෙකක් යන කොට අද ලුණු ආනයනය කිරීම ආරම්භ වෙලා තිබෙනවා. එහෙම නම්, එදා ඔබතුමන්ලා කියපු දේවල් ද මේ කරන්නේ? පොල් පිළිබඳව මොකක්ද කිව්වේ? පොල් අපනයනය කරනවා කියලායි කිව්වේ. නමුත් දැන් පොල් ආනයනය කරන්න කටයුතු කරලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ ජනතාව කොහොම රැවටිල්ලක් ද රැවැට්ටුවේ. කොයි තරම් නම් පව කියලා ද ජනතාව රවටා තිබෙන්නේ. ඒ කිව්ව දේවල් අද එකින් එක බොරු බවට පත් වෙමින් තිබෙනවා.

අපේ රටේ ඇඟලුම් අපනයනයෙන් සියයට 70ක්ම ඇමෙරිකාවට යන්නේ. ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ පාලනයත් එක්ක ඇමෙරිකාවේ දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන ඔබතුමන්ලා දන්නවා. ඔවුන් බදු අනුපාත වෙනස් කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳ ආණ්ඩුවේ අවධානය යොමු කරවූයේ මීට මාස ගණනකට කලින්. හැබැයි, ඒ වෙලාවේත් ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? Garment factory එක වැහීම පිළිබඳව අද අප කථා කළාම කිව්වා වාගේම, උද්ධච්ච කථාවක් තමයි ඒ කාරණයටත් මාස ගණනකට කලින් කිව්වේ. අපි කියපු දේට අවධානය යොමු නොකර එසේ උද්ධච්ච කථා කිව්වාට, ඇමෙරිකාවෙන් පනවා තිබෙන tariffs පිළිබඳව සාකච්ඡාවකට තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ නියෝජිත මහත්වරු පිරිසක් ගියා. හැබැයි, ඒකටත් නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ගියේ. ඒ පිළිබඳවත් ඇමෙරිකාවට කනස්සල්ලක් තිබෙනවා. නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට වඩා උසස් පුද්ගලයෙක් ඒ සාකච්ඡාවට ගියා නම් වැදගත් වනවා කියලායි මා හිතන්නේ. හැබැයි, ඒ අය ඒ සාකච්ඡාවට ගිහිල්ලා ආවාට පසුව ජනාධිපතිවරයා මොකක්ද කිව්වේ? ජනාධිපතිවරයා ඉතා පැහැදිලිව රටට කිව්වා, "ඉතා සාර්ථක සාකච්ඡාවක් කළා. ඒ සාර්ථක සාකච්ඡාව පිළිබඳව රටවල් දෙක එකතු වෙලා ඒකාබද්ධ ප්‍රකාශයක් කරනවා" කියලා. එහෙම කිව්වේ නැද්ද? කිව්වා. රටේ ජනාධිපතිවරයායි එහෙම කිව්වේ. ඒකාබද්ධ ප්‍රකාශයක් කරනවා කිව්වාම අපිත් සතුටු වුණා, රටක් හැටියට අපි හොඳ තැනකට ගිහිල්ලා තිබෙනවා කියලා. හැබැයි, ඒ ඒකාබද්ධ ප්‍රකාශය නම් තවම ඇවිල්ලා නැහැ. ඒ ඒකාබද්ධ ප්‍රකාශය කෙසේ වෙතත්, සතියකට විතර පස්සේ - ඇමෙරිකාවේත්, ලංකාවේත් ඒකාබද්ධ ප්‍රකාශයක් නැති නිසා - ලංකාව ප්‍රකාශයක් නිකුත් කළා. ලංකාව ප්‍රකාශයක් නිකුත් කරලා කිව්වා, "මෙහෙම සාකච්ඡාවකට ගියා. සාකච්ඡාව සාර්ථක වුණා. නමුත් අවසාන තීන්දුවක් නැහැ" කියලා. තමුන්නාන්සේලා කල්පනා කරන්න, අවසාන තීන්දුවක් නැතුව මේ රටේ විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තශාලා අනාගතය පිළිබඳව සැලසුම් කරන්නේ කොහොමද කියලා? ඇඟලුම් කර්මාන්තශාලා orders ගන්නේ ඊළඟ අවුරුදු ගණනාවකට. දැන් ඒවා අවිනිශ්චිත තත්ත්වයක තිබෙන්නේ. ඇඟලුම් කර්මාන්තශාලා හිමියන් එක්ක සාකච්ඡා කරන කොට පෙනෙනවා, ඒ අය කොච්චර අර්බුදයකට ද පත් වෙලා ඉන්නේ කියලා. වෙනත් රටවල් ඇමෙරිකාවත් එක්ක සාකච්ඡා කරලා මේ වන කොට අවසාන තීන්දු තීරණ අරගෙන ඇවිත් තිබෙනවා. නමුත්, අපේ රටට තවම හැකියාවක් ලැබිලා නැහැ, ඇමෙරිකාවත් එක්ක ඒ සාකච්ඡාවල අවසාන තීන්දුවකට එන්න. මම විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තශාලා ගැන කියන්නේ, අපේ ඇඟලුම් කර්මාන්තශාලා නිපැයුම් සියයට 70ක් විතර ඇමෙරිකාවට යවන නිසා.

ඊට අමතරව, අනෙක් දේවල් පිළිබඳවත් සැලසුම් කරන්නේ කොහොමද? ඒවා පිළිබඳව සැලසුම් කරන්න විධියක් නැහැ. එහෙම නම්, අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා,

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

කරුණාකර ඒ සඳහා මැදිහත් වෙන්න කියලා. කර්මාන්තශාලා වැහෙන කොට ඇමෙරිකාවත් එක්ක සාර්ථකව සාකච්ඡා සිදු කර තිබෙනවා කියලා බොරු - පව - කියන්නේ නැතිව ඇත්ත කියන්න. ඒ වාගේ විහිළු කථා නම් කියනවා. හැබැයි, ඇත්තටම වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක තවම වගකීමකින් කියා ගන්න විධියක් නැහැ, මේ රජයට. ඒ නිසා ඉතාම කනගාටුයි කියන්න, තමුන්නාන්සේලා මේ රට පාලනය කරන්න භාර ගෙන, මේ මාස හතඅට තුළ රට එක තැන ලොක් වෙලා, ආපසු හැරිලා තිබෙන බව. එම නිසා ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, මේ රටේ බහුතර ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න. ඒ වෙනුවෙන් තමුන්නාන්සේලා මේ යාවක මානසිකත්වයෙන් අයින් වෙලා, මේ රට ඉදිරියට ගෙන යන සැලසුමක් කරුණාකර ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Dinindu Saman Hennayake. You have 12 minutes.

Order, please! Will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 2.26]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විශේෂ මාතෘකා දෙකක් විවාදයට ගන්නවා. එකක්, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි. අනෙක, 2023 අංක 34 දරන විසර්ජන පනත යටතේ 8 වැනි වගන්තියට අදාළ සංශෝධන. ඒවා සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ අපට දිගටම පෙනුණා, විපක්ෂයේ හැසිරීම කොහොමද කියන එක. මේ යෝජනා දෙකේ තිබෙන වැදගත්කම, මේ යෝජනා දෙක අපේ රටට වැදගත් වෙන්නේ කොහොමද, ඒවා ඉදිරි ආර්ථිකයට බලපාන්නේ කොහොමද, ඒක ජනතාවට බලපාන්නේ කොහොමද කියන කාරණා ගැන හොඳ සංවාදයක් කරන්න තිබෙන අවස්ථාවක, විපක්ෂය එක දිගටම හාල්වල, පොල්වල, ලුණුවල, වෙන වෙන යාවක මානසිකත්වවල එල්ලිලා ඉන්නවා අපි දැක්කා. අපට මේ පනත් යටතේ ගෙනෙන රෙගුලාසි ගැන කථා කරනවාට අමතරව, විපක්ෂයේ ඒ කථාවලට උත්තර දෙන්නත් සිදු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේදී රණ විරුවන් ගැන කථා කළා. අපි එතුමන්ලාට කියන්න කැමැතියි, එතුමන්ලාගේම ඉතිහාසයට ගිහින් බලන්න කියලා. රණ විරුවන්ට අද මේ තත්ත්වය අත් කර දුන්නු, ඒ තිස් අවුරුදු යුද්ධය අත් කර දුන්නු ඒ ඉතිහාසයට යන්න. ඔබතුමන්ලාගේ නායකයෝ, ඔබතුමන්ලාගේ තාත්තාලා ඒ යුද්ධය පටන් ගැනීමට අදාළ දේශපාලන වාතාවරණය ඇති කරපු නිසා තමයි ඒ යුද්ධය ආරම්භ කරන්න වුණේ. එහෙම දේශපාලන වාතාවරණයක් ඇති කරපු මිනිස්සු එදා රණ විරුවන් යුද්ධ කරන කොට කියපු ඒවා අපට මතකයි. අලිමංකඩට පාමංකඩ කිව්වා. "ඕනෑම කෙනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කිව්වා; "මේක මහා කැලෑවක්" කියලා තොප්පිගලට කිව්වා. "මේ ගොල්ලෝ කොහොමද යුද්ධ කරන්නේ" කියලා ඇහුවා. එසේ රණ විරුවන් අන්තිමටම බාල්දු කරපු, එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන කර ගත්තු ඒ team එක අද කැලි කැලිවලට බෙදිලා ගිහින් කියනවා, අපි රණ විරුවාට ගෞරවය ලබා දෙන්නේ නැහැ කියලා. අපි එතුමන්ලාට මතක් කරලා දෙන්න ඕනෑ, මේ රටේ රණ විරුවාට නිසි ගෞරවය දීලා තිබෙන්නේ අප බව.

අපේ ආණ්ඩුව යටතේ රණ විරුවාගේ විශ්‍රාම වැටුප වැඩි වීම ගැන රණ විරුවාගෙන් අහන්න. රණ විරුවන්ට අදාළ වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් රණ විරුවාගෙන් අහන්න. ඒ වාගේම, ආබාධිත තත්ත්වයට පත් වෙලා ඉන්න රණ විරුවන්ට අද දීලා තිබෙන සුබසාධන පහසුකම් සම්බන්ධයෙන් රණ විරුවන්ගෙන් අහන්න. රණ විරුවන්ට දෙන්න තිබෙන හොඳම ගෞරවය එය මිස වචන කිය කියා දහලන එක නොවෙයි. ඒ නිසා ඔය එක්සත් ජාතික පක්ෂයේ, සමගි ජන බලවේගයේ මහත්වරුන්ට අපි කියනවා, ඒ යුද්ධය ඇති කළේ ඔබතුමන්ලා බව; ඒ යුද්ධයට වග කියන්න ඕනෑ ඔබතුමන්ලා බව; ඒ යුද්ධය ඇති කරලා රණ විරුවන් ඔය කියන පහත් තත්ත්වයට දැම්මේ ඔබතුමන්ලා බව. එම නිසා ඒ රණ විරුවන් ගැන දැන් කිඹුල් කඳුළු හෙළන්න එන්න එපා. ඔබතුමන්ලා එහෙම කිඹුල් කඳුළු හෙළන එක වැරැදියි. ඒ නිසා ඒ වැරැද්ද නිවැරැදි කරන්න ඕනෑ. ඒ නිවැරැදි කිරීම කරන වගකීම අපට තිබෙනවා.

මාධ්‍ය අයිතිකාරයෙක් මෙතැනට ඇවිල්ලා පක්ෂ නායකයෙකු විධියට කථා කරනවා අපි දැක්කා. යාවක මානසිකත්වයෙන් මිදෙන්න ඕනෑ කියලා එතුමා කිව්වා. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා තුන්වරක් රට ගියා, තුන්වරක් රට ගිහිල්ලා එන්න රුපියල් මිලියන 1.8ක් වියදම් වෙලා තිබෙනවා, එච්චර අඩු ගණනකින් යන්නේ යාවක මානසිකත්වය නිසාය කිව්වා. අපි ඔය මහත්වරුන්ට කියනවා, ඔය මහත්වරුන්ට පොඩ්ඩක් වැරැදිලා තිබෙන බව. ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා. මේ රටේ ආර්ථිකය කාබාසිනියා කිරීමට අදාළව එක එක තැන්වලට උඩ ගෙඩි දෙන්න ඔබතුමන්ලා මහන්සි වුණා. ඔබතුමන්ලාගේ පක්ෂයේ ව්‍යුහය දිහා බලන්න. යාවක මානසිකත්වය තිබෙන්නේ කොතැනද කියලා එතකොට තේරෙයි. එය, එන එන මිනිහා ගන්න පක්ෂයක්. ඒ මිනිහාගේ අතීතය මොකක්ද, ඒ ගොල්ලන්ගේ දේශපාලනය මොකක්ද, ඒ ගොල්ලන්ගේ වගකීම මොකක්ද කියලා දන්නේ නැතුව ඒ අය බඳවාගෙන, බොරුවට ව්‍යවසායක රාජ්‍ය හදන්න දහලන මිනිස්සු. උඩ ඉඳන් පහළටම ඉන්නේ හොරු.

ඒවා ඇතුළේ තමයි ව්‍යවසායක රාජ්‍ය හදන්න යන්නේ. එතුමාට අපි මතක් කර දෙනවා, ලෙඩක් විකුණලා සල්ලි හොයා ගන්නවාට වඩා, අපට මේ යාවක මානසිකත්වය හොඳයි කියන

එක. COVID-19 ආවාට පස්සේ රුපියල් 400ට ගෙනාපු Rapid Antigen Test kitඑක රුපියල් 1,400ට විකුණපු මනුස්සයා අද කථා කරනවා, යාවක මානසිකත්වය ගැන. ඔව්, මහත්තයෝ. ඔහොම හම්බ කරනවට වඩා මේ යාවක මානසිකත්වය අපට හොඳයි. ඒ වාගේම ඔබතුමාගේ පක්ෂයේ දෙවැනියා පිළිබඳව බලන්න. රුපියල් කෝටි දෙකහමාරක් ඉල්ලුවා මේ රටේ ජනතාවට සේලයින් හදන්න ආපු කොම්පැනියෙන්. ඒ කොම්පැනියෙන් කෝටි දෙකහමාරක් ඉල්ලා තිබෙන නිසා අදටත් ඒක නතර වෙලා තිබෙනවා. ඒ, ඔබතුමාගේ පක්ෂයේ දෙවැනියා; පොළොන්නරුවේ සංවිධායකවරයා. අද අවුරුදු 16කට හිරේ. එහෙම මිනිස්සුන්ගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, ව්‍යවසායක රාජ්‍යයක් හැදීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවසායක රාජ්‍ය හදන්න ඒගොල්ලන්ට බැහැ. මේ රාජ්‍ය හදන්න පුළුවන් එක කණ්ඩායමකට විතරයි. 159දෙනෙකුගෙන් සමන්විත මේ ජාතික ජන බලවේගය කණ්ඩායමට විතරයි මේ රාජ්‍ය හදන්න පුළුවන්. මේ රාජ්‍ය හදන්න කැප කිරීම් කරන්න ඕනෑ. මේ රාජ්‍ය හදන්න මහන්සි වෙන්න ඕනෑ. මේ රාජ්‍ය හදන්න වැඩ කරන්න ඕනෑ. මේ රාජ්‍ය හදන්න පරිත්‍යාග කරන්න ඕනෑ. ඒ පරිත්‍යාග කරන්න පුළුවන්, කැප කිරීම් කරන්න පුළුවන්, වැඩ කරන්න පුළුවන්, රාජ්‍ය හදන්න පුළුවන් මන්ත්‍රීවරු 159දෙනායි ඉන්නේ. අනෙක් ඔක්කොගේම වැඩ කෙරුවාව අපට පේනවා. ඒ පරිත්‍යාගය යාවක මානසිකත්වය කියලා නම් ඔබ හිතන්නේ, ඒ කැප කිරීම යාවක මානසිකත්වය කියලා නම්, අපේ රට හදන්න තිබෙන උනන්දුවට ඔබ හිතන්නේ යාවක මානසිකත්වය කියලා නම්, ඔව්, ඒ යාවක මානසිකත්වයට අපි කැමැතියි. ඒ යාවක මානසිකත්වය තුළ අපි මේ රට ගොඩ නඟනවා. ඒ තුළින් අපි මේ රට හරි පාරට ගෙනියනවා. රට ඒ තැනට ගෙනියන්න අපි සූදානම් කියන එක මතක් කර දෙන්න ඕනෑ.

අපි අද දැක්කා, මේ රටේ ආර්ථික ප්‍රගතිය හදන්න බැහැ කියලා ගෝණි බිල්ලන් මවන ආකාරය. අද දවසේම විපක්ෂයට තිබුණේ ලුණු ප්‍රශ්නයක්. එක් වරක් විපක්ෂය එක දිගට හාල් කෑවා. ඊට පස්සේ බිත්තර කෑවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? බිත්තර කාලා ඉවර වුණාට පස්සේ පොල් කන්න පටන් ගත්තා. දැන් ලුණු කන්න පටන් අරගෙන තිබෙනවා. දැන් විපක්ෂය ලුණු කන තැනට පත් වෙලා. අපි විපක්ෂයේ මහත්වරුන්ට කියනවා, ලුණු කන ගමන් බත් ටිකකුත් කන්න කියලා. මොකද නැත්නම් blood pressure එකට හොඳ නැහැ. දැන්, යන එන මං නැතුව නේ ඉන්නේ. බහුතරයක් වැලේ වැල් නැතුව ඉන්නේ. ඒ නිසා බත් ටිකකුත් කන්න, ලුණු කන ගන ගමන්. ඒකට අදාළ පහසුකම් නැත්නම් කියන්න, අපි ඒවා සම්පාදනය කරලා දෙන්නම්. ඒ තැනට විපක්ෂය වැටිලා. මෙතැනදී පැහැදිලි කිරීම් කළා, ඇයි ලුණු නිෂ්පාදනය අඩු වෙලා තිබෙන්නේ කියලා. මේ මහත්වරුන්ට අමතකයි, 2024 ලංකාවේ ලුණු නිෂ්පාදනය කිරීමට අදාළව හම්බන්තොට විතරක්,-

ඒගොල්ලන් අපේක්ෂා කළා, ලුණු මෙට්‍රික්ටොන් 125,000ක් හදන්න. හැබැයි, 2024දී ලුණු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 400යි. ඔය කෑ ගහන බබ්බු එක්කෙනෙක්වත් එදා ඒ ගැන කථා කළාද? කථා කළේ නැහැ. එහෙම කථා කරපු නැති අය අද අනවශ්‍ය ලුණු ප්‍රශ්නයක් හදලා තිබෙනවා. රටේ ලුණු නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා තමයි. ස්වාභාවික හේතු නිසා ලුණු නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා තමයි. හැබැයි, මේ ප්‍රශ්නයේ වගකීම ඔය මාධ්‍ය අයිතිකරුවන්ගේ ඉඳන් ඒ ඔක්කොම ගන්න ඕනෑ. රටේ ලුණු ප්‍රශ්නයක් නැති වෙලාවක, ලුණු ප්‍රශ්නයක් ඇති වෙනවා, ඇති වෙනවා කියලා මිනිස්සු තුළ අනවශ්‍ය බයක් හැදුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බය ඇතුළේ මිනිස්සු මොකද කළේ? වෙන දා ලුණු පැකට්ටුවක් ගන්න කෙනා ලුණු පැකට් 4,5 අරගෙනයි ගෙවල්වලට ගියේ. වෙන දා අපේ තිබෙන නිෂ්පාදනය ප්‍රමාණවත්, මේ රටට ලුණු නැවක් ඇවිල්ලා ඒ ලුණු ටික පැකට් කරලා දෙනකල්. ඒ යන කාලයට අදාළව ප්‍රමාණවත් ලුණු සංචිතයක් අපට තිබුණා. හැබැයි ඒක විනාශ කළේ කවුද? මේ විපක්ෂය විසින් විසින් අනියත බියක් හදලා හදලා රට ඇතුළේ ලුණු හිඟයක් හදන්න උත්සාහ කළා. ඒ වාගේම ඒගොල්ලනුත් එක්ක සම්බන්ධ වෙච්ච ව්‍යාපාරික නඩයක් ඉන්නවා. ඒගොල්ලන්ගේ කාර්යභාරය මොකක්ද? ඒගොල්ලන්ගේ කාර්යභාරය තමයි, අන්න අර කියන විපක්ෂයේ කූට වුවමනාවලට උදවු කරන එක. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේවා තේරුම් අරගෙන ඉන්නේ. අපේ දේශපාලන ව්‍යාපාරය කියන්නේ, එහෙම කඩා වට්ටන්න පුළුවන් ව්‍යාපාරයක් නොවෙයි. එය, මඩ ගහලා, අවලාද කියලා කඩා වට්ටන්න පුළුවන් ව්‍යාපාරයක් නොවෙයි. මහත්වරුනේ! හැරිලා බලන්න. ඔබතුමන්ලාගේ දේශපාලනය දිහා හැරිලා බලන්න. මෙතැන වාඩි වෙලා ඉන්න නායකයන්ගෙන් තමන් ජීවත් වන කොට්ඨාසය දිනපු නායකයන් කීයක්ද ඉන්නේ කියලා අපට කියන්න. එහෙම කොට්ඨාස දිනපු නායකයෙක් ඉන්නවා නම්, ඒ නායකයෝ ගැන අපි කථා කරමු. කොට්ඨාසය දිනාගන්නවත් බැරි මිනිස්සු අද ජනමතය ගැන කථා කරනවා. තමන් ඉන්න තැනට අදාළව ඡන්ද ප්‍රතිශතය වැඩි කරගන්න බැරි මිනිස්සු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙලා ඇවිල්ලා තමුන්ගේ කොටසේ ඡන්ද ගොඩ නඟා ගන්න බැරි මිනිස්සු අද ජනමතය ගැන කථා කරනවා. දැන් මේක විහිළුවක් වෙලායි තිබෙන්නේ. අද දවසේම අපි බලාගෙන හිටියා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ විවාදයට අදාළව එක වචනයක් හරි කථා කරනවාද කියලා. මේ විවාදයට අදාළව ඒගොල්ලන් කථා කරන්නේ නැහැ.

ඒ වෙනුවට මොකද කරන්නේ? හෝද හෝදා මඩේ දමනවා වාගේ එකම මඩ ටික ගහනවා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ. මේ ජනතාවගේ කාලය. මේ ජනතාවගේ අවශ්‍යතාව. අර ව්‍යවසායක මහත්තයා රටේ ව්‍යවසාය ගැන කථා කරනවා, කාලය ගැන කථා කරනවා. අපි එතුමාට කියනවා, ඔබතුමා මේ පාර්ලිමේන්තුව ඇතුළේ අදාළ මාතෘකාව ගැන කථා කරපු එක දවසක් කියන්න. අදාළ මාතෘකාව ගැන කථා කරලා නැහැ, එක දවසක්වත්; එක දවසක් කථා කරලා නැහැ. මේ පාර්ලිමේන්තුවේ කාලය එතුමාට ඕනෑ විධියට අනවශ්‍ය විධියට නාස්ති කරලා තිබෙන්නේ. එහෙම ව්‍යවසායක රාජ්‍ය හදන්න බැහැ මහත්තයෝ. ඔහොම ව්‍යවසායක රාජ්‍ය හදන්න බැහැ. ඒවා හීන විතරයි. ඒ නිසා ඔබතුමන්ලාගේ ඔය ළදරු මානසිකත්වය ඔබතුමන්ලා තියාගෙන ඉන්න කියලා අපි ඔබතුමන්ලාට කියනවා. අපි අපේ ගමන යනවා. අපේ ගමන යන්න අපි සූදානම්. ඒකට අදාළ වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ.

අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ, අන්න ඒ වැඩ පිළිවෙළට යන වැඩසටහන්. ඒ සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අපි සැලසුම් සකස් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පිට රටින් මේ රටට වාහන ගෙන්වීමේදී ඇති වෙච්ච ගැටලු ප්‍රමාණයක් තිබෙනවා, වාහනවල ලේඛන ඉදිරිපත් කරද්දී. වාහනවල ලේඛන ඉදිරිපත් කරද්දී ඒ අදාළ සමාගම් අදාළ විදේශීය බැංකුවලට ඒ ලේඛන courier කරලා, ඒවායේ සත්‍යභාවය තහවුරු කරලා තමයි මෙච්චර කාලයක් කටයුතු කළේ. ඒකට ලොකු කාලයක් යනවා. ඒ වාගේම ඒ ගනුදෙනුව ඇතුළේ වෙනත් කූට ව්‍යාපාර ක්‍රියාත්මක වෙලා තිබුණා. මම කෝපා එකේ සාමාජිකයෙක්. මම දන්නවා, වාහන ගෙන්වීම තුළ කොච්චර කූට ව්‍යාපාර ලංකාව තුළ ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියලා. වරායට එන්නේ ට්‍රැක්ටරය කියලා. රේගුවෙන් එළියට එන්නේ ට්‍රැක්ටරය කියලා. එතැනින් එළියට යනකොට ඒ ට්‍රැක්ටර, ඩිෆෙන්ඩර්, ප්‍රාඩෝ බවට පත්වෙලා එතැනින් එළියට යන්නේ. එහෙම තමයි මේ ගොල්ලන්ගේ දේශපාලනය. විපක්ෂයේ වාඩි වෙලා ඉඳලා ඒ කාර්යය කළේ එහෙම. ලංකාවේ මිනිසුන්ට අවුරුදු 5ක් වාහන ගෙනෙන්න

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

දුන්නේ නැහැ. අවුරුදු 5ක් වාහන ගෙනෙන්න දුන්නේ නැති වුණත්, ඒ වෙලාවේ මහ රජ්ජුරුවන්ගේ පුත්තු වාහන අරගෙන තිබෙනවා. එහෙම තමයි දේශපාලනය තිබුණේ. ලංකාවට අධිවේගී බයිසිකල් ගෙනෙන්න දෙන්නේ නැහැ. Engine capacity එක වැඩි මෝටර් සයිකල් ලංකාවට ගෙනෙන්න බැහැ. එහෙම වටපිටාවක් තිබියදී කැබිනට් අනුමැතියක් දුන්නා, ලංකාවේ තිබෙන අධිවේගී, engine capacity එක වැඩි මෝටර් සයිකල් ලියාපදිංචි කරන්න ඕනෑ කියලා. එහෙම මිනිස්සු හිටියේ. හොරකම තහවුරු කරන්න කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය දීලා, ඒ මෝටර් සයිකල් ලියාපදිංචි කරලා, ඒ කාල සීමාව පැන්නාට පස්සේ තමන්ගේ ව්‍යාපාරිකයන් හරහා තවත් ගෙන්වලා, ඒවාත් ලියාපදිංචි කරලා, අනීතිය නීතිය බවට පරිවර්තනය කරපු ආණ්ඩු තිබුණේ. ඒවා වෙනස් කරන්න තමයි මේ නීති ගෙනැල්ලා තිබෙන්නේ. මෙතැනදී අපි බලාපොරොත්තු වෙනවා, ඉතා කාර්යක්ෂමව ඒ වැඩසටහන් ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වෙයි කියලා. Online system එක හරහා අපට පුළුවන් වෙයි, ඒ අදාළ documents ටික හරිද කියලා බලන්න; ඒවා තහවුරු කර ගන්න; ඒකට අදාළ වැඩ පිළිවෙළ හදන්න. අපි විශ්වාස කරනවා, මේ පළමුවැනි යෝජනාවෙන්, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනැල්ලා තිබෙන රෙගුලාසි තුළින් ඒකට අදාළ කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීම තුළින් වාහන ආනයනය කරන අයට තිබෙන ගැටලු විශාල ප්‍රමාණයක් නිරාකරණය කරන්න පුළුවන් වෙයි කියලා සහ ඊට අදාළ විශ්වාසනීයත්වය ඇති කරන්න පුළුවන් වෙයි කියලා.

අපි ඩිජිටල් ආර්ථිකයක් ඉල්ලපු රටක්. ඩිජිටල් ආර්ථිකයක් ඉල්ලපු රටක අපි යනවා, online ක්‍රමය හරහා වැඩ කරන්න. ඒ වාගේම දැන් රාජ්‍ය සේවය තුළට online ක්‍රමය ගෙනැල්ලා තිබෙන්නේ. ඉදිරියේදී රජයේ වාහනවලට තෙල් ගහනවා නම්, digital card එකක් හරහා තෙල් ගහන්න පුළුවන්. මෙච්චර කාලයක් ඒවා අවභාවිත වුණා. දැන් ඒවා වෙනස් වෙලා තිබෙන්නේ. ඒ online ක්‍රමය හරහා ඉස්සරහට යන්න හදපු පාරක්. ඒ නිසා අපි හිතනවා, මේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනැල්ලා තිබෙන රෙගුලාසි තුළින් අපට ඒ අදාළ කරන වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒ තුළින් වාහන ආනයන ක්‍රියාවලියේදී මතු වන ගැටලු ටික අඩු කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අපි දන්නවා, 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය සංශෝධනය කරලා තිබෙනවා. එහි කොටස් 10ක් සංශෝධනය කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ අත්තිකාරම් ගිණුම්වල පවතින මුදල් සම්බන්ධයෙන් කොටස් 10ක් යටතේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. සමහර තැන්වල ඒ අත්තිකාරම් ගිණුම්වල මුදල් වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒවා අඩු කර ගන්න ඕනෑ. තවත් තැන්වල මුදල් අඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට වැඩියෙන් දෙන්න ඕනෑ. අල්ලස් හා දූෂණවලට අදාළව දැන් ලැබෙන පැමිණිලි වැඩියි. ඒ නිසා රුපියල් මිලියන 50, 150 දක්වා වැඩි කරලා තිබෙනවා, ආවේෂණ රාජකාරි සඳහා, අල්ලස් ගැනීම්වලට අදාළ රාජකාරි කටයුතුවලට නිලධාරින් මැදිහත් කරන්න. මෙන්න මේ වාගේ විශේෂ යෝජනා දෙකක් ගැන කථා කරන්න තිබුණු කාලය තමයි අද විපක්ෂය විසින් කාලකණ්ණි කරලා අත්හැරියේ. ඒ නිසා අපි ආදරයෙන් ඉල්ලනවා, සංවාද කරමු; ඒකට අදාළව මැදිහත් වෙමු; මාතෘකාවට අනුව කථා කරමු කියලා. ඒ සඳහා ඔබතුමන්ලා සියලුදෙනාට - විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්- ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත යටතේ යෝජනා සම්මතයන් 10ක් සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුමත කර ගැනීම සඳහා කටයුතු කරන අද දවසේ මම කැමැතියි රටේ ජනතාවට මේ මොහොතේ බලපාන කාරණා කිහිපයක් පිළිබඳව කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව හදපු ප්‍රධාන දේශපාලන පක්ෂය තමයි ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන දෘෂ්ටිවාදය සමාජවාදය කියලා තමයි අපි එදා අහලා තිබුණේ. එදා මෙදාතුර ජනතා විමුක්ති පෙරමුණ කථා කළේ සහෝදරත්වය, සමානාත්මතාව ගැන. ජේවීපීයට සම්බන්ධ ආණ්ඩුවක් ආවොත්, ආණ්ඩුව ඇතුළත්, ජනතාවත් හැමෝම සහෝදරත්වයෙන් එක සමාන වෙයි කියලා තමයි ජනතාව හිතුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ වෙද්දී ආණ්ඩුව ඇතුළෙන්ම ඇහෙන කාරණාවක් අපට මතක් වෙනවා. ආණ්ඩුව ඇතුළේ විවිධ මට්ටම්වල අය ඉන්න බව ආණ්ඩුව ඇතුළෙන්ම කියැවෙනවා. ඒ අතරේ සිංහාසනයේ වාඩි කරවන්න සුදුසු අය ඉන්නවා කියනවා. පුටුවේ වාඩි කරවන්න සුදුසු අය, බංකුවේ වාඩි කරවන්න සුදුසු අය වාගේම වෙනත් පැතිවල පාපිස්සකටවත් නොගන්නා අය වැනි විවිධ කණ්ඩායම් රජය ඇතුළේ ඉන්න බව ආණ්ඩුවේ ප්‍රධානීන්ගෙන්ම කියැවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමා අපට කථා කරන විධිය ගැන ඉගැන්වුවා. මේ වාගේ රෙගුලාසි ගේනකොට කථා කරන්න ඕනෑ මොනවාද කිව්වා. ලුණු ප්‍රශ්නය ගැන කථා කරන්න අවශ්‍ය නැහැ කිව්වා. දැන් ලුණු කන්න පටන්ගෙන ලු, කාලයක් හාල් කෑවා ලු. ඒ වාගේ නොයෙක් කතන්දර කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, රජයට මාස 7ක් යනකොට මේ රට ලුණුත් නැති රටක් බවට පත් කරන්න මේ රජය කටයුතු කරලා තිබෙන බව. මේවා ගැන අපට මේ සභාවේ කථා නොකර බැහැ. මොකද, මහ ජනතාවගේ නියෝජිතයෝ හැටියට ඉන්න අපි රටේ ජනතාවට ලුණු ප්‍රශ්නය බලපානවා නම්, අපි මේ සභාවේ ලුණු ප්‍රශ්නය කථා කරනවා. හාල් ප්‍රශ්නයක් එනකොට ඒ ගැන කථා කරනවා. කවුරුවත් ඉගැන්නුවාට, අපි ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කිරීම වෙනස් වෙන්නේ නැහැ. හැබැයි අපි මේ සභාවේ කථා කළත් නැතත්, ලුණු තිබුණත් නැතත්, මේ වෙනකොට ආණ්ඩුව ගැන ජනතාව කථා කරන්නේ නම් හොඳට ලුණු ඇඹුල් ඇතිව කියන එක මම ඒ මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙද්දී රට පුරා පවතින ලුණු හිඟය සහ ලුණු මිල කොතෙක්ද කියනවා නම් පාරිභෝගික ජනතාවට ඒක විශාල වශයෙන් බලපා තිබෙනවා. අද ඔබතුමා කඩේකට ගිහින් බලන්න, සීනි කිලෝවක මිලට වඩා ලුණු කිලෝවකට ගෙවන්න වෙලා තිබෙනවා, පාරිභෝගිකයාට. මේවා ගැන කථා නොකර පුළුවන්ද? පරිප්පු කිලෝවකට වැඩියි ලුණු කිලෝවක මිල. ගොවි ජනතාව ගැන කල්පනා කරලා බැලුවොත්, වී කිලෝ දෙකක් තුනක් විකුණන්න ඕනෑ ලුණු කිලෝවක් ගන්න.

කවදාවත් මෙහෙම තත්ත්වයක් තිබුණේ නැහැ මේ රටේ. අපේ ගම්වල කුඩා තේ වතු හිමියෝ ගැන කල්පනා කරලා බැලුවොත්, ලුණු පැකට් එකක් ගන්න අමු තේ දළු කිලෝ දෙක තුනක්වත් විකුණන්න වෙලා තිබෙනවා. කවදාවත් මෙහෙම තිබුණාද මේ රටේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හොඳට දන්නවා ඇති. අපේ ජන සමාජයේ විශ්වාසයක්, මතයක් තිබෙනවා ගෙදරක ලුණු පොල්කට්ට හිස් වෙන්න දෙන්න හොඳ නැහැයි කියලා. ඒක අසුබ දෙයක් විධියට සමහරු හිතනවා. අද ගෙදර ලුණු පොල්කට්ට විතරක් නොවෙයි රට පුරාම විශාල ලුණු හිඟයක් මේ පාලනය යටතේ ඇති වෙලා තිබෙනවා. ලොවෙත් නැති වෙන විධියට වැඩ පෙන්වනවා කියලා තමයි තමුන්නාන්සේලා බලයට ආවේ. අද ලුණුත් නැති වෙලා කියලා මිනිස්සු කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලුණු කියන්නේ මේ රටේ මිනිස්සු හාල් වාගේ, එළවලු වාගේ, පරිප්පු, සීනි වාගේ, මාළු වාගේ කිලෝ ගණන් කන දෙයක් නොවෙයි.

සාමාන්‍යයෙන් මාසයකට එක පවුලකට ලුණු පැකට් 2ක වාගේ තමයි උපරිමයෙන් ඕනෑ වෙන්නේ. තමුන්නාන්සේලාට මාස 7ක් තුළ රටට අවශ්‍ය ලුණු ටික හදාගන්නවත් බැරිවෙලා තිබෙනවා. එහෙම ආණ්ඩුවක් ගැන මහජනතාව ලොකු බලාපොරොත්තු ඇති කර ගන්නේ නැහැ. මාස 7ක් තිස්සේ ලුණු කැටයක් සපයාගන්න බැරි වෙච්ච දුර්වල ආණ්ඩුවකින්, මහවැලිය, වික්ටෝරියා, රන්දෙණිගල වගේ මහා ජලාශ හදයි කියලා මිනිසුන්ට කිසිම බලාපොරොත්තුවක් නැහැ. අවුරුදු 30කින් නිම කරන්න තිබුණු මහවැලි ව්‍යාපාරය හය අවුරුද්දෙන් ඉවර කරපු ආණ්ඩු මිනිස්සු දැක්කත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් ඒ වාගේ දේවල් බලාපොරොත්තු වෙන්න බැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් කටුනායක, කොග්ගල වාගේ ආයෝජන කලාප හදයි කියලා මිනිස්සු හිතන්නේ නැහැ. ඇඟලුම් කර්මාන්තශාලා 200 ව්‍යාපෘතිය රට පුරා අරගෙන ගිය ආණ්ඩු තිබුණත්, හත් මාසයක් ගියත් ජනතාවට ලුණු කැටයක් හෝ දෙන්න බැරි වුණු ආණ්ඩුවකින් මිනිස්සු එවැනි දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වාගේ ඇඳන් එක්දහස් ගණනක් තිබෙන රෝහල්, ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ තිබෙන කරාපිටිය රෝහල වාගේ රෝහල්, ලුණු කැටයක්වත් දෙන්න බැරි වුණු ආණ්ඩුවකින් හදයි කියලා මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ වාගේම ඩඩ්ලි සේනානායක ආණ්ඩුව කාලයේ සපුගස්කන්දේ තෙල් පිරිපහදුවක් හැදුවා. තරුණ සේවා සභාව, අධ්‍යාපන විද්‍යාපීඨ ඇති කරපු ආණ්ඩු අපි දැක්කා. පාසල් දරුවන්ට නොමිලේ පොත දුන්නා, නිල ඇඳුම් දුන්නා, දිවා ආහාරය දුන්නා. ඒ වාගේ රටට දැනෙන දැවැන්ත ව්‍යාපෘති ජනතාව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් අපේක්ෂා කරන්නේ නැති තරමට අද වෙනකොට ජනතාවගේ විශ්වාසය බිංගවෙලා තිබෙනවා. ඒක තමයි පසුගිය පළාත් පාලන මැතිවරණයේදී පෙන්නුවේ. හය මාසෙන් ඡන්ද ලක්ෂ 23ක් අහිමි කර ගත් එකම ආණ්ඩුව වර්තමාන ආණ්ඩුවයි කියන එක අද අපට කියන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි තමුන්නාන්සේලාට ඡන්දය දුන් මිනිස්සු අද හැම තැනම කියන්නේ, දේශපාලන ලුණු කාලා ලුණු කන්නත් බැරිවෙලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ වකවානුවල අසාර්ථක වුණු ආණ්ඩු අපි ඉතිහාසයේ දැකලා තිබෙනවා. මිනිස්සු 1970-1977 කාලයේ මොන තරම් දුෂ්කරතාවලට මුහුණ දුන්නාද කියලා අපි දැක්කා. එදා මිරිස් පොලු තිබුණා, හාල් පොලු තිබුණා, චිත්ත යාරයක් ගන්න, කලිසම් රෙද්දක් ගන්න සමුපකාරයට ගිහිල්ලා පෝලිමේ ඉන්න සිද්ධ වුණා. බයිසිකල් ටයර් එකක් ගන්න පරණ ටයර් එක කරේ දමාගෙන යන්න සිද්ධ වුණා. ඒ වාගේ කාල තිබුණා.

යුද්ධය තිබුණු කාලයේ ආණ්ඩු කරපු හැටිත් අපි දැක්කා. සුනාමියෙන් ලුණු ලේවායයන් ඔක්කෝම විනාශ වෙද්දීත්, 1988-1989 මහා භීෂණය රට තුළ තිබියදීත්, කොරෝනා වසංගතය නිසා මුළු රටම lock down කරලා තිබියදීත්, විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දීලා රට බංකොලොත් වුණාය කියපු වෙලාවේදීත් රට තුළ මේ වාගේ ලුණු හිඟයක් ඇති වුණේ නැති බව කනගාටුවෙන් වුණත් කිව යුතුව තිබෙනවා. ඒ නිසා තමයි ජනතාව දැන් කියන්න පටන් අරගෙන තිබෙන්නේ, මේක අසමත් ආණ්ඩුවක් කියලා. මාස 6න් ඡන්ද ලක්ෂ 23ක් අහිමි කර ගත්තේ ඒ නිසායි. ආණ්ඩුව කෙරෙහි මිනිසුන් තුළ බලාපොරොත්තුවක් තිබුණා නම්, තමුන්නාන්සේලාට මහා මැතිවරණයට වඩා වැඩි ජන වරමක් ලැබෙන්නට ඕනෑ. තමුන්නාන්සේලා හය මාසයක් යනකොට ඡන්ද විසිතුන්ලක්ෂයක් අහිමි කර ගත්තා.

ගරු කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමා පසුගිය මාර්තු මාසයේ අලිමංකඩට ගිහිල්ලා "රජ ලුණු" කියලා ලුණු පැකට්ටුවක් හඳුන්වලා දීලා රජ බොරුවක් කිව්වා. එදා එතුමා කිව්වා, නැවත ලංකාවට ලුණු ආනයනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. එතුමා අද උදේත් කථා කරනවා මම අහගෙන සිටියා. ඊට සම්පූර්ණයෙන්ම -හාත්පසින්ම- වෙනස් කථාවක් තමයි එතුමා අද මේ සභාවට ඇවිල්ලා කළේ. අලිමංකඩදී කිව්වා, ලුණු ආනයනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. අද මේ සභාවට ඇවිල්ලා වෙනත් කථාවක් කියනවා. අද වෙනකොට ලුණු හිඟය නිසා බරපතළ අර්බුදයකට මුහුණ දෙන්න සාමාන්‍ය ජනතාවට, පාරිභෝගික ජනතාවට විතරක් නොවෙයි, අපේ රටේ ධීවර ප්‍රජාවටත් සිද්ධවෙලා තිබෙනවා. බහුදින ධීවර යාත්‍රාවල මත්ස්‍ය අස්වැන්න ගබඩා කිරීම සඳහා අයිස් වාගේම ලුණුත් අත්‍යවශ්‍ය දෙයක් බව අපි කවුරුත් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙද්දි කිලෝ 50 ලුණු මිටිය කිලෝ 35කට සීමා කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කිලෝ 35 ලුණු මිටියක් මිලට ගන්න වෙන්නේ රුපියල් 10,500ක් වාගේ අධික මිලකට. මේ තත්ත්වය මත ධීවරයන්ට මේ වෙනකොට ලුණු තිත්ත වෙලා තිබෙනවා. මෙහෙම තත්ත්වයක් යටතේ අපට ලුණු ගැන කථා කරන්න එපා කියලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වාට, ජනතාවගේ ප්‍රශ්නයක් කථා නොකර ඉන්න පුළුවන්ද? ජනතාවට මේ ප්‍රශ්නය බලපාන බව එතුමන්ලාට දැනෙන්නේ නැද්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මිනිස්සු අහන්න පටන්ගෙන තිබෙනවා, රට වටේම මුහුද තියාගෙන ලුණු කැටයක් හිඟයකින් තොරව සාධාරණ මිලකට දෙන්න බැරි නම් මුහුද මැද තිබෙන රටක් මේ ආණ්ඩුව හදන්නේ කොහොමද කියලා. අද මිනිස්සුන්ට එහෙම හැඟීමක් ඇති වෙලා තිබෙනවා. රට වටේම මුහුද තියාගෙන මාස 7ක් තිස්සේ ජනතාවට ලුණු කැටයක් හරියට දීගන්න බැරි නම් මුහුද මැද තිබෙන රටක් තමුන්නාන්සේලා ඔය කියපු විධියට හදන්නේ කොහොමද කියන එක අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒක නිසා තමයි හත් මාසයක් ගිහිල්ලා පළිගැනීම් වාගේ දේවල් හැරුණුකොට, විවිධ සන්දර්ශන හැරුණුකොට ජනතාවට දැනෙන කිසිම දෙයක් කරගන්න බැරි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව යටතේ සම්බෝලයි, බතුයි තියා ලුණුයි, බතුයිවත් කන්න බැරි රටක් බවට මේ රට පත් වෙලා තිබෙනවා. මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා අපි මේ ප්‍රශ්න ගැන අදහස් ප්‍රකාශ කිරීම නතර කරන්න හැදුවත්, ජනතාවගේ පැත්තෙන් අපි ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න පැකිළෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කැමැතියි තවත් කාරණයක් ගැන කථා කරන්න. තමුන්නාන්සේලා බලය ගන්නකොට සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කියලා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ජනතාව ඇන්දෙව්වා. ජනාධිපතිවරයාම තමයි ඇවිල්ලා වේදිකාවල කිව්වේ -නිකම් නොවෙයි එතුමා ගණන් එක්ක කිව්වේ - රුපියල් 9,000ක් විදුලි බිල ගෙවනවා නම් ඒක රුපියල් 6,000ට අඩු කරනවා කියලා. ඒ වාගේම විදුලි බිල විධියට රුපියල් 6,000ක් ගෙවන කෙනාට එය රුපියල් 3,000ක් වෙන හැටිත්, රුපියල් 1,000ක් විදුලි බිල ගෙවනවා නම් ඒක රුපියල් 500ට අඩු වෙන හැටිත් එතුමා කිව්වා. ජනතාව ඒවාට ඇන්දිලා විශාල බලාපොරොත්තු ඇතුව ලයිට් බිල අඩු වෙන හැටි කල්පනා කර කර ගිහිල්ලා කතිරය ගැහුවා. දැන් නැවත හොඳටම පේන්න තිබෙනවා, ජනතාවට කරන්ට් වැදෙන විධියට ලයිට් බිල අසීමිතව වැඩි කිරීමට රජය පිඹුරුපත් සකස් කරමින් ඉන්න බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි බිල වැඩිවෙනවා කියන්නේ - ඒක ඔබතුමාට අමුතුවෙන් කියන්න දෙයක් නොවෙයි- ඒකෙන් පාරිභෝගික ජනතාවට හැම පැත්තෙන්ම පහර වදිනවා. ඒක පන්සල්, පල්ලි, කෝවිල් වැනි ආගමික සිද්ධස්ථානවලටත් බලපානවා. ව්‍යාපාරික ආයතනවලටත් බලපානවා, කර්මාන්තකරුවන්ටත් බලපානවා, සංචාරක හෝටල්වලට සහ අනෙකුත් හෝටල්වලටත් බලපානවා. පාසල් දරුවාට පවා ඒක බලපානවා. ලෙඩ ඇඳේ ඉන්න රෝගියාට පවා ඒක බලපානවා. ඒ නිසා සමස්ත රටේ ආර්ථිකයටම විශාල බලපෑමක් ඇති වෙනවා, ආපහු විදුලි බිල මේ ගණනට වැඩි කළොත්.

අද රටේ තිබෙන තවත් භීතිකාවක් තමයි, ඇඟලුම් කර්මාන්තශාලා වැහෙන්න පටන් ගෙන තිබෙනවා කියන එක. සමහරු කියනවා මම දැක්කා, එකක් වැහුණා, අනෙක් ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ කියලා. නමුත් අද මිනිස්සුන්ට මේක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඇඟලුම් කර්මාන්තශාලාවක් වැහෙනවා කියන්නේ ඒකෙන් විශාල පිරිසකට රැකියා අහිමි වෙනවා, ආදායම් මාර්ග නැති වෙනවා කියන එක. ආහාර සපයන අය, ප්‍රවාහන පහසුකම් සපයන අය ඇතුළු විවිධාකාරයෙන් ඇඟලුම් කර්මාන්තශාලාවක් හරහා ආර්ථිකය ගොඩනහා ගත් පිරිසකට ඒක බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද රටේ හැම තැනම තිබෙන්නේ අනාරක්ෂිත බවක්. ජන ජීවිතවලට අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දිනපතාම අහන්න, දකින්න ලැබෙන්නේ කොහේ හරි වෙඩි තැබීමක්, ඝාතනයක් සිද්ධ වුණා කියලායි. දැන් ඒක සාමාන්‍යකරණය වෙලා. මිනිස්සු අහන්නේ අද කොහේද පත්තු වෙලා තිබෙන්නේ, අද කොහේද ඝාතනයක් වෙලා තිබෙන්නේ කියලායි. ඒ මට්ටමට මේ රට පත් වෙයි කියලා කවුද හිතුවේ? තමුන්නාන්සේලා ආණ්ඩු බලය ගන්නකොට ජාතික ආරක්ෂාව ගැන කියපු කථා අපට මතකයි නේ. පෝය දෙකෙන් මේ ප්‍රශ්න විසඳන හැටි කිව්වා. ජාතික ආරක්ෂාව ගැන ටියුෂන් දෙන්න බංකුවක් අරගෙන එන්න කිව්වා. අද කෝ, ඒ අය?

ඒ නිසා, මේවා පිළිබඳව අපි කථා කළ යුතුව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා අද රටේ දැවෙන ප්‍රශ්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පනතක් යටතේ හෝ කුමන හෝ මාතෘකාවක් යටතේ උදේට නැඟිටලා කථා කරන්න දෙන්නේත් නැත්නම්, ලැබුණු වෙලාවේදී ජනතාවගේ ප්‍රශ්න මතු කිරීමට අපි කවදාවත් පැකිළෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ කාරණා ගැන කථා කරද්දී මේ රජය අසමත් රජයක් නොකියා, සමත් රජයක් කියලා අපට කියන්න පුළුවන්ද? ඒ කාරණයත් ඔබතුමාට සිහිපත් කරමින්, මට ලබා දුන් කාලය අවසන් කියලා ඔබතුමා කියන නිසා ඊට ගරු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැති අවස්ථාවක අපේ හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මා ගැන වැරදි අදහසක් මේ සභාවට කියලා තිබෙනවා. ඒ තමයි, ප්‍රභාකරන්ට උතුරේ පිළිරුවක් හදන්න යනවා වාගේ කථාවක් මම කිව්වා කියලා Hon. Archchuna කියලා තිබෙන බව. එම නිසා මම එකක් කියන්න ඕනෑ. මම කිසිම දවසක එවැනි කථාවක් කිව්වේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඇයි කියලා කියනවා නම්, මගේ පක්ෂ නායකයා රෝහණ විජේවීර සහෝදරයා. ළඟින්ම ආශ්‍රය කරලාත් තිබෙනවා. ඒ හැඟීම් තවමත් අපට තිබෙනවා. 1989දී ජීවිත නැති වෙච්ච විශාල පිරිසක් අපේ හිත ඇතුළේ, පපුව ඇතුළේ තවමත් ඉන්නවා. ඒ සියල්ලටම නායකත්වය දුන්, සංවිධානයක් හැටියට අප මෙහෙයවපු අපේ නායකයා පිළිබඳව පවා අපි කොහේවත් කියන්නේ නැහැ, විජේවීර සහෝදරයාට වෙනම පිළිරුවක් හදන්න ඕනෑ කියලා. එසේ තිබෙද්දී මම ගිහිල්ලා වෙනත් අයගේ පිළිරුවක් හදන්න කියනවා නම් ඒක සම්පූර්ණ වැරදි, අසත්‍ය තොරතුරක්. එක දෙයක් මම කියන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ අය කියන්න දෙයක් නැතිව මේ තරම් පහත් මට්ටමකට වැටිලා තිබෙන එක ගැන මම ඇත්තටම කනගාටුව ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මගේ පැත්තෙන් මම මේක කියන්න ඕනෑ. මේ රටේ මැරුණු මිනිස්සු ඕනෑ තරම් ඉන්නවා. ඒ මැරුණු සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා අපේ දරුවන්, අපේ කොල්ලෝ, අපේ කෙල්ලෝ. ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා මිසක් එක්තරා පුද්ගලයකු වෙනුවෙන් හෝ එක්තරා නායකයෙකු වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. අපි හැම දාම කියනවා වාගේ ප්‍රභාකරන් විතරක් නොවෙයි, උමා මහේෂ්වරන්ලා, සභාරත්නම්ලා වැනි ඕනෑ තරම් නායකයෝ ඉන්නවා. ඒ සියලුදෙනාම දෙමළ ජනතාවගේ සුබසිද්ධිය සඳහා සිහින මැව්වා. නමුත්, ඒවා පරාජයට පත් වුණා. ඒවා පරාජයට පත් වෙලා අවුරුදු 16ක් වෙනවා. ඒ අවුරුදු 16කින් පස්සේ අද අපි මේ රට ගොඩනැඟීමේ, සංහිඳියාව ගොඩනැඟීමේ ක්‍රියාවලියට යොමු වෙලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය වැළැක්වීමටත්, නැවත ජාතිවාදය අවුස්සන්නටත්, ඒ වාගේම JVP එක පිළිබඳව, එහෙම නැත්නම් ජාතික ජන බලවේගය පිළිබඳව වැරදි අදහසක් සමාජයට දෙන්නත් මෙවැනි උත්සාහයක නිරත වෙන්න එපා කියලා විරුද්ධ පක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.59]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගන්නා විෂයයන් අතර 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වූ රෙගුලාසි අනුමත කිරීමට නියමිතව තිබෙනවා. හැබැයි, අද උදේ වරුවේ ඉඳලා මේ වනකල් ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් හැරුණුකොට විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගේ එකම මාතෘකාව වෙලා තිබුණේ, ලුණු. ලුණු ගැන අහලා අහලාම අපේ කන්වල දැන් ලුණු මිදිලා වාගේයි. මේ වනකොට එච්චර වාර සංඛ්‍යාවක් විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද ලුණු ගැන කථා කළා. අපේ කර්මාන්ත අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා අද උදේම ඇවිල්ලා නිවැරදි පැහැදිලි කිරීමක් කළා, ලුණු සම්බන්ධයෙන් ඇති වෙච්ච අර්බුදයට ප්‍රධාන හේතුව මොකක්ද කියලා. දින වකවානුත් එක්කම එතුමා ඒ පිළිබඳව කිව්වා.

සාමාන්‍යයෙන් ලුණු අස්වැන්නක ආරම්භයේ ඉඳලා අවසාන අස්වැන්න දක්වා ගත වන කාලය ගත්තොත්, ඒ සඳහා මාස 7ක වාගේ කාලයක් ගත වෙනවා. දෙසැම්බර් මාසයේ ඉඳලා පටන් ගත්තත් තිබුණු කාලගුණ විපර්යාසය හා අර්බුද හමුවේ මේ වාගේ ප්‍රශ්නයක් එන්න පුළුවන් කියන එක ගැන එතුමා ඉතා නිවැරදි පැහැදිලි කිරීමක් කළා.

ඒ වාගේම, මීට මොහොතකට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේ මගේ දයාබර සහෝදර දිනිඳු සමන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ වෙළෙඳ පොළේ පුංචි අර්බුදයක් එනකොටම සමහර නාලිකාවලින් විශාල ශබ්දයක් සහිතව ඒ පුංචි අර්බුදය සමාජගත කළා, ඉදිරියේදී ලුණු ප්‍රශ්නයක් එනවා, ලුණු හිඟයක් එනවා, පුළුවන් තරම් ලුණු රැස් කරගන්න කියලා. එතුමාගේ කථාවේදී පැහැදිලි කළා වාගේ මිනිස්සු සමපේක්ෂණ, එහෙම නැත්නම් අනාගතයේදී වෙන්න පුළුවන් දේ ගැන කලින් ගන්නා තීන්දු නිසා ලුණු පැකට් එකක් අරගෙන යන ගෙදරට ලුණු පැකට් දෙක තුනක් අරගෙන ගිහින් තබා ගත්තා. ආහාර නිෂ්පාදන ආයතන පුළුවන් තරම් ලුණු තොග රැස් කර ගත්තා. ඒ නිසා හිතන්නේ නැති ඉක්මනින් මම කලින් කියපු අර්බුදය ආවා. හැබැයි, ඉතා කනගාටුවෙන් වුණත් අපට විපක්ෂයට කියන්න වෙනවා, ඔය ගැන කථා කරන්න වෙන්නේ උපරිම තව සතියයි එහෙම නැත්නම් දවස් කිහිපයයි, ලුණු ප්‍රශ්නයෙන් වෙන මොකකට හෝ මාරු වෙන්න වෙනවා කියලා. පොල්වලින් හාල්වලට, හාල්වලින් බිත්තරවලට, බිත්තරවලින් ලුණුවලට ආපු විපක්ෂයට ඉතා ඉක්මනින් තවත් අලුත් මාතෘකාවක් සොයා ගන්න වෙනවා, මේ ආණ්ඩුවට මඩ ගහන්න.

ලෝකය යම් රටක ආර්ථිකය සාර්ථකද, අසාර්ථකද කියලා බලන්නේ ලුණු දෙස බලාවත්, ගරු විපක්ෂ නායකතුමා කියන විධියට තක්කාලි දෙස බලාවත්, කැරට් දෙස බලාවත් නොවෙයි. ලෝකය යම් රටක ආර්ථිකය හරියට ක්‍රියාත්මක වනවාද, නැද්ද කියන එක බලන්නේ ඒ රටේ සාර්ව ආර්ථික විචල්‍යයන් හරි විධියට හැසිරෙනවාද නැද්ද කියන එක මත.

යාචක පිරිසක් ඉන්න, එහෙම නැත්නම් යාචක මානසිකත්වයකින් පෙළෙනවාය කියන 159දෙනෙකු වෙච්ච මේ ආදරණීය සහෝදරත්වය එකතු වෙලා මේ මාස 6ක, 7ක කාලය තුළ හදපු රටේ ආර්ථික දර්ශක ටිකක් ගැන අපි දැන් කථා කරමු. සාමාන්‍යයෙන් ආර්ථික වර්ධන වේගය, රටේ විනිමය අනුපාතිකය, විරැකියාව -එහෙම නැත්නම් සේවා නියුක්තිය, වියුක්තිය-, රටේ පොදු මිල මට්ටම කියන සාර්ව ආර්ථික විචල්‍ය හතර ප්‍රධාන වශයෙන්ම රට තුළ ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ඒවා හරියට, ලස්සනට ගලාගෙන යනවා නම් අන්න ඒ රට සාර්ථකව ඉස්සරහට යන ආර්ථිකයක් සහිත රටක් විධියට තමයි ලෝකය දකින්නේ. මේ මාස 6ක, 7ක කාලය ඇතුළත ඉතිහාසයේ නොවූ විරූ අයුරින් අපි විදේශ ප්‍රේෂණ ඉහළ දමාගෙන තිබෙනවා. ඒ වාගේම තමයි ඩොලරයේ අගය හෙවත් විනිමය අනුපාතිකය රුපියල් 300ක වාගේ මට්ටමක ස්ථාවරව පවත්වාගෙන යනවා. ඒ වාගේම, විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.5ක වාගේ මට්ටමක පවත්වාගෙන යනවා. මේ වසර අවසන් වෙනකොට මේ යාචකයෝ සෙට් එක එකතු වෙලා ඒ මට්ටම අඩුම තරමින් තවත් බිලියනයකින්වත් ඉහළ දමන්න උත්සාහ දරනවා. ඒකට යන්න හැකියාවක් මේ ආදරණීය සහෝදරත්වයට, මේ හැඟීමට, මේ හැකියාවට තිබෙනවා. ඒ වාගේම, රටේ උද්ධමන අනුපාතිකය පහළ ස්ථාවර මට්ටමක පවත්වාගෙන යනවා. අනික් අතින් ගත්තාම, අපි ආර්ථික වර්ධන වේගය වැඩි කරගෙන තිබෙනවා. මෙන්න මේ කරුණු දෙස බලා තමයි ලෝකයේ රටවල් යම් රටක ආර්ථික දර්ශක එහෙම නැත්නම් ආර්ථිකය හරියට ක්‍රියාත්මක වනවාද නැද්ද කියලා තීන්දු ගන්නේ.

මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැතත් ගරු විපක්ෂ නායකතුමා ඊයේ කථා කළා, රටේ උද්ධමනය ගැන. භාණ්ඩ list එකක් ගැන එතුමා කථා කළා. එහිදී විශේෂයෙන් කථා වෙච්ච භාණ්ඩ කිහිපයක් මම කියන්නම්. එකක්, තක්කාලි. අනික් එක, කැරට්. පසුගිය අවුරුද්දක තක්කාලි මිලත්, කැරට් මිලත් සන්සන්දනය කරලා කියනවා, ලංකාවේ මිනිස්සුන්ට මේ උද්ධමනය දරා ගන්න බැහැ කියලා. එතුමාගේ පක්ෂයේම සිටින අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් ඇහුවා නම් කියයි, රටක උද්ධමන අනුපාතිකය තක්සේරු කරනකොට -විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටක උද්ධමන අනුපාතිකය තක්සේරු කරනකොට- මූලික උද්ධමන අනුපාතිකය තක්සේරු කරන භාණ්ඩ පැසට ඔය නැවුම් ආහාර, එළවලු වාගේ දේවල් ඇතුළත් කරගන්නේත් නැහැ කියලා. ඒකට හේතුව තමයි, කාලගුණ විපර්යාස වාගේ දේවල් එක්ක මේ එළවලු මිල ඉතා ශීඝ්‍රයෙන් ඉහළ-පහළ යන්න පුළුවන් වීම. ඔය භාණ්ඩ පැස සකස් කිරීමේදී පාලනය කළ නොහැකි මිල ගණන් ඇතුළත් කරන්නේ නැහැ. ඒ නිසා තනි තනි අයිතම අරගෙන කවදාවත් රටක උද්ධමනය ගැන කථා කරන්නේ නැහැ. සමස්ත පොදු මිල දර්ශකය හැසිරෙන්නේ කොහොමද කියන එක ගැනයි රටක ආර්ථික දර්ශකය සකස් කිරීමේදී සැලකිලිමත් වන්නේ. පුංචි-පුංචි හුදෙකලා වෙච්ච සිදුවීම් අරගෙන ඒවා ආර්ථිකයේ කඩා වැටීමක් විධියට හිතනවා නම් මම ඒ අයට කියන්න කැමතියි, අපි මේ මාස 6, 7 ඇතුළත අර කියපු කැපවීම් කරලා, අපේ අනුර දිසානායක සහෝදරයා ඉතා දිළිඳු මට්ටමින් සංචාරවලට සහභාගි වෙලා ඉතුරු කරපු සල්ලිවලින් අපි මේ රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප ඉතිහාසයේ නොවුණු විධියට වැඩි කර තිබෙන බව.

අද උදේ ඉඳලාම මේ සභාව තුළ කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් නිතර නිතරම ගෝරනාඩුවක් විධියට එළියට ආපු දෙයක් තමයි, රණ විරුවන්ට නිසි සැලකිල්ලක් නැහැ කියන කාරණය. අපි රණ විරුවන්ට නිසි සැලකිල්ල, නිසි ගෞරවය ලබා දීලා තිබෙනවා, ඔවුන්ගේ මූලික වැටුප් වැඩි කිරීම තුළින්. නමුත් යුද්ධයට සැබෑ නායකත්වයක් දීපු හිටපු හමුදාපතිවරයකු වන ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා යුද ජයග්‍රහණයෙන් පසුව බෙල්ලෙන් අල්ලාගෙන ගිහිල්ලා සිරගත කළා, එවකට සිටි පාලකයන්. එතුමා කියන විධියට නඩුව දැම්මේත්, නඩුව ඇහුවේත්, නඩුවට අදාළ තීන්දු දුන්නේත් රාජපක්ෂලා නම්, අන්න ඒ රාජපක්ෂලාට යුද ජයග්‍රහණයෙන් පසුව සියලු හමුදාපතිවරුන්ට දෙන්න බැරි වුණු ඒ උත්තරීතර ගෞරවය අපේ ආණ්ඩුව යටතේ අපි ලබා දීලා තිබෙනවා.

අපට මේ රට වෙනුවෙන්, මේ භූමිය වෙනුවෙන්, ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ජීවිතය කැප කරන ඕනෑම මනුස්සයෙක් වීරෝදාර මනුස්සයෙක්. සංග්‍රාම භූමියේදී මේ රට දැය වෙනුවෙන් ජීවිතය පූජා කරන ඒ ආදරණීය සෙබළා, අපට වීරෝදාර

[ගරු දිනේෂ් හේමන්ත මහතා]

සෙබළෙක්. ධාවනය කරන බස් රථය ප්‍රපාතයකට වැටෙන්න යනකොට, එහෙම වැටෙන්න නොදී බස් එකේ සිටින මගීන් බේරා ගන්න ජීවිතය පරදුවට තබා බස් එක කණ්ඩියක හප්පා තමන්ගේ ජීවිතය ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් පූජා කරන රියැදුරා, අපට වීරෝදාර රියැදුරෙක්. තමන්ගේ උපරිම වෙහෙස මහන්සිය යොදවා මැරෙන්න යන රෝගියා බේරා ගන්න දඟලන වෛද්‍යවරයා, අපට වීරෝදාර වෛද්‍යවරයෙක්. ඒ නිසා අපි ඒ වචන දෙන්නේ සැබෑ ගෞරවයක් එක්කයි. හැබැයි, මෙතැන උදේ ඉඳලා හවස් වෙනකම් ගෝරනාඩු කරපු, කෑ ගහපු මන්ත්‍රීවරු ඇයි මේ වචන පාවිච්චි කරන්නේ? ඔවුන්ගේ දේශපාලන ගමනට තවත් එක දශමයක හෝ ජවයක් ගන්න පුළුවන් නම් ඒ හැකියාව ලැබෙන්නේ ඔන්න ඔය වාගේ වචනවල එල්ලුණොත් විතරයි.

විපක්ෂය පැත්තේ සිටින උතුරෙන් ආපු එක් මන්ත්‍රීවරයෙක් කියනවා, ප්‍රභාකරන් මගේ නායකයා, ඒ නිසා අපි දෙමළ ජනතාව වෙනුවෙන් මෙන්න මෙහෙමයි කරන්නේ වාගේ කථාවක්. විපක්ෂයේම සිටින -තාත්තාගේ පිනෙන්, තාත්තාගේ ඌෂ්ණයෙන්, තාත්තාගේ රැස්වලින් පාර්ලිමේන්තුවට ආපු- තවත් මන්ත්‍රීවරයෙක් කියනවා, රණ විරුවා කියන වචනය කිව්වේ නැහැ, ඒක රණ විරුවන්ට කරපු ලොකු අගෞරවයක් කියලා. දෙගොල්ලන්ගේම එකම පරමාර්ථය මොකක්ද? මීට අවුරුදු 16කට කලින් ශ්‍රී ලාංකික රණ විරුවන්, වීරෝදාර සෙබළුන් එකතු වෙලා මේ රටට ලබා ගත්ත සාමය තවදුරටත් මේ රට තුළ ස්ථාපිත වෙලා ඉස්සරහට ගියොත්, බංකොලොත් දේශපාලන පක්ෂවලට ඉහළට එන්න අවස්ථාවක් නැති බව ඒ අය හොඳටම දන්නා නිසා යළි ජාතිවාදය අරගෙන ඇවිල්ලා තිබෙනවා. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව ඒ මිය ගිය සැබෑ රණ විරුවන්ට නියම ගෞරවය ලබා දෙන්න අපි සූදානම්. නමුත් අපි කියන්න කැමැතියි, ප්‍රභාකරන් කරේ තියාගෙන ආවත්, රණ විරුවන් කියන වචනය කරේ තියාගෙන ආවත් මේ ශ්‍රී ලාංකීය ජන ප්‍රජාව තුළ නැවත වතාවක් ජාතිවාදී, වර්ගවාදී යුද්ධයක් ඇති වෙන්න අපි ඉඩ දෙන්නේ නැති බව. ඒක ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබුණා. අපි සපථ කර කියනවා, මේ ලංකාව ඇතුළත අනාගත පරම්පරාවට පසුගිය තිස් අවුරුදු යුද්ධය වාගේ යුද්ධයක් ඇති වෙන්න අපි ඉඩ තබන්නේ නැහැ කියලා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි හරහා අපි ගත් නිවැරදි තීන්දු ගැන මේ විපක්ෂයේ අය කොතැනකදීවත් කථා කළේ නැහැ. අපි ආනයන හා අපනයන සම්බන්ධයෙන් ගත් නිවැරදි තීන්දුව නිසාම ඇති වුණු කාර්යක්ෂමතාවත් එක්ක හෙට-අනිද්දා වෙනකොට ලංකාවට භාණ්ඩ ආනයනය කරන අයට, විදේශවලින් භාණ්ඩ එවන අයට එම ක්‍රියාවලිය කාර්යක්ෂමව කරගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම පිට රටින් ගෙන්වන වාහන වරාය රේගුව තුළ නතර කර තිබෙන කාලය අඩු වීම තුළින් ප්‍රමාද ගාස්තු ගෙවන්න අවශ්‍ය නොවන නිසා ඒ වාසියත් වාහන ගෙන්වන අයට -ආනයනකරුවන්ට- ලැබෙනවා. එහෙම නැතුව ප්‍රමාද ගාස්තු ගෙවන්න වුණොත්, ඒ ගෙවන්න වෙන වටිනාකම වාහනයේ අගයට එකතු කර, වාහනයේ මිල ඉහළ දමන්නට ආනයනකරුවන්ට සිද්ධ වෙනවා. මේක පුංචි ක්‍රියාමාර්ගයක් වුණත්, පුංචි දෙයක් වුණත් ඩිජිටල්කරණයත් එක්ක ලොකු වෙනසක් කරන්න හැකි වන විධියට ඔන්න අපි අදත් ලංකාවේ පුරවැසියන්ට, වාහන ආනයනකරුවන්ට ඔවුන්ගේ ව්‍යාපාරවලට සහනයක් ගෙනැවිත් දී තිබෙනවා.

වාහන ආනයනය කරන ව්‍යාපාර දියුණු වෙනකොට අමතර කොටස් ලංකාවට එන එක වැඩි වෙයි. වාහන සේවා සපයන, service කරන ආයතනවල සේවය වැඩිපුර සපයන්න අවස්ථාව ඇති වෙයි. වාහන කැඩුණාම හදන ගරාජ්වල සේවා ප්‍රමාණය වැඩි වෙයි. මෙන්න මේ වාගේ බැඳිලා ආර්ථිකයේ සෑම අංශයකටම, සමස්ත ශ්‍රී ලංකා ප්‍රජාවටම අද මේ ගත්ත පුංචි තීන්දුවේ, පුංචි උත්සාහයේ වටිනාකම ගලා යයි. අපි දවසින් දවස ක්‍රමක්‍රමයෙන් මේ රට ගොඩනඟන කර්තව්‍යයට උර දීලා තිබෙනවා. එතැනදී භෞතිකව මේ මහ පොළොවේ මහා වෙනසක් නොවුණා වාගේ පෙනුණාට, මේ මෑත කාලය වන විට ව්‍යුහාත්මක වෙනස්වීම්වලට අවශ්‍ය තීන්දු තීරණ විශාල ප්‍රමාණයක් අපි අරගෙන තිබෙනවා. ඩොලර් සංචිතය රැකගෙන, වාහන ආනයනකරුවන්ගේ ව්‍යාපාරත් රැකගෙන ඒ ආනයනය තුළින් රටේ දේශීය කර්මාන්තවලට, දේශීය ව්‍යාපාරවලට අවශ්‍ය අවස්ථාව සම්පාදනය කරමින් අපි ක්‍රමක්‍රමයෙන් මේ ගමන ඉස්සරහට යනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ නිවැරදි ප්‍රශ්නය හඳුනාගෙන ඒ අදාළ වෙලාවට යුහුසුලුව උත්තර දෙන්න අවශ්‍ය ශක්තිමත් බලයක්, ජවයක් අපි ඉදිරියේදී හදා ගන්නවා කියන එකයි. ස්වයං විවේචනයක් තිබෙනවා නම් ඒ ස්වයං විවේචනයක් තිබෙන එකම පක්ෂය අපි. තබන පියවර සාර්ථක වුවහොත් ඒ සම්බන්ධ සතුටක්, තබන පියවර අසාර්ථක වුවහොත් ඒ සම්බන්ධ ස්වයං විවේචනයක් කර ගන්න එකම පක්ෂය අපියි. එහෙම ස්වයං විවේචනයක් සහිතව වැරදි අඩු පාඩු හදාගෙන ඉස්සරහට යන මේ පක්ෂය ජන මතය තව දුරටත් ශක්තිමත් කරගෙන, ජන මතයට, ජන වරමට ගරු කරමින්, ඒ වගකීමට වගවීම ලබා දෙමින්, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති යළි යළිත් තහවුරු කරමින් ඉදිරියට යන බව සපථ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන් ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවත් කථා කරන වෙලාවේ මේ විවාදයට එකතු වෙන්න ලැබීම මම ගැන සතුටු වනවා.

අපි වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාකාරකම් පිළිබඳව, අද ආණ්ඩුවට උද්ගත වෙලා තිබෙන මේ ආර්ථික වැඩ පිළිවෙළේ ගැටලුම් පිළිබඳව මීට මාස 6කට කලින් කිව්වා. මාස 6කට කලින් කිව්වා, පුංචි කඩපිලක්වත් කරපු නැති උදවියට මේ ආර්ථික වැඩ පිළිවෙළ දෙන්න එපා කියලා. ඒකේ හොඳම නිදසුන අද මේ සමාජය අත්විඳිනවා. සමහරු නයි පෙන්වා බලය හදන්න උත්සාහ කළා. ඔබතුමන්ලා නයි ඇරලා බලය ගත්තා කියන කාරණය ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට එකඟව තීන්දු කරන්න. බොරු කියලා, නයි ඇරලා බලය අරගෙන, ඒ බොරුවෙන්ම, මුසාවෙන්ම, නයි ඇරගෙනම මේ බලය ගෙනයන්න බැහැ.

අපට මතකයි, හඳුන්නෙත්ති අමාත්‍යවරයා ඒ කාලයේ විපක්ෂයේ ඉන්නකොට කිව්වා, සහල් හෝ මොනවා හෝ පිටරටින් ආනයනය කරනවා නම්, ඒකට ඇමති කෙනෙක් මොකටද කියලා. එහෙම අපහාස කළා. එහෙම අපහාස කළ ඇමතිවරයෙක් තමයි හඳුන්නෙත්ති වර්තමාන ඇමතිවරයා. නේද,

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි? සහල් ආනයනය කරනවා නම්, ඇමති කෙනෙක් ඕනෑත් නැහැ කිව්වා; ආණ්ඩුවක් ඕනෑත් නැහැ කිව්වා. ඒක පිටකොටුවේ වෙළෙඳාම් කරන මුදලාලි කෙනෙකුට දෙන්න කිව්වා. දැන් කොහොමද දෛවයේ සරදම? නේද? ලජ්ජයි නේද? ඒ ලජ්ජාව වහ ගන්න අද මේ පාර්ලිමේන්තුවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ වෙලාවේ මුලසුනේ හිටියේ ගරු නියෝජ්‍ය කථානායකතුමා. හඳුන්නෙත්ති ඇමතිවරයාගේ, උගත් ඇමතිවරයාගේ, ජ්‍යෙෂ්ඨ ඇමතිවරයාගේ කථා බහේ "අයිසේ අර්ච්චුනා" කියන ඒ වචන හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න කියන්න විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. එහෙම ආමන්ත්‍රණය කරන්න බැහැ, මන්ත්‍රීවරයෙකුට. ඒක නොදන්නා මන්ත්‍රීවරයෙක් නොවෙයි, ඔය ලුණු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එතුමාගේ නොහැකියාවට එතුමාටම තද වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලුණු අත්‍යවශ්‍ය භාණ්ඩයක්. ලුණු නිෂ්පාදනය අද අක්‍රිය වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුවේ නොහැකියාව හරහා. අපේ ගම්වල ගොවීන් වැහි කාලය දන්නවා, ඍතුව දන්නවා. ඒ ඍතුවට වගා කරනවා ද, නැද්ද, ඒක රාශි කරනවාද කියලා දන්නවා. ඒ වාගේ ඔය ආයතනවල වැඩ කරන ප්‍රධාන නිලධාරින් වර්ෂා කාලයට වැඩි නිෂ්පාදනයක් කරන්න ඕනෑ කියන කාරණය දන්නවා. හැබැයි, ඒ ආයතන ඇතුළේ ඉන්න නිලධාරින්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මේ ආණ්ඩුව අද ඉඩ දෙන්නේ නැහැ. හැම රාජ්‍ය ආයතනයකම හොරු ඉන්නවා වාගේ වපර ඇහින් බලන්නේ. හොරු අල්ලනවා කියන මාතෘකාව තමයි ඔබතුමන්ලාගේ ජනප්‍රියකම කියලා ඔබතුමන්ලා හිතනවා නම්, ඒකමයි ඔබතුමන්ලාට වරදින්නේත්. ඒ ඇයි කියලා මම කියන්නම්.

ඒ කාලයේ රාජපක්ෂවරුන්ගේ පැවැත්ම වුණේ මොකක්ද? ඔවුන්ගේ පැවැත්ම වුණේ යුද්ධය සහ රණ විරුවන්. අදත් ඇහෙනවා නේ. රණ විරුවන්ට දෙන්න ඕනෑ ගෞරවය දෙන්න ඕනෑ. හැබැයි, ඒක කාගේවත් බලය ආරක්ෂා කිරීමක්, පාලනයක් රඳවා ගන්න හේතුවක් වෙන්න බැහැ. අන්න එතැනදී තමයි අපි වැරැද්ද, වැරැද්ද විධියට දකින්න ඕනෑ. ඒ යුද්ධය අවසාන කිරීමට සම්බන්ධ වූ සෑම රණ විරුවෙක්ම, රණ විරුවෙක් හැටියට දකින්න ඕනෑ. මේ සභාව නියෝජනය කරන මේජර් ජනරාල් කෙනෙකුත් ඉන්නවා. එතුමාට සොල්දාදුවා කියලා කථා කරන එක පිළිබඳව එතුමන්ලා තීන්දු කරාවි. නමුත්, රණ විරුවාට, රණ විරුවා කියන්න අවශ්‍ය වැඩ පිළිවෙළ වර්තමාන නායකත්වය තුළ නැති එක පිළිබඳව මාත් කනගාටු වෙනවා.

අද ඔබතුමන්ලා මොකක්ද විකුණන්නේ? ඔබතුමන්ලා අද විකුණන්නේ හොරු අල්ලනවා කියන එක. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, අද චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා මේ සභාවේ කථා කළා. එතුමා මීට මාස දෙකකට කලින් හිරේ හිටියේ. ඔබතුමන්ලා හිරේ දාපු චාමර සම්පත් අද ඔබතුමන්ලාගේ පැටිකිරිය කිව්වා. මහින්දානන්ද මහත්මයා දැන් ඇතුළේ ඉන්නවා. හෙට-අනිද්දා එළියට එනවා. යහ පාලන ආණ්ඩුව ආවාට පස්සේ රාජපක්ෂ හොරුත් ඔන්න ඔය විධියටමයි ඇල්ලුවේ. මාසයයි, සතියයි, දෙකයි, හොරා ඇවිල්ලා යහ පාලනයට බැන්නා. ගෝඨාභය රාජපක්ෂ, මහින්ද මහත්මයා බලයට ආවාට පස්සේ යහ පාලනයේ හොරු අල්ලලා සතියෙන් දෙකෙන් එළියට දැම්මා. ඒක කරන්න ද ඔබතුමන්ලාට බලය දුන්නේ? ඔබතුමන්ලාට බලය දුන්නේ ඒ විධියට හොරු අල්ලන්නද? නැහැ නේ. ඒ නිසා ඊට වඩා එහා ගිය වැඩ පිළිවෙළක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ආනයන, අපනයන සියල්ල බිම වැටිලා තිබෙන්නේ, ගරු ඇමතිතුමා. ඔබතුමාට යාපනයට යන්න පුළුවන් ද දන්නේත් නැහැ. ඔබතුමා යාපනයේ මිනිස්සුන්ගෙන් ඡන්දය ගත්තාට මිනිසුන්ට කන්න ලුණු නැහැ. *[බාධා කිරීමක්]* ඒකට තමයි එන්න හදන්නේ. *[බාධා කිරීමක්]* ආනයන, අපනයන කිය කියා එහෙම සිරිතක් නැහැ. මේ රටට වෙලා තිබෙන විපැත්තිය කියන්නේ. හරිද? ඔබතුමන්ලා දැන් ආනයන සීමා පනවලා මේ L/C එකේ තිබෙන අර්බුදය ලිහන්න ගියාට වැඩක් වෙන්නේ නැහැ. ඇයි? ඔබතුමන්ලා අත යට ගනුදෙනු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලුණුවලින් ඔබතුමන්ලා කළේ මොකක්ද? මෙතුමන්ලා මෝදි අගමැතිතුමාට පසුගිය කාලයේ බැන්නාට, මෝදි අගමැතිතුමා අපේ රටට ආවාට පස්සේ කරට අත දාලා ඒ පැත්තේ යන්න දුන්නා. දැන් අපේ රටට ඉන්දියාවේ ලුණු ටික එනවා. දැන් ඉන්දියාවේ ලුණු කිලෝ එකක් කීයද? ඉන්දියාවේ ලුණු මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 80යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැව් ගාස්තු, වරාය ගාස්තු ඇතුළු සියලු දේ එකතු කරලා අපි ගණන් හදලා බැලුවාට පස්සේ ලුණු කිලෝ එකක් ලංකාවේ මුදලින් රුපියල් 130ට දෙන්න පුළුවන්. ලුණු කිලෝ එකක් රුපියල් 130යි. ඕනෑ නම් තව මොකක් හරි බද්දක් ගැහුවොත් රුපියල් 200ක් වෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
නැහැ, නැහැ. බද්දත් එක්ක රුපියල් 130ට දෙන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බද්දත් එක්ක රුපියල් 130යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 130ට දෙන්න පුළුවන් ලුණු කිලෝ එකක් දැන් රුපියල් 350ට, රුපියල් 400ට එළියෙන් ගන්න වෙලා තිබෙන්නේ මොකද? මම ඒකට උදාහරණයක් කියන්නම්. සුදු ලූනු වංචාව ගැන ඔබතුමන්ලා files හදලා තිබෙනවා නේ. මට මතක විධියට සුදු ලූනු කිලෝ එකක් සතොසෙන් රුපියල් 170ට එළියට දුන්නා. හැබැයි, වෙළෙඳ පොළෙන් සුදු ලූනු කිලෝ එකක් එළියට ආවේ රුපියල් 350ට, රුපියල් 400ට. ඒකට තමයි හඳුන්නෙත්ති මහත්මයලා, අනුර කුමාර මහත්මයලා ෆයිල් එකක් හදාගෙන ඇහුවේ, සුදු ලූනු කිලෝ එකක් රුපියල් 350ට දෙන්න සතොසට බැරි වුණේ ඇයි කියලා. එයාලා සුදු ලූනු කිලෝ එකක් රුපියල් 170ට වෙළෙඳ පොළට විකුණලා, වෙළෙඳ පොළේ ව්‍යාපාරිකයන්ට, කළු කඩකාරයන්ට ලාභ උපයලා, ඒ අත යට ගනුදෙනුව සිද්ධ කළා කියලා ෆයිල් හදාගෙන ඉන්න ඔබතුමන්ලාම ලජ්ජා නැතිව, හිරිකිත නැතිව අද මොකක්ද කරලා තිබෙන්නේ? "අපි පිරිසිදුයි, හොරා කන්නේ නැහැ" කියලා කෑමොර දෙන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේ උදවියත්, ඒ ඇමතිත් කළේ රාජපක්ෂ කරපු හොරකම නම්, රනිල් වික්‍රමසිංහලා කරපු හොරකම නම්, ලජ්ජයි නේ; හිරිකිතයි නේ. එහෙම නොවෙයි ද මේ වෙලා තිබෙන්නේ? බද්දත් එක්ක රුපියල් 130කට දෙන්න පුළුවන් ලුණු ටික ගෙනැල්ලා පෞද්ගලික සමාගම්වලට දීලා, එයාලා ඒක කුඩු කරලා රුපියල්

[ගරු චමින්ද විජේසිරි මහතා]

350ට, රුපියල් 400ට විකුණනකොට, ඒ අත යට ගනුදෙනුවෙන් සල්ලි එන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බව තමයි අපට විශ්වාස කරන්න වෙන්නේ ඔබතුමන්ලා කියපු විධියට; ඉතිහාසයේ ඔබතුමන්ලා files හදපු විධියට. ඉතිහාසයේ ඔබතුමන්ලා රාජපක්ෂ හොරු කියලා, වික්‍රමසිංහ හොරු කියලා හදපු files තිබෙනවා නම්, ඒ සුදු ලූනු වංචාව සිද්ධ වුණු ආකාරයටම අද මේ ලුණු වංචාවත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ යටතේ කෙරෙනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නම්, ඔබතුමන්ලා යන්නේත් ඒ ගමනේමයි; ඒ පාරේමයි. රටේ ජනතාව ඔබතුමන්ලාට බලය දුන්නේ ඒ දේ කරන්න නොවෙයි. දැන් ඔබතුමන්ලාගේ පැවැත්ම වෙනුවෙන් දවසින්, සතියෙන්, මාසයෙන් එක එක්කෙනා හිරේ දාලා එළියට ගන්නවා. හොඳට මතක තියා ගන්න, ජනතාවට යථාර්ථය තේරෙනකොට ගහලා පන්නපු ඉතිහාසයක් දේශපාලනයේ තිබෙන බව. ඒ තත්ත්වයට වැටෙන්න යන්න එපා, තමුන්නාන්සේලා. මොකද, මෙතැන ඉන්න උගතුන් වියතුන් කියාගත් බහුතරයක් අය අවංකවම මේ රටේ අනාගතය ගොඩ නඟන්න ඕනෑ කියන තැන ඉඳන් ආපු මිනිස්සු. අපි ඒක නැහැ කියන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තවත් විනාඩි 2ක කාලයක් පමණයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක, දෙකක කාලයක් දෙන්න.

ඒ සියලුදෙනාගේම දේශපාලනය විනාශ කරන පෙළක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ ඉදිරි පෙළේ ඉන්න බව අපි බය නැතිව කියනවා. ඔය හඳුන්නෙත්ති මහත්මයලා එදා මේ පාර්ලිමේන්තුවේ හොරකම, වංචාව, දූෂණය ගැන කථා කරලා, ඒ හොරාගේ නම කියලා මේ පාර්ලිමේන්තුවේම කැන්ටිමේ ඒ හොරාත් එක්ක දවල්ට කාපු අවස්ථා අපි දැකලා තිබෙනවා. පසු පෙළේ ඉන්න NPP එකේ මන්ත්‍රීවරුන්ටයි මම මේ කියන්නේ. එතුමන්ලා එදා හොරා ගැන කිව්වා; හොරාට බැන්නා; ඒ හොරාත් එක්ක මේ පාර්ලිමේන්තුවේ කැන්ටිමේ කෑවා. බොරු නම් මේ පාර්ලිමේන්තුවේ නිලධාරින්ගෙන් අහන්න. නිලධාරින් මැරිලා නැහැ; විශ්‍රාම ගිහිල්ලා නැහැ. ඒ අයගෙන් අහන්න. හඳුන්නෙත්ති මහත්මයා කෑවා. බිමල් රත්නායක මහත්මයාත් කෑවා. ඔබතුමන්ලාගේ ජනාධිපති අනුර කුමාර මහත්මයාත් මලික් සමරවික්‍රම එක්කයි දවල්ට කෑවේ, මහ බැංකුව හොරා කෑවා කියලා කෑ ගැහුවාට. එහෙම ඩීල් දමලා ඔබතුමන්ලාගේ ආත්ම ගරුත්වය කෙලෙසන මේ පාලනයට විරුද්ධ වෙන්න. අපි එදා දේශපාලන වශයෙන් ඒවාට විරුද්ධ වුණා. ඒ විරුද්ධ වීමේ හැකියාව අපි ගොඩ නඟලා තිබෙනවා. ඒ ගොඩ නැඟීම මේ රටේ, මේ සමාජයේ අනාගතය බවට පරිවර්තනය කරන්න අපි උත්සාහ කරනවා. මේ හොරකම, වංචාව, දූෂණය අද NPP ආණ්ඩුවේ පැවැත්ම කියලා හිතන්න එපා.

ඔබතුමන්ලා හාල් ප්‍රශ්නය විසඳපු බවක් කියනවා, ගරු ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමනි. නමුත්, හාල් ප්‍රශ්නය විසඳලා නැහැ. හාල් කිලෝ එක රුපියල් 240යි, 260යි. රටේ ජනතාව පුරුදු වුණා, හාල් කිලෝව රුපියල් 230ට, 240ට අරගෙන ගිහින් කන්න. පොල් ගෙඩිය රුපියල් 240යි. පොල් ප්‍රශ්නයත් විසඳිලා නැහැ. හැබැයි, ජනතාව ඔබතුමන්ලාට කිව්වාට, ඔබතුමන්ලාට මේක තේරෙන්නේ නැති නිසා, ඔබතුමන්ලාට මේක කරන්න බැරි නිසා ඒ අයගේ පිරිවැයෙන් ගළපාගෙන, සමහර අවශ්‍යතාවලින් විතැන් වෙලා ජීවන වියදම, ජීවන වැඩ පිළිවෙළ ඒ අනුව හදා ගැනීම NPP ආණ්ඩුව කරපු එකක් නොවෙයි. ඒක ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළක් නොවෙයි.

මේ මුහුද අවට ඉන්න හැමෝටම මුහුදු වතුර දාලා හරි බත් කන්න පුළුවන් වෙයි. නමුත්, මධ්‍යම කඳුකරයේ ඉන්න අපේ ජනතාවට ලුණු නැතිව බත් කාලා පුරුද්දක් නැහැ. හැබැයි, ඔබතුමන්ලාට නම් පුරුදු ඇති.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට තව විනාඩි 3ක කාලයක් ලබා දෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ලුණු නැතිව බත් කාලා ඔබතුමන්ලාට පුරුදු ඇති. ඇයි? සාමාන්‍ය ජන ව්‍යවහාරයේ කියන දෙයක් තමයි, බොරු කියන මිනිස්සුන්ට ලුණු රහ දැනෙන්නේ නැහැ කියන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි.

ආණ්ඩුවේ බහුතරයක් හැරිච්ච, හැරිච්ච පැත්තට බොරු කියනවා. ඔබතුමන්ලාගෙන් බහුතරයකගේ දිව හැරිච්ච හැරිච්ච පැත්තට බොරු කියනවා. ඒ නිසා ඔබතුමන්ලාට ලුණු අවශ්‍ය වෙන්නේ නැහැ. හැබැයි, මේ රටේ ජනතාවට ලුණු ටික කෑමට ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා දෙන්න. ඔබතුමන්ලාගේ නොහැකියාව පිළිගන්න. ඔබතුමන්ලාට මේ වැඩේ කරන්න බැහැ. ඔබතුමන්ලාට මේ වැඩේ බැරි වුණාට රටේ ජනතාවට දවසින් දවස බොරුව පෙන්නලා අර සුපුරුදු හොරකම කරන එක තමයි විළිලජ්ජා නැති වැඩේ.

අද එළියේ ඉන්නවා පාතාලය. මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, ලුණු පාතාලය, කන්ටේනර් පාතාලය, තවත් පැත්තකින් ඉන්නවා

හාල් පාතාලය. නැද්ද? එතුමන්ලාගේ හැසිරීම බලන්න. එතුමන්ලාගේ වැරැද්දක් කියන්න බැහැ. පුදුම තරහක් නේ යන්නේ. මන්ත්‍රීවරුන්ට කථා කරන්නේ බොහොම ආවේගශීලිව. එතුමන්ලා ආණ්ඩුවේ නැතිව විපක්ෂයේ ඉන්න කොට කටින් නම් ඕවා කරන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුව ගත්තාම කරන්න බැරි බව තේරුම් ගන්න ඕනෑ. අද එතුමන්ලාගේ නොහැකියාව එතුමන්ලාගේ මුවින්ම, හැසිරීමෙන්ම පෙනෙනවා. හඳුන්නෙත්ති ඇමතිවරයා ඔහොම හැසිරෙයි කියලා අපි බලාපොරොත්තු වුණේ නැහැ. එතුමාට අද මහ පාරේ බැහැලා යන්න බැහැ. මොකද, එතුමන්ලාට ඡන්දය දුන්නු උදවිය බලනවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ලංකාවේ ලුණු ටිකත් කෑමට ගන්න නැති වෙලා තිබෙනවා, ලුණු ටිකක් ගන්න පෝලිම්වල ඉන්න යුගයක් නිර්මාණය වෙලා තිබෙනවා නේද කියලා. මේ, සුනාමියක් ඇවිල්ලා නොවෙයි. කවුදෝ මන්ත්‍රීවරයෙක් කිව්වා, සුනාමිය ආපු කාලයේ ඔය ලුණු ලේවායවල් ටික ඔක්කොම යට වෙලාත් ලුණු නැති වුණේ නැහැ කියලා. මේ කොරෝනා වසංගතය ඇවිල්ලා නොවෙයි, වෙනත් වසංගතයක් ඇවිල්ලා නොවෙයි, ආර්ථික අර්බුදයක් ඇවිල්ලා නොවෙයි. මෙය, මාස හයේ NPP එකේ අකාර්යක්ෂම, වැඩ බැරි පාලනය නිසා, බොරු කිය කියා ඉන්න නිසා වෙච්ච දෙයක්. එහෙම නම්, ඒකට ප්‍රායෝගික වැඩ පිළිවෙළක් හදන්න.

ගරු හඳුන්නෙත්ති ඇමතිතුමාට මම යෝජනාවක් කරනවා. ඔබතුමා විපක්ෂයේ සිටිද්දී කිව්වා, "ඕක කරන්න බැරි නම් පිටකොටුවේ ඉන්න වෙළෙඳ ව්‍යාපාරිකයෙකුට දෙන්න" කියලා. දැන් ඔන්න ඔබතුමාට ඒකට අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. මොකද, ඔබතුමා අසමත් වෙලා තිබෙනවා. ඔබතුමා fail වෙලා තිබෙනවා. මේ රටේ පුරවැසියාට කෑමට ලුණු ටික වෙලාවට දෙන්න බැරි වෙලා තිබෙනවා. එහෙම නම් ඔබතුමා එදා කියපු කියමන දැන් ඔබතුමාටම ඉටු කරන්න පුළුවන්. හඳුන්නෙත්ති මහත්තයෝ, කොන්ද කෙළින් තිබෙනවා නම්, ඔබතුමාගේ ඇමතිකම දෙන්න, පිටකොටුවේ වෙළෙඳ ව්‍යාපාරිකයෙකුට. එයා ඒක හරියට කරයි. ඒක රයිගම් මුදලාලිට දුන්නා නම් හරි. අන්න එතැනත් තිබෙනවා, ගේම් එකක්. පුත්තලමට ඒ ලුණු ටික යැව්වේ නැත්තේ ඇයි? පුත්තලමට යැව්වේ නැහැ, හම්බන්තොටට යැව්වා. හම්බන්තොටින් ඔය ඔක්කොම කරන්න බැරි බව ඕනෑම ඔළ මොට්ටළයෙකුට තේරෙනවා නේ, ගයන්ත කරුණාතිලක හිටපු ඇමතිතුමනි. හම්බන්තොටින් විතරක් ඒක කරන්න බැහැ. හැබැයි ඒ ලුණු පුත්තලමට යැව්වේ නැහැ. පුත්තලමේ ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න අධ්‍යක්ෂවරයාගේ කොම්පැනියටයි ඒවා දෙන්නේ. ඒවාටත් ෆයිල් හැදෙයි. මේ ආණ්ඩුවේ ඉන්න උදවියට අපි කියන්නේ, ෆයිල් පෙන්න පෙන්න ඉඳලා සතියෙන් දෙකෙන් ඒ අය එළියට දමන වැඩ පිළිවෙළ හදන්න එපා කියලායි. අධිකරණ ඇමතිතුමා දැන් ඉන්නවා පිටුපස ආසනයක. ඔන්න අධිකරණ ඇමතිතුමා, වැඩ්ඩෙක් වෙනවා නම්, ඔබතුමා NPP එකේ නම්, JVP එකේ නොවෙයි නම්, ඔන්න ඔබතුමාට කරන්න තිබෙන වැඩේ. මේ හොරු හොරා කන විධිය ඔබතුමා දැන් තේරුම් ගන්න. තමන්ගේ කණ්ඩායමට මේක දීලා කොහොම හරි අත යට ගනු දෙනු කරගෙන, වැඩේ කරගෙන නිදහසේ ඉන්නවා. එහෙම නම්, එහෙම අය ඔබේ පිළේත් ඉන්නවා. අධිකරණ ඇමතිවරයා මෙන්න මේ සැබෑ හොරු ටික, අත යට ඩීල් දාන මේ වැඩ පිළිවෙළ, මේ හොරකම කරන අය නිවැරැදිව අල්ලලා හිරේ දාන්න පුළුවන් වැඩ පිළිවෙළ හදන්න. මොකද, ඔබතුමා NPP එකේ නේ. ඔබතුමා JVP එකේ නොවෙයි. ඔබතුමා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ දේශපාලන පක්ෂයේ නොවෙයි නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තවත් විනාඩියක් ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාගේ වෙලාවෙන් ද එතුමාට විනාඩියක් ලබා දෙන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒ වාගේම මම අහනවා, NPP එකේ නායකයා කවුද කියලා. මොකද, ඔබතුමන්ලා NPP එකේ නායකයා කවුද කියන එකත් පොඩ්ඩක් මේ සභාවට කියනවා නම් හොඳයි. එතකොට අපට NPP එකෙන් අහන්න පුළුවන්, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති මොනවාද කියලා. JVP එකේ ප්‍රතිපත්ති ගැන අහන්න දෙයක් නැහැ. මොකද, එයාලා දැන් ඒවා ඉටු කරලා ඉවරයි. දැන් එය මහ පොළොවේ පෙන්වනවා. මේ මිනිස් ඝාතන හරහා, මේ රටේ තිබෙන අකාර්යක්ෂම පාලනය හරහා එයාලා එළියට වීසි වෙලා ඉවරයි. හැබැයි, අවසානයේදීවත් NPP එකේ මේ උගත්, වියත් සමාජයට ඒ අයගේ ගරුත්වය රැක ගන්න නම්, ඔය ඇතුළේ තිබෙන නරකාදිය, බොරුව, මුසාව ගැන එළියට ඇවිල්ලා කියලා තමන්ගේ දූ දරුවන් එක්ක මහ පාරේ බැහැලා යන්න පුළුවන්, තමන්ගේ වෘත්තියේ නාමය, ගෞරවය ආරක්ෂා කර ගන්න පුළුවන් NPPකාරයෝ ටිකක් වෙන්න. හත් දෙයියනේ! එහෙම නැතුව මේ JVP එකේ රෙදි හෝදන්න යන්න එපා. JVP එකේ වහල් වැඩේ කරන්න යන්න එපා. JVP එක කරන මේ වැඩවලට උදවු කරන්න එපා. අපි තමුන්නාන්සේලාට - විශේෂයෙන්ම NPP කියාගත්තු උගත් කඳවුරට - අවවාද කරනවා. මොකද, ඒ කඳවුරට යම් දේශපාලන වුවමනාවක් තිබුණා, මේ රට නිවැරැදි තැනට ගෙන යන්න. එදා ගෝඨාභය මහත්මයා බලයට ගේන්න මේ NPP එකේ ඉන්න බොහෝදෙනා වැඩ කළ බව අපි දන්නවා. ඒ වෙලාවේත්, ඒ මොහොතේත් රට නිවැරැදි තැනට යයි කියන විශ්වාසය තිබුණා. හැබැයි, එතැනින් ඒක ඉටු නොවන විට මේ බොරුවට, මුසාවට, කයිවාරුවලට අද තමුන්නාන්සේලා හසු වෙලා තිබෙනවා. නමුත් සැබෑ යථාර්ථය තුළින් සමාජයට, රටට යහපතක් ගෙන එන්න පුළුවන්. ඒ සඳහා ඉදිරියට එන්න. එතැනට හයිය දෙන්න. එතැනට හයිය දෙන්න සමගි ජන බලවේගයේ චමින්ද විජේසිරි ඇතුළු අපි සමඟ තමුන්නාන්සේලාත් එකතු වෙන්න. මොකද, අලුත් වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑ. ඒ අලුත් වැඩ පිළිවෙළ සර්ව සාධාරණව මේ රටේ ජනතාවට පිළිගන්න පුළුවන් ඇත්තක්, යථාර්ථයක් වෙන්න ඕනෑ. අන්න ඒක කරන්න පුළුවන් හයිය මේ පාර්ලිමේන්තුව තුළින් අනාගතය වෙනුවෙන් නිර්මාණය විය යුතුව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ලුණු නැහැ, හාල් නැහැ, පොල් නැහැ. රටේ ජනතාවට තුන්වේල කන්න හම්බ වෙන්නේ බොහොම අමාරුවෙන්. හැබැයි, ඒකවත් නැති කරන තැනට මේ වර්තමාන ආණ්ඩුව මාස හයක් ගත වන කොට ක්‍රියාත්මක වෙලා තිබෙනවා නම්, මම හිතනවා ඔබතුමන්ලා ෆේල් කියලා. ඉතින් තමුන්නාන්සේලා අසමත් කියලා පිළිගන්න. ඒ වාගේම රටට අවශ්‍ය ආර්ථික යන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙළට හයිය දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ එකතු වෙලා ගොඩ නගන්න මේ NPP එකේ බුද්ධිමත් අයට අපි ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.28]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මාතෘකා හැටියට තිබෙන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ 2023 අංක 34 දරන විසර්ජන පනත යටතේ යෝජනා සම්මතයි. අද ඒවා අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, ඒක තමයි තහනම් වචනය. අද මාතෘකාව තමයි ලුණු. අද උදේ ඉඳලා මේ විවාදය අහගෙන ඉන්න කොට දැනුණු දේ තමයි ඒක. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වෙන මොකුත් මාතෘකා නැහැ. ඒ ගොල්ලන්ට තිබෙන එකම මාතෘකාව "ලුණු". නමුත් ඔය විපක්ෂයේ වසර 76ක් පාලනය කරපු පාලක පන්තියේ හිටපු නායකයන්ගෙන් අපි ප්‍රශ්නයක් අහනවා. ලුණු කියන්නේ මූලද්‍රව්‍යයක්, වේගයෙන් දිය වන දෙයක්. හැබැයි ලුණු ගැන කථා කරන ඔබ දීර්ඝ කාලීනව ඇති වන ප්‍රශ්නවලදී ඒ ලුණු ගබඩා කරලා තියා ගන්න, ලුණු සුරක්ෂිත කිරීමේ ආයතනයක්, ගබඩාවක් ගොඩනැගුවා ද? ඔබතුමන්ලා අවුරුදු 76ක කාලයක් තුළ එහෙම දෙයක් කළේ නැහැ. නමුත්, දැන් ලුණු ගැන කථා කරනවා.

විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මහා දේශප්‍රේමී ලීලාවෙන් JVP එක ගැන අපට උගන්වන්න එනවා. ඒ වාගේම, ජාතික ජන බලවේගය ගැන උගන්වන්න එනවා. නැහැ, මහත්වරුනේ, අපට උගන්වන්න එපා. අපි කවුරුවත් බෙදිච්ච, වෙන් වෙච්ච කණ්ඩායමක් නොවෙයි. අපි එකට එකතු වෙච්ච, සහෝදරත්වයෙන් බැඳුණු කණ්ඩායමක්. මාලිමාව ද JVP ද කියලා නොවෙයි, එකම ගමනක එකම ස්ථාවරයක ඉඳලා වැඩ කරන එකම මන්ත්‍රීවරුන්, සහෝදරවරුන් කණ්ඩායමක් තමයි මේ දෙකේම ඉන්නේ. ඒ නිසා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා, ඔබ අපට දේශපාලනය උගන්වන්න එන්න එපා කියලා; අපි උගන්වලා තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ කියලා. මේ ඉන්න සාතිශය බහුතරයක් හොඳ පක්ෂ දේශපාලන අදහසක් ඇතුව එචපු අය. හෙට අනිද්දාට ප්‍රාදේශීය සභාව ඇතුළේ ස්ථාපිත කරන ආයතනයේ ඉන්න මන්ත්‍රීවරයාත් මේ වාගේ හොඳම දේශපාලනය කියවා ගැනීමක් කර ගත්තු මන්ත්‍රීවරයෙක්. මොකද, එහෙම මන්ත්‍රීවරයෙක් තමයි අපි ප්‍රාදේශීය සභාවටත් යවන්නේ. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ, හොරට එහාට මෙහාට පනින, මන්ත්‍රීකම විකුණන, ස්වාධීනත්වයෙන් ඉන්න බැරි, වෙන වෙන අයට මුක්කු ගහන මන්ත්‍රීවරුන් බිහි කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. අපි එහෙම නොවෙන, මේ රටට ආදරය කරන මිනිස්සු හදපු දේශපාලන ව්‍යාපාරයක අයිතිකරුවෝ. ඒක නිසා අපට ඒ ගැන කියලා දෙන්න ඕනෑ නැහැ.

ඊළඟට, රාජපක්ෂ පවුලේ බොහෝ අය උදේ ඉඳලා මහා හඬින් අඬනවා, "රණ විරුවා" කියලා කිව්වේ නැහැ කියලා. අපි දැක්කා, රණ විරුවාට කරපු වැඩේ. වසර 30ක් තිබුණු යුද්ධය නිමා කරන්න නායකත්වය දුන් නායකයා කකුල් දෙකෙන් ඇදගෙන හිර ගෙදරට ගෙනියලා හිර කරගෙන වද දුන්නු රටේ පාලකයෝ හිටපු රටක තමයි ඔබ අප ජීවත් වෙන්නේ. විලිලජ්ජා නැතුව තවමත් කියන්න එනවා දේශප්‍රේමී රණවිරුවා පිළිබඳව. අපි හොඳට ඒක හඳුනනවා; හොඳට දන්නවා. ඒක නිසා තමයි රණවිරු උපහාර උත්සවයේදී ඒ ඓතිහාසික ගමන් මගේ ආපු, ඒ ඓතිහාසික කර්තව්‍යය කරපු සෑම රණ විරුවෙකුටම වේදිකාවට ආරාධනා කළේ අපිත් එක්ක එකට ඉඳලා ඒ රණවිරු උත්සවය පවත්වන්න. හැබැයි, ඔය දේශප්‍රේමීන් ලෙස කථා කරන අය ඡන්දය ඉල්ලුවා කියලා ඒ යුද්ධය කරපු නායකයාට වෛර කළා. වෛර කරලා ඔහු ගෙන ගොස් හිර ගෙදර දාලා වද දුන්නා. අපි එහෙම කරන්නේ නැහැ. දේශපාලනය වෙනස් එකක්. යමෙක් යම් වටිනා දෙයක් කළා නම්, ගෞරවාන්විත ක්‍රියාවක් කළා නම් ඔහුට ගෞරවය දෙන්න අපි කිසිසේත් පැකිළෙන්නේ නැහැ. අපි වෙන වෙන අය වාගේ වෛරීසහගතව ඔවුන් එක්ක ගනුදෙනු කරන්න සූදානම් නැහැ. අපි අවංක ලෙස ඔවුන්ට වටිනාකම දෙන්න ඕනෑ. අපි ඒ වටිනාකම දෙනවා. ඒක නිසා තමයි අපි ඔවුන්ට ආරාධනා කළේ, "එන්න, අපි සංවිධානය කරන රණවිරු උපහාර උත්සවයට ඔබත් අපත් එක්ක එකතු වෙන්න" කියලා. ඒ සියලුදෙනා එක්ක අපි ඒ උපහාරය, ඓතිහාසික වටිනාකම් සහිත ඒ රණ විරුවාටත් ඒ වාගේම ජීවමාන ඉන්න රණ විරුවාටත් දුන්නා. එහෙම දේශපාලන ව්‍යාපාරයක්, අපි. එහෙම නැතුව රණ විරුවා තමන්ගේ දේශපාලනයට විරුද්ධ වෙන කොට ඔහුට තඩිබාලා හිරගෙදරට දාන්නත්, තමුන්ට සමීප වෙලා සපත්තු ලෙව කනකොට ඒ ගැතිකමට ගරු කරන ව්‍යාපාරයක් නොවෙයි, අපි. ඊට වඩා දියුණු දේශපාලන කියවා ගැනීමක් සහිත දේශපාලන ව්‍යාපාරයක්, අපි.

අද උදේ ඉඳන් අඬනවා, කෑ ගහනවා, ගාමන්ට් එකක 1,400කට විතර රැකියා අහිමි වුණා කියන කතන්දරය එක්ක. ඊයේද, පෙරේදාද, අදද මේක පුන පුනා කියමින් ඉන්නවා. අපි ඔබෙන් අහනවා, මේ රැකියා 1,400 විතර ද අහිමි වුණේ? නැහැ. ඉතිහාසයේ ඔබතුමන්ලා තමයි මේ රටේ රෙදි පිළි කර්මාන්ත සියල්ල වහලා දැම්මේ. මේ රටේ දේශීය කර්මාන්ත බහුතරයක් තිබුණා. ඒ සියලු කර්මාන්ත වහලා දැම්මේ වසර 76ක් ඇතුළතදී විපක්ෂය පැත්තේ හිටපු නායකයෝ කියා ගන්නා අය. ඔවුන් මේ රටේ දේශීය කර්මාන්ත විනාශ කළා. පිහන් කර්මාන්තය ඉවර කළා. ලුණු කර්මාන්තයෙන් භාගයක් ඉවර කළා. සම්පූර්ණයෙන්ම පේෂ කර්මාන්තශාලා විනාශ කරලා දැම්මා.

අපි පාසල් යන කාලයේ කඩදාසි කර්මාන්තශාලාව බලන්නයි අප එක්ක ගෙන ගියේ. ඇහලුම් කර්මාන්ත නොවෙයි, ඒ දවස්වල රෙදි කර්මාන්තශාලා බලන්න අපි එක්ක ගෙන ගියා. දැන් ඒ කිසිවක් නැහැ. ඒ සියල්ල වසා දැමුවේ වෙන කවුරුවත් නොවෙයි. ඔය උදේ ඉඳලා මොරහඬ දෙන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ පක්ෂවල අය එකතු වෙලා තමයි ඒ වැඩේ කළේ. දැන් අපට කියනවා, මාස හයක් ඇතුළතදී මේවා ඔක්කෝම කරපල්ලා කියලා. ඔබතුමන්ලා බය නැතුව ඉන්න. අපට තව වසර හතරහමාරක් තිබෙනවා. ඒ වසර හතරහමාර අවසන් වෙන කොට මේක ඇතුළේ කෑ ගහන්න ඕනෑ නැහැ. එළියට ගිහිල්ලා කෑ ගහලා කියන්න, "මුන් රට කෑවා. දේශීය සම්පත් විකුණුවා" කියලා. අපි එදාට ඒ ගනුදෙනුව බලාගන්නම්. අපි ඔබට කැට තියලා කියනවා, අපි එහෙම කරන මිනිස්සු නොවෙයි කියලා. අපි මේ රටේ දේශීය සම්පත් ආරක්ෂා කරන, මේ රටේ දේශීය දේ වෙනුවෙන් පෙනී ඉන්න දේශපාලන ව්‍යාපාරයක්.

පසුගිය කාලයේ පොහොර ප්‍රශ්නයත් එක්ක මහා මොරහඬක් දුන්නා. හැබැයි, පොහොර ප්‍රශ්නයට උත්තරය අපි හොයා ගනිමින් ඉන්න වෙලාවක ඒ ඔක්කෝම අමතක කරලා දාලා වෙන කථාවක් අරගෙන ඇවිල්ලා කියවනවා. පසුගිය කාලයේ බිත්තර ගැන කථා කළා. අද බිත්තර ගැන කථා කරන්නේ නැහැ. විපක්ෂය දෛනික එදා වේල ටුවර් එකක තමයි දේශපාලනය කරමින් ඉන්නේ. මොකද, ඔබතුමන්ලාට දැක්මක් තිබුණා නම් වසර 76ක් ඇතුළතදී මෙවැනි පහත් ලෙස කඩා වැටිච්ච දේශපාලනයක් දක්වා තල්ලු වෙන්න ඕනෑ කණ්ඩායමක් බවට පරිවර්තනය වෙන්න ඕනෑ නැහැ. අපට මේක කරන්න බැරි නම්, අපි ජනතාවට

කියලා මේ වසර පහ අවසන් වෙන්න කලින් ගෙදර යනවා. හැබැයි, අපි ජනතාවට අද මෙතැන සිට කියනවා, 76 වසරක් පාලනය කරපු පාලකයෝ මේ රට විනාශ කළා කියලා. මේ රටේ දේශීය කර්මාන්ත බිඳ දැම්මා. තමන්ගේ සාක්කුවට සොච්චමක් දමා ගන්න ඕනෑ නිසා, විදේශ සමාගම්වලට කර්මාන්ත ටික විකුණුවා. ඒ නිසා අපි ඔබෙන් ගෞරවයෙන් ඉල්ලනවා, තවදුරටත් මේ ගැන කිය කියා අඳෝනා නඟන්න ලැහැස්ති වෙන්න එපා කියලා.

ඒ විතරක් නොවෙයි. අපි අහන්න ඕනෑ, මෙන්න මේ කාරණයත්. දැන් හොරකම ගැන කථා කළා නේ. ගරු සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා හොරෙක් කිව්වා. මේවාට කියන්න දේවල් නැහැ. අපි දන්නවා, මේ වසර 76 තුළ මේ රට පාලනය කරපු, 1977න් පස්සේ මේ රටේ බිහි වෙච්ච පාලකයෝ ඔක්කොම හොරකම් කළ බව. හැබැයි, ඒ හොරකම් කළේ ඉතා සූක්ෂම ලෙස. අපි ඒ සූක්ෂමව කරපු දෙයත් සොයමින් ඉන්නවා. වැඩිකලක් යන්න කලින් ඒ හොරු ටික අපි අත්අඩංගුවට ගන්නවා. ඉතා වගකීමෙන් මේක කියන්නේ. මම කිව්වත්, අනුර දිසානායක සහෝදරයා කිව්වත්, සරත් සහෝදරයා කිව්වත් අපි හැමෝම එක තීන්දුවක ඉඳලා වැඩ කරන්නේ. ඒක මම වගකීමෙන් කියනවා. තව පොඩි කාලයක් භය නැතුව ඉන්න. කවුද හොරු කියලා අපි තීන්දු කරන්නම්. ගරු සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා හොරෙක් නොවෙයි. එතුමා මේ රටට ආදරය කරන දේශප්‍රේමී නායකයෙක්. මොකද, මේ රට ජාතිවාදයෙන් වෙළලා, ආගම්වාදයෙන් වෙළලා, කුලවාදයෙන් වෙළලා, උඩ රට පහත රට ලෙස බෙදලා, විනාශ කරලා තිබුණු රටක්. මේ රට ඒකීය රටක් බවට පරිවර්තනය කිරීම ඇතුළේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මහ රුදාවක් තිබෙනවා. ඒගොල්ලෝ ඒක කියලා යනවා යන්න. දැන් උදේ ඉඳලා ගොඩක් අය බොහෝ කයිය ගැහුවා. දැන් ඒ කවුරුත් පෙනෙන්න නැහැ. ඒ අය මොකද කරන්නේ? තමන්ට තිබෙන විනාඩි දහයේ මෙතැනට ඇවිල්ලා කථාව පවත්වලා, ගෙදර ගිහිල්ලා කොම්පැනියේ වැඩ, ව්‍යාපාරයේ වැඩ, බස් කොම්පැනියේ වැඩ. දේශපාලනය කරන්න ඕනෑ එහෙම නොවෙයි. අපි මේ පාර්ලිමේන්තුවට ආවේ එහෙම දේශපාලනය කරන්න නොවෙයි. උදේ මෙතැන කෑ මොර දුන්නු බොහෝ දේශප්‍රේමී නායකයෝ දැන් කවුරුවත් නැහැ. තව විනාඩි 10කින් මෙතැන කථාවක් තිබෙන මන්ත්‍රීවරයා මෙතැනට ඇවිල්ලා, ඒ කථාවේදී බොරු ටිකක් කියලා යන්න ලැහැස්ති වෙනවා. අපි කියන්නේ එහෙම කරන්න කියලා නොවෙයි. සංවාදයක් හදා ගන්න. බොරුවක් කරන්න නම් ඔය ක්‍රමය හරි. සංවාදය කියන්නේ, face-to-face ඉඳලා අපි කියන දේ, අපේ අදහස, අපේ මතවාදයේ වැරැද්දක් තිබෙනවා නම් ඒකත් එක්ක හැප්පෙමු. ඒකත් එක්ක අපිත් එක්ක සටන් කරමු. එහෙම කරලා කවුද නිවැරැදි කියලා බලමු. එහෙම නැතුව කථාව කළා, "එදා වේල ටුවර්ස්" වාගේ තමන්ගේ ගෙදර ගිහිල්ලා ව්‍යාපාරය කර ගත්තා.

දැන් මෙතැනදී ව්‍යාපාරික මහා ප්‍රජාව සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කරන නායකයෝ කවුරුත් නැහැ. ඔක්කොම අය කථාව කරන්න විතරයි, පාර්ලිමේන්තුවට එන්නේ. ඒක තමයි එදාත් කළේ, ඒක තමයි අදත් කරන්නේ. අපේ රටේ ජනතාවට අපි කියන්න ඕනෑ, එහෙම දේශපාලන ව්‍යාපාරක මිනිස්සු තමයි අපිට මේ චෝදනා නඟමින් ඉන්නේ කියන එක.

ඒ විතරක් නොවෙයි, සතොස කාලා විනාශ කළේ කවුද, විකුණා දැම්මේ කවුද? ඇවර කරන්න සූදානම් කළේ කවුද? ඒ සියල්ල කළේ විපක්ෂය. වසර 76ක් ඇතුළේ මේ රටේ සමුපකාර ව්‍යාපාරය විනාශ කළා. 1972 සිට 1977 දක්වා කාලය තුළ හදලා තිබුණු සමුපකාර ව්‍යාපාරය, සතොස ව්‍යාපාරය විනාශ කළේ කවුද? හැබැයි, දැන් අපට වෙලා තිබෙන්නේ වඳුරන්ගෙන් බණ අහන්න වෙච්ච රටක මන්ත්‍රීකම දරා ගෙන ඉන්නයි. වඳුරු රැළක් එකතු වෙලා අපට බණ කියනවා. අපි ඉතින් උදේ ඉඳන් අහගෙන ඉන්න තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෑ, ඔබතුමන්ලා ලූණු ගැන කිව්වාත්, පොල් ගැන කිව්වත්, බිත්තර ගැන කිව්වත්, හාල් ගැන කිව්වත් ජනතාව ඔබතුමන්ලාට ප්‍රතිඵලය දීලා තවම උණුසුම අවසන් වුණේ නැහැ කියලා. මැතිවරණය අවසන් වෙලා සතියක් ගියේ නැහැ. තව මාසයකින් මැතිවරණයක් පැවැත්වූවත් ඔබතුමන්ලාට ලැබෙන ප්‍රතිඵලය ඕකයි. ඒ නිසා ජනතාවගේ මතය, ජනතාවගේ මනස, ලාංකීය රටේ ක්‍රියාත්මක වන දේශපාලන තත්ත්වය පිළිබඳ අදහසක් හදාගෙන, ක්‍රියාත්මක වෙන්න කියන ගෞරවනීය, සහෝදරාත්මක ඉල්ලීම කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 3.40]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கும் மற்றைய உறுப்பினர்களுக்கும் வணக்கத்தைக் கூறிக்கொண்டு, இந்தச் சந்தர்ப்பத்தைத் தந்தமைக்காக நன்றியையும் தெரிவித்துக் கொள்கிறேன். இன்றைய இந்த விவாத நாளிலே, இந்த ஆட்சி அமைக்கப்பட்டுக் கடந்த 6 மாத காலமாக நடந்த சில செயற்பாடுகளின் மீளாய்வு பற்றி பேசலாமென நினைக்கின்றேன். கடந்த பாதீட்டில் இந்த அரசாங்கத்தினால் பல வாக்குறுதிகள் வழங்கப்பட்டன. பாதீடும் நிறைவேற்றப்பட்டது. அடுத்து உள்ளூராட்சி மன்றத் தேர்தலும் முடிவுற்றிருக்கிறது. இந்தத் தேர்தலினூடாகத் தமிழ் மக்கள் பல விடயங்களைச் சொல்லியிருக்கின்றார்கள். உண்மையில் இந்தப் புதிய அரசு தமிழ் மக்களுக்கான பல விடயங்களில் நம்பிக்கையைக் கட்டியெழுப்புமென்ற எதிர்பார்ப்போடு நாம் இருந்தோம். ஆனால், அவ்வாறு நம்பிக்கையைக் கட்டியெழுப்புவதற்கான சந்தர்ப்பங்கள் இதுவரை முற்றுமுழுதாக உருவாக்கப்பட்டிருக்கவில்லை என்ற விடயத்தை மன வேதனையுடன் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

முதலாவது, தமிழ் மக்களின் காணி சார்ந்த விடயத்திலே அரசு பொறுப்புடன் நடந்துகொள்ள வேண்டிய தேவை இருக்கின்றது. கடந்தகால அரசின் செயற்பாடுகளைக் குற்றம் சொல்லுகின்ற இந்த அரசு, கடந்தகால அரசின் அமைச்சரவையின் அங்கீகாரத்துடன் நிறைவேற்றப்பட்ட வன இலாகா தொடர்பான தீர்மானங்களை நிறைவேற்றுவதிலே பாரிய முனைப்புக் காட்டுவதை மட்டக்களப்பு மாவட்டத்திலே காணக்கூடியதாக இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்திலே வாகரைப் பிரதேசத்தின் ஆறாம் கட்டை, ஏழாம் கட்டை மற்றும் கட்டுமுறிப்புப் பகுதிகளிலும், கிரான் பிரதேசத்தின் அக்குறாணை, முறுத்தானை பகுதிகளிலும், ஏறாவூர்பற்று பிரதேசத்திலே புல்லுமலைப் பகுதிகளிலும்

[ගරු ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

இருக்கின்ற காணிகளைப் அபகரிப்பதில் வன இலாகா காட்டுகின்ற முயற்சியைப் பார்க்கின்றபொழுது, அது தமிழ் மக்களுக்கான இருப்பிடத்தை இல்லாதொழிக்கின்ற செயற்பாடுகளாகவே காணப்படுகின்றது. அந்த மக்கள் வாழ்ந்த நிலங்கள், பயிர் செய்த நிலங்கள், விளையாடிய மைதானங்கள், அமைத்த கோவில்கள் போன்றவற்றை வன இலாகா பிடிப்பதைப் பார்க்கின்றபோது, இவற்றை அரசாங்கம் செய்ய நினைக்கின்றதா அல்லது அரச அதிகாரிகள் முன்னின்று நடத்துகின்றார்களா? என்ற சந்தேகம் ஏற்படுகின்றது.

கடந்த மார்ச் மாதமளவில் வன இலாகாவினரால் குடிமக்கள் தாக்கப்பட்டமை பற்றிய விடயத்தை இந்தப் பாராளுமன்றத்திலும் அமைச்சுசார் ஆலோசனைக் கூட்டத்திலும் எழுப்பியபோது அதற்குரிய தீர்வு கொடுக்கப்படுமென்று கூறப்பட்டிருந்தபோதும், தொடர்ச்சியாக இவ்வாறான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. காணி விடயத்திலே தமிழ் மக்களுக்கு மிகுந்த சந்தேகங்களை ஏற்படுத்துகின்ற நிகழ்வுகள் படிப்படியாக நிகழ்ந்து வருகின்றன. முன்னைய ஆட்சிக்காலத்தின் செயற்றிட்டங்களை விமர்சிக்கின்ற இந்த அரசு, முன்னைய காலத்தில் நிறைவேற்றப்பட்ட அமைச்சரவைத் தீர்மானத்தை நிறைவேற்றுவதில் மட்டும் மிகுந்த அக்கறை காட்டுகின்றது என்பதை மாவட்டத்திலுள்ள தேசிய மக்கள் சக்திப் பாராளுமன்ற உறுப்பினர்களும் அறிந்திருப்பார்கள். தற்போது, உண்மையாகவே எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுத் தவிசாளர் அவர்கள் வன இலாகாவின் செயற்பாடுகளை நிறுத்துமாறு ஓர் அறிவிப்பை விடுத்திருக்கின்றபோதும் அவர்கள் நிறுத்துவதாக இல்லை; தொடர்ச்சியாக முன்னெடுத்துச் செல்கின்றார்கள்.

கடந்த காலத்தில் ஏற்பட்ட யுத்த நிலைமை காரணமாக மக்கள் காணிப் பத்திரங்களை இழந்திருக்கின்றார்கள். அந்த மக்கள் தங்களுடைய நிலங்கள் என்று சொல்வதற்கு ஆதாரங்கள் இல்லாதிருக்கும் நிலைமையில், அவற்றைப் பெற்றுக்கொள்வதில் பாரிய பிரச்சினை இருக்கின்றது. அதற்கப்பால், தற்போது காணி விடயத்திலே வடக்கிலே கொண்டுவரப்படுகின்ற சட்ட ஏற்பாடுகள்கூட தமிழ் மக்களுக்குக் காணிகளைப் பெற்று கொடுப்பதற்காகவா அல்லது தமிழ்ப் பிரதேசங்களில் இருக்கின்ற காணிகளைப் பறிப்பதற்காகவா என்ற ஐயப்பாடு மிகத் தெளிவாக எழுகின்றது. மக்களுக்குக் காணிகளைப் பெற்றுக்கொடுப் பதற்கான நிகழ்வுகள் என்றால், அவற்றை அவர்களுக்கு உரிய முறையில் பெற்றுக்கொடுக்க வேண்டுமேயொழிய, உரிமை கோராத காணிகளைப் பறித்தெடுப்பதற்கான நிகழ்வுகள் நடந்தேறிவிடக்கூடாது என்பதிலே நாம் மிகத் தெளிவாக இருக்கின்றோம். நிலம் சம்பந்தமான விடயங்களிலே இன்றைய அரசும் மிக மெத்தனமான போக்கை அல்லது தமிழ் மக்களுக்கு அநீதி இழைக்கின்றபோக்கையே கடைப்பிடிக்கின்றதா என்ற மிகப்பெரும் சந்தேகம் எழுந்திருக்கின்றது.

அடுத்து, தமிழ் மொழிமூலமான பாடப் புத்தகங்களிலே, வரலாறுகளிலே தமிழ்க் கலாசாரம் இல்லாதொழிக்கப் பட்டிருக்கின்றது. இன்று ஒரு பத்திரிகையாசிரியர் எழுதியவாறு வரலாற்றுப் பாடப் புத்தகத்திலிருந்த 'யாழ்ப்பாண இராச்சியம்' என்ற பகுதி நீக்கப்பட்டிருக்கிறது. மிகத் தொன்மையும் பெருமையும் கொண்ட யாழ்ப்பாண இராச்சியம் மற்றும் குளக்கோட்டன் ஆண்ட திருகோணமலை இராச்சியம் சம்பந்தமான விடயங்கள் மிகத் தெளிவான முறையிலே திட்டமிட்டு நீக்கப்படுவது தமிழ் மக்கள் மத்தியிலே சந்தேகத்தையும் பயத்தையும் கிலேசத்தையும் ஏற்படுத்தியிருக்கின்றது. ஆகவே, சமத்துவத்தையும் நல்லாட்சித் தன்மையையும் பேசுகின்ற அரசு, *[இடையீடு]* அதை நீக்குவதற்கான எந்தவொரு நடவடிக்கையையும் முன்னெடுக்கக் கூடாது. நல்லெண்ணத்தை வெளிப்படுத்த வேண்டிய பொறுப்பு அரசுக்கு இருக்கின்றது. அந்த முயற்சிக்கான ஆரம்பம் இந்த அரசிலே தோற்றுவிக்கப்பட வேண்டுமென்பதுதான் எமது எதிர்பார்ப்பாக இருக்கின்றது.

தற்போதுகூட பல்கலைக்கழகங்களில் வழங்கப்படுகின்ற சுற்றுநிருபங்கள் தமிழ் மொழியில் வழங்கப்படுவதற்கான முற்றுமுழுதான சாத்தியக்கூறுகளற்ற நிலை காணப்படுகின்றது. தமிழ் மொழிமூலப் பாடங்களுக்காக நடைபெறுகின்ற பரீட்சைகளிலே சிங்களச் சொற்கள் புகுத்தப்படுகின்றபோது, அந்தப் பரீட்சாத்திகளுக்குப் பாரிய நெருக்கடிகளை உருவாக்குகின்ற சந்தர்ப்பம் மிக அதிகளவாக ஏற்படுகின்றது. இது சம்பந்தமாக நாம் உயர் கல்வி அமைச்சினூடாகவும் எமது முறைப்பாட்டைத் தெரிவித்திருந்தோம். அதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டதா என்ற விடயங்கள் இங்கு முன்வைக்கப்பட்டிருக்கவில்லை. ஆகவே, இந்த விடயங்களிலே தமிழ் மக்களுக்கு ஒரு நியாயமான, நீதியான தீர்வினைப் பெற்றுக்கொடுக்கவேண்டிய மிகப்பெரிய பொறுப்பு சமத்துவத்தைப் பேசுகின்ற தேசிய மக்கள் சக்திக்கும் இந்த அரசாங்கத்திற்கும் இருக்கின்றது.

அதற்கப்பால், நாம் கிழக்குப் பல்கலைக்கழகத்தின் பேரவை உறுப்பினர் நியமனம் தொடர்பாகவும் பலமுறை இங்கு முறையிட்டிருந்தோம்; உயர் கல்வியமைச்சராக இருக்கின்ற கௌரவ பிரதமருக்கும்கூட இவ்விடயங்களைத் தெரிவித்திருந்தோம். ஆனால், அது சம்பந்தமாக எந்தவிதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்படவில்லை. பல்கலைக்கழகங்களுக்கு நாடளாவிய ரீதியிலே பேரவை உறுப்பினர்கள் நியமிக்கப்படுவதாகக் கூறப்பட்டபோதும், தென்னிலங்கையிலே இருக்கின்ற பல்கலைக்கழகங்களிலே தமிழ் மொழி சார்ந்த அறிவுஜீவிகள் நியமிக்கப்படுவதற்கான எந்த நடவடிக்கையும் எடுக்கப்பட்டிருக்கவில்லை. இவ்வாறான நடவடிக்கைகள் எதிர்காலத்திலே உங்கள் அரசின்மீதும் உங்கள் கட்சிமீதும் தமிழ் மக்களுக்குப் பாரிய அவநம்பிக்கையைத் தோற்றுவிக்கும் என்பதில் ஐயமில்லை. ஆகவே, இவ்வாறான செயற்பாடுகளை நீக்குவதற்காக நீங்கள் எந்த விதமான நடவடிக்கைகளை எடுக்கின்றீர்கள் என்பதை மிகத் தெளிவாகச் சொல்ல வேண்டும்.

அதற்கப்பால், ஒரு விடயத்தை நான் இங்கு குறிப்பிட வேண்டும். கடந்த தேர்தல் காலங்களிலே வடக்கு, கிழக்குப் பகுதிகளுக்குத் தற்போதைய சனாதிபதியிலிருந்து அமைச்சர்களாக இருக்கின்றவர்கள்வரை பலரும் படையெடுத்திருந்தார்கள். ஆனால், தமிழ் மக்களுக்குத் துன்பம் ஏற்படுகின்றபொழுது அங்கு அமைச்சர்களைக் காண முடியாதிருக்கின்றது. கடந்த மே 18இல் முள்ளிவாய்க்கால் நினைவு தினம் தமிழ் மக்களால் அனுஷ்டிக்கப்பட்டது. போரின்போது தமிழ் மக்கள் இன ரீதியாக அழித்தொழிக்கப்பட்ட சம்பவத்தை அன்று நினைவு தினமாக வட, கிழக்கிலே அனுஷ்டித்தார்கள். அந்த இடத்திலே உங்களுடைய கட்சி சார்ந்த, அந்த மாவட்டத்திற்குரிய தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கவில்லை; எந்த அமைச்சர்களும் வந்திருக்கவில்லை. சற்றே யோசித்துப் பாருங்கள்! வாக்குகள் தேவைப்படுகின்றபொழுது படையெடுத்து வருகின்ற நீங்கள், தமிழ் மக்களுக்கான துன்ப

நிகழ்வுகளிலே ஏன் பங்கேற்க மறுக்கின்றீர்கள்? உங்களுக்குத் தமிழ் மக்களின் வாக்குகள் மட்டுமா தேவைப்படுகின்றது? என்ற சந்தேகத்தையும் தமிழ் மக்கள் சார்பாக நான் முன்வைக்க விரும்புகின்றேன்.

கடந்த மே 18இல் பல்வேறு வகையான அசௌகரியங்கள் நிகழ்ந்திருந்தன. நினைவுகூருகின்ற நிகழ்வு நடைபெறுகின்ற அந்த நாளை இனவழிப்பு நாளாகவே நாம் பார்க்கவேண்டிய தேவையிருக்கின்றது. கொத்துக்கொத்தாகத் தமிழ் மக்கள் கொன்றொழிக்கப்பட்ட அந்த நிகழ்வை நாம் இனவழிப்பாகப் பார்க்கவேண்டிய தேவை மிக முக்கியமாக இருக்கின்றது. அதைப் பற்றி பேசுகின்றபோது அல்லது அதுபற்றி உரைக்கின்றபொழுது அதற்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதாக அமைச்சர் கூறுவது, தமிழ் மக்களது இந்த அரசாங்கத்தின்மீதான நம்பிக்கையைச் சிதைப்பதாக இருக்கின்றது. தாக்கப்பட்டவனைத் தண்டிப்பதா, தண்டித்தவனை விசாரிப்பதா என்பதற்கு அப்பால், தாக்கப்பட்ட தமிழ் இனத்தையே மீண்டும் மீண்டும் நீங்கள் இவ்வாறான ஒரு நிலைமைக்கு இட்டுச்செல்வது, தமிழ் மக்கள் மீதான ஒரு கெடுபிடி தொடர்ந்தும் கொண்டுசெல்லப்படப் போகின்றதா? என்ற ஒரு கேள்வியை எழுப்புகின்றது.

தமிழ் மக்களின் கலாசாரம், தமிழ் மக்களின் மொழி மற்றும் அவர்களின் நிலம் ஆகியன ஒன்றுபட்ட இந்த இலங்கைக்குள்ளே பாதுகாக்கப்படாவிட்டால், தமிழ்த் தேசிய இனம் எவ்வாறு உங்கள்மீது நம்பிக்கை வைத்துத் தொடர்ந்து செல்ல முடியுமென்பது ஒரு கேள்விக்குரிய விடயமாகவே இருக்கின்றது. ஆகவே, அன்பான சகோதரர்களே, நீங்கள் இந்த விடயத்திலே உங்கள் கொள்கைகளை மாற்றிக்கொள்ள வேண்டும். வெறுமனே வாக்கு அரசியலில் மட்டும் ஈடுபடாது, இந்த இலங்கையிலே வாழ்கின்ற தமிழ் மக்கள் சமமான உரிமையுடன் வாழ்வதற்கு உகந்த சூழ்நிலையை ஏற்படுத்திக் கொடுப்பதற்கும் முன்வருவீர்கள் என்ற நம்பிக்கையுடன் எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.49]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறக்குமதி மற்றும் ஏற்றுமதிச் சட்ட ஒழுங்குவிதிகள் சம்பந்தமான இன்றைய இந்த விவாதத்திலே வாகன இறக்குமதி தொடர்பாக இந்த இடத்தில் இருக்கும் சக உறுப்பினர்களுக்கு எனது கருத்துகளைக் கூறலாம் என நினைக்கின்றேன். இதுவரை காலமும் வாகனங்களை நாட்டுக்குள் இறக்குமதி செய்தால், இந்த நாட்டின் டொலர் பற்றாக்குறை அதிகரித்துவிடும் என்று கூக்குரலிட்ட எதிர்க்கட்சியினர், இன்று வாகனங்களை இறக்குமதி செய்திருக்கின்றனர். அதேநேரம், 50 இலட்சத்திற்குக் குறைவான பெறுமதியுடைய வாகனங்களுக்கு Luxury Taxஐ நீக்கி, சாதாரண மக்களும் வாகனங்களைக் கொள்வனவு செய்யக்கூடிய ஒரு நிலையை நாட்டில் நாம் ஏற்படுத்தியிருக்கின்றோம். இன்று நாட்டில் சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை அதிகரித்து வருகின்றது. அதனால் புதிய வாகனங்கள் சுற்றுலாப் பயணிகளுக்குத் தேவை. அதன் நிமித்தம் சாதாரண மக்களும் அந்த வாகனங்களைப் பெற்று, இந்த நாட்டின் சுற்றுலாப் பயணிகளுக்குச் சேவையினை வழங்கும்போது, இந்த நாட்டுக்குப் போதிய டொலர் வருமானத்தை ஈட்ட முடியும். எனவேதான் சாதாரண மக்களும் வாகனங்களை இலகுவாகக் கொள்வனவு செய்வதற்கு ஏற்றவகையில், 50 இலட்சத்திற்குக் குறைந்த வாகனங்களுக்கு நாங்கள் Luxury Taxஐ நீக்கி இறக்குமதி செய்திருக்கின்றோம்.

இன்று எதிர்க்கட்சி உறுப்பினர்கள் பலரும் இங்கு உப்பைச் சுட்டியே பேசினார்கள். அவ்வாறு கூச்சலிட்டு இந்தச் சபையில் உரையாற்றிவிட்டுப் பின்னர் எல்லோரும் வீட்டுக்கு அல்லது வியாபாரம் பார்ப்பதற்குச் சென்றுவிட்டார்களோ தெரியவில்லை. ஒரு விளம்பர நிலையமாகவும், மக்களைக் குழப்பும் விதமான கருத்துகளைத் தெரிவிக்கவுமே எதிர்க்கட்சி அரசியல்வாதிகள் இந்தப் பாராளுமன்றத்தைப் பயன்படுத்துகின்றார்கள். இன்று நாட்டில் நிலவும் நெருக்கடி நிலைக்குக் காரணமே இந்த நாட்டிலிருந்த முன்னைய ஆட்சியாளர்கள்தான்.

உண்மையாகவே பல புலம்பெயர் தேசங்களிலிருந்து வெளிநாட்டு முதலீட்டாளர்கள் எமது நாட்டில் முதலீடு செய்ய வந்திருந்தபோது, அவர்களிடம் இவர்கள் தரகுப் பணங்களைக் கேட்டிருக்கின்றார்கள். இன்று வட மாகாணத்தில் எமது காரியாலயத்திற்குப் பலர் வந்து, "நாங்கள் உப்புத் தொழிற்சாலையை ஆரம்பிப்பதற்காக முன்னைய அரசாங்கத்திடம் கதைத்திருக்கின்றோம்; அவ்வாறு கதைக்கும்போதே அவர்கள் எம்மிடம் தரகுப் பணம் கேட்டார்கள்" என்று கூறியிருக்கின்றார்கள். இன்று மீண்டும் அவர்கள் உப்புத் தொழிற்சாலையை அங்கு ஆரம்பிப்பதற்குப் பல இடங்களை அடையாளம் கண்டிருக்கின்றார்கள்; நாங்கள் அதனை முன்னெடுப்பதற்குத் தீர்மானித்திருக்கின்றோம்.

நாங்கள் ஆட்சி அமைத்து ஏழு மாதங்களாகின்ற நிலையில் ஒன்றைக் கூற விரும்புகின்றோம். எமது இந்த ஆட்சி ஐந்து ஆண்டுகளுக்கல்ல, அதற்கு மேலும் பல ஆண்டுகள் நீடித்து நிலைநிற்கும்! ஏனென்றால், மக்கள் நேயமுள்ள வகையில் நாங்கள் செயற்படும்போது படிப்படியாக மக்களுக்கு நம்பிக்கை ஏற்படும். ஆனாலும், இன்று மக்களுக்குப் பயம் ஒன்று இருக்கின்றது. ஏனென்றால், 76 ஆண்டுகளாக மக்களைப் பயமுறுத்தி வைத்திருந்த ஆட்சியாளர்கள்தான் இந்த நாட்டில் இருந்துள்ளார்கள். அதனால் ஒரு சிறு சம்பவம் ஏற்பட்டவுடனே மக்களுக்குப் பயம் ஏற்படுகின்றது. அதற்கு சிறந்த உதாரணமொன்றைக் கூறுகின்றேன். "எதிர்வரும் காலத்தில் இந்த நாட்டில் எரிபொருள் தட்டுப்பாடு வரப்போகின்றது" என்று எதிர்க்கட்சி உறுப்பினர்கள் அண்மையில் ஒரு மாய விம்பத்தை உருவாக்கினார்கள். அவ்வாறு 'தட்டுப்பாடு' என்று கூறியவுடனே, பயத்தின் காரணமாக தமிழ் மக்கள், சிங்கள மக்கள், முஸ்லிம் மக்கள் என்ற இன பேதம் இல்லாமல் மக்கள் உடனடியாக வரிசை யுகத்தை மீண்டும் நாடினார்கள்.

ஏனென்றால், முன்பு இருந்த ஆட்சியாளர்கள் நாட்டு மக்களுக்கு 76 ஆண்டுகளாகப் பயத்தை ஊட்டித்தான் அரசியல் செய்தார்கள். அதனால் ஒரு சம்பவம் நிகழ்ந்தவுடன் திரும்பவும் இப்படி வந்துவிடுமா? நாட்டில் யுத்தம் ஏற்பட்டுவிடுமா? என்ற பயம் மக்கள் மத்தியில் இருக்கின்றது. அந்தப் பயத்தை நீக்கும்வகையிலும் எமது ஆட்சியில் இன நல்லிணக்கத்தை ஏற்படுத்த வேண்டிய கடப்பாட்டின் நிமித்தமும் அரசாங்கம் இன்று செயற்பட்டு வருகின்றது. எதிர்க்கட்சி உறுப்பினர்கள் இந்த நாட்டு மக்களின் பயத்தை வைத்துக்கொண்டு அரசியல்

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

செய்கின்றார்கள்! உப்பு இல்லாமல் போகின்றது, உப்பு விலை கூடிவிட்டது என்று உப்பை வைத்து அரசியல் செய்கின்றார்கள்! ஆனால், முன்னைய காலத்தில் சமைப்பதற்கே நாட்டில் எரிவாயு இல்லாமல் இருந்தது. ஆனால், தற்போது எமது அரசாங்கம் அந்த நிலையிலிருந்து நாட்டை மீட்டு, நாட்டின் பொருளாதாரத்தை ஸ்திரமான நிலைமையில் வைத்திருக்கின்றது.

இன்று யாழ்ப்பாணத்தை எடுத்துக்கொண்டால், அங்கு எமது அரசாங்கம் அபிவிருத்தி வேலைகளை மேற்கொள்கின்றது. ஏனென்றால், எமது யாழ்ப்பாண மாவட்டம் 30 வருட யுத்தத்திற்கு முகம் கொடுத்திருக்கின்றது. தென்பகுதியைவிட நாங்கள் 30 வருடம் அபிவிருத்தியில் பின்னடைந்திருக்கின்றோம். அதனால் எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் வட மாகாணத்தின் அபிவிருத்திக்கென அதிகளவான நிதிகளை விடுவித்துள்ளது. அதேநேரம், வட மாகாணத்தில் சர்வதேச விளையாட்டு மைதானம் ஒன்று உருவாக்கப்பட வேண்டுமென்ற நிலைப்பாடு இருக்கின்றது. யுத்தம் முடிந்து 16 ஆண்டுகளாக இன்று எதிர்க்கட்சியில் உள்ள உறுப்பினர்கள் - இந்த நாட்டை ஆண்டவர்கள் - வட மாகாணத்திற்கு எதையும் செய்யவில்லை.

ஏனென்றால், வட மாகாணத்தை அபிவிருத்தி செய்யும் இலக்குடன் அவர்கள் செயற்படவில்லை. இனவாத ரீதியில் அவர்கள் செயற்பட்டார்கள்; இனவாதம் கதைத்துக் கதைத்தே ஆட்சியைக் கொண்டு சென்றார்கள்; நாட்டை அபிவிருத்தி செய்யவில்லை. இன்று எமது அரசாங்கமானது சிறந்த முறையில் பக்கச் சார்பு இல்லாமல் தமிழ், சிங்களம், முஸ்லிம் மக்கள் என அனைத்து மக்களின் அபிவிருத்தியையும் நாட்டின் அபிவிருத்தியையும் இலக்காகக்கொண்டு செயற்படுகின்றது. ஏனென்றால், இந்த நாட்டில் இன நல்லிணக்கம் ஒன்று ஏற்படும் பட்சத்தில்தான் இலங்கையை முன்னேற்றப் பாதையில் இட்டுச்செல்ல முடியும் என்பதில் எமது அரசாங்கத்திற்குத் திடமான நம்பிக்கை இருக்கின்றது.

அதேநேரம், இன்று எமது நாட்டின் ஜனாதிபதி அவர்கள், இராணுவ வீரர்களை மரியாதை செய்யும்போது, முதலில் காயமடைந்த இராணுவத்தினரிடம் சென்றிருந்தார். அதன் பின்னர் அவர்களின் பெற்றோரைச் சந்தித்திருந்தார். அவ்விடத்தில் அவர் தமிழ் மக்களையும் பாதிக்காத வகையில் ஆற்றிய உரையை இனவாதம் இல்லாத ஒரு சிறந்த உரையாக வட மாகாணத்தில் பார்க்கின்றார்கள். ஆனால், தமிழ் அரசியல்வாதிகள் திரும்பவும் இனவாதத்தைத் தூண்டும் விதமாகச் செயற்படுகின்றார்கள். அது கடந்த உள்ளூராட்சிச் சபைத் தேர்தலிலும் வெளிப்பட்டது. எமது பிரதேசத்தில் 'NPP ஆதரவாளர்கள் அணி' என்ற பெயரில் போலித்துண்டுப் பிரசுரங்களை விநியோகித்தார்கள். எவ்வாறு என்றால், தமிழ் மக்கள் கட்டாயமாகப் பௌத்த கொள்கையைப் பின்பற்ற வேண்டுமென்ற ஒரு போலிப் பிரச்சாரத்தினை வட மாகாணத்தில் செய்திருந்தார்கள்.

முன்னைய காலத்தில் ஆளும் கட்சியில் இருப்பவர்கள்தான் போலிப் பிரசாரத்தைச் செய்வார்களேயொழிய, எதிர்த்தரப்பில் இருப்பவர்கள் அப்படிச் செய்வதில்லை. எமது எதிர்த் தரப்பில் இருக்கும் தமிழ்க் கட்சிகள் இவ்வாறான போலிப் பிரசாரங்களைச் செய்தார்கள். நாங்கள் அந்தத் தேர்தல் களத்தில் எந்தவிதமான போலிப் பிரசாரத்தையும் செய்யவில்லை. எமது மாண்புமிகு ஜனாதிபதி அவர்கள், யாழ்ப்பாணத்திற்கு வந்தபோது, "வட மாகாணத்தில் அதிகளவான வேலை வாய்ப்பு இருக்கின்றது. முப்பதாயிரம் வேலை வாய்ப்பு இனங்காணப்பட்டிருக்கின்றது. அதிலும் பதினாறாயிரம் வேலை வாய்ப்பு வட மாகாணத்தில் இருக்கின்றது" என்று கூறியிருந்தார். அதற்காக நாம் மக்கள் மத்தியில் போய் "உங்கள் bio-dataஐத் தாருங்கள், உங்களுக்கு வேலை தருகின்றோம்" என்று போலிப் பிரசாரம் செய்யவில்லை. நாங்கள் கொள்கை ரீதியாக, தர்க்கரீதியாக மக்களுக்குத் தெளிவு படுத்தினோம். ஆனால், இந்தப் போலிப் பிரசாரங்களைக் கண்டு தமிழ் மக்கள் ஏமாறவில்லை என்பதை நாங்கள் திடமாகக் கூறுகின்றோம். ஏனென்றால், வட மாகாணத்தில் போலிப் பிரசாரம் மேற்கொள்ளப்பட்டபோதும், தமிழ் மக்கள் எங்களை இரண்டாவது இடத்தில் வைத்திருக்கின்றார்கள். இந்த அரசியல்வாதிகள் எங்காவது தொங்குவதற்கு இடம் கிடைத்தால், அதில் தொங்கிக் குளிர் காய்வது நன்றாகத் தென்படுகின்றது.

" தேசிய மக்கள் சக்தி அரசாங்கம் காணிகளைச் சுவீகரிக்கப்போகின்றது" என்று பலர் இன்று கூறுகின்றார்கள். இந்த விடயத்தில் மக்கள் நலன் சார்ந்துதான் நாங்கள் செயற்படுகின்றோம் என்பதைக் கூறுகின்றோம். ஏனென்றால், யாழ்ப்பாணத்தை எடுத்துக்கொண்டால், அங்கு காணிப் பிரச்சினையானது பல இன்னல்களைக் கொடுக்கின்றது. பலர் உறுதிப்பத்திரங்கள் இல்லாத நிலையில் விவசாயம் செய்கின்றனர். அந்தக் காணிகளுக்கு உறுதி அந்தஸ்து வழங்கப்படவில்லை. அதுபோல், அங்குள்ள பலர் தமது உறுதிகளைத் தொலைத்து விட்டார்கள். அதுமட்டுமன்றி, ஒரு வீட்டுக்கு இரண்டு உறுதிப்பத்திரங்கள் இருக்கின்ற நிலையும் காணப்படுகின்றது. சட்டத்தரணிகள் நுட்பமான முறையில் இரண்டு உறுதிப்பத்திரங்களைத் தயாரித்துள்ளமையால், நீதிமன்றத்தில் வழக்குகள் நடைபெறுகின்றன. அதேநேரம் யுத்தம் காரணமாக இடம்பெயர்ந்து, புலம்பெயர் தேசங்களில் வசிக்கின்றவர்களின் ஆதனங்கள்கூட முன்னைய அரசாங்கத்தின் ஆதரவுடன் இயங்கியவர்களால் அபகரிக்கப்பட்டிருக்கின்றன. உதாரணமாகச் சொன்னால், யாழ்ப்பாணத்திலுள்ள ஸ்ரீதர் திரையரங்கு தனிநபரொருவருக்குரிய ஆதனம். குறித்த ஆதனத்தை முன்னைய அரசாங்க ஆட்சிக் காலத்தில் அமைச்சராக இருந்தவர் அரசாங்கத்தின் ஆதரவுடன் சுவீகரித்து வைத்துக் கொண்டுள்ளதோடு, இன்று வரையில் அதனைக் கையளிக்கவில்லை. அதேபோன்று அந்த ஸ்ரீதர் திரையரங்கின் அருகாமையில் இருக்கின்ற கடையையும் அவர் சுவீகரித்து வைத்திருக்கின்றார். எதிர்வரும் காலத்தில் மக்களுடைய காணிகளை நாங்கள் மக்களிடமே ஒப்படைப்போம்.

மாண்புமிகு ஜனாதிபதி தோழர் அநுர குமார அவர்கள் வட மாகாணத்தில் அதிகளவான தெங்கு உற்பத்தி வலயங்களை அடையாளம் காண முடிந்துள்ளதாகக் கூறியிருந்தார். அங்கு அரச காணி எது? தனியார் காணி எது? என்று தெரியாமல் இருக்கின்றது. இவ்வாறான ஒரு சட்டமூலத்தைக் கொண்டுவந்து அந்த பிரதேசங்களை நாங்கள் அடையாளம் காணவேண்டிய நிலை காணப்படுகின்றது. அவ்விதம் காணிகள் அடையாளப்படுத்தப்படும்போது, யாருடைய வீடுகளோ, குடிமனையோ சுவீகரிப்புச் செய்யப்படப் போவதில்லை. அவ்வாறு நாங்கள் செயற்படுவோமாக இருந்தால் திரும்பவும் இந்த நாட்டில் இன நல்லிணக்கம் ஏற்படாது என்பதில் எங்களுக்கு நம்பிக்கை இருக்கின்றது. காணிகளை அடையாளப்படுத்தக் கோரும்போது, அவர்கள் தங்களுடைய அத்தாட்சிப்படுத்தலை - அதாவது அந்த பிரதேசத்தில் தாங்கள் குறிப்பிட்டளவு காலம் விவசாயம் செய்ததற்கான அத்தாட்சியை - கிராம சேவையாளரிடம் காட்டுவார்களானால் அவர்களுக்கான உறுதிப்பத்திரத்தை வழங்குவதற்கு நாங்கள் தீர்மானித்துள்ளோம்.

தேசிய மக்கள் சக்தி இனவாதத்தை வெளிப்படுத்துவதாக இன்று சிலர் கூறுகின்றார்கள். ஆனால், அது அவ்வாறில்லை என்பதற்கு நான் ஒரு சிறிய உதாரணத்தைக் கூற விரும்புகிறேன். இலங்கையிலிருந்து இந்தியா சென்று அகதிகளாக வாழ்பவர்கள் தாங்கள் இலங்கைப் பிரஜைகள் என்று அடையாளப்படுத்த முடியாமலிருந்த நேரத்தில், அவர்களும்கூட இலங்கைப் பிரஜைகள்தான் என்று தங்கள் உரிமைகளை நிலை நிறுத்தக்கூடிய வகையில் பிரஜாவுரிமைச் சட்டத்தைத் திருத்த வேண்டி ஓர் ஒத்திவைப்புப் பிரேரணை இன்று கடற்றொழில் அமைச்சராக இருக்கும் அமைச்சர் அவர்களால் 2007ஆம் ஆண்டு அவர் குழுக்களின் பிரதித் தவிசாளராக இருந்தபோது கொண்டுவரப்பட்டது. தமிழர்களின் இருப்பை, அவர்கள் தொலைத்த அடையாளங்களை நிரூபிப்பதற்கான சட்டத் திருத்தத்தைக் கோரி அன்று ஆளுங்கட்சியுடன் இணைந்திருந்தபோது 2007ஆம் ஆண்டு அவர் அந்தப் பிரேரணையைக் கொண்டுவந்திருந்தார். அதனால் நாங்கள் ஒன்றைக் கூறுகின்றோம், தமிழர்களுடைய காணிகளை அரசுடைமை ஆக்குவது எங்களுடைய நோக்கமல்ல! தங்களின் வயிறு வளர்ப்பதற்காகப் பிறரின் ஆதனங்களை அபகரித்தமை போன்ற நடவடிக்கையில் நாங்கள் ஈடுபடவில்லை. மக்களின் காணிகளை மக்களுக்கே பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் தீர்மானித்திருக்கின்றோம். ஏனென்றால், காணிச் சுவீகரிப்பு நடைபெறப்போவதாகப் பாரியளவில் இன்று தமிழ் மக்களைப் பயமுறுத்தி வைத்திருக்கின்றார்கள்.

இந்தக் காணி அடையாளப்படுத்தல்களின்போது அரசியல்வாதிகள் பலர் தங்களின் சொந்தங்கள், உறவினர்களின் காணிகள் என்று வெளிப்படுத்தல் உறுதிகளை நிறைவேற்றிக் கொண்டுவருவார்கள் என்பது எனக்கு நிச்சயமாகத் தெரியும். ஏனென்றால், பல அரசியல்வாதிகள் இன்று நிலச்சுவாந்தர்கள் ஆகியிருக்கின்றார்கள் என்பது எமக்குத் தெரியும். மறைமுகமாகத் தமது உறவினர்கள், சொந்தங்கள்மூலம் பல காணிகளைக் கையகப்படுத்தி வைத்திருக்கின்றார்கள். "அரசியலுக்கு வந்தாலே உழைக்கலாம்" என்ற எண்ணக்கருதான் இன்று பலரின் மனதில் இருக்கின்றது. ஆனால், தேசிய மக்கள் சக்தி மாற்றத்தை ஏற்படுத்தியிருக்கின்றது. பிழைப்புவாத அரசியலைக் களைந்திருக்கின்றது. பாராளுமன்ற உறுப்பினர்களது pension நிறுத்தப்படப் போகின்றது; எதிர்வரும் காலங்களில் அவர்களின் வரப்பிரசாதங்கள் குறைக்கப்படப் போகின்றது. ஏனென்றால், இந்தப் பாராளுமன்ற உறுப்பினர் பதவி என்பது எங்களுக்குச் சொந்தமானது அல்ல, மக்களுக்கானது என்றே நாம் கருதுகின்றோம். அதனால் மக்களுடைய சேவையை இலக்காகக்கொண்டு தேசிய மக்கள் சக்தி செயற்படும் என்பதை நாங்கள் இந்த இடத்தில் ஆணித்தரமாகக் கூறுகின்றோம். எனவே, மக்களைப் பயமுறுத்தி அரசியல் செய்வதை விட்டுவிட்டுத் தர்க்கரீதியான அரசியலுக்கு வாருங்கள் என நாங்கள் அவர்களுக்குக் கூற விரும்புகிறோம்.

நாங்கள் வட மாகாணத்தை அபிவிருத்தி செய்வதை இலக்காகக் கொண்டிருக்கின்றோம். சர்வதேச தரத்திலான stadium ஒன்றை அங்கு அமைப்பதற்குத் தீர்மானித்திருக்கின்றோம். அதேநேரத்தில், யாழ்ப்பாணத்தில் உள்ளக விளையாட்டு அரங்கை நிறுவுவதற்குத் தீர்மானித்து, நிதியொதுக்கியிருக்கின்றோம். அதற்கான வேலைத்திட்டம் எதிர்காலத்தில் ஆரம்பிக்கப்படும். இன்று அதிகளவான சுற்றுலாப் பயணிகள் வந்து செல்லும் இடமாகக் காணப்படுகின்ற குறிகாட்டுவான் இறங்குதுறையைப் புனரமைப்பதற்குக்கூட இதுவரை காலமும் யாரும் முன்வரவில்லை. இன்று நாங்கள் அதைப் புனரமைப்பதற்குத் தீர்மானித்துள்ளோம். அதிகளவான கிராமிய வீதிகளைப் புனரமைக்கத் தீர்மானித்துள்ளோம். நாங்கள் வடக்கின் அபிவிருத்தியில் அதிக கரிசனை கொள்ள வேண்டியிருப்பதற்குக் காரணம் என்னவென்றால், நான் முன்னர் குறிப்பிட்டதுபோன்று அது 30 வருட யுத்தத்திற்கு முகங்கொடுத்த பிரதேசம். எனவே, தென்பகுதியோடு ஒப்பிடும்போது அதனை மேலும் முன்னேற்றப் பாதையில் கொண்டுசெல்ல வேண்டிய தேவையிருக்கின்றது. அதனால் எமது அரசாங்கம் அதற்கான செயற்பாடுகளை மேற்கொள்ளும் என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

சில அரசியல்வாதிகள் போலித் தேசியம் கதைத்து, போராட்டத்தையும் போராட்ட வீரர்களையும் வைத்து அரசியல் இலாபம் தேடும் நடவடிக்கைகளில் ஈடுபடுகிறார்களே தவிர, உண்மையாகப் போராடி மரணித்தவர்களின் குடும்பங்களுக்கு உதவ வேண்டும் என்பது அவர்களுடைய நோக்கமல்ல. தமிழர்களின் இருப்பைப் பேணிப் பாதுகாக்க வேண்டும் என்பதும் அவர்களுடைய நோக்கமல்ல. இவர்கள் திரும்பவும் இந்த நாட்டை எவ்வாறாவது இனவாத வலையில் வீழ்த்துவதற்கே முற்படுகிறார்கள். ஆனால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் இன நல்லிணக்கத்தை ஏற்படுத்துவதற்காக அனைத்து மக்களையும் ஒன்றுபடுத்துவதற்காகப் பாடுபட்டுக் கொண்டிருக்கின்றது.

எதிர்வரும் காலத்தில் இன நல்லிணக்கத்தைப் பேணிப் பாதுகாப்பதற்கான நடவடிக்கைகளை எடுத்துவருகின்றது. அனைத்து மக்களுடைய கலை, கலாசாரங்களையும் அனைவரும் புரிந்துவைத்திருக்க வேண்டும் என்ற அடிப்படையில் மூவின மக்களுடைய கலாசாரங்களையும் பிரதிபலிக்கும் ஒரு நிகழ்வைக்கூட அறிமுகப்படுத்தியுள்ளோம். அவ்வாறு இன நல்லிணக்கமொன்று ஏற்படும் பட்சத்தில்தான் நாட்டை முன்னேற்றப் பாதையில் இட்டுச்செல்லலாம் என்பதை இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, அந்த இலக்கை நோக்கி எமது அரசாங்கம் பயணிக்கும். மக்களுக்கு நாங்கள் ஒன்றை மிகத் தெளிவாகக் கூறுகின்றோம். எதிர்க்கட்சியினரின் பயமுறுத்தல்களுக்கு ஏமாறாதீர்கள்! தேசிய மக்கள் சக்தியுடன் மீளவும் அணி திரளுங்கள்! நாங்கள் புதிய பாதையில் பயணிப்போம்! என்று கூறிக்கொண்டு விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අද දවසේ ප්‍රධාන මාතෘකාව හැටියට කථා බහ කරනවා අපට ඇහෙන්නේ "ලුණු" පිළිබඳවයි. ඒක හරියට මැක්කාගේ කථාව වාගේයි. කොහෙන් පටන් ගත්තත් මැක්කාගෙන් ඉවර කරනවා වාගේ විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම මුළු කථාවේදීම ලුණු පිළිබඳව තමයි කථා කළේ. මේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා උදේ වරුව සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්නේ, මාධ්‍යයට අවශ්‍ය කරන කොටස කියලා,

[ගරු උපුල් කිත්සිරි මහතා]

ආණ්ඩුව පිළිබඳව රටට වැරදි මතයක් දෙන්නයි. ඒ කථාවේ අවසාන කොටසේදී කියනවා, මේ ආණ්ඩුවට නිවැරදි වෙන්න, මේ ආණ්ඩුවට උපදෙස් දෙන්න තමයි මේවා කියන්නේ කියලා. හැබැයි, ඊට වඩා වැඩි ප්‍රමාණයක් අපි නිරන්තරයෙන් දකින්නේ මොනවා හෝ එකක් දෙකක් අල්ලාගෙන ආණ්ඩුවට මඩ, අවලාද නඟන ආකාරයක් තමයි.

ඊයේ දවසේත්, අදත් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙක් එතුමන්ලාගේ ජ්‍යෙෂ්ඨත්වය වාගේම අත්දැකීම් පිළිබඳව කථා කළා. අපි නවක මන්ත්‍රීවරු වෙන්න පුළුවන්. හැබැයි, ඒ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා එතුමන්ලා හැසිරෙන විධියෙන්, කථා කරන විධියෙන් නවක මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් දෙනවා නම් මම හිතන විධියට ඒක තමයි හොඳ. නමුත් ඒ කථා ඇතුළේ අපට ඒ ජ්‍යෙෂ්ඨත්වය, හරබරතාව පෙනෙන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ සකස් කරන ලද රෙගුලාසි පිළිබඳවත්, 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ගෙන එන යෝජනා සම්මත 10ක් පිළිබඳවත් තමයි අපි අද සාකච්ඡා කරන්නේ. වාහන ආනයනය පිළිබඳව කථා කරද්දී මම කියන්න ඕනෑ, පසුගිය අවුරුදු 5ක් තිස්සේ වාහන ආනයනය නතර කරලා තිබිලා අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ අපි හෙමින් සීරුවේ වාහන ආනයන සීමාවන් ඉවත් කරලා, දැන් ඉදිරියට එමින් ඉන්නවා කියන එක. අවුරුදු 5ක් තිස්සේ වාහන ආනයනය සීමා කරලා තිබිලා ඒ තහනම ඉවත් කරලා, මේ වැටිච්ච ආර්ථිකය ඇතුළේ හීන් සීරුවේ පටන් ගත්ත මේ ක්‍රියාදාමය මීට වසර 10කට විතර කලින් අපේ රටට වාහන ගෙන්වපු ආකාරයටම සිදු වෙයි කියලා තමයි එතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ. මේ රටේ ආර්ථිකය යහපත් වෙනකොට ආනයන සීමා ඉවත් කරලා, අවශ්‍ය කරන විධියට අණ පනත්, නීති වෙනස් කරලා ජනතාවට අවශ්‍ය කරන සහන දෙන්න ආණ්ඩුවක් හැටියට අපි පැකිළෙන්නේ නැහැ. සමහර කථාවලදී අපි දැක්කා, අපේ ආණ්ඩුව පත්වුණු ගමන් වාහන ආනයන තහනම ඉවත් කරනවාය, අඩුම මිලට වාහනයක් දෙනවාය කියලා අපි කිව්වාය කියන එක උලුප්පා දක්වනවා.

සමහර වෙලාවට අපේ මන්ත්‍රීතුමන්ලා මැතිවරණ වේදිකාවේ කියපු ඇතැම් කාරණා ගෙනහැර දක්වන්න උත්සාහ කළා. හැබැයි අපි ඔබතුමන්ලාට කියනවා, ඒ කථාවල කොටසක් කියන්නේ නැතුව හරය හොඳට අහලා බලන්න, ඒ කියපු දේවල් අහලා බලන්න කියලා.  එතකොට අපි කියපු ඒවාත්, ඔබතුමන්ලා කියන දේවල්වලත් තිබෙන පරස්පරය හොඳට තේරෙයි.

අපි පාර්ලිමේන්තුව හැටියටත්, ආණ්ඩුව හැටියටත් යම් අණ පනත්, රෙගුලාසි වෙනස් කරන්න ඕනෑ. කාලයෙන් කාලයට අදාළ රෙගුලාසි වෙනස් කිරීම තමයි අපි අද දවසේත් මේ කරගෙන යන්නේ. සමහර වෙලාවට අපට අත්තිකාරම් ගිණුම්වල මුදල් වැඩි කර ගන්න වෙනවා, රටේ අවශ්‍යතා මත. ඒ වාගේම ආර්ථිකය යහපත් වෙනකොට, පිරිවැය අඩු වෙනකොට සමහර අත්තිකාරම් මුදල් අඩු කරන්නත්  අපිට සිද්ධ වෙනවා. එවැනි කාරණා තමයි මේ පාර්ලිමේන්තුවට අද ගෙනැල්ලා තිබෙන්නේ.

විපක්ෂයේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා පසුගිය ආණ්ඩුවලින් කරපු වික්ටෝරියා ජලාශය, රන්දෙනිගල ජලාශය, මහවැලි ව්‍යාපාරය පිළිබඳව කථා කළා. ඒ වාගේම සමහර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කළා. අධ්‍යාපනයට වියදම් කරන විධිය, නොමිලේ දෙන දේවල් පිළිබඳව, තම තමන්ගේ ආණ්ඩුවලින් කළ දේවල් ගැන එතුමා කථා කළා. හැබැයි එතුමන්ලාට අමතකයි, ඒ ව්‍යාපෘති හරහා මේ රටේ කොයි තරම් මුදලක් නාස්ති කළාද කියලා. සමහර මැති ඇමතිවරුන්ට ඕස්ට්‍රේලියාවේ තිබෙන ඇපල් වතු ගැන කථා කළේ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණු කාලවල කියලා අපිට හොඳට මතකයි. එතුමා ඒ ව්‍යාපෘති ගැන මොන තරම් කථා කළත්, 2024 අවුරුද්දේ අවසාන කාලය වෙනකොට -මේ රටේ හාල් හිඟය එනකොට- මේ රටේ එකම ගබඩාවකවත් වී ඇටයක් නැති තත්ත්වයක් නිර්මාණය කළේත් එතුමන්ලාගේ ආණ්ඩුවයි කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ වාගේම වී අලෙවි මණ්ඩලය සතුව 2024 අවුරුද්ද අවසන් වෙනකොට එකම ලොරියයි තිබුණේ. ඒ පිළිබඳවත් එතුමන්ලා අවධානය යොමු කළා නම් හොඳයි කියලා මම හිතනවා. වී ගබඩා කිරීම් පිළිබඳවත් කථා කරනවා අපි දැක්කා. ඒ වාගේම පසුගිය කාලයේ එළවලු ගබඩා කිරීම සඳහා එකම ශීතාගාරයක්වත් මේ රටේ නිර්මාණය කරලා නැහැ කියන එකත් අපි දැක්කා. පසුගිය අවුරුදු 10 තුළ ලංගම ඩිපෝවලට එකම බස් රථයක්වත් ගෙනැල්ලා නැහැ. ඒ ඩිපෝවල තිබෙන බස් රථ ඇණිවල අවසන් අවුරුදු 10 තුළ ගෙනාපු එකම බස් රථයක්වත් නැහැ. එතුමන්ලා කථා කරද්දී ඒවා පිළිබඳවත් කථා කළා නම් හොඳයි කියලා මට හිතෙනවා.

එතුමන්ලා ආර්ථිකය පිළිබඳව කථා කළේ අපි ආණ්ඩුව ගත්ත දවසේම ඒක කඩාගෙන වැටුණු විධියටයි. අපට මතකයි, අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දවස් 5ක් යනකොට විපක්ෂයෙන් මහා හඬක් නැඟුවා මේ රටේ හාල් නැහැ, පොල් නැහැ කියලා. ඕනෑම කෙනෙක් දන්නවා, ආණ්ඩුවක් පත් වෙලා දවස් 5ක් වුණාට, එක කන්නයක් පැහෙන්න මාස තුනහමාරක් හතරක් යනවා කියලා. ඒ වාගේම තමයි අපේ ආණ්ඩුව ආපු ගමන් පොල් නැහැ කියලා කෑ ගැහුවාට, සාමාන්‍යයෙන් මලක් පොල් ගෙඩියක් බවට පත් වෙලා මෝරන්න මාස 6ක වාගේ කාලයක් ගත වෙනවා. අපි ඇවිල්ලා මේ පොඩි කාලය ඇතුළත කරපු හුඟක් දේවල්, කරපු හොඳ විපක්ෂය දකින්නේ නැහැ.

අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කර්මාන්ත පිළිබඳව, ආයෝජකයෝ පිළිබඳව මහා හයියෙන් කථා කරලා ගියා. හැබැයි, එතුමාට අමතකයි, එතුමාගේ තාත්තාගේ කාලයේ, බාප්පාගේ කාලයේ ආයෝජකයෝ මේ රට හැර දාලා ගියේ ඇයි කියලා. එතුමා ඒවා කියන්නේ නැහැ, ඒවා අමතක වෙලා. අපි දන්නවා, සමහර ආයෝජකයන්ගෙන් ඩොලර් මිලියන ගණන් ගත්ත නිසා තමයි ඒ ආයෝජකයෝ මේ රට දාලා ගියේ කියන එක. මේ රටට ආදරය කරන ආයෝජකයෝ ඇවිල්ලා සමහර වෙලාවට ඔවුන්ට ඉඩම් ලබා ගන්න ඕනෑ වෙනකොට ඒවායින් කොමිස් මුදල් ඉල්ලපු ඉතිහාසයක් අපි දැක්කා.

ඒ නිසා ආයෝජකයෝ පිළිබඳව අද උනන්දුවෙන් කථා කරද්දී එතුමන්ලාගේ කාලයේ ආයෝජකයෝ රට දාලා ගියේ කොහොමද කියලා එතුමන්ලාට අමතක වෙලායි තිබෙන්නේ.

අපේ ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා ඉඩම් පිළිබඳව කථා කළා; උතුරේ ජනතාවට අයිති ඒ ඉඩම් පිළිබඳව කථා කළා. මම ඔබතුමාට කියන්න ඕනෑ, උතුරේ පමණක් නොවෙයි, දකුණේත් තවම ජනතාවට ඒ අවශ්‍ය කරන ඉඩම්වල නිසි අයිතිය ලැබී නැති බව. අපි රටක් හැටියට ගත්තොත්, සියලුම ජනතාවට ඉඩම් ඕනෑ වාගේම, රටේ අනාගතය වෙනුවෙන්, සතා සිවුපාවා වෙනුවෙනුත් රක්ෂිත වෙන් වෙන්න ඕනෑය කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලාට ඉඩම් පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම්, නැත්නම් වෙන යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ පිළිබඳව නිවැරදිව සාකච්ඡා කරන්න අපි අවස්ථාව දීලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලාට පුළුවන් ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ සඳහා අපෙන් කිසිදු බාධාවක් නැහැ. ඔබ කියනවා නම්, උතුරේ ජනතාවට විතරයි ඒ ප්‍රශ්නය තිබෙන්නේ කියලා, දකුණේ ජීවත් වන අපි ගැනත් මම කියන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තත්

අපි දකිනවා, එම දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් අතිබහුතරයකට ඉඩම්වල අයිතිය තවම නිරවුල් කරලා නැහැ කියන එක. එම නිසා ආණ්ඩුවක් හැටියට ඒ ජනතාවගේ ඉඩම් අයිතිය නිරවුල් කිරීම කියන කාරණයේදී, අපි උතුර පිළිබඳව මෙන්ම දකුණ පිළිබඳවත් එකම මතයකයි, එකම හඬකයි ඉන්නේ.

විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග පද්ධතිය ගත්තොත්, ඒවා ඉතාම අබලන්. මෙතුමන්ලා අවුරුදු ගණනක ඒ පාලනයන් පිළිබඳව කථා කළාට, අපි දන්නවා සාමාන්‍යයෙන් ග්‍රාම නිලධාරි වසමක් ගත්තොත්, කිලෝමීටර 10ක, 15ක ප්‍රමාණයක් තවමත් දුෂ්කර මාර්ග පද්ධති විධියට තිබෙන බව. ඒ වාගේම බොහෝ ග්‍රාම නිලධාරි වසම්වල ජල ප්‍රශ්නය, විශේෂයෙන් පානීය ජල ප්‍රශ්නය ලොකු ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. මම මුලින් කථා කළ ඉඩම් පිළිබඳ කාරණාවත් එහෙමයි. ඒ වාගේම ග්‍රාමීය ජනතාව ඉතා දුෂ්කර ආර්ථික තත්ත්වයන් ඇතුළේ ඉන්නේ. දුෂ්කරව ජීවත් වන අපේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවන්නත් අපි විශේෂ වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ඒ පිළිබඳව අපේ අවධානය යොමුවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කර්මාන්තය ගත්තොත්, අපේ ඉලක්කය තමයි වාර්ෂිකව සංචාරකයින්ගේ පැමිණීම මිලියන තුනක් දක්වා වර්ධනය කරන එක. නමුත් ඒකට අවශ්‍ය කරන පහසුකම් උතුරේත්, දකුණේත් මෙන්ම රට පුරාම හරියට නිර්මාණය වෙලා නැහැ. ඒ නිසා අපේ බලාපොරොත්තුව තමයි, සංචාරක කර්මාන්තය දියුණු කරනවා වාගේම, සංචාරක ප්‍රදේශ දියුණු කරලා, ඒවාට අවශ්‍ය පහසුකම් සලසා දීම. මෙතුමන්ලා නිරන්තරයෙන් කථා කළත්, මෙතුමන්ලාගේ කාලයේ ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්න වන ජල ප්‍රශ්නය, මාර්ග පද්ධතිය, ඉඩම්වල ඇති ගැටලු, ග්‍රාමීය ආර්ථිකය, ඒ වාගේම සංචාරක කර්මාන්තයට අදාළ මෙවැනි පැති ගැන විශේෂ අවධානයක් තිබුණේ නැහැ. එම නිසා අපි මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, ආණ්ඩුවක් හැටියට අපි ජනතාවට දුන් පොරොන්දු පරිදි එම කටයුතු ඉටු කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට විනාඩි 14ක කාලයක් තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මෙතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 14ක කාලයක් තිබෙනවා කියලා කථික ලැයිස්තුවේ සඳහන් කර තිබෙනවා. ඉලෙයියතම්බි මන්ත්‍රීතුමා විනාඩියක කාලයක් ගත්තා, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා විනාඩි 3ක කාලයක් ගත්තා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතුමන්ලාට කාලය දුන්නාට පස්සේ කිව්වා, මට විනාඩි 14ක් තිබෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. එහෙම කිව්වාට, ලේකම්තුමාට වැරදීමකින් කියලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එහෙම වරදින්න විධියක් නැහැ නේ. ඒ ගරු මන්ත්‍රීතුමා කථා කරන්න කලින්,-*[බාධා කිරීමක්]* එහෙම දෙන්න බැහැ නේ. අපෙන් ඇහුවේ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.*

[අ.භා. 4.16]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, අවුරුදු ගණනක් තිස්සේ කිසි ආණ්ඩුවක් එළවලු ගබඩා කරන්න ගබඩාවක් හැදුවේ නැහැ කියලා. ගරු අනුර කුමාර දිසානායක කෘෂිකර්ම ඇමතිතුමාගේ කාලයේත් එතුමා ඒ දේ කළේ නැහැ. හැබැයි ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා අපි හදපු "ප්‍රභාෂ්වර" කියන ලංකාවේ පළමුවැනි මෙට්‍රික්ටොන් 5,000ක කෘෂි ගබඩාව විවෘත කළා කියන එක මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි.

කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි කථා කරනවා සීමා සංශෝධන සඳහා ඉදිරිපත් කරන ලද නියමයන් ගැනත්. ඒවායින් එකක් පිළිබඳව විතරයි මම අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම්වලට සහභාගි වන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ගේ උපාය දූතයන් ලෙස කටයුතු කරන අවස්ථාවේදී දෙන ඒ අත්තිකාරම් මුදල රුපියල් මිලියන 50 ඉඳලා රුපියල් මිලියන 150ට වැඩි කරන්න අපි අවසර ලබා දීම කියන කාරණය. මේක වැදගත්.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම කිව්වේ-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ගැන මම කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

නැහැ. නැහැ. එතුමා කිව්වා, එතුමන්ලාගේ කාලයේ ගබඩා ඉදි කළේ නැහැ කියලා කිව්වාය කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම නම සඳහන් කළේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

නැහැ. එතුමා කිව්වේ, එතුමන්ලාගේ කාලයේ ගබඩා ඉදි කළේ නැහැ කියලා කිව්වාය කියලා. එතුමා කිව්වා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි. ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කළා නේ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

දැන් මෙතැන අපි කථා කරන්නේ අල්ලස් වැටලීම්වලදී උපාය දූතයන් ලෙස කටයුතු කරන කට්ටියට දෙන අත්තිකාරම් මුදල රුපියල් මිලියන 50 ඉඳලා රුපියල් මිලියන 150ට වැඩි කරන එක ගැන. මේක හරි වැදගත්. මොකද, මේ රටේ දූෂණය නැති කරන්න අවශ්‍ය සම්පූර්ණ සහයෝගය පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ලබා දිය යුතුයි. ඒ නිසා ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකේ ඔබතුමියත් හිටියා - ඒ මුදල රුපියල් මිලියන 150 දක්වා වැඩි කරන එක අපි ඉතා ඕනෑකමින් approve කළා. තව අවශ්‍ය සහයෝගයක් දෙන්න සූදානම් කියලාත් අපි කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට දැන් පොඩ්ඩකට කලින් text message එකක්, news alert එකක් ආවා, රුපියල් ලක්ෂ 5ක පගාවක් ගත්තා කියලා වවුනියාව පැත්තේ පොලීසියක OIC කෙනෙක්ව අල්ලලා කියලා. දැන් බලන්න, විශාල දූෂණ මේ රටේ සිද්ධ වෙනවා. ජනතාව බලාපොරොත්තු වෙනවා, මේ දූෂණයට විරුද්ධව දීපු පොරොන්දු ඉෂ්ට කරයි කියලා.

මම කාරණා තුනක් පිළිබඳව අද කථා කරන්න බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඉස්සෙල්ලාම කියන්න ඕනෑ මේ e-Visa ප්‍රශ්නය ගැන. මේ තමයි මගේ සභාපතිත්වයෙන් යුතුව 2024.07.12වැනි සිකුරාදා අපි ඉදිරිපත් කරපු වාර්තාව, "Outsourcing Online Visa and Passport Application Services between the Consortium and the Department of Immigration and Emigration of Sri Lanka" කියලා. අද මා නැවතත් මේ වාර්තාව **සභාගත*** කරනවා.

මේකෙදි ඉතාම දැඩි පීඩනයක් යටතේ අපට සිද්ධ වුණා, පිටු හයසිය හැටගණනක වාර්තාවක් මේ ගරු සභාවට සභාගත කරන්න. මේ වාර්තාවේ conclusion එකේ තිබෙනවා, "The Committee is of the opinion that the absence of a competitive bidding process in procuring the services of the Consortium prevented DOIE from obtaining the best value for money" කියලා. මෙහෙම කියාගෙන ගිහිල්ලා recommendation එකක් දෙනවා, "…Auditor-General undertakes a comprehensive forensic audit of the entire procurement process utilizing the findings outlined in this report" කියලා. Auditor-General ගේ මේ වාර්තාව තවම ලැබිලා නැහැ. දැන් මේකට අවුරුද්දකට කිට්ටු වෙනවා. ආණ්ඩුව පැත්තේ කිසිම කෙනෙක් මේ e-Visa ප්‍රශ්නය ගැන කථා කරන්නේ නැහැ. රුපියල් ලක්ෂ 5ක් ගත්ත පොලිස් නිලධාරියෙක් අල්ලාගෙන හිරේ දමනවා, අවුරුදු ගණනකට. කෝ, මේකට ගත්ත ක්‍රියාමාර්ගය?

දැන් බලන්න, ඊයේ ආණ්ඩුව පැත්තේ කවුරු හරි ඇමතිවරයෙක් කියනවා මම අහගෙනයි, "මේවා ගැන ක්‍රියාමාර්ග ගන්න අපි එනකම් ඉන්න සිද්ධ වුණා" කියලා. ඒක එහෙම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නොවෙයි. මේ නඩුව දාලා තිබෙන්නේ 2024 ජූලි මාසයේ 29වැනිදා, එවකට සිටි ගරු රවුෆ් හකීම් මැතිතුමා, ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා සහ ගරු සුමන්තිරන් මැතිතුමා. ඒ අය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ. ශ්‍රේෂ්ඨාධිකරණය දීපු Interim Order එක මම කියවන්නම්. එහි "Court decides to grant leave to proceed …" යනුවෙන් කියලා ඊට පස්සේ කියනවා, "following interim orders" කියලා. "1. Order suspending the operation and the effect of the Cabinet Decision dated 11.09.2023 on the approval of Cabinet of Ministers subject to the proposal on eVisa consular services, visa services, biometric services and tourism promotion" කියලාත් කියනවා. දැන් බලන්න, මොකක්ද මේකට වෙලා තිබෙන්නේ කියලා. උදාහරණයක් හැටියට ගත්තොත්, අර හර්ෂ ඉලුක්පිටිය කියන හිටපු කොමසාරිස් ජනරාල් තවමත් හිරේ. ඔහුව remand එකේ තියාගෙන ඉන්නවා, Interim Order එක ක්‍රියාත්මක කළේ නැහැ කියලා. ඒක පැත්තකින් තියන්නකෝ. නමුත් ආණ්ඩුව හැටියට කෝ, මේක ගැන විමර්ශනයක්? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඩොලර් 25ක් අය කළා, ඩොලර් එකෙන් කරන්න පුළුවන් වැඩේට.

ඇයි, මේ ගැන කථා කරන්නේ නැත්තේ? ලක්ෂ 5ක් ගත්තු කෙනෙකු හිරේ දමන එක කරන අතරේ මේවා ගැන හොයන්නේ නැත්තේ ඇයි? ඩොලර් මිලියන 200ක් ආයෝජනය කරනවා කිව්වා මේ project එකට. හැබැයි, එක ඩොලරයක්වත් ආයෝජනය කළේ නැහැ. මේ රටම විශාල වශයෙන් වැරැදි පාරේ යවලා තමයි මේ වැඩේ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද “Daily Mirror” පුවත් පතෙහි පළ වෙච්ච දෙයක් පෙන්වන්න මම කැමැතියි. මම හිතුවා මේක සිංහලෙනුත් තිබෙනවා කියලා. හැබැයි, ඉංග්‍රීසියෙන් විතරයි තිබෙන්නේ. මේ තිබෙන්නේ මොකක්ද? මේක සඳහන් කරලා තිබෙන්නේ advertisement එකක් හැටියට. මේකේ කියලා තිබෙන්නේ, “Failure To Disclose Conflict of Interest May Result In 7 Years of Rigorous Imprisonment For Public Officials” කියලායි. මේක කියන්නේ, Commission to Investigate Allegations of Bribery or Corruptionහි ප්‍රධාන පුද්ගලයෙක්. මේ advertisement එක sponsor කරලා තිබෙන්නේ ජපන් රජය සහ UNDP එක. ජපන් රජය මේක sponsor කරන්න හේතුවක් ඇති කියලා මට හිතෙනවා. ඔවුන් දිගින් දිගටම කියලා තිබෙනවා, දූෂණය නිසා ඔවුන්ව discriminate වුණා කියලා.

දැන් බලන්න, මම කලින් පෙන්නුවා වාගේ එක පැත්තකින්, තවම විගණකාධිපතිවරයා පත් කරලා නැහැ. අපට ආරංචි විධියට ඊයේ Constitutional Council එකේදී, විගණකාධිපතිවරයා පත් කිරීම සම්බන්ධව ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු පුද්ගලයාගේ නම reject වෙලා තිබෙනවා. අපි පෙරේදාත්, ඊයේත් මේ සම්බන්ධයෙන් කථා කරමින් ඇහුවා, රාජ්‍ය විගණන සේවයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වෙනුවට කවුද මේ පත් කරන්න හදන පුද්ගලයා කියලා. අපි දැනුවත් වුණු විධියට එතැන සිද්ධ වෙලා තිබෙනවා, conflict of interest එකක් සම්බන්ධයෙන් වන ලොකු දෙයක්. ඒ කියන්නේ මෙතැන actual conflict of interest එකක් තිබෙන්න පුළුවන්; potential conflict of interest එකක් තිබෙන්න පුළුවන්; presumed conflict of interest එකක් තිබෙන්න පුළුවන්. කාටත් ඉතිහාසයක් තිබෙනවා. නමුත්, Public Service එකට ඇවිල්ලා යම් රැකියාවක් හෝ position එකක් ගන්න කොට ඒ ඉතිහාසය ගැන, තමන්ට මේ conflict of interest එක තිබෙනවා කියලා කියන්න ඕනෑ. අපට ආරංචි වුණු විධියට ඊයේ නම ඉදිරිපත් කර තිබුණු පුද්ගලයා, රටේ Auditor-General වෙන්න හදන පුද්ගලයා කියලා නැහැ, ඔහු Ceylon Petroleum Corporation එකේ Director කෙනෙකු හැටියට ආණ්ඩුවෙන් පත් කර තිබුණා කියලා. ඉතින් බලන්න, මේක කොච්චර වැරැදි ද කියලා. එහෙම කෙනෙකු කොහොමද රජයේ ප්‍රධාන විගණනය භාරව ඉන්නේ? Conflict of interest එකක් තිබෙනවා නම්, අවුරුදු 7ක් හිරේ යනවා කියලා පත්තරේ full-page advertisement එකක් දාලා තිබෙන කොට විගණකාධිපතිවරයා වශයෙන් පත් වෙන්න හිටපු පුද්ගලයා එහෙම කළේ ඇයි? මේ වාගේ conflicts of interest ඇත්ත වශයෙන්ම හැම තැනම වාගේ තිබෙනවා.

තවත් උදාහරණයක් ගත්තොත්, බලන්න SriLankan Airlines එකට පත් කර තිබෙන පුද්ගලයා ගැන. SriLankan Airlines එකේ සභාපති ඉන්නේ හේලීස් එකේ දැනටත් ඉන්න Director කෙනෙක්. එහෙම නැත්නම්, බලන්න අද කථා කරපු ලුණු සංස්ථාවේ වැඩේ. ලුණු සංස්ථාවේ Director කෙනෙකු හැටියට ඉන්නේ පෞද්ගලික ලුණු සමාගමක අයිතිකරුවෙක්. එහෙම නැත්නම් බලන්න, ජනාධිපතිවරයාගේ ප්‍රධාන ආර්ථික උපදේශක ගැන. විගණක සමාගමක ප්‍රධානියෙක් තමයි, ප්‍රධාන ආර්ථික උපදේශක. අද පළ වී තිබෙන document එකේ සඳහන්ව තිබෙනවා, conflict of interest කියන්නේ මොකක්ද කියලා. ඒ කියන්නේ, තමන්ට යම් හේතුවක් නිසා රජයේ insider information දැන ගන්න පුළුවන් නම්, තමන්ගේ පෞද්ගලික වැඩ කටයුතුවලට, එහෙම නැත්නම් තමන් පෞද්ගලිකව එකතු වෙලා ඉන්න ආයතනයට ඒවා පාවිච්චි කරන්න පුළුවන්. සමහර වෙලාවට ඒවා පාවිච්චි නොකරනවා වෙන්නත් පුළුවන්. ඒක තමයි කියන්නේ potential conflict එකක් තිබෙනවා කියලා. දැනට කියලා නැති වෙන්න පුළුවන්. හැබැයි, ඉදිරියේදී ඒවා පාවිච්චි කරනවා වෙන්නත් පුළුවන්. ඒ නිසා potential conflict of interest එකක්, presumed conflict of interest එකක්, actual conflict of interest එකක් තිබෙනවා නම්, ඒවා disclose නොකර ඉන්නවා නම්, එහෙම නැත්නම් එය හරියාකාරව සිදු කරන්නේ නැත්නම් අවුරුදු 7ක් හිරේ යනවා කියලා සඳහන් වනවා. ඉතින්, මේවා සම්බන්ධයෙන් මොකද වෙන්නේ කියලා දැන ගන්න මම කැමැතියි.

මා ගන්නා දෙවැනි කාරණාව තමයි, 'සොබාදනවි' විදුලි බලාගාරය පිළිබඳ කාරණය. සොබාදනවි විදුලි බලාගාරයට අදාළ Cabinet Paper එක ගැන මම කලින් දවසකත් කථා කළා. මේක මම සභාගත කරන්නම්. මේකේ දිනය වශයෙන් තිබෙන්නේ ජනවාරි 31වැනි දා. Ministry of Energy මඟින් ජනවාරි 31වැනි දා Cabinet Paper එකක් දාලා කියනවා, 'සොබාදනවි' කියලා combined-cycle duel-fuel power plant එකක් හදනවා, ඒකේ unit එකක levelized cost එක රුපියල් 20යි කියලා. ඊට පස්සේ මොකද කරන්නේ? මම දිනයත් එක්කම කියන්නම්. ටික දවසකට පස්සේ - මාර්තු මාසයේ 18 වැනි දා - ඒ ගොල්ලන් කියනවා, "අපි බලාගාරයෙන් ගන්න කොට, පුද්ගලයන්ගේ rooftop solar power unit එකක මිල කිලෝවොට් 100 ඉඳලා 500ක් දක්වා කලින් තිබුණේ රුපියල් 27.6ක් ලෙසයි, ඒක රුපියල් 15.49 දක්වා අඩු කරනවා" කියලා. මොකක්ද, ඒකට හේතුව? "අපට සොබාදනවිහි LNGවලින් නිපදවන ඒකකයක් රුපියල් 20ට ගන්න පුළුවන් නම්, rooftop solar power unit එකකට අපි රුපියල් 27ක් ගෙවන්නේ ඇයි, ඒ නිසා මේකට රුපියල් 15ක් ගෙවනවා" කියලායි කියන්නේ. මේ Cabinet Paper එක අනුව levelized cost එක,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට ලබා දී තිබෙන්නේ විනාඩි 14 ද, 12 ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 12යි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, මට විනාඩි 14ක් ලබා දී තිබෙනවා. ඒ විනාඩි දෙක දෙන්නකෝ, කරුණාකර.

ඒගොල්ලෝ පෙන්වා දෙනවා, ඒ ඒකකයක් රුපියල් 20ට ගන්න බැහැ කියලා. කවුද කියන්නේ එය රුපියල් 20යි කියලා? ගණන් හදලා පෙන්වා තිබෙනවා, සාධාරණ ලෙස ගණන් හැදුවොත් ඒ ඒකකයක් රුපියල් 43.25ක් වෙනවා කියලා. කවුරුත් මේක duel-fuel power plant එකක් කියලා කිව්වාට - සහස්දනවි එකත් තිබෙනවා - duel-fuel නෑ. තවම LNG මෙට්‍රික්ටොන් එකක්වත් ගෙනැල්ලා නැහැ කවදාවත්. ඒක ඩීසල්වලින් දුවන්නේ. ඒක ඩීසල්වලින් දිව්වොත් levelized cost එක රුපියල් 72යි ගණනක් කියනවා. දැන් කල්පනා කරලා බලන්න, මෙතැන conflict එකක් තිබෙනවාද, නැද්ද කියලා. මෙතැන Commission to Investigate Allegations of Bribery or Corruptionහි lady කියලා තිබෙන දේ වෙලා තිබෙනවාද, නැද්ද? කවුද මේවායේ Board of Directorsහි ඉන්නේ? කාටද වුවමනාව? CEB එකේ සභාපති හැටියට කවුරු සිටියාද, ඉන්නවාද කියලා අපි දන්නේ නැහැ තවදුරටත්. එක වෙලාවකට එකක් කියනවා, තව වෙලාවකට තව එකක් කියනවා. අපි අද bribery ගැන කථා කරනවා නම් මේ conflicts of interest ගැනත් කථා කරන්නම ඕනෑ. ඒක තමයි අද ජපානයෙන් sponsor කරපු full-page advertisement එක දාලා තිබෙන්නේ. මේවා සිංහලෙනුත් දාන්න කියලා මම ඔවුන්ට කියනවා.

අවසාන වශයෙන් මම කථා කරන්නේ, e-NIC procurement එක සම්බන්ධයෙන්. අපි දිගින් දිගටම මෙතැන කථා කළා, අර Unique ID එක - digital infrastructure - හදන්න ඉන්දියාව එක්ක agreement එකක් තිබෙනවා කියලා. Dr. Hans Wijayasuriyaලා එහෙම ගෙනැල්ලා ඒ වැඩේ කරගෙන යනවා. අපි මේ ගැන මාර්තු මාසයේ 11 වැනි දා මේ පාර්ලිමේන්තුවේ කථා කළා. කථා කරලා කිව්වා, කරුණාකර මේ parallel project එක කරන්න එපා කියලා. ඉන්දියාවෙන් සල්ලි අරගෙන Unique ID එක කරනවා නම් ඒකට plastic cards අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ඔයගොල්ලන් e-NIC කියලා parallel project එකක් කරනවා. අරකට වියදම් කරන ගමන් මේකට polycarbonate card එකක් ගෙනෙන්න හදනවා. අපි පෙන්වා දුන්නා, polycarbonate card එකක් ඩොලර් එකහමාරත්, දෙකත් අතර වෙනවා, card එකක් තබා ගන්න අවශ්‍යම නම් නිකම් PVC card එකක් ගන්න, ඒක ඇමෙරිකානු ඩොලර් ශත 20ක්, 30ක් වෙයි කියලා. ඕක කරන්න එපා කියලා අපි කිව්වා. අපි සභාපති හාන්ස් විජයසූරිය මැතිතුමාටත් කථා කරලා මේ ගැන කිව්වා. ඔහුත් පිළිගත්තා මෙතැන ගැටලුවක් තිබෙනවා, ඒ ගැන සොයා බලන්නම් කියලා. අප්‍රේල් මාසයේ 07 වැනි දා කැබිනට් මණ්ඩලයෙන් තීරණයක් ගන්නවා, polycarbonate cards මිලියන 15ක් මිල දී ගන්න. මොකක්ද මේ කරන්නේ? Polycarbonate cards මිලියන 15ක් මිල දී ගන්න අවශ්‍යතාවක් නැහැ. මෙතැන conflict of interest එකක්ද තිබෙන්නේ? එහෙම නැත්නම් ඇයි මෙහෙම කරන්නේ? මේක අවශ්‍ය නැත්නම් අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා කියන්නේ, කෑම එක රුපියල් 300ක් වැඩි කරනවා, තව කොහෙන් හෝ රුපියල් 500ක් කපනවා වාගේ දේවල්. එහෙම නොවෙයි, large-scale corruption තිබෙනවා, large-scale conflicts of interest තිබෙනවා. ඔබතුමන්ලා මේ ගැන හිතලා බලන්න. මට වෙලාව නැති නිසා මීට වඩා කථා කරන්න හැකියාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පෙන්වන්න අවශ්‍ය වුණේ මේකයි. ඔව්, අපි Commission to Investigate Allegations of Bribery or Corruption වෙත අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා; ඒකට අවශ්‍ය මුදල් ඇතුළු සියලු දේ ලබා දෙනවා. හැබැයි, අර රුපියල් ලක්ෂ 5ක් ගත්තු පොලීසියේ OIC ගැන සොයනවා වාගේම මම දැන් ඉදිරිපත් කරපු විශාල ප්‍රශ්න පිළිබඳවත්, conflicts of interest පිළිබඳවත් සොයා බලන්න. එසේ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අප කථා කරනවා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ තීන්දු තීරණ ගැනීමේ කාරණය සම්බන්ධයෙනුත්. මෙම කාරණය සම්බන්ධයෙන් කථා කරද්දී මම කියන්න ඕනෑ, පසුගිය කාල සීමාව තුළ ලංකාවට වාහන ගෙන ඒම සම්බන්ධයෙන් දැවැන්ත ප්‍රශ්නයක් තිබුණු බව. වසර 5ක් ලංකාවට කිසිදු වාහනයක් ගෙන්නුවේ නැහැ. එවැනි රටක්, මෙය. ඒ තත්ත්වය වෙනස් කරලා මේ වනකොට ශ්‍රී ලංකාව තුළ අලුත් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ වාහන ගෙන්වීමේ ක්‍රමවේදය වෙනස් කරලා, ඒ ක්‍රමවේදයට සාධාරණයක් ඉෂ්ට කරන්න තමයි අදාළ රෙගුලාසි ඉදිරිපත් කරන්න අපි තීරණය කළේ.

නමුත්, මේ කථාව පැත්තකින් තබා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය ගෙනෙන සමහර කාරණා, සමහර තර්ක, මේ රටේ අනාගතය සම්බන්ධයෙන් මවන බිල්ලා ගැන මේ සභාව තුළ කථා කරන්න අපට සිදු වෙලා තිබෙනවා. පසුගිය කාල සීමාවේදී මේ පාර්ලිමේන්තුව තුළ මේ රටේ අනාගතය සම්බන්ධයෙන් දැවැන්ත තීන්දු තීරණ ගණනාවක් ගත්තා. ඒ තීන්දු තීරණ හැම එකක්ම ගනිද්දී විපක්ෂයේ මහත්වරු ඒ තීන්දු තීරණ ගැන කථා කරනවා වෙනුවට ඒ කාල සීමාව තුළ ඒගොල්ලන් මවාගත්තු බිල්ලාත් එක්ක තමයි දිගටම කථා කළේ.

අද මවපු බිල්ලා තමයි ලුණු. අද මේ මහත්වරුන් කථා කරන්න පටන් ගත්තා ලුණු බිල්ලා ගැන. අද විපක්ෂය සම්පූර්ණයෙන්ම ලුණුවලින් පෝෂණය වෙන්න පටන් ගෙන තිබෙනවා. හැබැයි, මේකේ විශේෂයක් තිබෙනවා. මේ අය ලුණු ගැන කථා කරනවා. කථා කරලා සභාවෙන් පිට වෙලා යනවා. මේක මේ සභාව තුළ තිබෙන තවත් විශේෂයක්. මොකද, සමහර මහත්වරුන් සමහර මාතෘකා ගැන කථා කරනවා. ඒ කථා කළාට, ඊට පසුව සභාවේ කිසිම කෙනෙක් නැහැ. විපක්ෂයේ මහත්වරුන් සියලුදෙනාම තමන්ගේ කථාව අවසන් වුණාම මේ සභා ගර්භයෙන් පිට වෙලා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ රට මාස 7කට ඉස්සෙල්ලා භාර ගත්තේ. ඒ භාර ගන්නකොට තිබුණේ සම්පූර්ණයෙන් විනාශ වුණු රටක්. රටේ අනාගතය සම්බන්ධයෙන් සියලුදෙනාටම තිබුණේ මහ දැවැන්ත බයක්. මේ රටේ තරුණ පරම්පරාව ලංකාව හැර දා යන්න එය විශේෂ හේතුවක් කර ගත්තා. ඒ සඳහා පාස්පෝට් ගන්න පෝලිම් ඇති වුණු යුගයක් එවකට තිබුණේ. හැබැයි, මේ මාස 7 අවසාන වෙනකොට, ලංකාව ඒ සියලු තත්ත්වයන්ගෙන් මිදී තිබෙනවා. අද ලංකාවේ ආර්ථිකය දැවැන්ත දියුණුවකට පත් වෙලා තිබෙනවා. නමුත් මේ මහත්වරුන්ට ඒක පෙනෙන්නේ නැහැ. අද අපි ඩොලර් අතින් ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඩොලර් එකට ස්ථාවර මිලක් හදාගෙන තිබෙනවා. ඒ වාගේම කොටස් වෙළෙඳ පොළ තත්ත්වය ඉහළට ගෙනිහින් තිබෙනවා. ඒ අනුව ආර්ථික වශයෙන් දැවැන්ත දියුණුවකට පත් වුණු රටක් බවට මේ රට පත් වෙලා තිබෙනවා. අපි වාහන ආනයනය සම්බන්ධයෙන් දැවැන්ත තීරණ තීන්දුවලට එද්දී, ඔය සමහර මහත්වරු කිව්වා, වාහන ගෙන්වන්න එපා, වාහන ගෙන්වන්න පටන් ගත්තොත් ඩොලර් සංචිතය දැවැන්ත විධියට කඩා වැටෙයි කියලා. හැබැයි, ඒ මහත්වරු අද ඒ කථා කියන්නේ නැහැ.

ඒ වාගේම සමහර මහත්වරු අද අපේ ආර්ථිකය සම්බන්ධයෙන් වෙනම කතන්දරයක් කියනවා. කටුනායක තිබෙන එක කර්මාන්තශාලාවක් ලංකාවෙන් ඉවත් වෙලා යන්න තීරණය කරලා තිබෙනවා ලු. ඒ ගැන කඳුළු හෙළන මේ මහත්වරුන්ගේ පාලන කාලය තුළ කර්මාන්තශාලා එකසිය ගණනක් පමණ ලංකාවෙන් ඉවත් වුණා. නමුත් ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, ඒගොල්ලන්ගේ කාලයේ ඉවත් කරන්න බලාපොරොත්තු වුණු කර්මාන්තශාලා ගණනාවක් මේ මාස 7 තුළ, අපි මේ රජය භාරගත්තාට පසුව නැවත අපි ආරම්භ කර තිබෙනවා. සීනි කර්මාන්තශාලාව, කඩදාසි කර්මාන්තශාලාව, හයිලන්ඩ් වාගේ කර්මාන්තශාලා, පුල්මුඩේ ඛනිජ වැලි කර්මාන්තශාලාව වැනි කර්මාන්තශාලා සියල්ලම අපි ප්‍රතිනිර්මාණය කර තිබෙනවා. ඒ අනුව විදේශ ආයෝජකයන් ලංකාවට එන්න පටන් ගෙන තිබෙනවා. විදේශ ආයෝජකයන් ලංකාවට එන්න පටන් ගෙන තිබෙන්නේ අපේ රට පිළිබඳව, අපේ රටේ ආර්ථිකය පිළිබඳව තිබෙන දැවැන්ත විශ්වාසයත් එක්කයි. ඒ විශ්වාසය අපි ගොඩනගා ගෙන තිබෙනවා. මේ විධියට ආර්ථික වශයෙන් ඉස්සරහට යන රටක් බවට අපි අපේ රට පත්කර තිබෙනවා.

පසුගිය කාල සීමාවේ මේ රටට සංචාරකයෝ ආවේ නැහැ. මොකද, විදේශිකයන් තුළ ලංකාවේ අනාගතය සම්බන්ධයෙන්, අපේ රටේ අභ්‍යන්තරය සම්බන්ධයෙන් දැවැන්ත බයක් තිබුණා. නමුත් අපේ රටේ තිබුණු යුද්ධය අද වනවිට සම්පූර්ණයෙන් නැවතිලා. අපේ රට යුද්ධයක් නැති රටක් බවට පත් වෙලා; බොහොම සාමකාමී රටක්. මේ තත්ත්වයත් එක්ක උතුර, නැඟෙනහිර ඇතුළු ලංකාවේ හැම දිසාවකටම ගමන් කරන්න පුළුවන් තත්ත්වයක් තමයි අද රට තුළ තිබෙන්නේ. මේ වෙනකොට ලංකාවට සංචාරකයන් ලක්ෂ 9ක් ඇවිල්ලා තිබෙනවා. ඒක විශේෂයක්. නමුත් ඒවා ගැන කථා කරන්නේ නැහැ. රට කඩා වැටෙනකම් බලාගෙන ඉන්නවා. ඔය මහත්වරු කඩා වැටෙන රටක් ගැන බලාගෙන ඉන්න.

සමහර අය ලුණු ගැන විතරක්ම කථා කරනවා. එහෙම ලුණු ගැන විතරක්ම කථා කරන්න එපා. අපි රට භාර ගනිද්දි සීනි කිලෝ එක රුපියල් 330යි, දැන් 220යි; පාන්පිටි කිලෝ එක රුපියල් 220යි, දැන් 140යි; අල කිලෝ එක රුපියල් 330යි, දැන් 120යි; බී ලූනු කිලෝ එක රුපියල් 330යි, 340යි, දැන් 120යි. බිත්තරයක මිල රුපියල් 70ට තිබුණේ, දැන් රුපියල් විසිගණනට තිබෙනවා. එහෙම කන බොන ජාති ගැන කථා කරනවා නම්, ඕනෑ තරම් කථා කරන්න පුළුවන්. හැබැයි, ඔයගොල්ලන් ලුණු ගැන විතරක් කථා කළාට, අපි මේ සභාව තුළ වැදගත් විධියට ලුණු ප්‍රශ්නය ගැන සාකච්ඡා කර තිබෙනවා. ඒ නිසා තව ටික කාලයකින් ලුණු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණාම, මේ අය තව මොකක් හරි ප්‍රශ්නයක් හොයා ගනීවි. විපක්ෂයේ මහත්වරුන්ට දැවැන්ත ප්‍රශ්න ටිකක් හැදිලා තිබෙනවා. හැබැයි, ඒ කිසිවක් සමාජයට එච්චර වටින්නේ නැහැ. මේ සමාජය අපේ ජාතික ජන බලවේගය රජයෙන් විසඳුම් බලාපොරොත්තු වුණේ ඔය ලුණු ප්‍රශ්නය වාගේ සිල්ලර ප්‍රශ්නවලට නොවෙයි.

ඒක මේ රටේ විපක්ෂයේ ඉන්න මහත්වරුන්ට දැවැන්ත ප්‍රශ්නයක් වුණාට, රජයක් විධියට අපි දැවැන්ත පෙළගැස්මක් එක්ක යන ඉදිරි ගමනක් තිබෙනවා. ඒ ඉදිරි ගමනත් එක්ක අපි මේ මහත්වරුන්ට සොලවන්න බැරි මහා ශක්තිමත් ගමනක් ආරම්භ කර තිබෙනවා. ඒ ගමන අපි යන හැටි බලාගෙන ඉන්න. අපි මේ ආණ්ඩුව බාර අරගෙන තවම මාස 7යි. ඒ මාස 7ට අපි දැවැන්ත වෙනසක් මේ සමාජය තුළ සිදු කරගෙන තිබෙනවා. වෙන මොකුත් ඕනෑ නැහැ, අපි මේ රට බාර ගනිද්දී මේ පාර්ලිමේන්තුව තිබිච්ච විධිය ගැන විපක්ෂයේ මහත්වරු ආපහු ආවර්ජනය කරන්න කියලා මම බොහොම ආදරයෙන් ඉල්ලනවා. මේ රටේ හිටපු සියලු ආකාරයේ දූෂිතයෝ මේ පාර්ලිමේන්තුව තුළ හිටියා. මේ පාර්ලිමේන්තුවේ කුඩුකාරයෝ හිටියා; ගංජාකාරයෝ හිටියා; එතනෝල්කාරයෝ හිටියා. මේ පාර්ලිමේන්තුවේ කවුද නොහිටියේ? මේකේ මයික් කැඩුවා; මිරිස් කුඩු ගහගත්තා. මේක එවැනි තත්ත්වයක තිබුණු පාර්ලිමේන්තුවක්. නමුත්, අද පාර්ලිමේන්තුව කොහොමද? අද දැවැන්ත විනයක් එක්ක මේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක කරගෙන යනවා. හැබැයි, ඒ විනයට අවමන් කරන විපක්ෂයේ මහත්වරුත් ඉන්නවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු උදේම අනවශ්‍ය දේවල් මේ සභාවේ කථා කරන්න පටන් ගන්නවා. එහෙම කථා කරලා මොනවා හරි නාඩගමක් නටනවා. ඊට පස්සේ මේ සභාවෙන් ඉවත් වෙලා යනවා. මෙන්න මෙහෙම තමයි විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ සභාව ඇතුළේ හැසිරෙන්නේ. අපි විපක්ෂයේ මහත්වරුන්ට කියනවා, විනයානුකූලව හැසිරෙන්න කියලා. ඔබතුමන්ලා විනයානුකූලව හැසිරෙන්න ඉගෙන ගන්න. එතකොට මේ පාර්ලිමේන්තුව ලස්සන පාර්ලිමේන්තුවක් බවට පත් වේවි. අන්න ඒකවත් හරියට කරන්න විපක්ෂයේ මහත්වරු අද ඉඳලා ඉගෙන ගන්න කියලා මම බොහොම ආදරයෙන් ඉල්ලනවා.

ඒ වාගේම, අය වැය විවාදය අවසන් වුණාට පස්සේ අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් පැහැදිලිවම ඇහුවා, "අපේ මන්ත්‍රීවරු 159දෙනා ගැන මොනවා හරි චෝදනාවක් තිබෙනවා ද?" කියලා. අපි ගැන ඉදිරිපත් කරන්න කිසිදු චෝදනාවක් විපක්ෂයට තිබුණේ නැහැ. අපේ ආණ්ඩුවට දැන් මාස 7ක් ගෙවිලා ඉවරයි. අපි තවමත් දූෂිත නැති, බොහොම ලස්සන පාර්ලිමේන්තුවක් කරගෙන යනවා. ඒ වාගේම, රටේ අනාගතය සම්බන්ධයෙන් අපි වැඩ කටයුතු කරද්දී, සමහර මහත්වරු අපේ මැති ඇමතිවරුන්ට "හොරා" කියනවා. අපි බොහොම පැහැදිලිව කියනවා, කිසිදු පදනමක් නැතිව අපේ මැති ඇමතිවරුන්ට හොරා කියන්න එපා කියලා. ඒක ඔයගොල්ලන්ගේ ක්‍රමයක් බවට පත් වෙලා තිබෙන්න ඇති. විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් අපේ චන්ද්‍රසේකර් ඇමතිතුමාට කියනවා, එතුමා ප්‍රභාකරන්ගේ පිළිරුවක් හදන්න සූදානමින් ඉන්නවා කියලා. අපි විපක්ෂයේ මහත්වරුන්ගෙන් බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා, ඔප්පු කරන්න බැරි නම් මේ සභාව ඇතුළේ වෙන දා වාගේ පච ඇදබාන එක සම්පූර්ණයෙන්ම නවත්වන්න කියලා. ඔයගොල්ලන්ට මාතෘකා නැත්නම් ඒක වෙනම සංවාදයක් කරගන්න. මේ සභාවේ වැඩ කටයුතු මුලින් පටන් ගනිද්දී විපක්ෂයට ඕනෑ විධියට මේ සභාවේ හැසිරෙන්න බැරි නිසා, ඒ අයට ලැබිච්ච අවස්ථාව තවත් විනාඩි දෙකක්, තුනක් වැඩි කරගෙන ඇති වෙනකම් ආණ්ඩුවට මඩ ප්‍රහාර එල්ල කරන එක සම්පූර්ණයෙන්ම කැත වැඩක්.

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

අපි මේ රට බාර අරගෙන තවම මාස 7යි වෙන්නේ. අපි මේ රට බොහොම වැදගත් විධියට පිළිවෙළට ඉදිරියට ගේනවා. ඒක නිසා මේ ආණ්ඩුව ගැන සැකයක් තිබෙන සෑම කෙනෙකුටම අපි කියනවා, මහත්වරුනි, ටික කාලයක් බලාගෙන ඉන්න කියලා. මොකද, ඔයගොල්ලන් අපට රට බාරදීලා තවම මාස 7යි. විනාශයට පත් වෙච්ච රටක් අපි බාර ගත්තේ. ඒ රට දැවැන්ත විධියට සංවර්ධනය කරමින් අපි ඉදිරියට ගෙනයමින් ඉන්නවා. අපි අපේ ගමන අපේම ජනාධිපතිවරයකුගෙන් පටන් ගත්තා. ඊට පස්සේ තවත් මාස දෙකකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනෙක් අපි එකතු කර ගත්තා. එතකොට අපට 160ක් හිටියා. මේ වෙනකොට අපි පළාත් පාලන ආයතනවලට තවත් 4,000ක් එකතු කරගෙන තිබෙනවා. දැන් අපට 4,160ක් ඉන්නවා. ලංකාවේ පළාත් පාලන ආයතනවල ග්‍රාමීය නායකයෝ 4,000ක් අපි හදලා තිබෙනවා. ඒක තව පැටව් ගහනවා. සමහර මහත්වරුන්ට පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් සැකයක්, බයක් තිබෙනවා. පසුගිය කාලසීමාවේ විපක්ෂයේ නායකයන් අපේ ගම්වලට ඇවිල්ලා ඡන්දය හිඟා කෑවා, පළාත් පාලන ආයතන ඇතුළට ඇවිත් බලය ලබා ගන්න. කැට තියලා කියනවා, එක පළාත් පාලන ආයතනයකවත් බලය ඔයගොල්ලන්ට හිතෙන හිතෙන විධියට ගන්න දෙන්නේ නැහැ කියලා. ඒක මේ සමාජය විසින් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒක තමයි මේ ඡන්ද ප්‍රතිඵලයෙන් කියන්නේ. ඔයගොල්ලන් සමහර ප්‍රතිඵල විකෘති කරන්න උත්සාහ කරමින් ඉන්නවා. විපක්ෂයට අවශ්‍ය බොහෝ දේවල් ඔබතුමන්ලා මේ සභාව තුළ ප්‍රකාශයට පත් කළාට, මේ රටේ මහජනතාව බුද්ධිමත්. අපේ රටේ ජනතාව බුද්ධිමත් නිසා තමයි මීට මාස 7කට ඉස්සෙල්ලා මහජනතාව තීන්දුවක් ගත්තේ, අවුරුදු 76ක් තිස්සේ ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ ක්‍රියාත්මක කරපු ඒ කාලකණ්ණි පිළිවෙත් ටික සම්පූර්ණයෙන්ම නවත්වලා, වෙනස් කරන්න ඕනෑ කියලා. ඒ වෙනස අද වෙනකම් ඒ විධියටම ස්ථාවරව තිබෙනවා.

ඔබතුමන්ලා එක එක ගණන් හදාගෙන ඉන්න. ඔබතුමන්ලා කියනවා නේ, අගෝස්තු මාසය වෙනකොට මේ ආණ්ඩුව ඉවරයි කියලා. අගෝස්තුවලට තව ටික කාලයයි. අගෝස්තු වෙද්දී වෙනත් කෙනෙක් ජනාධිපති වෙනවා කිව්වා. ආයෙත් කිව්වා, දෙසැම්බර් වෙද්දී මේ ආණ්ඩුව ඉවරයි කියලා. බලාගෙන ඉන්න. අපි කියනවා, ඔබතුමන්ලාටත් වෙන්නේ එළුවා පස්සෙන් ගිය කෙනාට වෙච්ච දේ තමයි කියලා. දෙසැම්බර් මාසය වෙනකොටත් ඔයගොල්ලන්ට සොලවන්න බැරි ආණ්ඩුවක් අපි හදලා තිබෙනවා. අපි කැට තියලා මේ කථාව කියනවා. අපි මේ රට බාර ගත්තේ නිකම් නොවෙයි.

අපි මේ ආණ්ඩුව භාර ගත්තේ ඕනෑ තරම් කැප කිරීම් කරන්නයි. සමහර මන්ත්‍රීවරු කියනවා, අපි අතර ලොකු ගැටුමක් තිබෙනවාය කියලා. අපි අතර කිසිදු ගැටුමක් නැහැ. බොහොම ආදරණීය රටක් නිර්මාණය කරගැනීමේ අභිලාෂයෙන් JVP, NPP කියලා කිසිදු භේදයක් නැතුව අපි සියලුදෙනා එකට එකතු වෙලා මේ රට නිර්මාණය කර ගැනීම වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් කරනවා. ඒ ගැන සපථ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ ඉතාම වැදගත් සාකච්ඡාවකට තමයි අවස්ථාව සූදානම් කරලා දුන්නේ. නමුත් මේ වැදගත් විවාදයේදී සාකච්ඡාවට භාජන කරන්න ඕනෑ කරුණු වෙනුවට මාතෘකාවට අදාළ නැති වෙන වෙන දේවල් තමයි විපක්ෂය නියෝජනය කරන පිරිස සඳහන් කළේ. ඒකෙන් අපට පෙනෙන්නේ ජාතික ජන බලවේගයේ වර්තමාන ආණ්ඩුව මේ සමාජය හරවත් සංවාදයකට යොමු කරලා තිබෙනවා කියන එකයි. ආර්ථිකයේ ප්‍රධාන නිර්ණායක නිවැරදි දිශානතියට ගෙන ගිහිල්ලා තිබෙනවා.

Hon. Presiding Member, emphasizing the importance of this piece of legislation we are discussing today, I would like to say that the delivery of promises we gave to the people is important. One of them is to facilitate business, to make it easier to do business in Sri Lanka. Saying no to corruption and having necessary systems and processes in place, Sri Lanka would once again be recognized as a nation serious about addressing its chronic issues. One of them relates to making use of online facilities by the certification agencies.

But, before getting on to technical details, I would like to highlight a point made by an Hon. Member a short while ago, referring to conflicts of interest. It is important to recognize the requirement to disclose the conflicts of interest. But, Madam, apart from disclosure, it is more important to ensure your ethical conduct while you are on respective boards or government institutions. What was lacking in the past was mentioning their affiliations. But, when decisions were made, they were actively involved in those processes. They were passing information to outsiders who had business interest. We do not have to go far. At the Committee of Parliament inquiring into the Central Bank Bond scam, several Members seated there, while discussions were going on those sensitive matters, made phone calls and shared information with outsiders. Today, those very Members are trying to preach us about conflicts of interest. So, there is absolutely no substance in what those fake Members say with their understanding of conflicts of interest. They are trying to preach us about conflicts of interest, whereas they had breached the very essence or the fundamentals of it while taking part in those Parliamentary Committees. So, for the members of the public, it is important to recognize that; even though they are trying to portray a different conduct, their reputation in terms of doing wrong things is well known to the society.

As a nation, we need to rely on the members of the business community. There are several capable individuals in the business community who have contributed to the success of several businesses. As the Government, we are serious about getting the their input where necessary, considering their conduct, the past track record and particularly, their not engaging in wrong activities and corruption-related transactions. Then, we

would also like to get business enterprises involved. From the discussions that the Government is having to take Sri Lanka forward to a better place, we cannot leave the business community out and go in a separate direction. No, we will work with the business community, get ideas from those individuals, experts of the business community out there, to take Sri Lanka to a better place. Therefore, we will work with the private sector business community to build this nation, which was ruined by those politicians and the corrupt culture they had built.

Madam, coming back to the subject matter, I would say that it is important to recognize the validity and efficiency these systems would bring about in the nation.

මේ ඉදිරිපත් කරන කරුණු කාරණා තුළින් අපේ වැඩකටයුතුවල efficiency එක, සක්‍රිය බව, ගුණාත්මක බව වැඩි කරලා අඩු පාඩු නැතුව ඒ කටයුතු ඉදිරියට ගෙනයන්නට අවස්ථාව ලැබෙනවා. මෙහි එක කාරණාවක සඳහන් කරනවා, මෙතුවක් කල් ගනුදෙනු කළා වාගේ නැතිව, අදාළ agencies එක්ක, නැත්නම් ඒ වෙනුවෙන් පත් කර තිබෙන නියෝජිත ආයතනත් සමඟ ගනුදෙනු කිරීමේදී e-mail එකක් මඟින් ගනුදෙනු කරන්නට ඕනෑ කියලා. මේ වාගේ සරල දේවල් පවා දැන් තමයි හඳුන්වා දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ 2025 අවුරුද්දේ වර්තමාන රජය කථා කරනවා, ඩිජිටල් අනාගතයක් ගැන. නමුත් e-mail තාක්ෂණය යොදා ගෙන ගනුදෙනු කරන එක පවා දැන් තමයි මේ වැඩකටයුතු හරහා හඳුන්වා දෙන්නේ. අනික් ආයතනවල මේක කෙරුණා වෙන්න පුළුවන්. නමුත් අලුතෙන් ඉදිරිපත් වුණු ආයතනවලටත්, ලියාපදිංචි වුණු ආයතනවලටත් e-mail ක්‍රමවේදය භාවිත කිරීම වැනි සුළු දේවල්වලට පවා වර්තමාන ආණ්ඩුව අවධානය යොමු කර තිබෙනවා.

Madam, on the one hand, with these process improvements we are referring to, we could say no to corruption and minimize the opportunities and chances for corruption and on the other, would track and trace sources of revenue generation, which is a very important step as far as the country is concerned and the situation we are in, as of now.

Facilitation of businesses to continue their activities is very important. I will take one example to demonstrate that. We have not limited it only to talking, Madam, but have implemented some of these digitization initiatives. The agency related to today's Debate is the Comptroller General's Office. We have implemented a digitization process there, which requires no individual to go to the Comptroller General's Office to give an application. We implemented it early this year, in January or February, and upon inquiry into the success of the digitization process, the Chambers indicated to me that even though we have implemented digitization, people still have to walk into those counters. Early this week, I, in fact, went to the Comptroller General's Office to see whether it is true, whether people still have to come to the counters. There are five counters available at the office. Only one counter was operating and a few people were there at the counter. I went and spoke to a person at the counter, who was from the business community and had come to ge the support of the officers. I asked him, "Why did you have to come here today, when there are online services available?" Madam, he mentioned that he wanted to follow up on an application he had made. I, in fact, thought that the application had been pending for a long time. I went there on a Monday morning. Then, I asked him, "When did you apply?" He said that he applied it on Friday and had come on Monday morning to check on its progress, which, in a way, is a good thing to have an efficient service delivered, even though there was no necessity with hardly a single working day passing from Friday to Monday. Then, I asked him, "Why did you come today? You made the application on Friday and you are here on Monday asking the officials about its progress." We never know why people come there; people may still be used to previous practices, which are not good practices, unfortunately. Then, that person explained the reason why he came. It was due to an emergency; they had ordered some spare parts related to aircraft engines, which they needed to get cleared urgently. That is why he had come in person. Then, I asked from the Department also, "Is there not a process to facilitate this type of outliers or exceptional situations, emergencies?" So, they also explained to the person who had come there. That example is just to highlight what we have implemented so far. Within this six-month period, we hav been going ahead with the digital journey in this country. The business community is benefiting, as we speak, from this engagement. Otherwise, every day, they have to send people to those institutions, which is a cost to them and leads to bribery and corruption as well. That is one example. There are many other examples I can give, but for the time being, I will limit it to the Sri Lanka Standards Institution. There, out of seven processes, two with the highest number of traffic are already done online or digitally delivered. These are examples to show the deliveries of the present Government, what we have implemented facilitating and saving cost to the business community and making it easier to do business in Sri Lanka.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක් විධියට ඉදිරියට යන ගමනේ එක සන්ධිස්ථානයක තමයි අපි ඉන්නේ. ඒකට processes ඉදිරිපත් කරනවා වාගේම අපේ නීති රාමුවේ තිබෙන අදාළ සංශෝධන කරගෙන යන්නට ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි අද කථා බහ කරලා මේ වැඩසටහන් ඉදිරිපත් කරන්නේ. අපි දන්නවා, ඉස්සර කාලයේ Volkswagen factory එකක් ගේනවා කියලා රටම බොරුවෙන් අන්දලා කරපු වැඩ පිළිවෙළ ගැන. ඒ වෙනුවට අපි දැන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙනවා. මොකද, අපි මැතිවරණයේදී වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක - implement - කරමින් තමයි මේ වෙලාවේ අපි මේ ගමන යන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ ගමන ඉදිරියට යනකොට, there is a new culture we are inculcating. People have voted in favour of that culture. It is an evolution from the manual-based transactions mentioned in the Gazette we are debating today. We are evolving into the digital space, but what is more important is that the Government is on a mission or a journey to deliver what we had promised to people who trusted this Government without knowing who we are.

What they trusted in is the expertise our Members had, the ingenuity in our approach and the governance approach we will implement in Sri Lanka. That is what we are implementing as the days pass by. Support is extended to large businesses, corporations operating here and to the SME sector as well. Our intention is to provide that support and help achieve the aspirations of the

[ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා]

businesses. Similarly, it is also our intention to ensure that the aspirations of the people, particularly of the parents, are achieved and delivered. Parents are worried that their children would not have a country to live in after they complete their education. This Government is delivering on those promises.

That is why it is important to discuss these important policies in this House. Madam, today, I was expecting that we would get some suggestions to amend the Regulations we have presented today. There have been discussions, but however, unfortunately, there were no valuable suggestions or recommendations made relating to the matter we are deliberating today. Some Hon. Members were discussing about salt. Madam, I cannot amend this legislation with salt; I need input relating to the Regulations under this legislation. They were saying that we are implementing the law without attending to previous corruptions. Recommendations are required for the Regulations brought under this piece of legislation we are deliberating today.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින මේ පාර්ලිමේන්තුව තුළින් හරවත් සාකච්ඡාවක් සිදු වුණා. අපේ රටේ ජනතාව බලාපොරොත්තු වන ඒ හරවත් සාකච්ඡාවට තමයි මේ පාර්ලිමේන්තුවට වියත් දැනුම තිබෙන පිරිසක් තෝරා එවා තිබෙන්නේ. රට පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ඒ පිළිබඳ නිවැරදි සාකච්ඡාවක්, කතිකාවක්, විවාදයක් කරලා අදාළ කරුණු පදනම් කරගෙන මේ ගැසට් සංශෝධනයන්ට පාර කැපෙයි කියලා ඔවුන් විශ්වාස කරනවා. නමුත් ඒ වෙනුවට අද දවස පුරාම ලුණු පිළිබඳව තමයි සංවාදය ඇති වුණේ. මම කලින් කිව්වා වාගේ ලුණු දාලා මේ ආනයන හා අපනයන (පාලන) පනත සංශෝධනය කරන්නට, මේ ගැසට් එක සංශෝධනය කරන්නට හැකියාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

රජය ගෙන යන මේ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරලා මේ වාගේ අණ පනත් අවශ්‍ය වේලාවට සම්මත කරලා මේ වැඩ කටයුත්ත සාර්ථකව ඉදිරියට කර ගන්නට මේවා ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතනවලට අවශ්‍ය පිරිස් බලය, අවශ්‍ය සම්පත් දෙන්නට අවශ්‍යයි. ඒ සඳහා මෙවර අය වැය තුළින්ම වැඩ කටයුතු සූදානම් කරලා තිබෙනවා. අපි අහලා තිබෙනවා කිහිප තැන කියනවා, රජය මේවාට අරමුදල් දෙන්නේ නැහැ කියලා. අය වැය - Budget එක - තුළින් මේ තිබෙන වාතාවරණය තුළ ඒ prioritization එකට අනුව, එම ආයතනවලට අවශ්‍ය සියලු සම්පත් -මානව සම්පත් වේවා, භෞතික සම්පත් වේවා, උපදේශන සම්පත් වේවා මේ සියලු දේ - ලබා දෙන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරලා තිබෙනවා.

So, let us not make the excuse that resources are a constraint for us to deliver. Let us get it done together with your suggestions. You are able to contribute to these valued debates and discussions.

Similarly, the Government is also engaged in business through our State-owned enterprises. It is important for us to ensure that the governance framework of those businesses is improved. We have an accountable mechanism, that if the entities are not able to deliver the results, the people of the country have to finance those activities as well. Therefore, separate initiatives are underway, as we are discussing, to improve those arrangements, to revise those legislations and to implement them in a timely manner.

Similarly, when we bring in new legislations, it is not only the aspect of the Government that we consider, but we also have dialogues and discussions with the industry as well. Just to highlight an example, we wanted to repeal the SVAT given to businesses. It is also known that the Government has laid the road map even with dates being identified. The SVAT will be repealed with a suitable mechanism implemented, under which entities would be able to submit their documentation through an online platform, the Inland Revenue Department would be able to go through them and provide the applicable refund within the shortest possible time. In this discussion, we engaged with the industries, particularly with the garment segment, which is considered the most-affected. We have had multiple discussions with the industry so far to accommodate their suggestions. As of now, they have suggested to consider trading houses also in this equation. That shows the cooperation between the business community and the present Government. We are not making high-handed decisions; we are making decisions for the betterment of the country. It is Sri Lanka - the North, the South, the East and the West - that we are going to build together with the input and the support of the business community. Another example to demonstrate our engagement with the industry is the continuous discussions the the ceramic manufacturers had with the Government to explain the challenges they are going through.

I am extremely happy to announce to this House, Madam, that the National Tariff Policy the Hon. President mentioned in his Budget Speech is also going to be established.

This week, we are going to establish the National Tariff Policy Committee. Its inaugural session will be held this week. We invite the industries to coordinate with the channels that are available through the Ministry of Industry and Entrepreneurship Development, to take part in those discussions and to submit their suggestions, proposals and challenges they have. So, we have a mechanism in place in the country. For the first time in the history of Sri Lanka, instead of politicians deciding on what should be the tax, a mechanism is now put in place to decided what should be the Excise Duty on articles imported into the country. So, that is a victory and a milestone we have achieved as a country, but we need to make sure that we improve it continuously. It is not only about establishing a committee and having its first meeting, but continuation of the activities. Therefore, I invite the business community to engaged with the process. The Ministry of Industry and Entrepreneurship Development has played a tremendous role in getting this done.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
The officials of the Ministry of Finance also have contributed to the success of these initiatives. So, as a nation, we should be able to move forward and achieve

many things that we could not achieve earlier as a country. We are are on a mission, Madam, and are hopeful that, as a country, we would achieve it together.

Thank you very much.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විසර්ජන පනත: යෝජනා සම්මතය
## ஒதுக்கீட்டுச் சட்டம்: தீர்மானம்
## APPROPRIATION ACT: RESOLUTION

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 01 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 01 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 01002 "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.50,000,000 සිට රු.150,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 02 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 02 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.20,000,000,000 සිට රු.8,500,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු හර්ෂණ නානායක්කාර මහතා]

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 03 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 03 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.2,700,000,000 සිට රු.2,650,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 04 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 04 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 23202 "බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම - බන්ධනාගාර දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.140,000,000 සිට රු.160,354,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.140,000,000 සිට රු.160,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## V

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 05 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 05 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.8,000,000 සිට රු.16,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VI

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 06 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 06 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25003 "විවිධ අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.1,500,000 සිට රු.400,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VII

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 07 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 07 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.2,500,000,000 සිට රු.3,000,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.2,500,000,000 සිට රු.1,900,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VIII

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු හර්ෂණ නානායක්කාර මහතා]

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 08 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 08 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.200,000,000 සිට රු.50,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.40,000,000 සිට රු.80,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.50,000,000 සිට රු.60,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IX

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 09 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 09 දරන නියමය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකීපනතේ තෙවැනි උපලේඛනයේIIවැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.400,000,000 සිට රු.350,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය
2025.04.27 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.) "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## X

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

(මෙම නියමයන් වලංගු වන්නේ 2024.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

**2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2024 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.**

**කණ්ඩායම් විධාන අංක 01**

2023 අංක 34 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතලවලට අනුව අනුර කුමාර දිසානායක වන මම, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය යටතේ මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 18701, 20201, 20401, 21001, 21101, 24501, 24701, 25401, 26101, 27401, 30401, 31001, 33501, 33601, 50101, 22101, 26301, 28201 සහ 32701 ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II ආණ්ඩුවේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III ආණ්ඩුවේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV ආණ්ඩුවේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | ශීර්ෂ අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | 18701 | - | - | 6,000,000 | 5,876,298.39 | - | - | 10 |
| 2 | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 20201 | - | - | 2,600,000 | 1,950,000 | - | - | 11 |
| 3 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 20401 | - | - | 5,000,000 | 4,850,000 | - | - | 12 |
| 4 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 21001 | - | - | 11,000,000 | 10,000,000 | - | - | 13 |
| 5 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 60,000,000 | 57,000,000 | - | - | 14 |
| 6 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 24501 | - | - | 4,000,000 | 3,500,000 | - | - | 15 |
| 7 | ශ්‍රී ලංකා රේගුව | 24701 | - | - | 55,000,000 | 52,000,000 | - | - | 16 |
| 8 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | - | - | - | - | 320,000,000 | 336,000,000 | 17 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 26101 | - | - | - | - | 320,000,000 | 410,000,000 | 18 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය | 27401 | - | - | - | - | 260,000,000 | 345,000,000 | 19 |
| 11 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 30401 | - | - | 8,700,000 | 6,500,000 | - | - | 20 |
| 12 | රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව | 31001 | - | - | 16,000,000 | 13,000,000 | - | - | 21 |
| 13 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 33501 | - | - | - | - | 1,500,000 | 3,100,000 | 22 |
| 14 | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 33601 | - | - | - | - | 6,000,000 | 11,000,000 | 23 |
| 15 | රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය | 50101 | - | - | - | - | 1,800,000 | 8,000,000 | 24 |
| 16 | කම්කරු දෙපාර්තමේන්තුව | 22101 | 75,000,000 | 77,900,000 | - | - | - | - | 25 |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | 26301 | 80,000,000 | 80,500,000 | - | - | - | - | 26 |
| 18 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | 250,000,000 | 260,108,952.10 | - | - | - | - | 27 |
| 19 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 32701 | 20,000,000 | 20,000,400 | - | - | - | - | 28 |

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2025.04.27 වැනි දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

## උතුරු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සවිබලගැන්වීම
## வட மாகாண சிறிய மற்றும் நடுத்தர அளவிலான ஏற்றுமதியாளர்களை மேம்படுத்துதல்
## EMPOWERMENT OF SMALL AND MEDIUM SCALE EXPORTERS IN THE NORTHERN PROVINCE

[பி.ப. 5.01]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌவர தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சபை ஒத்திவைப்பு வேளையில் பின்வரும் பிரேரணையை நான் முன்மொழிகின்றேன்:

"கைவிடப்பட்டுள்ள மனித மற்றும் பௌதிக வளங்கள் தவிர்ந்த, வட மாகாணத்தில் குறிப்பாக, யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், முல்லைத்தீவு மற்றும் வவுனியா ஆகிய மாவட்டங்களின் பெரும்பாலான பிரதேசங்கள் நாட்டின் ஏற்றுமதிப் பொருளாதாரத்துக்குப் பங்களிப்புச் செய்யக்கூடியவாறு முழு அளவில் பயன்படுத்தப்படவில்லை. ஏற்றுமதிச் செயற்பாடுகள் மற்றும் சந்தை தொடர்பான போதிய விழிப்புணர்வின்மை, போதிய உட்கட்டமைப்பு வசதிகள் காணப்படாமை மற்றும் கிராமிய கைத்தொழில்களுக்கு அரசாங்கத்தின் ஒத்துழைப்புக் கிடைக்காமை போன்ற பல்வேறு சவால்கள் இந்நிலைமை ஏற்படுவதற்கான முக்கிய காரணிகளாகக் காணப்படுகின்றன.

வட மாகாணத்தில் விவசாயம் மற்றும் கடற்றொழில் ஆகிய துறைகளின் செயற்பாடுகள் அதிகளவில் காணப்படுகின்றன. அங்கு நெற்செய்கை முக்கிய இடம் வகிப்பதுடன், கடற்றொழில் துறையும் குறிப்பிடத்தக்களவில் பொருளாதாரத்துக்குப் பங்களிப்புச் செய்கின்றது. எவ்வாறாயினும், இத்துறைகள் மூலமாகத் தேசிய ஏற்றுமதி வருமானத்துக்குப் பங்களிப்புச் செய்வதற்கான இயலுமை போதுமானதாகக் காணப்பட்டபோதிலும், இதுவரையில் அது சரியாகப் பயன்படுத்தப்படவில்லை. வெளிநாடுகளில் வாழ்கின்ற பெரும்பாலான இலங்கையர்கள் தமது தாய் நாட்டின் உற்பத்திகளைக் கொள்வனவு செய்வதற்கு விருப்பத்துடன் இருந்தபோதிலும், ஏற்றுமதிச் சந்தையைக் கைப்பற்றும் முறைமை தொடர்பில் அல்லது எமது நாட்டின் உற்பத்திகளைச் சர்வதேச ரீதியாக மேம்படுத்துதல் மற்றும் சந்தைப்படுத்துதல் முறைமை தொடர்பில் எமது நாட்டு மக்களிடம் போதிய அறிவின்மை பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது.

மேற்கூறிய மாவட்டங்களில் விசேடமாக பனை, மரக்கறி வகைகள், பழங்கள் மற்றும் கடற்றொழில் சார்ந்த கைத்தொழிலை வலுப்படுத்துவதற்குத் தேவையான துரித நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு அரசாங்கத்திடமும் அதேபோன்று சம்பந்தப்பட்ட அமைச்சுக்களிடமும் நான் தயவுடன் கேட்டுக் கொள்கின்றேன். உள்நாட்டு உற்பத்தியாளர்களைத் தெளிவூட்டுவதற்காக ஏற்றுமதிச் செயற்பாடுகள், சந்தை தொடர்பான மூலோபாயங்கள் மற்றும் பொருட்களின் தரம் தொடர்பான பயிற்சி வேலைத்திட்டங்களை மேற்கொள்வது மிகவும் முக்கியமானதாகும். இதற்கு மேலதிகமாக ஏற்றுமதிச் செயற்பாடுகளை இலகுபடுத்துவதற்கான உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பண்டங்களின் போக்குவரத்து வசதிகளை வழங்குவதன் மூலமாகப் பாரிய ஒத்துழைப்பையும் பெற்றுக்கொடுக்க வேண்டியுள்ளது.

வட மாகாணத்தில் சிறிய மற்றும் நடுத்தர அளவிலான ஏற்றுமதியாளர்களை வலுவூட்டுவதன் மூலம் உள்நாட்டுப் பொருளாதாரத்தை மேம்படுத்த முடிவதோடு, நாட்டின் ஏற்றுமதி வருமானத்தையும் அதிகரித்துக்கொள்ள முடியும். இந்த மாவட்டங்களிலுள்ள பொருளாதார இயலுமைகொண்ட கைத்தொழில்களை வெளிக்கொணர்வது தொடர்பில் துரிதமானதும் பயனுறுதி மிக்கதுமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு அரசாங்கம், சம்பந்தப்பட்ட அமைச்சுக்கள் மற்றும் அலுவலர்கள் ஒன்றிணைந்து செயற்படுவது அவசியமானதாகும் என்று இச்சபைக்குப் பிரேரிக்கின்றேன்."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய நாட்டில் குறிப்பாக வடக்கு மாகாணத்தில், யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்களில் நீண்ட கால யுத்தம் காரணமாக அந்தப் பிரதேசங்களில் சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகள் மிக மோசமாகப் பாதிக்கப்பட்டன. இன்று எங்களுடைய அரசாங்கம் வடக்கில் பல்வேறு அபிவிருத்தி நடவடிக்கைகளையும் தொழிற்றுறைகளையும் மேம்படுத்துகின்ற முயற்சிகளில் ஈடுபட்டு வருகின்றன. குறிப்பாக, காங்கேசன்துறையிலுள்ள தொழிற்பேட்டை, ஆனையிறவிலுள்ள உப்பளம், பரந்தனிலுள்ள இரசாயனத் தொழிற்சாலை, மாங்குளத்திலுள்ள தொழிற்பேட்டைகள் மற்றும் ஓட்டுசுட்டானிலுள்ள ஓட்டுத்தொழிற்சாலை என்பவற்றை மேம்படுத்தி, எமது நாட்டின் பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதற்கான முயற்சிகளை மேற்கொண்டு வருகின்றது.

அதேபோன்று, வடக்கில் தென்னை முக்கோண வலயம் ஒன்றை உருவாக்கி, அதற்கூடாகவும் அங்கு தொழில்முயற்சிகளை மேம்படுத்துவதற்கு எமது அரசாங்கம் பாடுபட்டுக்கொண்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, வவுனியாவில் ஆயிரம் ஏக்கர் காணியில் மரவள்ளிச் செய்கையை மேற்கொண்டு, அதை ஏற்றுமதி செய்வதற்கான முயற்சியிலும் அரசாங்கம் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றது. மேலும், மண்டைதீவில் சர்வதேச கிரிக்கெட்

மைதானமொன்றை உருவாக்கி, அதற்கூடாக அந்நியச் செலாவணியை அதிகரிப்பதற்கும் நாங்கள் எதிர்பார்க்கின்றோம். அதேபோன்று, யாழ்ப்பாணத்தில் உள்ளக விளையாட்டு அரங்கொன்றை நிர்மாணித்து அதனூடாகப் பல்வேறு அபிவிருத்திகளைச் செய்வதற்கும் நாங்கள் எதிர்பார்த்துள்ளோம். இப்படிப்பட்ட சூழலில், வட பகுதியில் சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகளை மேலும் மேம்படுத்த வேண்டும் என்பதற்காகத்தான் நான் இந்தப் பிரேரணையைக் கொண்டுவந்தேன்.

2022ஆம் ஆண்டு மொத்தத் தேசிய உற்பத்தியில் - GDPஇல் - வடக்கு மாகாணம் 4 சதவீத பங்களிப்பைச் செய்திருந்தது. அது 2023ஆம் ஆண்டு 4.5 சதவீதமாகக் காணப்பட்டபொழுதும், தென் மாகாணமானது 43 சதவீத பங்களிப்பைச் செய்திருந்தது. இது ஒவ்வொரு மாகாணத்துக்கும் இடையில் பொருளாதாரத்தில் பாரிய இடைவெளி இருப்பதையே எடுத்துக் காட்டுகின்றது. வடக்கு மாகாணத்தில் தொழில்முயற்சிகளை மேம்படுத்தி, அதன்மூலம் ஏற்றுமதிகளை அதிகரிப்பதனூடாக நாட்டின் மொத்தத் தேசிய உற்பத்திக்கு நாங்களும் அதிகளவு பங்களிப்புச் செய்ய முடியும்.

யாழ்ப்பாணத்துக்கென தனித்துவமான சில விடயங்கள் இருக்கின்றன. குறிப்பாக, கடல்சார் உற்பத்திகள், விவசாய உற்பத்திகள் மற்றும் பனை சம்பந்தமான விளை பொருட்கள் என்பன மிகவும் பிரபல்யமானவை. அவற்றை ஏற்றுமதி செய்வதனூடாக எமது நாட்டுக்கு வருமானத்தைப் பெறமுடியும். எங்களுடைய நாட்டிலிருந்து புலம்பெயர்ந்து வாழுகின்ற மக்கள் அவற்றைப் பெற்றுக்கொள்வதில் ஆர்வமாக இருக்கின்றார்கள். அதேபோன்று, எமது பிரதேசத்தில் விளைகின்ற வெங்காயம், திராட்சைப் பழம், மாம்பழம், பலாப்பழம் என்பவற்றுக்குக்கூட உலக நாடுகளில் அதிக கேள்வி காணப்படுகின்றது. அதேபோன்று, வட மாகாணத்துக்கென விசேடமான உணவுப் பொருட்களும் காணப்படுகின்றன. அவற்றை நாங்கள் ஏற்றுமதி செய்ய வேண்டும் என்றால், எங்களுடைய உற்பத்தியாளர்களை ஊக்குவிக்க வேண்டும். அவர்களை ஊக்குவிப்பதற்குப் பல்வேறு வேலைத்திட்டங்களை அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் செய்யவேண்டி இருக்கின்றது. பலருக்குத் தொழில்நுட்பம் சம்பந்தமான, ஏற்றுமதி சம்பந்தமான அறிவு குறைந்தளவிலே காணப்படுகின்றது. இவை சம்பந்தமான அறிவை மேம்படுத்துவதனூடாக அவர்களுக்கான வாய்ப்பை நாங்கள் பெற்றுக் கொடுக்க முடியும். இதை நாங்கள் வேகமாகச் செய்வதற்கு எதிர்பார்க்கின்றோம். அதற்காக எங்களுடைய அரசாங்கத்தில் பல்வேறு முயற்சிகள் நடைபெறுகின்றன.

எமது நாட்டில் யுத்தம் முடிவடைந்து 16 ஆண்டுகளின் பின்னர், மாற்றாந்தாய் மனப்பான்மையுடன் எங்களுடைய வடக்கு மாகாணத்தையும் வடக்கு, கிழக்கு மக்களையும் நோக்கி, அங்கு அபிவிருத்திகளைப் புறக்கணித்த கடந்த கால அரசாங்கங்களைத் தாண்டி எங்களுடைய அரசாங்கம் வட மாகாணத்தை நோக்கி நேசக் கரம் நீட்டியிருக்கின்றது. இந்த வேளையில், எமது பிரதேசங்களில் உற்பத்திகளை அதிகரிப்பதனூடாக ஏற்றுமதியை அதிகரித்து, அதன்மூலம் எங்களுடைய பிரதேசங்களை வளப்படுத்தி, ஏனைய மாகாணங்களுக்கு ஈடான ஒரு மாகாணமாக எமது வட மாகாணத்தை மாற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்ற நோக்கில், நாங்கள் எல்லோரும் ஒன்றிணைந்து பாடுபட வேண்டும் என்பதை வலியுறுத்துவதற்காகவே நான் இந்தப் பிரேரணையை இங்கு முன்மொழிந்தேன் எனக்கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, the Hon. (Dr.) S. Sri Bavanandarajah. Hon. Member, you have three minutes.

[பி.ப. 5.07]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Hon. Presiding Member, I second the Adjournment Motion moved by the Hon. Rajeevan Jeyachandramoorthy.

எமது வட மாகாணத்தைப் பொறுத்தவரையில் அங்குள்ள 5 மாவட்டங்களிலும் முன்பு ஒரு காலத்தில் சிறிய மற்றும் நடுத்தரத் தொழிற்சாலைகள் அநேகமாகக் காணப்பட்டன. குறிப்பாக, யாழ்ப்பாண மாவட்டத்திலே அலுமினியத் தொழிற்சாலைகள், வாளித் தொழிற்சாலை, கண்ணாடித் தொழிற்சாலை, பழச்சாறு உற்பத்தித் தொழிற்சாலைகள் என்று பல தொழிற்சாலைகள் காணப்பட்டன. ஆனால், ஏற்பட்டிருந்த போர் நிலைமையாலும் அரசியல் நடவடிக்கைகளாலும் இந்தத் தொழிற்சாலைகள் எல்லாமே இன்று மூடப்பட்டு விட்டன. எனவே, நாங்கள் மீண்டும் அவற்றைப் புதுப்பிக்கவேண்டிய தேவையிருக்கின்றது.

யாழ். மாவட்டத்தைப் பொறுத்தவரையிலே விவசாயம், கடற்றொழில், புடவைக் கைத்தொழில், அத்துடன் பனைசார் உற்பத்தித் தொழில் தொடர்பான பல சிறிய மற்றும் நடுத்தரத் தொழிற்சாலைகளை உருவாக்க வேண்டிய தேவையிருக்கின்றது. அவை இதுவரை அங்கு உருவாக்கப்படாமல் இருப்பதற்கு அரசாங்கத்தின் தேவையற்ற தடைகள் காரணமாக இருந்திருக்கின்றன. எனவே, அந்தத் தடைகளையெல்லாம் நீக்கி எமது பகுதியிலே தொழிற்சாலைகளை ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை எடுக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. உதாரணமாக, இளைஞர்களுக்கான தொழிற் பயிற்சிகளை வழங்குவது, இந்தத் தொழிற்சாலைகளுக்குத் தேவையான பண வசதிகளை வங்கிகள்மூலம் செய்து கொடுப்பது, சந்தை வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பது போன்ற நடவடிக்கைகளை எங்களால் மேற்கொள்ள முடியும். மேலும், ஏற்றுமதியின்போது ஏற்படக்கூடிய சில தடங்கல்களை நீக்கி, உற்பத்தியாளர்கள் தம் உற்பத்திகளை நேரடியாகவே ஏற்றுமதி செய்யக்கூடிய ஒரு சந்தர்ப்பத்தை வழங்குவதன்மூலம் எமது பகுதியிலே தொழில் வாய்ப்புகளை ஏற்படுத்தக்கூடியதாக இருப்பதுடன், நாட்டின் வெளிநாட்டு வருமானத்தையும் உயர்த்தக்கூடியதாக இருக்கும்.

கௌரவ உறுப்பினர் றஜீவன் ஜெயசந்திரமூர்த்தி அவர்கள் குறிப்பிட்டதுபோல, நாட்டின் மொத்த உற்பத்தியில் எமது யாழ். மாவட்டம் 4 சதவீதப் பங்களிப்பையே செய்கின்றது. முன்னொரு காலத்திலே சுமார் 20 சதவீதத்துக்கும் மேல் பங்களிப்புச் செய்திருந்தது. போர் காரணமாகவும் தொழிற்சாலைகள் மற்றும் ஏற்றுமதிச் சந்தை வாய்ப்புகள் நிறுத்தப்பட்டதன் விளைவாகவுமே எமக்கு இப்படியான நிலை ஏற்பட்டது. எனவே, public-private partnership மூலமாவது அங்குள்ள சிறிய மற்றும் நடுத்தரத் தொழில் துறையாளர்களை ஊக்குவித்து, அந்த உற்பத்தியாளர்களுக்குத் தேவையான சலுகைகளையும் வங்கி வசதிகளையும் செய்து கொடுப்பதன்மூலம் வட மாகாணத்திலிருந்தும் இந்த நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக்கொடுக்கும் வழிமுறைகளை ஏற்படுத்தித் தருமாறு எங்களது அரசாங்கத்திடம் நான் கேட்டுக் கொள்கிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. M. Nizam Kariapper. You have seven minutes.

[5.09 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, when you spoke in Tamil, I think everybody was shocked.

Thank you, Madam, for the opportunity to speak on this Adjournment Motion aimed at empowering small and medium exporters in the Northern Province. I rise today to support this Motion, but, of course, with a vital amendment; the scope of this discussion should be extended to include the Eastern Province as well is my proposal. The economic and social realities of the Northern and the Eastern Provinces are deeply intertwined, their challenges are similar and so is their untapped potential. Both provinces are rich in culture, traditions and natural resources. But, decades of conflict, displacement and economic neglect have left them lagging behind. Today, if we are to speak seriously about inclusive national growth, we must focus on empowering small and medium enterprises in these regions, enabling them to become prospective exporters.

Madam, I wish to draw your attention to another important and critical matter that has gone unnoticed. Under the Ninth Schedule of the Constitution - Provincial Council List - matters relating to promotion of agriculture, fisheries, co-operative industries, cottage industries and local economic development fall within the jurisdiction of the Provincial Council. This clearly reflects the framers' intent that economic development of each province is not a central subject alone, but one that must be driven from the ground up with the Provincial Council paying a lead role. Ignoring this structure is not only a policy failure, but also a constitutional abdication.

The Northern and Eastern Provinces have distinct sectors with export potential, which could contribute meaningfully to the national economy. Let us start one by one. Culinary heritage and agro exports, traditional food items - you know about Jaffna traditional food items - organic products and preserved seafood from these regions are of high demand, especially among the overseas community. With proper training, packaging and marketing support, these items could be developed into powerful export brands. I will take an interesting example. When I visit Jaffna Courts, I go to "*Rasavin Wana*m". Just in front of it, there is a small boutique, which has a sweet item called "*elluppahu" ,* a blackball full of nutritional value. You do not get that in any part of the country. So, these have to be promoted. I always go there and have that snack.

Then, handloom and traditional textiles. Our handloom sector is a cultural treasure. It also presents a strong case for premium exports in the global sustainable fashion and ethical trading market if only be invested in modernization, design, innovation and *e*-commerce integrations.

Then, Palmyra-based products. Palmyra is abandoned in both provinces and holds immense value from jaggery, vinegar to fibre products and handicrafts. But, this industry remains informal and fragmented. It needs organized support, quality certification and research-led value addition.

Also, you get seafood and marine products. Our coastal belt, particularly in the North and the East, are rich with exportable seafood like crab, cuttlefish and dried fish. But, we lack a cold chain, export licence and post-harvest processing support necessary to compete internationally.

While the initiative of the Central Government and private sector participation are vital, there is a missing partner in the conversation - the provincial council. For far too long now, the Northern and the Eastern Provincial Councils have not been functioning. Without electoral representation, the local mandate and the institutional capacity to plan and deliver, we are limiting the potential for a truly localized responsive development. Therefore, Madam, I call upon this House and the Government to immediately take steps to hold the Provincial Councils Elections. It is essential that the provincial councils become an active partner in economic development of these regions as they are best placed to understand the local needs, to mobilize rural entrepreneurs and coordinate support across the departments.

வட, கிழக்கில் எங்களுடைய மாகாண சபை இயங்கினால், அதன் உறுப்பினர்கள் இதனுடைய உண்மையான தேவையை உணர்ந்து செயற்படக்கூடியதாக இருக்கும்.

Therefore, Madam, I urge the Government to expand the focus of export development programmes to both the Northern and the Eastern Provinces, establish SME export incubation zones in key districts like Jaffna,Vavuniya, Batticaloa and Ampara, support handloom clustsers, palmyrah co-operatives, seafood collectives and provide modern tools, marketing training and credit access, facilitate diaspora engagement and overseas promotion through targeted trade fair and digital campaign and finally, to resort to full democratic governance in the provinces by holding the long overdue Provincial Councils Elections. Only then, can we build partnership with the Centre, the provinces and the people, a triangular that is essential for genuine and lasting development.

Madam, in conclusion, I would say let us not look at the North and the East merely as regions recovering, but as engines of growth. Let us also believe in the capacity of our people, their skills, their resilience and their dreams. Let us provide them the institutions, infrastructure and inspiration they need to connect to the world as confident sub-exporters.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Mayilvaganam Jegatheeswaran. You have three minutes.

[பி.ப. 5.15]

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பாராளுமன்ற உறுப்பினர் றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் கொண்டுவந்த மிகவும் நல்லதொரு விடயம் பற்றிய இந்தப் பிரேரணையை நான் ஆதரிக்கின்றேன். இலங்கையின் சிறிய மற்றும் நடுத்தரத் கைத்தொழில் துறையை எடுத்துக்கொள்கின்றபோது, விசேடமாக வட மாகாணம் அவ்வாறான கைத்தொழில் உற்பத்திகளை மேற்கொள்ளக்கூடிய பல்வேறுபட்ட மூலப்பொருள் வளத்தைக் கொண்ட பிரதேசமாகக் காணப்பட்டபோதிலும், 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்த பிறகு இருந்த அரசாங்கங்கள் அந்தத் தொழில் துறைகளை ஊக்குவிப்பதற்குப் பொருத்தமான நடவடிக்கைகளை எடுக்கவில்லை.

இந்தப் பாராளுமன்றத்திலே கடந்த 16 வருடங்களாக எமது வட மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பல்வேறுபட்ட அரசியல் கட்சிகளைக் சார்ந்த பலர் இருந்தபோதும் பொருத்தமான நடவடிக்கைகளை மேற்கொண்டு அந்தக் கைத்தொழில் துறையை மேம்படுத்துவதற்குரிய எந்தவிதச் செயற்பாடுகளையும் மேற்கொள்ளாததன் காரணத்தினால், வடக்கு மாகாணத்திலே சிறிய மற்றும் நடுத்தரக் கைத்தொழில்கள் மிகவும் நலிவடைந்த நிலையிலே காணப்படுகின்றது. அதை மேம்படுத்தும் நோக்கத்துடன் எங்களுடைய அரசாங்கத்தின் மூலமாகப் பல்வேறுபட்ட செயற்றிட்டங்களை நாம் எதிர்காலத்திலே மேற்கொள்ளவிருக்கின்றோம்.

இதிலே சிறப்பாக முக்கியமாகக் கூறவேண்டிய விடயம் என்னவென்றால், உண்மையிலே சிறிய மற்றும் நடுத்தரக் கைத்தொழில்களுக்குச் சந்தைப்படுத்தல் என்பது மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. அதேபோல, தொழில்நுட்ப வசதிகளும் முக்கியத்துவம் வாய்ந்தவை. ஏனைய நாடுகளின் தொழில்நுட்பப் பயன்பாட்டுடன் ஒப்பிடும்போது இலங்கையில் மிகவும் குறைவாகவுள்ள தொழில்நுட்ப வசதிகளை மேம்படுத்தி, குறிப்பாக வட மாகாணத்தில் உள்ள சிறிய மற்றும் நடுத்தரக் கைத்தொழிலாளர்களுக்கு அவ்வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதனூடாக, அவர்களின் உற்பத்தியை அதிகரிக்கச் செய்வதோடு, கூடுதலான சந்தைப்படுத்தல் வாய்ப்பையும் உருவாக்கிக் கொடுப்பதற்கான நடவடிக்கைகளை அரசாங்கம் என்ற ரீதியில் நாம் எடுக்கவேண்டிய தேவைப்பாடு காணப்படுகின்றது. அத்துடன், உற்பத்தியின்மூலம் மிகவும் கூடிய வருமானத்தைப் பெறக்கூடிய நிலைமை தொடர்பாக மக்களுக்கு விழிப்புணர்வை ஏற்படுத்தவேண்டிய தேவைப்பாடும் இருக்கின்றது. அதுமட்டுமல்லாமல், பதப்படுத்தி நீண்டகாலம் பயன்படுத்தக்கூடிய வகையிலான உற்பத்திப் பொருட்களுக்கான தொழில்நுட்ப ஆலோசனைகளையும் சிறிய மற்றும் நடுத்தரக் கைத்தொழிலாளர்களுக்கு நாங்கள் வழங்க வேண்டும். இதன்மூலம் அவற்றின் ஏற்றுமதியை அதிகரிக்கக்கூடியதாக இருக்கும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிந்துவிட்டது.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

அரை நிமிடம் தாருங்கள்!

இவர்களுக்கான இட வசதியைப் பெற்றுக்கொடுப்பது மிகவும் முக்கியமானது. அதுபோல், தற்போதைய நவீன காலத்தில் விளம்பரப்படுத்தல் என்பதும் மிகவும் முக்கியமானது. இந்தச் சிறிய கைத்தொழிலாளர்களுடைய உற்பத்தி தொடர்பான விளக்கங்களையும் அதன் நன்மைகளையும் வெளிநாடுகளில் விளம்பரப்படுத்துவதனூடாக இங்கு வரும் சுற்றுலாப் பயணிகள் கூடுதலான உற்பத்திகளைக் கொள்வனவு செய்யக்கூடிய வாய்ப்புகளை ஏற்படுத்துவதன்மூலம் அந்த மக்களுடைய பொருளாதாரத்தை விருத்தி செய்யக்கூடியதாக இருக்கும். இதற்காக எமது அரசாங்கம் பல நடவடிக்கைகளை ஆரம்பித்திருக்கின்றது. குறிப்பாக, சந்தைப்படுத்தல் வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுப்பதற்காக 'லக்சல', BCC, 'சதொச' போன்ற நிறுவனங்களுடன் தொடர்புகளை ஏற்படுத்தியிருக்கின்றோம். இதன்மூலம் பொருளாதார நெருக்கடிகளில் வாழ்கின்ற மக்களுக்கு, விசேடமாகப் பெண் தலைமைத்துவத்தைக் கொண்டுள்ள குடும்பங்களுக்கு அவர்களுடைய சிறு கைத்தொழிலை மேம்படுத்துவதற்கான வாய்ப்பு ஏற்படும். வட மாகாணத்திலே கூடுதலான பெண் தலைமைத்துவக் குடும்பங்கள் இருக்கின்ற நிலையில், அவர்களின் வருமானத்தை அதிகரிக்கக்கூடிய வகையில் எமது அரசாங்கம் மேலும் சிறப்பான நடவடிக்கைளை எடுக்க வேண்டும். அதற்காக வட மாகாணத்தைச் சேர்ந்த அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களும் முழுமையாக ஒத்துழைப்போம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. (Dr.) Ramanathan Archchuna. You have seven minutes.

[பி.ப. 5.20]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்கு முதற்கண் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்றையதினம் முன்னாள் அதிபரான கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் யாழ்ப்பாணத்தை மையப்படுத்தி சிறிய மற்றும் நடுத்தர ஏற்றுமதியாளர்கள் தொடர்பில் ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவந்தமைக்கு உண்மையாகவே யாழ். மாவட்ட மக்களின் பிரதிநிதி என்ற அடிப்படையில் நான் மிகவும் சந்தோஷமடைவதோடு, அதற்கு என்னுடைய முழு ஆதரவையும் தெரிவிக்கின்றேன்.

கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்களே, நீங்கள் எவ்வளவுதான் JVPக்கு வால் பிடித்தாலும், அவர்களுடைய

[ගරු රාමනාදන් අර්ච්චුනා මහතා]

செம்புகளைத் தூக்கினாலும், நாங்கள் தமிழர் என்பதை ஞாபகம் வைத்துக் கொள்ளுங்கள்! நீங்கள் என்னைவிட வயதில் மூத்தவர்; என்னுடைய அண்ணனின் வயதை ஒத்தவர். ஒரு காலத்தில் நானும் நீங்களும் உங்களுடைய தமிழ் பாராளுமன்ற உறுப்பினர்களும் அரசாங்கம் செய்த ஒடுக்குமுறைகளால் பாதிக்கப்பட்டு, வடக்கு மாகாணத்திலிருந்து புத்தகப் பைகளுடன் சைக்கிளில் கிலாலி ஊடாக இடம்பெயர்ந்து வந்தவர்கள் என்பதை நீங்கள் மறந்து விடக்கூடாது. அதுமாத்திரமன்றி, நீங்கள் பிரதேச அபிவிருத்தி குறித்த பிரேரணைகளைக்கொண்டு வரும்போது, கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் சொன்னதுபோல கிழக்கு மாகாணத்தை மறக்கக்கூடாது. மேலும், வடக்கு, கிழக்கு சேர்ந்ததுதான் தமிழர் தாயகம் என்பதை நீங்கள் மனதில் வைத்துக்கொண்டுதான் இவ்வாறான பிரேரணைகளைக் கொண்டுவர வேண்டும். இந்தப் பிரேரணை பிரதேசவாதமானதாகக் காணப்படுவதால் சற்றுக் கவலையளிக்கின்றது. நீங்கள் தெரியாமல் இந்தப் பிழையை விட்டிருப்பீர்கள் என நினைக்கின்றேன். கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் இப்பொழுது சொன்ன விடயம் மிகவும் முக்கியமானது. நான் மேலதிகமாக எதனையும் சொல்ல விரும்பவில்லை. கௌரவ நிசாம் காரியப்பர் உட்பட ஏனைய உறுப்பினர்கள் எல்லோரும் வடக்கு மாகாணத்திலிருந்து என்னென்ன பொருட்களை ஏற்றுமதி செய்யலாம் என்று சொன்னார்கள்.

ஏற்றுமதித்துறையில் அனுபவமுள்ளவன் என்ற அடிப்படையிலும், நான்கு வருடங்களில் இலங்கையின் பெறுமதியில் கிட்டத்தட்ட 110,000 US Dollarsக்கு ஏற்றுமதி செய்தவன் என்ற அடிப்படையிலும் நான் உங்களுக்கு ஒருசில விடயங்களைச் சொல்ல வேண்டும். இலங்கையில் தேயிலைக்கு அடுத்தபடியாக ஏற்றுமதி செய்யப்படுவது பதனிடப்பட்ட தோலாகும். இன்றைக்கு வடக்கு மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் தோல் பதனிடும் தொழிற்சாலை ஒன்றுகூட இல்லை. இதை நான் கௌரவ நிசாம் காரியப்பர் அவர்களுக்கும் சொல்ல விரும்புகின்றேன். ஏனெனில், அங்கு தோல் பதனிடும் தொழிற்சாலையானது மிகவும் முக்கியமானது. கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் இவ்வாறான விடயங்களைக்கொண்டு வந்தபோது, தோல் பதனிடும் தொழிற்சாலை ஒன்றை எங்களுடைய சாவகச்சேரியில் அமைக்குமாறு நான் வேண்டுகோள் முன்வைத்தேன்.

2017ஆம் ஆண்டு கட்டப்பட்ட சாவகச்சேரி பொருளாதார மத்திய நிலையமானது இன்று வரை திறக்கப்படாமல் இருக்கின்றது. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් බාධා කරන්න එපා කියන්න. මම කථා කරලා ඉවර වුණාට පස්සේ කථා කරන්න කියන්න. DCC meetingஇல் நான் உங்களிடம் எத்தனை தடவை சாவகச்சேரியிலுள்ள பொருளாதார மத்திய நிலையம் தொடர்பில் சொல்லியிருக்கிறேன். உங்களால் அது தொடர்பில் எந்த நடவடிக்கையும் எடுக்க முடியாது. இருந்தாலும், உங்களுக்கு ஞாபகப்படுத்துகின்றேன். எதிர்வரும் 30ஆம் திகதி DCC meeting நடைபெற இருக்கிறது. நீங்களும் வாருங்கள்; நானும் வருகிறேன்; கதைப்போம்! அதுகூட, mediasஇல் வரும்.

මම මේක සිංහලෙන් කියන්න කැමතියි. අපි වෙනුවෙන් - දෙමළ ජනතාව වෙනුවෙන්- මෙච්චර කාලයක් මේ ආණ්ඩු එක්ක රණ්ඩු වුණා, අපේ නායකයෝ. අපේ නායකයෝ කියන්නේ කොටි නායකයෝ. ඔයගොල්ලන්ට ත්‍රස්තවාදින් වුණාට ඒ අය අපේ නායකයෝ කියලා අවුරුදු 30ක් අපි හිතාගෙන හිටියා. අපි අපේ නායකයන්ට තවම ගොඩක් ගරු කරනවා. අපි තවමත් ඒගොල්ලන්ට ගරු කරලා සලකනවා. හැබැයි, සිංහල ජනතාව වෙනුවෙන් රණ්ඩු කරපු රණ විරුවන්ට "රණ විරුවා" කියලා කොන්ද පණ ඇතුව කියන්න අද ඔයගොල්ලන්ට බැරි වෙලා තියෙනවා. ඒක එකක්.

දෙවැනි එක මේකයි. ඔබතුමන්ලාගේ සුනිල් හඳුන්නෙත්ති කියලා ඇමති කෙනෙක් ඉන්නවා. එතුමා අද මට කිව්වා, උතුරේ ඉන්න ජනතාව හදන ලුණු - salt - දකුණට ගේන්න එපා කියමින් මම රණ්ඩු වෙනවා කියලා. එතකොට මම කිව්වා, "Parliament (Powers and Privileges) Act එක යටතේ මම මෙයාට ගහනවා" කියලා. මම ගහනවාමයි. හැබැයි අපි -දෙමළ මිනිස්සු- කවදාවත් කියන්නේ නැහැ, උතුරේ හදන ලුණු ටික දකුණට ගේන්න එපා කියලා. අපි කියන්නේ උතුරේ හදන ලුණු ටික එතැනම pack කරලා ගේන්න කියලා. අඩුම ගණනේ ඒකවත් කරන්න බැරිද? නමුත්, ඔයගොල්ලෝ ලුණු දකුණට ගෙනැල්ලා private companiesවලට විකුණනවා. උතුරේ හදන ලුණු ටික උතුරේ pack කරලා රටට බෙදන්න බැරුව දකුණට ගෙනැල්ලා ඒක companiesවලට, co-operativesවලට වැඩිපුර ගාණට විකුණන එක ගැන කථා කරන්න ගියාම හඳුන්නෙත්ති ඇමතිවරයා කියන්නේ මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you.

ආයේ ප්‍රදේශවාදයක් ගැන කථා කරනවා. එතුමා කියන්නේ කිලිනොච්චියේ ඉන්න කෙනාට එතැන Manager post එකට එන්න දෙන්නේ නැතිව මම බාධා කරනවා කියලා. සුනිල් හඳුන්නෙත්ති එතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න, department එකේ ඉන්න,- එතුමා දන්නේත් නැහැ. දැනට අලිමංකඩ saltern එකේ ඉන්න කෙනා Jaffna එක්කෙනෙක්. එයා අයින් කරන්න කියලා මම ඉල්ලන්නේ කොහොමද?

අනිත් එක මේකයි. මේක දැනගන්න ඕනෑ මේ රටේ ජනතාව. කොච්චර බොරු කිව්වාද? මාව කොටියෙක් විධියට මේගොල්ලෝ ප්‍රකාශ කරනවා. මම කොටියෙක් නම් මම බය නැතුව,- මෙතැන 159ක් ඉන්නවා. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තිබෙන්නේ. CID එක තිබෙනවා. ඕනෑ වෙලාවක ඔයගොල්ලන්ට මම මරන්න පුළුවන්. ඒ වුණාට මම බය නැතිව අපේ හිතේ තිබෙන එක -දෙමළ මිනිසුන්ගේ හිතේ තිබෙන එක- කියනවා.

හැබැයි, මන්ත්‍රීකම් 159ක් තියාගෙන ඒගොල්ලන්ගේ රණ විරුවන්ට "රණ විරුවන්" කියලා කියන්නත් බැරි, "රණ විරුවන්" කියලා පිළිගන්නත් බැරි කොන්ද පණ නැති ආණ්ඩුවක් තමයි මේ තියෙන්නේ. අපි සලකලා තියෙනවා. අපේ ප්‍රභාකරන් රණ විරුවාගේ නමට කවදාවත් -එක දවසක්වත්- හානි කළේ නැහැ, එයාගේ නම සවුත්තු කළේ නැහැ. අපි රණ විරුවා රණ විරුවා විධියට සැලකුවා. එල්ලාල ගැන අපි ඒ විධියට බැලුවා. එල්ලාල අනුරාධපුර රජය අවුරුදු ගාණක් අරගෙන ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක් දෙන්න.

සිංහල ජනතාව එල්ලාල කියන දෙමළ රජුට ඒ වියියට සලකලා තියෙනවා. හැබැයි, අද තමන්ගේ රණ විරුවන්ටවත් සලකන්න බැරි මන්ත්‍රීකම් 159ක ආණ්ඩුවක් -government එකක්- තියෙනවා කියන්නේ, මාර දුකයි. තව එකක් කියන්න කැමතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 20ක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 20ක් දෙන්න.

ඒ වාගේම, තව ඇමති කෙනෙක් කියනවා, අපේ මිනිස්සු මරලා තියෙනවා, ඒක අපිට කියන්න බැරි ලු, අපිට law එකක් පාවිච්චි කරනවා ලු, අපේ මිනිස්සු මරලා තියෙන එක කියන්න බැරි ලු. ඒ තත්ත්වයට තමයි මේ රට ගිහිල්ලා තියෙන්නේ. ඒ තත්ත්වයට තමයි මේ ආණ්ඩුව ගිහිල්ලා තියෙන්නේ. ලජ්ජයි! මේක කියන්න ලජ්ජයි!

Thank you, Hon. Rajeevan Jeyachandramoorthy, for bringing this Adjournment Motion.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Madam, I rise to a point of Order.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சபையில் கௌரவ உறுப்பினர் அவர்கள் JVP, தேசிய மக்கள் சக்தி எனப் பிரித்துக் காட்டுகின்றார். நாங்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தைச் சேர்ந்தவர்கள். நான் கொண்டுவந்த விடயம் வடக்கு மாகாணத்தின் அபிவிருத்தி சம்பந்தமானது. அவர் இந்த விடயத்தை வேறு திசையில் கொண்டுசெல்வதை நான் கண்டிக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කියන කාරණය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. ඒක point of Order එකක් නොවෙයි.

ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.27]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විනාඩි 4කින් පිළිතුරු කථාව කරන්න අමාරුයි.

මේ මාතෘකාව සහ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. අපේ රට අවුරුදු 30ක යුද්ධයක් පැවැති රටක්. උතුරු හා නැඟෙනහිර කියන පළාත් දෙකේම දැනට බලය ගිලිහිලා තිබෙන පක්ෂවලට, නායකයන්ට, ඒ නායකයන්ට උදවු කරපු අයට, ඒගොල්ලන්ගේ යහළුවන්ට, Facebook එකේ ලියන අයට බැරි වුණා, සත පහක සංවර්ධනයක් උතුරු, නැඟෙනහිරට කරන්න. ජාතිවාදය පදනම් කරගෙන දේශපාලන බලය හොබවපු අය තවමත් උත්සාහ කරනවා, ජාතිවාදය පදනම් කරගෙන බලය ගන්න. දැන් රටේ සිංහල, දෙමළ, මුස්ලිම් පක්ෂ එකයි තිබෙන්නේ. ඒක තමයි, ජාතික ජන බලවේගය. ජාතික ජන බලවේගය ආණ්ඩුව ආර්ථික සංවර්ධනය කරන්න යනකොට වේදනාවෙන් කෑ ගහුවාට වැඩක් නැහැ. අපි දන්නවා, conflict එකකට ගිය රටවල සාධාරණත්වය, සිද්ධ වෙච්ච දේවල් පිළිබඳ යුක්තිය, හානිපූරණය කියලා ජාත්‍යන්තරය පිළිගත් කාරණා කීපයක් තිබෙන බව. ඒ ගැටුම් නැවත ඇති නොවීම සඳහා රටක් අනුගමනය කරන්න ඕනෑ ක්‍රියාමාර්ග තිබෙනවා. යුද්ධය අවසන් වෙලා අවුරුදු 16ක් යද්දීත් ඒ ක්‍රියාමාර්ගවත් හිටපු පාලකයන්ට ගන්න බැරි වුණා.

මේ මාතෘකාව යටතේ අපි කියන්න කැමැතියි, ධීවර අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය දැඩි මැදිහත් වීමක් උතුර හා නැඟෙනහිර ප්‍රදේශවලට කරමින් සිටින බව. එදා ඔබතුමන්ලාට එකදු අපනයන සංවර්ධන කලාපයක්වත් උතුරේ ඇති කර ගන්න බැරි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාන්කුලම්, KKS, පරන්තන් කියන ප්‍රදේශ තුනේ අක්කර 600ක් අපනයන සැකසුම් කලාප නිර්මාණය කරන්න අපි ආයෝජන කර තිබෙනවා. එතැනින් එහාට ගියාම, අපනයන කර්මාන්ත ගත්තොත්, කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය, IT කර්මාන්තය කියන කර්මාන්ත හතරටම උතුරු, නැඟෙනහිර විභවයක් තිබෙනවා. මම ගිය මාසයේ උතුරු, නැඟෙනහිරට ගිහිල්ලා අපනයනකරුවන් හමු වුණා. අපනයනකරුවන් 22ක් ඉන්නවා. ඒ විසිදෙදෙනා මුහුණ දෙන ගැටලුවලට හිටපු පාලකයන්ට මෙච්චර කාලයක් විසඳුම් දෙන්න බැරි වුණා. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපනයන සංවර්ධන

[ගරු චතුරංග අබේසිංහ මහතා]

මණ්ඩලය - EDB එක - මේ වන කොටත් ආරම්භ කරලා තිබෙනවා. දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යාලයක් ඒ ප්‍රදේශයේ ස්ථාපිත කිරීම, ඉදිරි මාස පහ තුළ සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් 300 දෙනෙකු හඳුනාගෙන ඔවුන්ට අදාළ වැඩ කටයුතු කිරීම ආදිය ඒ හරහා කරනවා. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන දෙපාර්තමේන්තුව මිලියන 12ක් මේ අවුරුද්දේ උතුරට විතරක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, නැඟෙනහිරටත් මුදල් වෙන් කර තිබෙනවා. තෝරා ගත් අපනයනකරුවන් 5 දෙනෙක් සමඟ ඔවුන් මේ වන කොට වැඩ කරමින් ඉන්නවා.

මේ ක්‍රියාවලිය ගත්තාම, අපනයනකරුවන්ට අවශ්‍ය ප්‍රවාහනය හදා ගන්න මේ රටේ පාලකයන්ට බැරි වුණා. විශේෂයෙන්ම අපනයන කර්මාන්තය වෙනුවෙන් උතුර හා දකුණ යා කරන්න පුළුවන් ගුවන් සේවයක් අපට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

ඒ වාගේම ධීවර කර්මාන්තයේත් දැවැන්ත ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අවුරුදු ගණනාවක් ගිහිල්ලාත් මෙතුමන්ලාට බහුදින ධීවර යාත්‍රාවලට port එකක් හදා ගන්න බැරි වුණා. අපි කියන්න කැමැතියි, ඒ ආයෝජන සියල්ල කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ වෙලාවේ වෙන් වෙලා තිබෙන බව. එතැනින් එහාට ගත්තාම, ධීවර කර්මාන්තයේ sea cucumber වගාව ප්‍රවර්ධනය වෙලා, මේ වෙනකොට ඉතා වේගයෙන් වර්ධනය වෙමින් යනවා. අක්කර 1,738ක මේ වෙනකොට ඒ කර්මාන්තය සිද්ධ වෙනවා. ඊට පස්සේ කිවුල් දිය ඉස්සන් වගාව, මුහුදු පැළෑටි වගාව වැනි තෝරා ගත් විවිධ අපනයන ක්ෂේත්‍ර සඳහා වන කර්මාන්තවලට අවශ්‍ය පහසුකම් සපයමින් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චතුරංග අබේසිංහ මහතා**

(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)

(The Hon. Chathuranga Abeysinghe)

මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම, මේ ක්‍රියාවලියට යාපනය විශ්වවිද්‍යාලය දායක කරගන්නත්, යාපනයේ තිබෙන පෞද්ගලික IT විශ්වවිද්‍යාලය දායක කර ගන්නත්, පළාත් සභා සහ ප්‍රාදේශීය සභාවල ඒ අවශ්‍ය කරන යන්ත්‍රණය භාවිත කරලා දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් දියත් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ නිසා තමයි, මේ වේදනාවෙන් කෑ ගහන්නේ. මොකද, ආයෙත් කවදාවත් ජාතිවාදය පදනම් කරගෙන බලය ලබා ගන්න ලැබෙන්නේත් නැහැ, ආර්ථික ප්‍රශ්න ගැන කථා කරලා බලය ලබා ගන්න ලැබෙන්නේත් නැහැ. මොකද, අපි මොනරාගල දිස්ත්‍රික්කයට වාගේම, උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලියට දැවැන්ත ප්‍රමුඛත්වයක් දීලා තිබෙන නිසා.

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදීත් ගැටලුවක් තිබෙනවා. ඒකත් අපි තේරුම් ගන්න ඕනෑ. උතුරේ නිෂ්පාදන දකුණට ඇවිල්ලා තමයි අපනයනය කරන්නේ. ඒ නිසා අපනයනය ප්‍රමුඛ කර්මාන්ත කිහිපයක්, විශේෂයෙන්ම කෘෂි අගය එකතු කිරීම හා ධීවර අගය එකතු කිරීමේ කර්මාන්ත කිහිපයක්, අපි ඉතා කඩිනමින් උතුරු සහ නැඟෙනහිර පළාත්වල ආරම්භ කිරීමට පිඹුරුපත් සකස් කරලා තිබෙනවා. ඉතින්, ඉවසාගෙන ඉන්න වෙනවා. මේ අවුරුද්දෙන් එහාට ඔබතුමන්ලාට කථා කරන්න මාතෘකාවක් නැති වෙන තත්ත්වයක් තමයි ඇති වෙන්නේ.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 මැයි 23වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2025 மே 23, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 23rd May, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.